# 2025-10-14 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ.

## සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව.

මෙදින පෙ.ව 9.30 ට සාමාන්‍ය මහා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.

| අනු අංක | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 02. | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සභික |
| 03. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සභික |
| 08. | ගරු මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 09. | ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා | සභික |
| 10. | ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 11 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 12 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සභික |
| 13 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභික |
| 14 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය | සභික |
| 15 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නඳුන් සමීර මැතිතුමා | සභික |
| 16 | ගරු මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 17 | ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා | සභික |
| 18 | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 19 | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 20 | ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 21 | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 22 | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 23 | ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 24 | ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා | සභික |
| 25 | ගරු මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 26 | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සභික |
| 27 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 28 | ගරු මන්ත්‍රී පී.මාලින්ද  මුදන්නායක මැතිතුමා | සභික |
| 29 | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 30 | ගරු මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |
| 31 | ගරු මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා | සභික |
| 32 | ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා | සභික |
| 33 | ගරු මන්ත්‍රිනී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය | සභික |
| 34 | ගරු මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා | සභික |

**නොපැමිණීම්:-**

- ගරු ප්‍රාදේශීය සභා සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා.
- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා.

01.ඩී.බී.මනොජ් තිවංක මයා, සභාවේ ලේකම් ලෙස සහභාගී විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
2025.10.14 දින පැවැත්වීමට නියමිත මහා සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරිමට තමා අපි මේ සූදානම් වෙන්නේ.අද දින රත්නපුර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වෙනවා, අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්. ඒ සඳහා අපේ ගරු සභාපතිතුමාත් සම්බන්ධ වුණා.එ් නිසා සභාපතිතුමා නැතුව,අද දින අප සභාවේ වැඩකටයුතු සිදු කර ගෙන යමු.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
පළමුව තිබෙන්නේ පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

**01.පසුගිය සභා වර්තාව සභා සම්මත කිරීම.**

**01.01.2025-09-09 වනදිනපැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරමි.**

සංශෝධන තිබේ නම් සංශෝධන ඉදිරිපත් කරන්න. මොකද මෙවර වාර්තාවට එය ඇතුළත් කරන නිසා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවක් තිබුණා විල්ලේගොඩ ගල්ගොරඩ්වත්ත ලෙස එය ගල්ගොඩේවත්ත ලෙස නිවැරදි විය යුතුයි.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේ ඉදිරිපත් කළ අදහස් දැක්වීම් වල යම් කිසි අපැහැදිලි තත්වයක් තිබුණා. එහිදී මා විසින් ඉදිරිපත් කළ අදහස නිවැරදිව නිරූපනය වෙලා තිබුණේ නැහැ.ගරු මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක්මත් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් ඉල්ලුවා.ඒ නිසා මං හිතුවා මං එදා කියපු දේ පොඩි නිවරදි කිරීමක් කළොත් හොදයි කියලා.මං එදා එක්තරා සමාජ ක්‍රියාකාරීත්වයක් පැහැදිලි කරන කොට,එයට අදාළ වුල් එකක් මෙවලමක් පිළිබඳවයි මම කතා කළේ.ඒ මෙවලම තමයි මම කියපු වචනේ, සාවද්‍යා පරාවර්තනය කියලා.ඒ සම්බන්ධයෙන් මං හිතන්නේ වාර්තාවේ ඒක පැහැදිලි වෙලා නෑ. සමහර අයට ඒක යම්කිසි ගැටලුවක් තියෙන බව පේනවා.අපි සාමාන්‍යයන් පරාවර්තනය කියන වචනය අප අහලා තියෙන්නේ ඉස්කෝලෙදී ආලෝකය සම්බන්ධයෙන්.ආලෝකය පරාවර්තනය වෙනවා.එතකොට ආලෝකය පරාවර්තනය වෙන කොට යම් කිසි පෘෂ්ඨයක් මත වැටෙන කොට පරාවර්ථනය වෙනවා.එතකොට ඒ පරාවර්තනයෙන් පස්සේ යන ආලෝකය දිහා බලලා ගන්න තීන්දුවයි, ආලෝකය ආපු තැන දිහා බලලා ගන්න තීන්දුවයි දෙකම හැම වෙලේම ඒක නෙමෙයි.බල්බ් එකෙන් එන ආලෝකය දිහා බැලුවොත් බල්බ් එක පේනවා.ඒක පෘෂ්ඨයකින් පරාවර්තනය වෙලා එනකොට එක දිහා බැලුවහම පේන්නේ බල්බ් එක නෙමේ.පෘෂ්ඨය පේන්නේ.එහෙම වෙන්නේ දිලිසෙන්නෙ නැති පෘෂ්ඨයක් නිසා.ප්‍රභවය පේන් නෑ.හැබැයි දිලිසෙන පෘෂ්ඨයක් නම් කඩතොළු නැත්නම් පිරිසිදු නම් ඒ වගේ තැනකින් එන පරාවර්තනයේ දී අපිට පරාව වැදෙන තැන බැලුවහම අපිට අර ආපු තැන පේනවා.ප්‍රතිබිම්බයත් පේනවා.අරම්භයත් පේනවා.එතන පරාවර්තනයේදී සාවද්‍යා හැඟීම ඇති කරන් නෑ.හැබැයි වැරදි පරාවර්තනයක් විසාදී පරාවර්තනයක් වුණාහම ආපු ප්‍රභවය පේන් නෑ.වෙන එකක් පේන්නේ.ආලෝක විද්‍යාව හා සාවධ්‍ය පරාවර්තනය තියෙනවා.මම කියන්න හැදුවේ සමාජ ක්‍රියාරීත්වයක් දිහා බලන එක වටහා ගන්න කොට පරාවර්තනය විසින් ලබා දෙන අදහස ගැනයි.අපි යම් තොරතුරක් කිවුවහම,කෙනෙක් අහලා එයාගෙන් ඒක පරාවර්තනය වෙනවා.එයාගෙන් පරාවර්තනය වෙනකොට අර කියපු අදහසම එන්නේ නෑ.එයා ග්‍රහනය කරගන්නා ආකාරය, එයාගේ අනුව.ඒක ඒ විදිහටම නෙමේ.උදාහරණයක් ගත්තොත් මට ලේසියි,එක්තරා වාමාංසික රටක ජනාධිපති කෙනෙක් බටහිර ලෝකේ රටක.... ජාතිකයෙක්.සාමාන්‍යයන් බටහිර ලෝකේ හැම වෙලේම බලන්නේ වාමාංසික රජයක් දිහා පිළිකුළෙන් බලන්නේ.වැරදියට බලන්නේ.අපහාස කරන්න බලන්නේ.නින්දා කරන්න බලන්නේ.

**සභික ඩී.ගයේෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.සභා රීති 14-3 අපි වාර්තාව සභා සම්මත කරන කොට අපිට දෝෂයක් තියෙනව නම් පෙන්වලා දෙන්න පුළුවන්.හැබැයි ඒක කතාවක් බවට පත් කර ගැනීම අපිට අනුමත කරන්න බෑ.ඒක 14-3 "පසුගිය මාසයේ සභා රැස්වීම් වාර්තා,අනුගාමී මාසයේ සාමාන්‍ය සභා රැරැස්වීමේ වාර්තාව කියවා ඇති ලෙස සලකා ස්ථිර කළ යුතු බවට යෝජනා කළ යුතු අතර සංශෝධන හෝ නිවරදි කිරිම් කිසිවක් ඇත්නම් එයම පමණක් සලකා" මං හිතනවා මන්ත්‍රිතුමාගේ යෝජනාව අපි වෙනත් අදහස් දැක්වීමේදී ගමු.බාධා කිරිමක් නෙමේ.නැත්නම් අපි මේක පූර්වාදර්ශයකට අරගෙන යන්න වෙනවා ඉස්සරහට.හැමෝම වාර්තාවේ තියෙන දෙයක් ගැන

**සභික අයි.එච්.රණවීර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මම වෙනත් අදහස් දැක්විමේ දී මේ පිළිබඳ අදහස් දැක්විමට බලාපොරොත්තු වෙනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
එසේ නම් ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව වෙනත් අදහස් දැක්වීම් වලදී සිදු කරමු. වෙන සංශෝධන තියෙනවද?

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,2025-09-09 වන දින පැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කරමි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව2025-09-09 වනදිනපැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
**02. සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ නිවේදන.**
කිසිවක් ලැබී නැත.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
**03. මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා ඇති ලිපි සභාගත කිරිම.**
අපේ සමගි ජනබල වේගයේ ගරු මන්ත්‍රී රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා එන්න විදිහක් නැ කියලා ලිපියකින් දන්වලා තියෙනවා.එතුමා අසනිප වෙලා.එතුමාට මහා සභාවට පැමිණිමට නොහැකි බව දන්වා තියෙනවා. එම නිවාඩු අනුමත කිරිමේ ලිපිය ස්ථිර කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා විසින් අද දින සභාවට පැමිණිට නොහැකි බව එවන ලද ලිපිය අපි භාර දීමට සැලැස්සුවා,එම ලිපිය මම සභාවේ අනුමත කිරීමට යෝජනා කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
**04.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.**
කිසිවක් ලැබී නැත.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
**05.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගියවර න්‍යාය පත්‍රයේ 6.17 ඒ වෙලාවේ ඔබතුමා සභාවට දැනුම් දෙනවා කියලා කිවුව විස්තරයක් මං හිතනවා අද ඔබතුමා ඒකට සුදානම් වෙලා ඇති කියලා.වෙළඳ සංකිරණය පුළුල් කරන එක ගැන.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒක ඇත්තටම කාර්මික නිලධාරී මහතා සමඟ සම්බන්ධ වෙලා ඒක ඇත්තටම කරන්න උන් නැහැ.ඒකට සැලැස්මක් හදනවා කියලා තමයි අපි යොජනා කළේ.ඒක ඉදිරි සභාවක දී අපි කාර්මික නිලධාරීතුමාගේ නිර්දේශයක් අපි ලබා දෙනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
**06. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
6.1. සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමාගේ යෝජනාව

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා :-**

**6.1. කළුඅඳුරවත්ත හතරමන් හන්දියේ සිට පොල්කොටුව දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීමයෝජනා කරමි. (500 m,හේවායින්න)**එම 500 m කොටස අදියර දෙකකින් හෝ නිමකර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම පොල්කටුව කියන ප්‍රදේශය ඉතා කඳු සහිත ගම්මානයක්.දැනට තිබෙන මාර්ගය වාහනයක් යන්න බැ.කන්ද වැඩි නිසා.මෙම පාර දැන් අලුතෙන් කළුඅඳුර වත්ත හරහා පාරක් තියෙනවා.ඒක හරහා ආවොත් ඒ කන්ද ලොකු බැවුම මහ හරවා ගන්න පුළුවන්.එතන නිවාස 28ක් පමණ තිබෙනවා.එතකොට එහි නිවාස ඉදිකිරීම් කටයුතු සිදු කරනු ලබන්නේ 1Kmවගේ දුරක් කරේ බඩු අදින්න වෙලා තියෙනවා.ඒක නිසා මේක ඉතාමත් ඉක්මනින් මෙම සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.1 යෝජනාවකළුඅඳුරවත්ත හතරමන් හන්දියේ සිට පොල්කටුව දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව (500 m,හේවායින්න) මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
6.2. සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ යෝජනාව

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**

**6.2.බටහිර කලටුවාව ට්‍රාන්ස්ෆෝමරය අසල සිට දයාවංශ මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීමයෝජනා කරමි.(300 m)**

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම මාර්ගයත් කිසිම සංවර්ධනයක් සිදු වෙලා නෑ.ඉතා ඉක්මනින් කොන්ක්‍රීට් දමා සංවර්ධනය කළ යුතු මාර්ගයක්.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.2 යෝජනාව බටහිර කලටුවාව ට්‍රාන්ස්ෆෝමරය අසල සිට දයාවංශ මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව (300 m) මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
6.3. සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමාගේ යෝජනාව

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**

**6.3.සමුපකාරය අසල සිට ගුණපාල මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීමයෝජනා කරමි.(බටහිර කලටුවාව, 200 m)**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි ,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේකත් බටහිර කලටුවාව වසමට අයිති එකක්. මේ මාර්ගයත් අර කිව්ව වගේම හැකි ඉක්මනින් සංවර්ධනය කළ යුතු මාර්ගයක්.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමාගේ 6.3 යෝජනාව සමුපකාරය අසල සිට ගුණපාල මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව (බටහිර කලටුවාව, 200 m) මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
6.4. සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා :-**

**6.4.බටහිර කරඳන උපාසිකාවත්ත පාර ධර්මසිරි මහතාගේ නිවස අසල සිට ඉදිරියට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, බටහිර කරඳන උපාසිකා වත්ත පාර ධර්මසිරි මහතාගේ නිවස අසල සිට ඉදිරියට සංවර්ධනය කිරීම යෝජනා කිරීමේ දී මීටර් 600 ක් පමණ දුරට එම මාර්ගය සංවර්ධනය කිරීමට ඉතුරු වෙලා තිබෙනවා.එහි මුල කොටස කොන්ක්‍රීට් කරලා තියෙනවා. නමුත් ඉදිරියට සංවර්ධන කටයුත්තක් වෙලා නෑ.වැසි සහිත කාල වලදී මඩ වගුරු බවට මේ මාර්ගය පත් වෙනවා.ඒ නිවාස වාසීන් ඉතාමත් අපහසුතාවට පත් වෙනවා.එතකොට එතන නිවාස තියෙනවා නිවාස 20 කට ආසන්න ප්‍රමාණයක්.මම බලා පොරොත්තු වෙනවා මේ සභාව මඟින් අදියර දෙකකදී හෝ එම කටයුත්ත කර ගන්න ලැබෙයි කියලා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අප ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ කිලෝමීටර් හයසිය ගානක් තියෙනවා ඔක්කො ම පාරවල්.එවා අතරින් සමහර පාරවල් තියෙනවා ඉතාම අබලන් වෙච්චා.සමහර පාරවල් තියෙනවා හදල නිකන්,හදලා නැවත හදන්න තියෙන ඒවා. නියමිත ප්‍රමිතියකින්,ඒ ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්න. අපි රජයේ ප්‍රතිපාදනත් එක්ක ප්‍රාදේශිය සභා ප්‍රතිපාදනත් එක්ක මේ අවුරුදු 4 ඇතුළත සියලුම පාරවල් සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඔබතුමා කියනවා අවුරුදු 4 ඇතුළත 600 km ම ඇහැලියගොඩ බල ප්‍රදේශයේ තියෙන මේ 600 km ම හදනවා කියලා.ඉතාමත් ම විශිෂ්ටයි.මං හිතනවා මේ ගැන මාධ්‍ය වාර්තා කරයි කියලා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 6.4 යෝජනාව බටහිර කරඳන උපාසිකාවත්ත පාර ධර්මසිරි මහතාගේ නිවස අසල සිට ඉදිරියට සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
6.5.කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**6.5.කැකුණ දොල ජල මුලාශ්‍රය නළ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.**

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම ජල ව්‍යාපෘතියෙන් එම ප්‍රදේශයේ කණිෂ්ඨ පාසල, විහාරස්ථානයට හා අවට නිවාස වාසීන් නිවාස 50 කට අධික ප්‍රමාණයක් එම ව්‍යාපෘතියෙන් ජල පරිභෝජනය කරනවා.නමුත් එහි ජල නළ පද්ධතිය කැඩී බිඳී යාම හේතුවෙන් අද අක්‍රමවත්ව නිසි ක්‍රම වේදයක් නැතුව නිවාස වලට ප්‍රධාන වශයෙන් ම පාසලට විහාරස්ථානයට අද ජලය නොමැති තත්ත්වයක් උදා වෙලා තියෙනවා.මෙහි සංවර්ධන කටයුත්ත සිදු කරලා දෙන්න පුළුවන් නම් ඒ ප්‍රදේශ වාසීන්ටත් ඒ ප්‍රධාන ආයතන දෙකටත් විශාල යහපතක් සේවාවක් වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව කාලොචිතයි.මොකද පන්සලටත්, පාසලටත් බොහෝ බලපාලා තියෙනවා.දවස් දෙකක් පැවුවහම බලපානවා ඒ ජල ප්‍රශ්නය.ඒ නිසා ඒකට ප්‍රමුඛතාවය ලබා දෙන්න පුළුවන් නම් ගොඩක් කාලොචිත යෝජනාවක්.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 6.5. යෝජනාව කැකුණ දොළ ජල මුලාශ්‍රය නළ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
6.6. සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**

**6.6.හපුගහ හේන ගම්මැද මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ සඳහන් කල මාර්ගයේ මුල කොටස සංවර්ධන කටයුතු සිදු වෙලා තිබෙනවා.නමුත් ඉන් ඉදිරියේදී ගං වතුර ගලද්දී ඉතාම දුෂ්කරම කොටසක් තියෙනවා.එම ප්‍රදේශ වාසීන් ඉතාමත්ම අපහසුතාවට පත්වෙනවා.මැසිවිලි නගමින්, ඉතාම දුක්ඛිත තත්ත්වයකට පත් වෙලා තියෙනවා.මොකද ප්‍රධාන මාර්ගයේ ගමන් කරද්දී අපට පේනවා මේවා සංවර්ධනය වෙලා තියෙනවා කියලා.නමුත් ගම් ඇතුළට ගිහිල්ලා බලන්න කොට තවත් ගැටලු තියෙනවා මේ ප්‍රදේශයේ.මම බලා පොරොත්තුවෙනවා සංවර්ධනය කළ යුතු කොටස මීටර් 700 ක් පමණ තියෙනවා.මොනයම් ආයතනයක් දැනුවත් කර හෝ මෙය හැකි ඉක්මනින් සාදා දෙන්න පුළුවන් නම් ඒ මිනිස්සුන්ට ගොඩක් යහපතක් වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ මාර්ගය සම්බන්ධව ඇතැම් ස්ථාන තියෙනවා බයිසිකලයක්වත් යන්න බැරි විදිහට සෝදා පාළුවට ලක් වෙලා තියෙනවා.මුල කොටස නම් සැලකිය යුතු ප්‍රමාණයක් සංවර්ධනය වෙලා තියෙනවා.විශේෂයෙන් ආර්ථික වශයෙන් වටිනාකම් තියෙන ප්‍රදේශයක්.තේ වගාව බහුලව තියෙන ප්‍රදේශයක්.ඒක සංවර්ධනය කිරීම උචිතයි.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
කෘෂි මාර්ගයක් විදිහට සංවර්ධනය කරන්න පුළුවන්ද?

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
කෘෂි මාර්ගයක්, ඒක පොඩ්ඩක් අධ්‍යනය කරලා කියන්න පුළුවන්.තේ වගාව බහුල වශයෙන් තියෙනවා.ඒක කෘෂිකර්මය කියන එක මොන පැත්තට දාගන්න පුළුවන්ද කියන එක මට නිගමනය කරන්න බෑ.එහෙම කරන්න පුළුවන් නම් ගොඩක් වටිනවා.දෙකම වටිනවා.දැන් මාර්ග 600 km කරනවා කියනවනේ.මේකත් ඒකට දාල කරන්න.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 6.6. යෝජනාව හපුගහ හේන ගම්මැද මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.7.සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**

**6.7.මීටිපොල බෝධිය මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සෑහෙන කාලෙක පටන් මීටිපොල බොධිය මාර්ගය අබලන් වෙලා තියෙන්නේ.පසුගිය රජයන්වලදී ඕක කරන්න හැදුවා,ගල් ටික ගිහින් දාල,ඒ ටික නැති වුණා.ඒ නිසා ඒ ප්‍රදේශයේ ජනතාව ඉල්ලා ඒ ටික කොන්ක්‍රිට් කරලා මේ මාර්ගය හැකි ඉක්මනින් සකසා දෙන්න කියලා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වසර හතරක් තුළ සංවර්ධනය කරන ඒ මාර්ග සංවර්ධනය කරන වැඩපිළිවෙලේ දී මේකටත් ප්‍රමුඛතාව දෙන්න කියලා යෝජනා කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපි ඇත්තටම කිවුවේ වසර 4 ඇතුළත සභාවේ සියලුම ග්‍රාමීය හා නාගරික මාර්ග සංවර්ධනය කරන්න.සියල්ලටම ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන වෙන් කරන්න බෑ.මධ්‍යම රජයෙන් ප්‍රතිපාදන එනවා,ඒ අනුව සියලුම මාර්ග අපි උත්සහ කරනවා .ඒ කිලෝමීටර් 600 ම නෙමේ සංවර්ධනය කළ යුතු කොටස් තියෙනවා.ඒවා සංවර්ධනය කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 600Km ක වපසරියක පාරවල් විහිදිලා තියෙනවා බල ප්‍රදේශයේ.දැන් කලින් ආණ්ඩුවල 300 ක වැඩි ප්‍රමාණයක් හදලා තියෙනවා.ඒක අපි පිළිගන්න එපැයි. කලින් ආණ්ඩුවල මොනව හරි කරලා තියෙනවනේ.76 සාපයක් වුණත්.එතකොට එතනදී බෝගහ පාර කියද්දී මට මතක් වුණේ , මේ පැත්තේ මට මතක් වුණේ දේවානිලා නෑ.මීටිපොල බෝගහ පාර හදනකොට දැන් දේවානි වගේ හිටියොත් මේ බො ගහේ අත්තක් කැපෙන හින්දා මේ පාර හදන්න දෙන්න බෑ.එහෙම කියලා වෙන්න ඇති අනික් පැතිවල හැදෙන්න නැතුව ඇත්තේ.මේ පැත්තේ ඔබතුමන්ලා මොනව හරි සංවර්ධනය කරන්න යන කොට ඒවට අකුල් හෙලන්න උද්ඝෝෂණ කරන්න ඒවා එපා කියන්න, මං හිතන්නැ මේ විපක්ෂ කණ්ඩායමේ කවුරුත් ඉදියි කියලා.ඒ කියන්නේ ඔයාලට ඕන විදිහට පාරවල් ටික හදන්න පුළුවන්.ඒකට අවස්ථාව නිර්මාණය වෙලා තියෙනවා.මොකද අපි ඒ අභියෝග එක්ක සටන් කරලා තමයි මෙච්චර කාලෙට ඒ පාරවල් ටික හදලා තියෙන්නේ.ඒ කියන්නේ දැන් ඒ අභියෝගෙත් නැනේ.දැන් සල්ලිත් තියෙනවා.කිලෝමීටර් 600 න් 300 ට වඩා ප්‍රමාණයක් හදලාත් තියෙනවා. ඒක හින්දා තව පොඩ්ඩයි තියෙන්නේ.ඒක හින්දා මේ අවුරුදු 4 ට ඔබතුමාලට මේක හදලා ඉවර කරන්න පුළුවන්.අපි ඒ අවස්ථාව ලබා දීලා තියෙනවා.අපේ මේ විපක්ෂේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ යෝජනා පිළිබඳවත් ප්‍රතිපාදන ලබා දීමේ දී සැලකිලිමත් වන්න.එතකොට ඔවුන් සමහර විට ඔබතුමාල වගේ කොට්ඨාශ සභාවලට වාඩිවෙන් නැතුව ඇති.හැබැයි කොට්ඨාශවලින් එන ප්‍රමුඛතාවය මත ම ,කොට්ඨාශ සභා වල නිර්දේශ මතම පමණක් නෙමෙයි ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ,මේ පැත්තෙ අයත් මන්ත්‍රිවරු විදිහට ඉදගෙන තියෙනවා.ඒ අයට ලොකු වගකීමක් තමන්ගේ හිසේ තියාගෙන තමයි මෙතන වාඩි වෙලා ඉන්නේ.ඔවුන්ටත් ප්‍රතිපාදන ලබා දීලා ඒ සාධාරණය ඉටු කරන්න කියලා ඔබතුමාගෙන් මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

**සභික අමිල් නිමේෂබණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම එකට කාරණා දක්වන්න ඕන.දැනටමත් අපි මාර්ග ටික 3Km කට වඩා මාර්ග ටිකඉදිවෙමින් යනවා.දැනට මේ දවස්වල ලහි ලහියේ වැඩ ටික කෙරිගෙන යනවා.මං හිතන්නේ හැමොටම මේ පිළිබඳ ජේනවත් ඇති.ඒ හින්දා අපි ගොඩක් මහන්සිවෙලා ඉස්සරහට වැඩ ටික කරගෙන යනවා.හැමදෙනාගේ සහයෝගය දෙන්න අනිවාර්යෙන ම අවුරුදු 4 ක් යනකොට මේ ටික ඔක්කොම ඉවරයි කියලා තමා අපෙත් අදහස.මේ යන විදිහට.ඒතරම් සංවර්ධනය වේගෙන් යනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමාගේ 6.7. යෝජනාව මීටිපොල බෝධිය මාර්ගය කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරිම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.8. සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**

**6.8.මීටිපොල තැපැල් කාර්යාලය පෙර පරිදි යථාවත් කර පැවැත්වීමට ගරු අමාත්‍යතුමා දැනුවත් කිරීමට යෝජනා කරමි.**

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිනිය:-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපේ මන්ත්‍රීවරු ඔබතුමන්ලගේ ඉස්සරහ තියෙන මයික් එක අනිවාර්යෙන් ඔන් කරලා කතා කරන්න.නැත්නම් සභාවාර්තාව ලියද්දි නිලධාරීතුමිය ගොඩක් අපහසුතාවට පත්වෙනවා.ඒ හඩ රෙකෝඩරයේ හරියට රෙකෝඩ් නොවන හින්දා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මීටිපොල තැපැල් කාර්යාලය මෑතක් වන තෙක් ක්‍රියාත්මක වුණා.මේ මෑතකදී කවුරුන් හෝ විසින් තීරණයක් අරගෙන තියෙනවා සතියට දවස් දෙකක් පවත්වන්න.මීටිපොල ප්‍රදේශයේ සෑහෙන ජනතාවක් ඉන්නවා. මීටිපොල කිරිපෝරුව ප්‍රදේශයේ අයටත් තැපැල් කාර්යාලයක් විදිහට පාවිච්චි කරන්න කියෙන්නේ මීටිපොල තැපැල් කාර්යාලය.ඉතින් එක ගරු අමාත්‍යතුමා දැනුවත් කරලා හැකි ඉක්මනින් යථාවත් කර ගැනිමට කටයුතු කර දෙන්න අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මීටිපොල තැපැල් කාර්යාලය පිළිබඳව ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා කර එතුමාව දැනුවත් කළා.ඊට පස්සේ එක දවස් 2ක් නොවෙයි දවස් 03ක් තැපැල් කාර්යාලය විවෘත කිරීමට ගරු අමාත්‍යතුමා දැනුම් දීලා තියෙනවා.ඊට පස්සේ ප්‍රදේශවාසීන්ට අපි  දැනුවත් කිරීම කළා.ඉතින් ඒකෙදි ලාබ ලබන ආයතනයක් ලෙස පෙන්වන්න, ඇත්තටම මීටිපොල ගමේ අය වගේම කිරිපෝරුවේ ඒ සේවාව තැපැල් කාර්යාලය හරහා සිදු කර ගන්නවා .ඉදිරි දින කීපයත් විවෘතව තබා ගැනිමට කටයුතු කරන්න, ගරු මන්ත්‍රීවරුන්ගෙන්, අපේ කොට්ඨාශයේ ජනතාව දැනුවත් කරලා මේ කටයුත්ත සාර්ථක කර ගන්න  සහයෝගය ලබාදෙන කියලා මා ඉල්ලා සිටිනවා.

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මීටිපොල තැපැල් කාර්යාලය දින දෙකක් පවත්වාගෙන යන්න කටයුතු කරලා තියෙන කොට මම කතා කළා දිස්ත්‍රික් තැපැල් ස්ථානාධිපති තුමිය සමඟ.ඊට පස්සේ ඇත්තටම කිරිපෝරුව මීටිපොල ජනතාව ඉතාම අසීරුතාවයකට පත්වෙලා තියෙනවා.මොකද මේ වෙන කොට දැන් හදිස්සියට මුද්දරයක් ගන්න තැනක් නෑ.එහෙම තියෙන තත්ත්වයක්.සාමාන්‍ය කඩවල්වල මුද්දර විකුණන්නත් බෑ.දවස් තුනක් කියන්නේ,දවස් තුනකට දැන් ඇරලා තියෙනවා.සඳුදා, සිකුරාදා, සෙනසුරාදා.නමුත් දීමනාවල් ගන්න, වැඩිහිටි දීමනාවල් ගොවි විශ්‍රාම වැටුප් ඒවගේ ම රෝගී දීමනා, සාමාන්‍යෙයන් රුපියල් 250 දීමනාව තැපැල් කාර්යාලයෙන් ගන්න ඒ මිනිසුන්ට ඒ දවසට බැරි වෙනවා.ඉතින් එතකොට ලොකුම අසීරුතාවයක්.මං ස්ථානාධිපතිතුමිය එක්ක කතා කළා.කොහොම හරි මේක ලාභ ලබන ආයතනයක් ඇහැලියගොඩ තැපැල් කාර්යාලය,ඇහැලියගොඩ බල ප්‍රදේශයේ පළවෙනියටම තිබුණ තැපැල් කාර්යාලය මීටිපොල.මෙ වනවිට ඒක බැහැල ,අඩුවෙලා තියෙනව නම් එක්කෝ ස්ථානාධිපතිතුමිය දැනට ඉන්න නිධාරීතුමියගේ අඩුවක්.මොකද ඒක වහලා නෙමේ කරන්න ඕනේ ,මාරු කරන්න ඕනේ කවුරුහරි නිලධාරියෙක්.ඇත්තටම ඒක කරලා දෙනව නම් ඒ දවස් 5 ම අරින්න,දවස් 6 ම අරින්න.කටයුතු කරලා දෙනව නම් ඒක ලොකු දෙයක් කියලා ප්‍රකාශ කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
සභාව හැටියට එම දැනුම්දී  කරා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව කොට්ඨාශ මන්ත්‍රීතුමිය  විසින් ඇමතිතුමා එක්ක කතා කරලා ඇති බව දැන් දැන ගත්තා.නමුත් අපගේ මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත්කර තිබෙනවා.මේ පිළිබඳව සභාවේ එකඟතාවයකින් සභාවේ යෝජනා සම්මත වුණා නෙ.දැන් අපි සභාවක් විදිහට ඇමතිවරයාට මේ යෝජනාව සම්මත වීම් පිළිබ දැනුම් දීමක් කරනවද?මමත් මීට කලින් මාසවල යෝජනා කීපයක් ඉදිරිපත් කරා. මම දන්නැ ඒ යෝජනා වලට මොකද වුණේ කියලා.ඒක දැනුම් දුන් ද මොකද වුණේ.නැත්තන් අපරාදේනේ අපි වටිනා කාලයත් කැප කරගෙන ඇවිල්ලා මෙතන යෝජනා ඉදිරිපත් කරනවා. එතනින් එහාට ඒකෙ ප්‍රගතිය පිළිබඳ අපේ මන්ත්‍රීවරු කිසිවෙක් ,මං දන්නැ මේ පැත්තේ මන්ත්‍රීවරු කිසිවෙකුට දැනුම් දීමක් කරන් නෑ සභාවෙන්.ඉස්සර එහෙම නෙමේ අපි යෝජනාවක් කරාහම ඒදේවල් වල ප්‍රගතිය අපිට පිටපතක් හරි ගෙදරට එනවා මෙන්න මේ විදිහට තමා ක්‍රියාත්මක වුණේ සභාවේ මෙන්න මේ තීරණය මෙන්න මේ විදිහට මේ ආකාරයට මේ අංශවලට යවලා තියෙනවා කියලා.එතකොට අපිට පහසුවක් වෙනවා මේ පිටපතක් එක්ක ඉදිරි ක්‍රියාමාර්ග ගන්න.මන්ත්‍රීතුමිය කතා කරලා තියෙනව නම් ගැටලුවක් නෑ ඒකට විසඳුමක් හම්බෙලා තියෙනව නම් ප්‍රදේශයේ අනෙක් මන්ත්‍රීවරුත් ප්‍රශ්නයක් නැත්නම් ඒක ගැටලුවක් නෑ.ඒ ප්‍රශ්නෙ ගැන නෙමේ මේ කියන්නේ,හැබැයි අපි මොනව හරි දෙයක් සභාවට යෝජනා කළොත් ඒකට ගත්ත ක්‍රියා මාර්ග මොනවද කියලා අඩු ගානේ ලිවුමකින් හරි නැත් නම් මැසේජ්  එකකින් හරි නැත් නම් ඊ මේල් එකකින් හරි ඒ මන්ත්‍රීවරයා දැනුවත් කරනව නම් ඒක ඉතාමත් සාර්ථකයි  ඉදිරි ක්‍රියාමාර්ග ගන්න.ඒක හින්දා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ මාස 4 ට එහෙම වුණේ නෑ.අඩු ගානේ මේ සභාවාරෙ ඉදන්වත් අපි කියන යෝජනා ඒ විදිහට ක්‍රියාත්මක වෙයි කියලා අපි විශ්වාස කරනවා. අපිට ප්‍රගතිය දැනුම් දෙන්න.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
මීටිපොල තැපැල් කාර්යාලයේ ඒ වසා දැමීමට ආවට පස්සේ,සභාපතිතුමාටත් ආවා.මටත් ඒ පැත්තෙ මිනිස්සු කිව්වා.ඒකත් එක්ක අපිත් මැදිහත් වුණා.අපිත් මැදිහත් වෙලා තමයි ඒක නැවත දවස් දෙකක් හෝ තුනක් විවෘත කරගෙන යන්නේ.අපි ඉදිරියේදී බලමු.සේවක පුරප්පාඩු තියෙනවා.පාඩු ලබන ආයතනයක්.පාඩු ලබන

ආයතනවල නිර්දේශ තියෙනවා.ඒවත් එක්ක අපි බලනවා.කිසිම ආයතනයක් වහන් නෑ.එතකොට ඒ මීටිපොල තියෙන උපතැපැල් කාර්යාලයත් ඉදිරියේදී, සතියේ දින හය ඒ අදාළ කාර්ය කරන්න බලාපොරොත්තු වෙනවා. මෙකෙ සභා තීරණය ඇත්තටම දැනටමත් අපි අහැලියගොඩ සම්බන්ධිකරණ කමිටු සභාපති අමාත්‍ය හිනිදුම සුනිල් සෙනවි අමාත්‍යතුමා අපි දැනුවත් කරලා තියෙන්නේ.ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග අරන් තියෙන්නේ.ඒ සම්බන්ධව සභා යෝජනාවක් ආවා කියලා අපි එතුමව දැනුවත් කරන්නම්.

**සභික ඩී.ජී.ගයේෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපි දැන් කතා කළා තැපැල් කන්තෝරුව ලාභ ලබන ආයතනයක් බවට, ලාභ නොලැබීම තමා හේතුව වෙන්නේ කියලා.හැබැයි සභාපතිතුමා මේකෙ තියෙන්නේ මේවා සේවාවක්.එතකොට මීටිපොලේ කෙනෙක්ට තැපැල් කාර්යාලයට නගරයට එන්න බැරි අපහසුතාවය හින්දා තමයි උප තැපැල් කාර්යාල පිටුවන්නේ.පලීගලත් තියෙනවා.මං හිතනවා ඇහැලියගොඩ පහ හයකට වඩා ඇති. එතකොට මේවා පිහිටවලා තියෙන්නේ ලාභ ලැබීමේ අරමුණින් නම් අපි මේක, මේක සේවාවක් විදිහට කරනව නම් ඒක අපි සේවාවක් විදිහට ලබා දෙන්න ඕන.දැන් අපි බටහිර කලටුවාවට යන CTB බස් එක නැවැත්තුවොත් ලාභ ලබන් නෑ කියලා ඒක වෙනම ගැටලුවක්නේ.එතකොට මේ සමහර ආයතන පිහිටෙවුවේ ජනතාවට සේවාවක් කරන්න.හැබැයි අපි ඒක ටික දවසක් යනකොට අර්ථකථනය කර ගන්නවා මේ ආයතනය ලාභ ලබන් නෑ කියලා.කවද හෝ දවසක ඒ තත්ත්වය ප්‍රාදේශීය සභාවට ආවොත්,ප්‍රාදේශීය සභාව ලාභ ලබන ආයතනයක්ද කියලා, ප්‍රාදේශීය සභාවත් වහන්න වෙනවා.AG office එකත් වහන්න වෙනවා. CTB එකට වෙලා තියෙන්නේ ඒකනේ. CTB එක හැදුවේ සේවාවක්.ගමනා ගමන මණ්ඩලය පිහිටුවන්නේ ජනතාවට සේවයක් කරන්න.හැබැයි අපි ඒක වෙන තැනකට ගෙනිහින් දැම්මා.මේකට ලාභ ලැබීම කියන එක ගත්තොත් ඇහැලියලොඩ තියෙන ප්‍රධාන තැපැල් කාර්යාලයත් වහන්න වෙනවා.මොකද තැපැල් සේවය ම ලාභ ලබන් නැනේ.ඔබතුමන්ලගේ ඇමතිවරයෙක් මේ ළඟදි ප්‍රකාශයක් කළා,අපිට තැපැල් දෙපාර්තමේන්තුවේ දි හම්බුණා.අපිin එකේදි ඇහුවා, ඔයාල තැපැල් සේවය ද ලිවුමක් ඉක්මනට යවන්න පාවිච්චි කරන්නේ කුරියර්ද එකද කියලා. මාත් එක්ක රූපවාහියේ ගියපු කතාවක් මං කියන්නේ.එතකොට එතුමා කිවුවේ නිලධාරී නිශ්ශබ්දව හිටියා කියලා.එතතොට මේ තැපැල් සේවය සේවයක්නේ.මේ මීටිපොල ජනතාවට තියෙන පහසුකම්.ඒක නවත්වන්න මේ ආණ්ඩුවෙන් ක්‍රියාමාර්ගයක් ගන්න එපා කියලා මං ඉල්ලා සිටිනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

ඒ කාරණය මෙතන්ට අදාළ නැති වුණාට එක මතක් කරන්න ඕනේ,ඒ ආයතය සේවා සපයන්න තමයි ස්ථාපනය කරලා තියෙන්නේ.ඒවා කඩන් වැටිලා අකර්මරණය වෙලා නිසි පරිපාලනය නැතිවෙලා ඒවා කඩන් වැටුනට පස්සේ IMF එකටත් ගිහිල්ලා, IMF එකේ නිර්දේශ අනුව තමයි මේවා තීරණය වෙන්නේ.ඔබතුමන්ලා අමතක කරන්න එපා අපි තාම ඉන්නේ IMF එකේ දඩු අඩුව ඇතුලේ.එකෙන් නිදහස් කරනවා, කොහොමත්.මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා දැන් රට වට්ටලා ඊට පස්සේ වික්ෂෙට ගිහිල්ලා දැන් නිකන් කෑ ගැහුවට වැඩක් නෑ.ඔබතුමන්ලා ඒ තැන්වල හිටියා.කොහොම උණත් අපි 2028 වෙනකන් මේ IMF ක්‍රියාදාමෙත් එක්ක යන්න වෙනවා.අපි එකත් එක්ක නිර්දේශ ජනතාවට හානියක් නොවන විදිහට හානිය අවම වෙන විදිහට අපි ඒ නිර්දේශ ක්‍රියාත්මක කරනවා.මීටිපොල උපතැපැල් කාර්යාලය ගත්තත් අපි ඒක ඒ නිර්දේශවලට යන් නැතුව අපි සේවාව පවත්වාගෙන යන්න කටයුතු කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, IMF වගේ දේවල් අපිට මේ කඩේ වැහුවා වගේ ආණ්ඩුව ගත්ත ගමන් වහන්න බෑ.එතකොට ඒ කාරණා එක්ක අපිට යන්න වෙනවා,අකමැත්තෙන් වුණත්.අපි එතනින් එහාට

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

ඒක දැනුවත් වෙලා තමයි අපි කිවුවේ.මිනිස්සු රවට්ටලා නෑ.ඔබතුමාල බලයට ආවේ IMF එක වතිනවා කියලා.හැබැයි ඒක නැවතුන් නෑ.ඒකයි තියෙන ප්‍රශ්නෙ.අපේ ගමේ මිනිස්සු අහනවා මාලිමා ආණ්ඩුවත් යන්නෙ IMF එක පස්සෙද, වැල් පාලමේද කියලා.එයාල කියනවා රැස්වීම්වලදී එහෙම නෙමේ කිවුවේ IMF එකෙන් අයින් වෙනවා.අපි IMF එක පිළිගන්නේ නෑ,ඕවගෙන් හිඟා කන්නෑ.IMF එක කියන එක නෙමේ පිළිගන්නේ.එහෙම නැත්තනම් අපි ණය ගන් නෑ අපි යන්න කියනවා.ඒකාලේ කිවුවේ ඔයාලගේ ඇමතිවරු.(ඝෝෂාව)හැබැයි රනිල් වික්‍රමසිංහ හදපු වැල් පාලෙමේම තමයි තවදුරටත් යන්නේ.ලැජ්ජාවක් නෑ.ලැජ්ජාවක් නැතිකම ඉතින්.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

සියලුම මන්ත්‍රීවරු, අපි පොඩි විනයක් පවත්වාගෙන යන්.හැම මන්ත්‍රීවරයෙකුට ම එක යෝජනාවකට කතා කරන්න එක අවස්ථාවක් තියෙනවා.අපි සභාව රීතිත් එක්කනේ කටයුතු කරන්නේ.අපි හැමෝම කතාවට ලැස්තිවෙලා එමු.ඒ අදාළ යෝජනාව ඇතුළේ ඔබතුමන්ලා හැමෝටම එක අවස්ථාවක් තියෙනවා කතා කරන්න.අපි ආදර්ශයක් වෙමු.අපි ඇහැලියගොඩ ප්‍රධාන පුරවැසියෝ ටික.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමාගේ 6.8. යෝජනාව මීටිපොල තැපැල් කාර්යාලය පෙර පරිදි යථාවත් කර පැවැත්වීමට ගරු අමාත්‍යතුමා දැනුවත් කිරීම සඳහා වූ යෝජනාවට, ඇහැලියගොඩ ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටු සභාපති හිනිදුම සුනිල් සෙනවි අමාත්‍යතුමා මේවන විටත් දැනුවත් කර ඇති බවත් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු වී ඇති බවත් උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.9. සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**

**6.9.ප්‍රාදේශිය සභා කාර්යාලය සඳහා විදුලි ජනක යන්ත්‍රයක් ටෙන්ඩර් කර මිලදී ගැනීමට යෝජනා කරමි.**

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,විදුලිය නැති දවසට මේ සභාවේ සේවය කරන සේවක මහතුන්ටත් සභාවේ සේවය සභාවට එන ජනතාවටත් හරි අපහසුතාවකට පත් වෙනවා විදුලි සැපයුම නොමැති දිනවල.ඒ දවස් වල ආපුවහම එදා කරන වැඩ කටයුතු සභාවෙන් කර ගන්න බෑ.අපහසුතාවයන් පවතිනවා.මේ නිසා මම යෝජනා කරනවා සභාවට,අවශ්‍ය ධාරිතාවයෙන් යුතු විදුලි ජනක යන්ත්‍රයක් ටෙන්ඩර් කරලා මිලදී ගන්නට යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමාගේ 6.9. යෝජනාව ප්‍රාදේශිය සභා කාර්යාලය සඳහා විදුලි ජනක යන්ත්‍රයක් ටෙන්ඩර් කර මිලදී ගැනීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.10.සභික එස්.ඒ.ටී.එස්.චමිලා සුරිආරච්චි මැතිණියගේ යෝජනාව

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සුරිආරච්චි මැතිණිය:-**

**6.10.මීටිපොල දම්මුල්ල කිරිපෝරුවට යන ප්‍රධාන මාර්ගයේ පීල්ල කඩේ අසල සිට නුග ගහ ළඟ දක්වා කාණු දමා කාපට් කිරීම හෝ කොන්ක්‍රීට් කිරීම යෝජනා කරමි. ( පළාත් සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.- මීටර් 100)**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සුරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, කිරිපෝරුව දම්මුල්ල මේ මාර්ගයේ තියෙන මේ පාර පළාත් සභාවට අයිති පාරක්.අපේ වසම් තුන හතරටම තියෙන ප්‍රධාන පාරක්.ඇත්තටම මේ පාර බැවුම් පැත්තට තියෙන ගොඩක් තැන් පාර අබලන් වෙලා තියෙනවා.මේක අපේ කිරිපෝරුව මීටිපොල වසමට විතරක් නෙමේ පානදුර හොරන ඒ පැත්තට යන්න තියෙන මාර්ගයක්.මේක සංවර්ධනය කර දෙන්න කියලා මම පළාත් සභාවට යෝජනා කරන්න, යෝජනා කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාවට දිගුවක් එකතු කරන්න කැමතියි.සභාවට ආපු පළවෙනි දවසෙම මං කිව්වා වාහන ගමන් කරන්නේ බොහෙම අපහසුවෙන්.ඒක හින්දා ඇරැපොල වසම දක්වා තියෙන ටික සංවර්ධනය කළොත් හොදයිගොඩක්ම.ඇත්තටම FINISH ටිකක්වත් දාලා තාවකාලිකව හරි හදලා දෙන්න.නැත්නම් වාහනයක් මාරු වෙන්න බෑ.සැහෙන අපහසුතාවයට පත්වෙනවා.අපට මේ මාර්ගයේ ඉදලා කළුතරට පාදුනරට ඒ පැත්තට යන්න තියෙන කෙටිම මාර්ගය තමයි ඔය මාර්ගය.ඒක හින්දා ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කරලා පළාත් මාර්ග අධිකාරිය සම්බන්ධ වෙලා මේ කටයුත්ත කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම මාර්ගය අනතුරු බහුල තත්ත්වයට පරිවර්ථනය වෙලා තියෙනවා මේ වෙනකොටත් .ඒ පාරේ තියෙන දුෂ්කරතාවය නිසා.ත්‍රිවිල් එකක් බයිසිකලයක් පාරේ අයින් කරන්න බැරි තත්ත්වයට ම සෝදාපාළුවට ලක්වෙලා තියෙනවා.ඒක ඉක්මන් ක්‍රියාමාර්ගයක් නොගත්තොත් ඇළට පාර ගලවන් ගියොත් ලාභ ලබනවා කෙසේ වෙතත් මුලික අවශ්‍යතා ටික සපුර ගන්නවත් බැරිවෙයි,විශේෂයෙන් බස් රථ කීපයක් ගමන් කරනවා මීටිපොල පැත්තටත්, දම්මුල්ල පැත්තටත්.ඊට අමතරව ව්‍යාපාරික ප්‍රජාව බහුලව බෙම්මුල්ලට ගමන් ගන්න කෙටි මාර්ගයක් ලෙස භාවිතා කරනවා.විශේෂයෙන්ම ආර්ථික වශයෙන් තේ කුරුඳු රබර් වගා කරන විශාල පිරිසක් ඉන්නවා ඒ ප්‍රදශෙවල.ඔවුන්ගේ ප්‍රවාහන කටයුතු කර ගන්න භාවිතා කරන පාරක්.මේ පාර ඉක්මන් ක්‍රියාමාර්ගයක් නොගත්තොත් අනතුරුදායක තත්ත්වයත් එක්කම ආර්ථික වශයෙනුත්,ඒත් එක්කම මුලික අවශ්‍යතා සපුර ගන්නත් බැරි තත්ත්වයක් උදාවෙන්න වැඩි කාලයක් යන් නෑ.ඒනිසා මුලික අවශ්‍යතා ටික සලකලා මේකට ප්‍රමුඛතාවය ලබා දෙන්න ඔබතුමන්ලගේ මේ සංවර්ධන යෝජනාවල ප්‍රමුඛතාවය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු අපට ස්තුතිවන්ත වෙන්න ඕනේ.මොකද පළත් සභාව සම්බන්ධ යෝජනා මීට කලින් මාස තුනක් දාන්න දුන් නෑ මේ ප්‍රාදේශිය සභා න්‍යාය පත්‍රයට.හැබැයි විපක්ෂෙ කණ්ඩායම මැදිහත් වෙලා ,එක වෙලාවක එක යෝජනාවක් අපිට පරාද කරන්නත් වුණා.ඒ මැදිහත් වීම තුළ ඔවුන්ටත් අවස්ථාව හම්බෙලා තියෙනවා ඒ පළාත් සභාවට යොමු කරන යෝජනාත් මේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරල ලස්සනට මේ ප්‍රශ්න ටික විසඳගෙන යන්න.ඉතින් මං හිතනවා හිතින් අපිට ස්තුතිවන්ත වෙනවා ඇති ආණ්ඩු පක්ෂෙ මන්ත්‍රීවරු, අනේ අපිට මේ අවස්ථාව ලබා දීමට විපක්ෂෙට ස්තුතියි කියලා.අපි ඒක පිළිගන්නවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපි ඒක මෙහෙම දැම්මේ නැති වුණාට අපි දැම්මා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒ කොහොමද දැම්මේ දැන්?

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
එය ප්‍රාදේශය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා හරහා යොමුකරා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඉතින් සභාපතිතුමනි, ප්‍රාදේශය සම්බන්ධීකරණ කමිටුවක් නැහැනේ අපට කථා කරන්න.දැන් අලුතින් චක්‍රෙල්ඛනයක් ගහලා තියෙනවා සම්බන්ධීකරණ කමිටුවේ සංයුතිය.ඒකට සභාපති, උපසභාපති, සභාපති නොවන කණ්ඩායමක මන්ත්‍රිවරු දෙන්නෙකුයි ඒකට යන්න තියෙන්නේ.මාස තුනකට සැරයක් රැස් වෙන්නේ.මොකද්ද? එහෙම නෙමෙයි සම්බන්ධිකරණ කමිටුව හරහා අපිට තවත් වේදිකාවක් හැදෙන්න එපැයි.මන්ත්‍රිවරුන්ට මෙතන බැරිවෙන ඒවා ගිහින් කතා කරන්න, අපිට තව අවස්ථාවක් තියෙන්න ඕන.ඒ අවස්ථාව අහිමි කරලා තියෙනවා මේ ප්‍රජාතන්ත්‍රවාදී කියන මේ ආණ්ඩුවෙන්.එහෙම වෙන්න බැ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 6.10. යෝජනාව මිටිපොල දම්මුල්ල කිරිපෝරුවට යන ප්‍රධාන මාර්ගයේ පීල්ල කඩේ අසල සිට නුග ගහ ළඟ දක්වා කාණු දමා කාපට් කිරීම හෝ කොන්ක්‍රීට් කිරීම සඳහා වූ යෝජනාව ( පළාත් සභාවට ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.-මීටර් 100) ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා පළාත් සභාවට යොමු කිරීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.11.සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණියගේ යෝජනාව

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**

**6.11.බටවත්ත මාර්ගය සංවර්ධනය කිරිම යෝජනා කරමි.(වීරේ මහතාගේ කඩේ අසල සිට පලිගල ගම් මායිම දක්වා - මීටර් 200)**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, බටවත්ත මාර්ගය කියන්නේ නැදුරන වසමට අයිති ඉතා අබලන් මාර්ගයක්.ඒකෙ තරමක් දුරට සංවර්ධන කටයුතු යම් ප්‍රමාණයක් සිදු කරලා තියෙනවා.ඊට එහා මේ වීරෙ මහතාගේ කඩේ අසල සිට ,යන්න බැරි තරමටම අබලන් වෙලා තියෙනවා.ප්‍රදේශවාසීන්ගේ පුද්ගලික මුදල් එකතු කරලා, එයාලා ගල් දාල පාර සාමාන්‍ය තත්ත්වයට යන්න එන්න පුළුවන් තත්ත්වයට හදාගෙන තියෙනවා.ඒ මාර්ගය ඉක්මනට සංවර්ධන කටයුත්තක් සඳහා යොමු කරන්න කියලා මං ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 6.11. යෝජනාව බටවත්ත මාර්ගය සංවර්ධනය කිරිම සඳහා වූ යෝජනාව (වීරේ මහතාගේ කඩේ අසල සිට පලිගල ගම් මායිම දක්වා - මීටර් 200) මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.12.සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණියගේ යෝජනාව

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**

**6.12.මිටිපොල වසමේ පොදු සුසාන භූමියට ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරිආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මිටිපොල වසමේ තියෙන ලොකු ප්‍රශ්නයක් මේක.අවමංගල්‍ය අවස්ථාවක් සිදුවන අවසන් කරන මොහොතේ ඒ භූමියට ගියාට එතන ඇත්තටම ගොඩනැගිල්ලක් නැ සුසාන භූමියේ රැදිලා ඒ කටයුත්ත කර ගන්න.ඉතින් මේකට ප්‍රදේශවාසීන්ගේ දැඩි ඉල්ලීමක් තියෙනවා,ඒකට ගොඩනැගිල්ලක් හදලා දෙන්න කියලා.ඇත්තටම මේ පොදු සුසාන භූමියේ ඉඩම ප්‍රාදේශිය සභාවට අයිති ඉඩමක්.ඒ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු කරලා දෙන්න කියලා මං ඉල්ලා සිටිනවා.

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, මිටිපොල සුසාන භූමිය ප්‍රාදේශිය සභා වට අයිති.මම කලින් යෝජනාවක් කළා සුසාන භූමිය දැන් ප්‍රමාණයෙන් අඩුවෙලා තියෙනවා.වටේ නිවාස හදලා,මිනිස්සු පදිංචි වෙලා ඉන්නවා.ඒක මං යෝජනා

කළාවටේ සුද්ද කරලා ප්‍රමාණය වෙන් කරලා දෙන්න කියලා.ගොඩනැගිල්ල හදන්න ඉස්සෙල්ලා මං හිතනවා ඒ වැඩේ කරන්න ඕනෙ.මම යෝජනා කරනවා මේකත් සමඟම ඒකත් කරලා දෙන්න කියලා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
සභාව සතුව සුසාන භූමි 11 හෝ 12ක් තිබෙනවා මට මතක හැටියට.ඒ සියලුම සුසාන භූමි වටේට ඉඩම අසල්වැසියන් විසින් අත්පත් කරගෙන තිබෙනවා.ගොඩක් වෙලාවට නාකන්දල, මගේ කොට්ඨාශයේත් එහෙමයි.සභාව සතු පර්චස් ප්‍රමාණය දැන් අඩුයි.අපි සියලුම මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වෙනවා ඒ සම්බන්ධව ඇති ප්‍රශ්න දෙන්න.අපි ඊට පස්සේ,නැවත මැනලා, මායිම් ගහලා ,ඒ සඳහා අපි ඉදිරි වර්ෂයේ ප්‍රතිපාදන වෙන්කර ගෙන අපි ඒ සියල්ල සිදු කරමු, සියලුම සුසාන භූමිවල.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 6.12. යෝජනාව මීටිපොල වසමේ පොදු සුසාන භූමියට ගොඩනැගීල්ලක් ඉදිකිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.13.සභික ඒ.සී.ටී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව

**සභික ඒ.සී.ටී.අතුරලිය මැතිතුමා:-**

**6.13.නැ/විලේගොඩ බුළුව මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නැ/විලේගොඩ බුළුව මාර්ගය,ආර්ථික වශයෙන් වැදගත් වෙනවා කියන වචනෙ භාවිතා කරන්නේ නැත්නම් පාඩු ලබනවා කියලා අයින් වුනොත් එහෙම.ආර්ථික වශයෙන් සුවිශේෂී මාර්යක්.ගොඩක් තේ වගාවේ නියලෙන පිරිසක් ඉන්නවා.ඒත් එක්කම නිවාස 50 කට ආසන්න ප්‍රමාණයකට වගේ මේ පාරේ ගමන් කරනවා.මං හිටපු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය මුදල් වෙන් කරලා තිබුණා.කොන්ත්‍රාත්කරුවෝ ඉදිරිපත් වෙච්ච නැති නිසා මේ මාර්ගය ක්‍රමානුකූලව සංවර්ධනය කරන්න අවස්ථාවක් අදා වුණේ නෑ.බුළුව මාර්යට පිවිසෙන පාලමත් එක්කම දැන් අබලන් වෙමින් පවතිනවා.ඒක ඉක්මන් නඩත්තුවක් සිදු නොවුනොත් මං කිවුවෙ ආර්ථික වශයෙන් හා නිවෙස්වල මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නිවසක් ඉදි කර ගැනීම සඳහා වැලි ගල් සපයා ගැනිම, ඊට අමතරව අනෙකුත් මූලික අවශ්‍යතා,අසනීපයක් වුණොත් ලෙඩෙක් ප්‍රවාහනය කරන්න වැනි අපහසුතාවලටත් ලක්විමේ ඉඩකඩ වැඩියි.ඒනිසා මෙය සංවර්ධනය කිරිම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මමත් එකට අදහස් දැක්විමක් කරන්නම්.ඒක දුෂ්කර මාර්ගක් තමයි.නමුත් අපේ සංවර්ධන යෝජනාවලදීත්, මම හිතන්නේ අතුරලිය මන්ත්‍රීතුමත් දන්නවා දෙවැනි යෝජනාව විදිහට යෝජනාව ආවා.පළවෙනි යෝජනාව දැනට ක්‍රියාත්මක කරලා ඉවරයි.මං හිතන්නේ ලබන අවුරුද්දේ මුල වෙන කොට අපට පළාත් සභා හෝ මධ්‍යම රජයේ ප්‍රතිපාදන වලින් අපේ සභා අරමුදල් ඒකට යොදවන්න මදි,අපට ලක්ෂ 5 කින් වගේ අපට ඒක කරන්න අමාරුයි.ඒ නිසා අපි ලබන අවුරුද්දේ දෙවැනි යෝජනාවෙන් අපට ඒ මුදල් අනුමත වෙයි.ඒ යෝජනාව කාලෝචිත යෝජනාවක් ලෙස මම අනුමත කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ග්‍රාමීය සංවර්ධන යෝජනාවල දෙවැනියට තියෙන එක නේද?

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්න ගේනවා ඒවා අපිත් දන්වා.අපි කැනොගහ ඉන්නේ මේක විනයානුකූලව ගෙනියන්න ඔනනේ.ඒ නිසා මම කියන්නේ ,කොට්ඨාශ සභාවක් අදාළ නැ අපට ඒ සැලැස්මෙදි.ඒකෙ ඉන්නේ ආර්ථික සංවර්ධන නිලධාරි, ග්‍රාම නිලධාරී, සමෘර්ධි සංවර්ධන නිලධාරී ඒ වගේම කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වශයෙන් මම සහභාගී වෙනවා. ඊට අමතරව අපේ වසමේ සියලුම ස්වෙච්චා සංවිධානවල නිලධාරින් සහභාගි වෙනවා.ඒ ගොල්ලෝ සහභාගිවෙලා තමයි මේ,අපි ඒ සැලැස්ම හදන්නේ.අතුරලිය මන්ත්‍රීතුමා එතුමත් දන්නවා විලේගොඩ වසමේ එක හදද්දි එතුමත් සහභාගී වුණා.ඉතින් මම නම් දේශපාලනීකරණය කරලා නෑ.අනික් මන්ත්‍රීවරු කොහොම කරනවද කියන එක මට අදහසක් නෑ.විශේෂයෙන්ම කොට්ඨාශ සභාවක් කියලා කිසිම කෙනෙක් එතන කැදවලා නැ.ස්වෙච්චා සංවිධාන, ග්‍රාම සංවර්ධන සමිතිය, මරණාධාර සමිතිය ඒ වගේම ක්‍රිඩා සමිති යෞවන සමිති මේ සියලුම සමිතිවටත් අපි ආරාධනා කරලා තියෙනවා.ඒ සමිතිවල නිලධාරීන් එනවා ඊට අමතරව වසමේ ඕන කෙනෙකුට සහභාගී වෙන්න පුළුවන්.විනිවිද භාවෙන් තමා මේ කටයුත්ත කරන්නේ, ඉතින් යම් කිසි තැන්වල අඩුපාඩුනම් වෙලා තියෙන්න පුළුවන්.ඉතින් මං කියන්නේ ඒක කොට්ඨාශ සභාව කියන එක වැරදියි.සියලුම රාජ්‍ය නිලධාරීන්ගෙන් තමා මේ යෝජනා ගේන්නේ.මම කිසිම රාජ්‍ය නිලධාරියෙකුට බලපෑමක් කරනෙත් නෑ.එතුමන්ලා ගේන යෝජනාවලට මම සහයෝගය දැක්වීම තමයි කරන්නේ.මොකද ඒක ගමේ වැඩි දෙනෙක්ගේ මතය වෙන්න ඕන.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, නමුත් විලේගොඩටයි නැ/විලේගොඩටයි තියෙන ඒ අයිතිය පැල්පිටියටයි මෝරගලටයි නැ.අද පැල්පිටිය මෝරගල ග්‍රාමීය කමිටුවේ නායකයා ගරු උපසභාපති.ගරු මහේෂ් රත්නායක මැතිතුමා පැල්පිටිය මෝරගල ග්‍රාමීය කමිටුවේ නායකයා.ඒකනේ වැඩේ ප්‍රාදේශීය සභාවෙන් ලිවුමක් ගිහිල්ලා තියෙනවා ගරු සභාපතිතුමනි,ප්‍රාදේශීය සභාවෙන් ලිවුමක් ගිහිල්ලා තියෙනවා සියලු රාජ්‍ය ආයතනවලට පැල්පිටිය මෝරගල කොට්ඨාශවල සියලුම රජය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක විය යුත්තේ ගරු උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ අධීක්ෂණය හා උපදෙස් මතයි කියලා.පැල්පිටිය මෝරගල කොට්ඨාශයේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ නියමිත ඡන්ද ක්‍රමයක් තුළ පත් වුණේ මම.දිලීන් කරුණාපාල.එතකොට දිලීන් කරුණාපාල නෙමේ ග්‍රාමීය කමිටුවේ ඉන්න සභාපතිවරයා හරි ,ග්‍රාමීය කමිටුවේ ඒ,සමන්සිරි මන්ත්‍රීතුමා කරන කර්ය දිලීන් කරුණාපාලට පැවරිලා නැ.ඒකයි මේ ආණ්ඩුවේ ස්වභාවය.අනිත් තැන්වලට තියෙන ඒ තත්ත්වය පැල්පිටිය මෝරගලට නැති කරලා තියෙනවා.මං ඒකයි කිවුවේ පැල්පිටිය මෝරගල තීරණ ගන්නේ තීන්දු ගන්නේ රාජ්‍ය සේවකයෝ මැදිහත් වෙච්ච ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ,නැත්නම් ග්‍රාමීය නායකයෝ ඉන්න රාමුවක් තුළනෙමෙයි.දේශපාලන කොට්ඨාශ සභාවක් තුළ කොට්ඨාශ සභාවේ අනුමැතියට යටත්ව තමයි මේ පැල්පිටිය මෝරගල ඒ තීන්දු තීරණ ගන්නේ.ඒ අවස්ථාව අපිට නැති කරලා තියෙනවා.ඒක මේ සභාවේ කියන්න ඕනේ.ජනතාව දැනුවත් කරන්න ඕනේ.ඉතින් ඒ අවස්ථාව අපිට නැති කරන්න එපා.මාත් මේ නිකන් නෙමෙයිනේ, මහජන ඡන්දෙන් පත් වෙච්ච මන්ත්‍රීවරු.මාත් එක්ක මිස්බාහ් සහෝදරයත් තේරී පත්වෙලා ඉන්නවා.ඒ අදාළ කාර්යන්,මුලදී කිවුවේ එහෙම නෙමේ, කොට්ඨාශ මන්ත්‍රීවරයාට ,පත්වෙච්ච මන්ත්‍රීවරයට වැඩි අවස්ථාවක් දීල තමයි සලකන්නේ කියලා.නමුත් තත්ත්වය දිනෙන් දින දිනෙන් දින ව්‍යාකූල තත්ත්වයකට පත්වෙලා තියෙවා.දැන් වෙනත් අයගේ දේශපාලනඥයන්ගේ මැදිහත් විම තමයි එතන සිද්ධ වෙන්නේ,ගමේ මිනිස්සුන්ගේ අවශ්‍යතාවයන් උවමනාවන් හදුනන්නේ ගමේ ඉන්න කොට්ඨාශ මන්ත්‍රීවරයා,නැත්නම් ඒ සම්බන්ධව නැත් නම් ඉන්න මන්ත්‍රීවරු.ඉතින් වෙන බාහිරින් ආපු අය තමයි විශේෂයෙන් උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා ඇවිත් තමයි පැල්පිටිය මෝරගල තීන්දු තීරණ ගන්න උත්සහ කරන්නේ.ඉතින් අපිට ඒක අනවශ්‍ය බලපැම් කරන්න එපා.අපිටත් ඒ තත්ත්වය තුළ මේ රාමුව තුළ කටයුතු කරන්න ඉඩ ලබා දෙන්න.ඒක තමයි මම ඒ කිවුවේ. සමන්සිරි මන්ත්‍රීතුමාගේ පැහැදිලි කිරීම ඉතාමත්ම වැදගත්.ඒ වගේ අපටත් අවස්ථාව දෙන්න කියන එක මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**

ගරු සභාපතිතුමනි,ඇත්තටම සමන්සිරි මන්ත්‍රීතුමාට නැගෙනහිර විලේගොඩ, විලේගොඩ ගැටලුවක් නැ.අතුරලිය මහත්මයත් එක්ක සුහදව ඒ වැඩ කටයුතු ටික යනවා. ඒක මටත් තියෙනවා.උඩුමත්ත තොරණගොඩ කිසිම දෙයක් මාව දැනුවත් කරන් නැ.මං හිතන්නේ දැන් මං ළඟ තියෙනවා හෙන් ගහලා තියෙන චක්‍රලේඛය. එකෙ තියෙන්නේ ඒ කමිටුවලට මැදිහත් වෙන්න ඕනේ ග්‍රාමනිලධාරී,සමෘර්ධි සංවර්ධන නිළධාරී.,ආර්ථික සංවර්ධන නිලධාරි ඊට අමතරව ඒ කොට්ඨාශවල ඉන්න මන්ත්‍රීවරු කියලා.මන්ත්‍රීවරයා කියන එක නැ.මං දන්නැ ඒක කොහොම ද ආවේ කියලා කිසිම දෙයක් මටත් කියන් නැ.පෙ‍ෙළක් වෙලාවට මං යන්නෙම නැ.උවමනාවක් නැතේ අපිව ඕන් නැත්නම්.හැබැයි මම මහජනතාව වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම සේවය මම කරනවා.සභාපතිතුමා දැනුවත් කිරීම් කරන්න.සමහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් එන ඒවා අපිට කියන්න එපා කියාලාද මොනවද සිද්ධි දන්නේ නැ.ගරු සභාපතිතුමා එම ආයතන දැනුවත් කිරීම සිදුකරන්න.මෙහෙම මන්ත්‍රීවරයෙකුත් ඉන්නවා.මොකද මමත් රාජ්‍ය නිලධාරියෙක් විදිහට මගේ කැප කිරීම කරනවා මට දෙයක් කරන්න පුළුවන් කියල මං දන්නවා.ඒක ගැනත් පොඩ්ඩක් සොයලා බලන්න කියලා මගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී. අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මං හිතන්නේ සමන්සිරි මන්ත්‍රීතුමා මේකට මැදිහත් වීමක් සිදුව නැතුව ඇති .නමුත් නැ/විලේගොඩ කිසිම රැස්වීමකට මට ආරාධනාවක් සිදුවන්නේ නැහැ.හේතුව කුමක්ද කියා මම දන්නේ නැහැ. එයට නිලධාරීන් අකමැති නිසාද මම දන්නේ නැහැ. මං හිතනවා සද්භාවයෙන් ඒ වචනය කියන්න ඇත්තේ කියලා. මට නැගෙනහිර විලේගොඩ කිසිම කටයුත්තකට ආරාධනා කරන් නැ.ඒ කටයුතුවලට මම කිසිම දේකට සම්බන්ධ කර ගත්තේ නැ.මම දැඩි ලෙස විශ්වාස කරනවා සමන්සිරි මන්ත්‍රීතුමා ප්‍රජාතන්ත්‍රවාදී නෙමේ බහුවිධ ප්‍රජාතන්ත්‍රවාදී කියලා මං හිතන්නේ.මේ ආණ්ඩුවේ තිබ්බ සංකල්පත් එක්ක මං හිතන්නේ එතුමා එතන නතර වෙන එකක් නැ කියලා.නැගෙනහිර ඔය කියන සද්භාවය,සමන්සිරි මන්ත්‍රීතුමා මං දැඩිව විශ්වාස කරනවා.එතුමා මං පෞද්ගලිකව දන්න චරිතයක්.සමන්සිරි මහත්තයා මැදිහත් විමක් නැ.වෙන හස්තියක් ක්‍රියාත්මක වෙනවද දන්නේ නැ.මට කිසිම දේකට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබිලා නැ.උපසභාපතිතුමා හස්තිය ක්‍රියාත්මක වෙලාද දන්නෙත් නැ?සමහර විට එහෙම වෙලාද දන්නෙත් නැ.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,අපට පසුගිය කාලයේ ජනතාව බලය දුන්නේ ලොකු බලයක් දුන්නා. මෙතෙක් තිබුණු ක්‍රම වැරදි නිසා නව ගමනක් යන්න, ඒවා වෙනස් කරන්න විශාල බලයක් දුන්නා.සියලුදෙනාට ලොකු බලයක් දුන්නා අපේ Mandate එක, ඒක තමා.අපි ඒක තුළ ඉඳගෙන රට දියුණු කිරිම කරන්නේ.ඒකෙ මූලික දේ රට දියුණු කරන්න ඕනේ.ඒ සඳහා විනයක් තියෙන රටක් තියෙන්න ඕනේ.මේ රාමුව තුළ යන්න ඕනේ.ඒ නිසා මේ රාමුවට එකඟ වෙන අවංක වෙන අවංකව එකඟ වෙන ඕන ම කෙනෙක්,මෙතන ඉන්න අයත් අපිට අදාළයි. අපේ Mandate එකකත් එක්ක එනතුවෙන ඕනම කෙනෙක් මොන පක්ෂයේ හිටියත් අපි ඒ අයත් එක්ක එකතු වෙලා ඒ වැඩකටයුතු කරන් යනවා.මේකට අවංක වෙන්න ඕනේ.අර මිතුරු ලෙසින් ඉන්න සතුරු ගතිය නැතුව අවංක මිතුරුකම තියෙනව නම්,මං දවසක් පැහැදිලි කළා ,අවංකව ඇතුළෙත් මිතුරු ගතිය තියෙනව නම් මේ රට හදන්න ඕන් නම්, මේ රට දියුණු කරන්න ඕන් නම් අවංක බවඅපි අතර කිසි භේදයක් නැ.අපි සියලු දෙනා එකතු වෙලා මේ කටයුතු කරන්න පුළුවන්.ඒ නිසා අපි වැඩ කරන්නේ තනි තනියෙන් නෙමේ.මන්ත්‍රීවරුන් විදිහටත් නෙමේ,අපි සාමූහිකTeam work එකක් තියෙන්නේ.ඉහළ ඉඳන් පල්ලෙහාටම Team work එකක් තියෙනවා.අර මන්ත්‍රි නෙමෙයි මේ මනත්‍රි නෙමෙයි,අපි හැමවෙලේම සාමූහිකව සාකච්ඡා කරලා සාමූහික වැඩ කරනවා.ඉහළ ඉඳන් පහළට එහෙම ගලනවා.ඒ නිසා එක මනත්‍රි කෙනෙක් හොඳයි තව මන්ත්‍රි කෙනෙක් නරකයි කියන කාර්ය අපේ නැ.අපි සියලු දෙනාම සාමූහිකව වැඩ කරන අය.ඒනිසා අපිත් එක්ක ඕන

කෙනෙකුට වැඩ කරන්න පුළුවන්.අවංකව වැඩ කරන ඕන කෙනෙකුට අපි ආරධනා කරනවා භේද තියා ගන්න එපා එන්න එකට අපි වැඩ කරමු.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, සභාපතිතුමාගේ වම්පස මන්ත්‍රීතුමන්ලා නිතරම ගැටළුවක් තිබුණානේ,සභාපතිතුමාට නම් වශයෙන් නෙමේ,ගොඩක් වෙලාවක් කාලය ගත්තනේ විපක්ෂයේ ඉස්සෙල්ලා හිටපු මන්ත්‍රීවරුන්ට සද්භාවය පිළිබඳ ගැටලුවක් තිබුණණේ, දැන් කතා කරන එකත් එක්ක.දැන් අපේ උපසභාපතිතුමා අද සභාපතිතුමා.පහුගිය අවුරුදු පහේ විපක්ෂයේ හිටපු කෙනෙක්නේ.එතකොට අපි එළියේ හිටියට ඒ විපක්ෂයේ හිටපු මන්ත්‍රීවරයට දුන්නු තැන අපි දැනගෙන හිටියා.එතකොට මං මේ වම්පස මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ පොඩ්ඩක් තමන්ගේ හෘර්ද සාක්ෂියට එකඟව ඒ විපක්ෂයේ ඉද්දි, දැන් ඔයාල සද්භාවයක් ගැන කතා කරනවනේ ඒ නිසා මේ තමන් පක්ෂයේ ඉද්දි ඒ විපක්ෂයේ හිටපු නිලධාරීන්ට, මනත්‍රීවරයට සලකපු හැටි මෙනෙහි කරලා බලන්නකියලා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.සී.ටී.අතුරලිය මැතිතුමාගේ 6.13. යෝජනාව නැ/විලේගොඩ බුළුව මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.14.සභික ඒ.සී.ටී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව

**සභික ඒ.ටී.සී. අතුරලිය මැතිතුමා:-**

**6.14.බිසෝ උයන පහළ කොටස කොන්ක්‍රීට් කිරීම හා පාලම පළල් කිරිමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ බිසෝ උයන පහළ කොටස කොන්ක්‍රීට් කිරීම හා පාලම පළල් කිරීම, මේකටත්සඳහා මුදල් වෙන්කර තිබුණා ඒ සඳහා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් නොවූ නිසා එම කටයුතු සිදුකිරීමට නොහැකි වුණා.ඇහැලියගොඩ නගරයේ සිට දෙහිඕවිට දක්වා ගමන් කරන මාර්ගය යම් අවස්ථාවක අවහිර වීමක් සිදුවුවහොත් ඒ සඳහා භාවිත කල හැකි අතුරු මාර්ගයක් තමයි මේක.මෙමමාර්ගය සංවර්ධනය කර ගන්න පුළුවන් වුණොත්.ඒත් එක්කම මේ පාළම අඩි අටකට පමණ සීමා වෙලා තියෙනවා.මම මේ යොජනා කරන පාර කොටස දැඩිව අබලන් වෙලා තියෙනවා.එතකොට බිසෝයනේ වාහනයක් තියෙන කෙනෙක් යන්නඕනේ කී.මී. එකක් පමණ ගිහිල්ලා තමයි ඇහැලියගොඩ නගරයට යන්න ඕනේ. මෙතනින් යන්න තියෙනව නම් කි.මි.භාගයක් ඇති,කෙටි ගමන් මාර්ගයක් භාවිතා කරන්න හැකියාව තියෙනවා.දෙපැත්තම ගිය රජයේ 76 සාපය තුළ සංවර්ධනය වෙලා තියෙනවා.මේ සාපය විතරයි ඉතුරු වෙලා තියෙන්නේ.මං ඒකටයුත්ත ඉක්මන් කරලා කරලා දෙන්න කියලා කියනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.සී.ටී.අතුරලිය මැතිතුමාගේ 6.14. යෝජනාව බිසෝ උයන පහළ කොටස කොන්ක්‍රීට් කිරීම හා පාලම පළල් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.15. සභික ඒ.සී.ටී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව

**සභික ඒ.ටී.සී අතුරලිය මැතිතුමා:-**

**6.15.ගල්මැදුර වත්ත මාර්ගයේ අමිල මහතාගේ නිවස දෙසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි. (50 m)**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මෙම මාර්ගයත් 137 විලේගොඩ ග්‍රාමනිලධාරී වසමට අයිතියි.එම මාර්ගයත් පසුගිය රජයන් තුළ කි.මී.50ක් පමණ සංවර්ධනය කර තිබෙන්නේ.දුෂ්කරම තැන තමයි තියෙන්නේ කන්ද උඩ තිබෙන නිවසත්, තවත් නිවාස5කට වගෙ ප්‍රමණය කට මෙය බලපානවා.මෙම මාර්ගය මේ මීටර් 50 සංවර්ධනය කලහොත් ඒ මාර්ගය සංවර්ධනය කිරීම එතනින් නතර වෙනවා. ඒ නිසා ඒ සඳහා නැවත ප්‍රෙවිශයක් ගන්න අවශ්‍ය වෙන්නෙ නෑ.ඒ නිසා මේ කටයුත්තට ප්‍රෙවිශයක් ගන්න කියලා මම ඔබතුමාට මං යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.සී.ටී.අතුරලිය මැතිතුමාගේ 6.15. යෝජනාව ගල්මැදුර වත්ත මාර්ගයේ අමිල මහතාගේ නිවස දෙසට යන මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (50 m)

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.16.සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ යෝජනාව

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා**

**6.16. ඇහැලියගොඩ නගරයේ ටෙලිකොම් ආයතනය අසල ඇති පොදු වැසිකිලිය අලුත් වැඩියා කොට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මේ ඇහැලියගොඩ නගරයේ ටෙලිකොම් ආයතනය අසල ඇති පොදු වැසිකිලිය සංවර්ධනය කිරීමෙන් විශාල සේවාවක් සිද්ද වෙනවා.දැන් ඒ ස්ථානය වල් බිහිවෙලා යන්නවත් බෑ.ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින්නේ.මෙය සංවර්ධනය කිරීමෙන් ඇහැලියගොඩ මැණික් වෙළඳ ප්‍රජාවට විශාල සේවාවක් වෙනවා.ඒ වගේම තවත් විශිෂ්ට සේවාවක් වෙන්නේ වෙසක් උත්සවයේ දවසට ඒ මැණික් ප්‍රජාව විසින් පවත්වන් වෙසක් දන්සැල් වලට, එය ඉතාමත්ම ඉවහල් වෙනවා.මට වෙළඳ ව්‍යාපාරික මහත්මයෙක් කිවුවා මීට කලින් මේ දන්සැල් පවත්වන්න පෙර ගලිබවුසරයක් දාලා ඒ වැසිකිලි සුද්ද පවිත්‍ර කරලා ගත්තා කියලා.ඉතින් අද බලපුවහම එතනට යන්නවත් බැරි විදිහට වල් බිහිවෙලා තියෙන්නේ.මේ වැසිකිලිය උඩ තියෙනවා ටැංකියක්. ඒ ටැංකියත් හොඳ තත්ත්වයෙන් පවතිනවා.ඉතින් එය සංවර්ධනය කරලා ජනතාවට පාවිච්චි කරන්න පුළුවන් මට්ටමට සකස් කරලා හැදුවොත් මං හිතන්නේ නගරයට බලපාන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි මේ වැසිකිලි ප්‍රශ්නය.ඒකට විශාල රුකුලක් වෙනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම මේකට එකතු කරන්නම් එම යෝජනාව කලිනුත් අපි යොජනා කරා.නමුත් මෙය දුම්රිය රක්ෂිතයේ පිහිටා ඇති නිසා, එය ප්‍රතිසංස්කරණය කළ නොහැකි බව තමයි අපහට දැනුම් දෙනු ලැබුවේ.එම නිසා එය සංවර්ධනය කරනවා නම් ඉතාමත් හොඳයි.ඒ සඳහා කාරුණ ගැන අවධානය යොමු කරනවා.

**සභික ඒ.ටී.සී. අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම ඒ යෝනාව කළේ මංගල සභාවාරයේදී.ඒකත් එක්ක තව යෝජනා දෙකක් කළා.ඒකෙදි මට ලැබුණ පිළිතුර අපේ සමන්සිරි මන්ත්‍රීතුමා කියපු එක තමයි කවුවේ.ඒක තමයි කරන්න පුළුවන් ආයතනත් එක්ක සම්බන්ධීකරණය වෙලා ඒක දුම්රිය දෙපාර්තමේනතුවට අයිති.දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අවශය නිසානේ වැසිකිලිය හැදුවේ.ඒකෙ නිත්‍යානුකූලව පවරගෙන නැත්නම් එවා ක්‍රමානුකූලව කරන්න ඕනේ.ඒක ආයතනත් එක්ක සම්බන්ධීකරණය වෙලා මිනිසුන්ට ප්‍රතිලාභ ලැබෙන ක්‍රමවේදයකට ඒක ලඟා කර ගන්න උත්සහ කරන්න කියලා තමයි මං අදහස් කරන්නේ.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං හිතනවා සභාපතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුව එක්ක මේ ප්‍රශ්නය කතා කර ගත්තොත් අකමැති වන එකක් නැහැ.මේක අවශ්‍යතාවක්නේ.දැන් දුම්රිය ස්ටේෂන් එකක වුණත් වැසිකිලි අවශ්‍යතාව තියෙනවනේ මගීන්ට.එහෙම බාධාවක් වෙන එකක් නෑ.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාගේ අවධානයට, න්‍යාය පත්‍රය කලින් ඇවිත් තියෙනවනේ යෝජනා ඉදිරිපත් කරද්දී ඔබතුමන්ලා පැහැදිලිව සංක්ෂිප්තව එයට අදාළව කරුණු ගම්‍ය වෙන විදිහට ඒ යෝජනා කරන්න.ඊට පස්සේ මේ සභාවෙන් එන අදහස්වලට නැවත අදහස් දැක්වීම් කරන්න යන්නේ නැතුව.රීති තියෙනවනේ.රීති තියෙන්නේ ඒ නිසා තමයි. එහෙම කරමු අපි.

ඊටපස්සේ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම කියන එක,දැන් දුම්රිය මාර්ගය එන්න නියමිතයි,හෙට අන්ද්දම එන්නේනැති වෙයි.එකෙ අවිස්සාවේල්ල දක්වා සියලුම කටයුතු කෙරිලා තියෙන්නේ.අවිස්සාවේල්ල බස් නැවතුම්පල පිටිපස්සේ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් විදිහට එතන සංවර්ධනය වෙනවා.එතනින් මෙහාට ඒ පරණ පාරම රේල් පාර එනවා.එතකොට අපිට තාම ඇහැලියගොඩ කොහොමද වෙන්නේ කියලා තාම අපිට දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කියලා නෑ.ඒක ආවට අපිට පුළුනන් වෙයි ඒ ඉඩමට ඒ ඉඩමේ මොකුත් සංවර්ධන කටයුත්තක් වෙන් නැත්නම්, අපිට ඇත්තටම පුළුවන් වෙයි ඇත්තටම එතන ඔබතුමා කිවුවා ගේ අලුත්වැඩියා කටයුත්තට යන්න.අපිට එතකන් පොඩ්ඩක් ඉන්න වෙනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං අද දැන ගන්න කැමතියි පළවෙනි සභා වාරයේදී රුපියල් ලක්ෂ 54 ක් ඒ වෙනුවෙන් ඇස්තමේන්තුවක් එවලා තිබුණා.අපි හැමෝ ම ඒ වෙනුවෙන් එකඟ වුණා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒක නෙමේ මන්ත්‍රීතුමා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒක හරි, ඒ සල්ලිවලට මොකද වුණේ? ඒක හදලා ඉවරද.එක තාම නැද්ද? මිනිස්සු අහනවා අපෙන් වැසිකිලියක් හදලා ඉවරද කියලා.අපි කිව්වා පලවෙනි මාසෙම අපි නම් සහයෝගය දුන්නා කියලා.මේකෙ තාම ඒක හැදුවේ නැද්ද?ප්‍රගතිය පිළිබඳ පොඩ්ඩක් කියන්න පුළුවන්ද?

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒකට ඇමස්තමේන්තුව හදලා තිබුණේ.අපට සභාවේ මුදල් තමා ප්‍රශ්නෙ ඇති වුණේ.අපිට අර වරිපනම් සීමාවේ නැවත තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට අපි මුදලක් ගෙවීමට තිබුණා.කොහොමත් අපිට ඉදිරියේදී පරිපූරක ඇස්තමේනතුවක් දාලා ඉතුරුවෙලා තියෙන වැඩ ටික කරන්න ඔබතුමන්ලගේ සහය බලාපොරොත්තු වෙනවා ඉස්සරහට.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මැණික් පොලේ වැසිකිලිය සම්බන්ධවමම හිතන්නේ ඒක සුද්ද පවිත්‍ර කරලා, එතන ඒ යන අයට සකසලා දුන්නොත් හොඳයි කියලා.මැණික් පොළ ලඟ තියෙන ගොඩනැගිල්ලෙත් වැසිකිලියක් තියෙනවා.ඒකත් යන්න බැරි තත්ත්වයකට වගේ පත්වෙලා තියෙන්නේ.මන්ත්‍රීතුමා කියපු එක මමත් බැලුවා.මොකද අපිට රේල් පාර එයි,එනකන් අපිට සුද්ද පවිත්‍ර කරලා දුන්නොත්, ඒ මිනිසුන්ට ඒක යහපතක් වෙයි. පහසුයි.සමහර වෙලාවට බොහොම අපහසුතාවයට පත්වෙනවා මැණික් මුදලාලිලා විතරක් නෙමේ අනිත් අයත් ඒ තත්ත්වයට පත්වෙලා.ඒක නිසා මම ඉල්ලීමක් කරනවා, ඒක සම්පූර්ණ නෙමේ, ඒක සුද්ද් පවිත්‍ර කරලා යන්න එන්න පුළුවන් විදිහට හදලා දෙමු කියලා මම යෝජනා කරනවා.

**සභිකසුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු අභිනව සභාපතිතුමාගෙන් අවසරයි,සභාපතිතුමනි මම මේ පොදු කාරණාවක් ගැන සිහිපත් කරන්නේ. අපි අපේ වැඩි ප්‍රමාණයක් නවක මන්ත්‍රීවරු මනත්‍රීවරියන් වැඩි පිරිසක් ඉන්න නිසා මං සිහිපත් කරන්නේ,මේක අපේ ඔබතුමියන්ලා දෙන්නටත් අදාළයි.අප විසින් යෝජනාවක් සම්මත කර ගත් පසු ,මාස 06ක් යන තෙක් වලංගුයි.තවත් ඒ සම්බන්ධව ඒ ගැන යෝජනා එනකොට ඔබතුමියලා ඒ ගැන පරීක්ෂා කරලනේ අපේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්නේ.ඒ ගැන පොඩි අවධානයක් යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ 6.16. යෝජනාව ඇහැලියගොඩ නගරයේ ටෙලිකොම් ආයතනය අසල ඇති පොදු වැසිකිලිය අලුත් වැඩියා කොට සංවර්ධනය කිරිම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.17. සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ යෝජනාව

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**

**6.17.බෝපැත්ත මිල්ලගහහේන මාර්ගය සංවර්ධන කිරීම යෝජනා කරමි.(මෙය බෝපැත්ත වෙලන්ගල්ල මාර්ගයේ සිට විහිදී යන අතුරු මාර්ගයකි.)**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම බෝපැත්ත මිල්ලගහහේන මාර්ගය සංවර්ධන කිරීමේ දී දෙපැත්තට පැතිබැමි දෙකක් දාන්නට සිද්ධ වෙනවා.එක් පැත්තකට මීටර් 25ක්පමණ හා අනෙක් පැත්තට මීටර් 10ක්පමණ පැති බැම්මක් ඉදිකළ යුතු වෙනවා.එමෙන්ම මෙය නිවාස 10කට පමණ ගමන් කරන මාර්ගයක්.එම නිසා අදාළ සුදුසු ක්‍රමවේදයකට මෙම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙස ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ 6.17. යෝජනාව බෝපැත්ත මිල්ලගහහේන මාර්ගය සංවර්ධන කිරීම සඳහා වු යෝජනාව(මෙය බෝපැත්ත වෙලන්ගල්ල මාර්ගයේ සිට විහිදී යන අතුරු මාර්ගයකි.) මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.18. සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ යෝජනාව

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**

**6.18.බෝපැත්තේ හපුගස්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ බෝපැත්තේ හපුගස්වත්ත මාර්ගය සංවර්ධන කමිටුවටත් යෝජනා කරලා තියෙන මාර්ගයක්.එම ප්‍රදේශයේ නිවාස 07කට පමණ මේ මාර්ගයේ ගමන් කරනවා.එම ප්‍රදේශවාසීන් විසින් සිදුකරන ලද ඉල්ලීමට අනුව තමයි මම මේ සභාවට යෝජනාව දැම්මේ.ඒ නිසා මෙම මාර්ගය සංවර්ධනය කිරීම ඉතා ප්‍රයෝජනවත් කාර්යයක් බව මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ 6.18. යෝජනාව බෝපැත්තේ හපුගස්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.19.සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**

**6.19.රයිසින් ග්‍රවුන්ඩ් හි ඩී.එම්.ජයතිලක මහතාගේ නිවස අසල කාණු පද්ධතියට හියුම් පයිප්ප දමා සකසා දීමයෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**

ගරු සභාපතිතුමනි, රයිසින් ග්‍රවුන්ඩ් පිවිසුම් මාර්ගයේ කාණු පද්ධතියක් නොමැති නිසා වතුර ගලාගෙන යන්නේ අවසාන නිවස, බැවුම වැඩි හින්දා තමා තියෙන්නේ.ඒ හින්දා ඒ කාණු පද්ධතියේ වතුර ගලාගෙනයන ලෙස කාණු පද්ධතිය සකසා දෙන ලෙස මම ඔබතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 6.19. යෝජනාව රයිසින් ග්‍රවුන්ඩ් හි ඩී.එම්.ජයතිලක මහතාගේ නිවස අසල කාණු පද්ධතියට හියුම් පයිප්ප දමා සකසා දීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.20.සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**

**6.20.දිද්ද සම්පත් මහතාගේ වත්ත අසල මාර්ගයේ ඉවුර කැඩී යැම වලක්වා ගැනීමට පැති බැම්ම සංවර්ධනය කිරීමයෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,දිද්ද මාර්ගයේ පැතිබැම්ම,සම්පත් මහතාගේ වත්ත අසල තියෙන පැති බැම්ම කැඩිලා යනවා.මං හිතන්නේ නඩත්තු කිරීමට වැඩි මුදලක් වැය වේවි. මේ සංවර්ධන යෝජනා ස්ථිර වෙලා ක්‍රියාත්මක නොවුනොත්.ඒ නිසා ඒ සඳහා ක්‍රියාත්මක වන ලෙස මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 6.20. යෝජනාව දිද්ද සම්පත් මහතාගේ වත්ත අසල මාර්ගයේ ඉවුර කැඩී යැම වලක්වා ගැනීමට පැති බැම්ම සංවර්ධනය කිරීම සඳහා වුයෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.21.සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණියගේ යෝජනාව

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**

**6.21.පන්ගොඩැල්ල ආරාම පාර යූ.ඩී.ධර්මසේන මහතාගේ නිවස අසල ප්‍රාදේශිය සභා පාර නාය යන ස්ථානය පිළිසකර කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**

ගරු සභාපතිතුමනි,මෙම පන්ගොඩැල්ල ආරාම පාර , මේ පාර බෝපැත්ත පාරට සම්බන්ධ වන පාරක්. මේක ප්‍රාදේශිය සභාවට අයත් වරිපනම් සීමාවේ තිබෙන පාරක්.ඒක එක් අවස්ථාවක එය නාය යෑමට ලක්ව තිබුණා. එහි පහළ ගෙයක් තියෙනවා,, යූ.ඩී.ධර්මසේන මහතාගේ ගේ තියෙන්නනේ එතන.එයාඑල ඒ ගෙයින් අයින්වෙලත් තියෙනවා.දෙවනුව නැවත වාහනයක් ගිහිල්ලා නැවත එතන කඩාගෙන ගිහින් තියෙනවා,ලොකු ප්‍රදේශයක්.ඒක ඉදිරියට මේ වර්ෂා සහිත කාල වලදී කඩාගෙන් ගියොත්, ප්‍රාදේශිය සභාවට මං හිතන්නේ ලොකු වියදමක් දරලා හදන්න වෙන පාරක් වෙනවා.එහෙම වුණොත් එතනින් ලෙඩෙක් ගෙනියන්නවත් ත්‍රිරෝද රථයක්වත් මේ වන කොට යන්න බෑ දැඩි අවධානම්,ත්‍රිරෝද රථයක් ගියත් පස් කඩාගෙන වැටෙන තත්ත්වයක් තියෙන්නේ.මේක මේ වරිපනම් සිමාවේ තියෙන ප්‍රාදේශියසභා පාරක් හින්දා විශේෂ අවධානයක් යොමු කරලා පාර පිළිසකර කර ගන්න අවශ්‍යා කටයුතු කරලා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ පාර කැඩිලා ගියපු තැන තියෙන්නේ මගේ නිවසට යාබදව ගෙවල් 4 ක් 5 ක් එහාපැත්තෙන්.ප්‍රධාන මාර්ගයේ අනතුරක් සිදු වුණත්,පහුගිය දවස්වල බියර් ලොරිය පෙරලිච්ච වෙලේ ,අපේ පාරේ තමා සියලුම වාහන ගියේ.ගියපාර වැස්සට මටත් කියලා තිබුණා, මමත් ගිහින් බැල්වා. මනත්‍රිතුමියත් ඇවිත් හිටියා.ග්‍රාමනිලධාරි තුමියත් හිටියා.හැකි ඉක්මනින් හදන්න නැත්නම් කඩාගෙන ගියොත් පල්ලෙහා ගෙයක් තියෙනවා ඊට එහා අලුතින් හදපු ගෙයක් තියෙනවා ගල් වැටියකුත් එක්ක. ඒකත් එක්ක ගැලවිලා යන්න පුළුවන්. ඒ නිසා හැකි ඉක්මනින් හදලා දෙන්න අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරිමැතිණියගේ 6.21. යෝජනාව පන්ගොඩැල්ල ආරාම පාර යූ.ඩී.ධර්මසේන මහතාගේ නිවස අසල ප්‍රාදේශිය සභා පාර නාය යන ස්ථානය පිළිසකර කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.22.සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණියගේ යෝජනාව

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**

**6.22.පහලනාගොඩ උඩදොළුවාවේ පන්සල දක්වා දිවෙන මාර්ගයේ නයෝමි මහත්මියගේ නිවස අසල සිට සුරංග මහතාගේ නිවස දක්වා කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මෙම නාගොඩ පාර කියන්නේ කොළඹ සිට වෙලන්ගල්ල පාරට සම්බන්ධ වන පාරක්. උඩදොළුවාව පන්සල පිහිටා ඇත්තේද එම මාර්ගයේමයි. එහි නයෝමි මහත්මියගේ නිවස අසල සිට පොඩි කඳු බෑවුමක් තියෙන තැනක්.එතන ගල් ගැලවී ,වලවල් සෑදී,අපහසුයි. ගමන් කරන්න.වාහන ගමන් කිරීමටද අපහසු තත්වයක් තිබෙනවා.මම හිතන්නේ අපේ ලේකම් මහත්තයත් දන්නවා ඒ පිළිබඳව.ඒ පාර ලොකු කොටසක් නෙමේ පොඩි කොටසක් තමා තියෙන්නේ පාර සංවර්ධනය කරන්න .එම නිසා එහි සංවර්ධනය කිරීමට ඇති කුඩා කොටස සංවර්ධනය කර දෙන මෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරිමැතිණියගේ 6.22. යෝජනාව පහලනාගොඩ උඩදොළුවාවේ පන්සල දක්වා දිවෙන මාර්ගයේ නයෝමි මහත්මියගේ නිවස අසල සිට සුරංග මහතාගේ නිවස දක්වා කොටස සංවර්ධනය කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.23.සභික එස්.එම්.සුමිත්‍රා සේනාරත්න මැතිණියගේ යෝජනාව

**සභික එස්.එම්.සුමිත්‍රා සේනාරත්න මැතිණිය:-**

**6.23.මාහර විමලදෙණිය මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනාරත්න මැතිණිය:-**

ගරු සභාපතිතුමනි,විමලදෙණිය මාර්ගය කියන්නේ, පන්සලටත් පාසලටත් ඉහළ ගමක කොටසක්. මේ වන කොට එහි මීටර් 150ක විතර දුරක් සංවර්ධනය කර තිබෙනවා.තව මීටර් 150 ක විතර දුරක් සංවර්ධනය කිරීමට තිබෙනවා. මෙම පාර තේ වත්තකට,රබර් වත්තකට, සහ කුරුඳු වත්තකට යන පාරක්.එම නිසා මම යෝජනා කරනවා මෙම පාර සංවර්ධනය කර දෙන ලෙසට.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනාරත්න මැතිණියගේ 6.23. යෝජනාව මාහර විමලදෙණිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.24.සභික එස්.එම්.සුමිත්‍රා සේනාරත්න මැතිණියගේ යෝජනාව

**සභික එස්.එම්.සුමිත්‍රා සේනාරත්න මැතිණිය:-**

**6.24.මාහිංගොඩ සිට මාහර පන්සල දක්වාත් පන්සල සිට අස්ගගුල මාර්ගයට පිවිසෙන බටදොබේ පාලම දක්වාත් ප්‍රාදේශිය සභාවට අයත් මාර්ග දෙපස නියමිත මැනුම් කටයුතු කොට මාර්ගයේ පළල ප්‍රමාණය ක්‍රමානුකූලව සකසා ගැනීමට යෝජනා කරමි.**

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනාරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මේ පාර තියෙන තුන සභාපතිතුමා යන එනකොට දැකලා ඇති.ඇත්තටම විශාල ගැටලුවක් තියෙනවා පාරේ මිනිස්සු හුරු වෙලා ඉන්නවා.තමන්ගේ බැම්ම එහා පැත්තෙන් මල් හා වෙනත් බෝග වගා කර ගන්නවා.ඒක විශාල ගැටලුවක් වෙලා තියෙනවා.මොකද නගරයේ හදිසි අවස්ථාවකදී අපේ වාහන දාල යන්නේ ඒ පාරේ.ඒ පාර තමා ප්‍රයෝජනයට ගන්නේ.පාරේ විශාල ප්‍රමාණයක් ඒ ගස් වලින් පාර ප්‍රමාණයක් අවහිර වෙලා තියෙන්නේ.ඒක දැන් ගොඩක් කාලෙක ඉඳන් මිනිස්සු හුරු වලා තියෙන දෙයක්. ඒක අපිට පෞද්ගලිකව කරවන්න ගියොත් ඒක ගැටළු මතු වෙනවා.ඒ වගේම අපේ පන්සලේ නායක හාමුදුරුවොත් යෝජනාවක් විදිහට කළා, මේ ගැටළුව සභාවෙදි ඉදිරිපත් කරන්න කියලා.එම නිසා මම ඉල්ලා සිටිනවා ඒගැන අවශ්‍ය කටයුතු සිදුකරන්න කියලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මාහර විතරක් නෙවෙයි, මේ ප්‍රශ්නය තියෙන්නේ හැමතැනමත් තියෙනවා.මම දැක්කාGPS වලින් මැනුම් කටයුතු සිදු කරලා ඉවරයි කියලා අපිටත් ඒවා දාල තිබුණා.ඒ අනුව අපි මායිම් ගල් හිටවනවා නම් ඒ මායිම් ගල් හිටවලා, ඒ අවශ්‍ය ප්‍රමාණය ලකුණු කරල දුන්නොත්,එක තමා අර තිරසාරත්වය කියන්නේ ඒකට.එතකොට අපි ඒක අනාගත පරම්පරාවට අපි මාර්ගයේ පළල උරුම කරල දෙනවා අනාගත පරම්පරාවට. එය අතිශයින්ම වැදගත් කාරණාවක්. අනිත් ප්‍රදේශ වලත් ඒ ගටලුව තියෙනවා.මිනිස්සු කාණුවෙ තමයි මල් හිටවල තියෙන්නේ.කාණුවෙන් බැම්ම ගහල, කාණුවෙ ඉතිරි කොටසේ තමයි මල් හිටවල තියෙන්නේ.මේක හොඳ නැති ක්‍රියාවක් .ඉතින් ඒක අපි හොඳ පූර්වාදර්ශයක් කරගෙන,අනිත් තැන් වලටත්, අඩුම තරමින් සමහර තැන් අපිට ගලවන්න බරි වෙයි.අඩුගානේ නිවේදනයක් හරි දැන ගන්න පුලුවන් වුනොත් ඊලගට හරි මල් හිටවන එක නවතියි. ඒ අනුව අපි මාර්ග අවහිර කරල තියෙන තැන් වලට ප්‍රාදේශිය සභා හරහා, ප්‍රාදේශිය සභා මාර්ගවල නිවේදනයක් හරි යවමු මෙන්න මේ කරන්න එපා,මේක ඉවත් කර ගන්න කියලා.එහෙම දැන්වීමක් හරි ගහන්න පුලුවන්නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා. මෙය මගේ අදහසක් විදිහට ඉදිරිපත් කරනවා එම අවහිර කර ඇති පාර්ශවයන්ට අපි දැන්වීමක් දාමු මෙය පළමු වර සිහි කැඳවීමයි කියලවත් ,මේක ඉවත් කර ගන්න කියලා.කම්කරුවෝ නැත්නම්.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
දිලීන් මන්ත්‍රීතුමා කිවුවා වගේ... ,

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,හැම පාරකම මේවන විට, පාරේ මල් හිටවන එක කරගෙන යනවා. එහි අවසාන ප්‍රතිඵලය තමයි පාර අල්ලා ගන්න එක.ඒක මම දකිනවා අපි ගිය හැම තැනකම මේ ක්‍රමය තියෙනවා. ඒක මම හිතනවා අපේ දිලීන් මන්ත්‍රීතුමා පැහැදිලි කළා වගේ, සභාව මැදිහත් වෙලා සභාවෙ පාරවල් වල අපි ඒ ලකුණු කිරීම කළොත් හොඳයි කියලා.අපි ඒක ඒකම මම එකතුකිරීමක් කරන්නම්. ඒ හැම පාරකම නාමකරණය කිරීමකුත් අංකකරණය කිරිමකුත් කළොත් අපිට ලේසි වෙනවා ඉදිරි වැඩකටයුතු කරගෙන යන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමිය බොහොම කාලොචිත හා ඉතාමත් ම ඇත්තටම ජාතික ජන බල වේගයේ පුනරුදයේ වැඩපිළිවෙලත් එක්ක බොහොම කාලෝචිත හා අනාගතය ගැන හිතල ගෙනාපු යෝජනාවක්. එය මම ඉතා අගය කරනවා. ඒ නිසා මම අදහසක් විදිහට ඉදිරිපත් කරනවා,අපේ බල ප්‍රදේශයේ කොට්ඨාශ 18ක් තියෙනවා.එම 18 නියෝජනය කරන අපේ සභික නෝනාවරු මහත්වරුන් සිටිනවා.අපේ දිලීන් මන්ත්‍රීතුමා කිවුව වගේ අපේ කොට්ඨාශයේ අපි දන්නවා ,ඕක වෙන්නේ, සභාපතිතුමා අඩි 10 ක පාරක් තියෙනවා.අඩි 10 පාර අනුමත වෙනවා අඩි 8 ක් කොන්ක්‍රිට් කරන්න. එතන අඩි 02ක් තියෙනවා. ඒ දෙපාර්ශවයේ අය හිතාගෙන ඉන්නවා ඒ අඩිය තමන්ගේ කියලා. හොද යෝජනාවක් මේ ගෙනාවේ.ඒ නිසා ඔබතුමා ලිඛිතව කොට්ඨාශ නියෝජනය කරන ඒ මන්ත්‍රිවරු අපේ 18 දෙනෙක් ඉන්නවා මන්ත්‍රිවරු හා මන්ත්‍රිවරියන්.දැන් අපි උදාහරනයක් ගමුකො ,යකුදාගොඩ කොට්ඨාශය ගත්තහම අපේ ආරියදාස මන්ත්‍රිතුමා ඉන්නවා.මන්ත්‍රිතුමා දැන් ගෙයක්

ගෙයක් ගානේ ගිහින් දන්නවා දැන් ඔය ප්‍රශනෙ තියෙන තැන්.මන්ත්‍රීතුමාගෙන් ඒ ටික ගන්නවා.එතකොට අපේ ජයසෝම මන්ත්‍රීතුමා ඉන්නවා බටහිර කලටුවාව, හේවායින්නජ් පැත්තේ තොරතුරු ටික අරගෙන,ඒ වගේ මන්ත්‍රීවරු සියලු දෙනාගෙන් තොරතුරු ටික අරගෙන ඔබතුමා, අපේ දිලින් මනත්‍රීතුමා කිවුවා වගේ ලිඛිතව ඒ කට්ටිය දැනුවත් කිරිමේ වැඩපිළිවෙළක් හදන්න.අපි දැනට ඒ තීන්දුව ගත්තොත් තව අවුරුදු 15 කින් 20 කින් අපිට හොද වැඩපිළිවෙලක් වෙයි. ඒ නිසා එය ඉතාමත් කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,ඔය වගේ සිද්ධියක් වුණා බෝපැත්ත පාරේ. මම අතුරලිය මන්ත්‍රීතුමාටත් කතා කළා, සමන්සිරි මන්ත්‍රීතුමාටත් කථා කළා.පස්සේ මං හිතුවා මේක මන්ත්‍රීවරුන් දෙන්නම ඉන්න කොට්ඨාශය නිසා, මං ඔබතුමාටත් කතා කරලා කිවුවා.එතන මේවන විටත් එම බැම්ම බැඳලා ඉවරයි.එම බැම්ම ඇතුළත තමයි මල් හිටවන්න හදන්නේ .විජේනායක විද්‍යාලය ඉදිරිපිට මගේ හොඳම හිතවතුන්. හිතවත්තු වුණාට එතන , ළමයි පාරෙ ඉදලා ත්‍රිවිල් එකකට හරි බස් එකකට හරි වාහනයකට නගින පාර හින්දා මම කිවුවා.මේවන විට එතන තාවකාලිකව නවත්වලා තියෙනවා. ඒතන විශේෂයෙන්ම ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා,ඒත් එක්කම එතන ලයිට් කණුව තියෙන්නේ ,පාරෙ.ඒ හේතුව හින්දද දන්නේ නැහැ,ඔවුන් ඒකට අල්ලලා පුංචි බැම්මක් ගහලා පාරෙ, මල් හිටුවන්න හදල තියෙන්නේ කියල.පුළුවන්නම් ඒ ලයිට් කණුවත් ඉවත් කරන දෙන්න පුළුවන්නම් හොඳයි කියන යෝජනාව මම කරනවා.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සමහර තැන්වල වැටවල් හදලා තියෙනවා වගේම, සමහර තැන්වල පාර කපලා තියෙනවා.කොන්ක්‍රීට් එක ළඟටම.මුළු පාරෙම කොන්ක්‍රීට් එක නැති නිසා කොන්ක්‍රීට් එක ළගටම පාර කපනවා.ඒගැනත් සැලකිලිමත් වන්න කියා මම කියා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි,ඒකටම මම දිගුවක් එකතු කරනවා.අපිට ලියුම් ගහන්න යම් කිසි කාල පරාසයක් යනවනේ.අපි මූලික වශයෙන් රාජ්‍ය නිලධාරීන්ව දැනුවත් කරලා මින් ඉදිරියට මේ කටයුතු සිදු නොවන විදිහට ,රාජ්‍ය නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා,නැත්නම් ලිඛිතව මැනීමක් කරන්න පුළුවන්නම් හොඳයි.ග්‍රාම නිලධාරීන්ට විෂය පථයේම තියෙනවා ,සභාව මැදිහත් වෙන්න අවශ්‍ය වටපිටාව හදල දෙන්න කියලා ඉල්ලීමක් කළොත්හොඳයි.නැත්නම් තොරතුරු හොයලා ලිවුම් ගහනකොට මේ තියෙන ප්‍රමාණය තව වැඩිවෙන්න පුළුවන්.ඊට ප්‍රථමව ප්‍රාදේශිය ලේකම්තුමිය සමගත් සාකච්ඡා කරල,අපි පුළුවන් නම් රාජ්‍ය නිලධාරීන් හරහා දැනුවත් කිරීමක් කරන්න මෙවැනි ක්‍රියාමාර්ග ඉදිරියට මේ කටයුතු සිදු නොවන ලෙසට.එවැනි ප්‍රවේශයකට යන්න පුළුවන් නම් දැනට තියෙන තත්ත්වෙ පාලනය කරගන්නහැකියාව ලැබෙයි.

**සභික ඩී.ජී.චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නේ වෙන තැනකට යන්නේ.මූලික ඉදිකිරීමක් කරනව නම් එයට අනුමැතිය ගත යුතුයි ප්‍රාදේශිය සභාවෙන්.එතකොට ඒ Plan එක අනුමත කිරිමේ දි වීථි රේඛා සහතික ගන්න කොට මුලින්ම සැලැස්ම අනුමත කර ගත යුතුයි.එතන තමයි පළවෙනි එක.එතකෙට සාමාන්‍යයන් වෙන දෙයක් තමයි නගරෙන් පිට ග්‍රාමීය පැත්තට යනකොට ඕක අනුමත කිරිමක් වෙන් නෑ.ප්‍රායෝගිකව වෙන දෙයක්.වටේ තාප්ප ගහන එක ,ටෙයිලට් වලවල් කපන එක ඒ සියලු දේ සභාවෙන් අනුමත වෙන්නඕනේ.හැබැයි ප්‍රායෝගිකව නගර සිමාවෙන් කිලෝමීටරයක් දෙකක් එහාට ගියාට පස්සේ ඕක අනුමත වෙන් නෑ,බැංකු ලෝන් එකක් ගන් නැත්නම්.පළවෙනි දේ අපි ඕක වෙන තැනකට ගෙනියන් නැතුව මාර්ග ටික, මන්ත්‍රීතුමිය ගෙනාපු යෝජනාව තමයි මාර්ගවල දෙපැත්ත අපේ තියෙන සීමාවේ පිට,ඒ කියන්නේ අඩි 16 පාර තියෙනවා පළාත් සභාවෙන් හරි ප්‍රාදේශිය සභාවෙන් හරි අනුමත වුණු සල්ලිවලින් අඩි 8කොන්ක්‍රීට් එකක් දානවා ,තාප්ප දෙක එනවා අඩි 8 ගාවට .ඕකනේ ප්‍රායෝගික ප්‍රශ්නේ.කාණුවත් නෑ මොකුත් නෑ.එතකොට ඒක මුලින් විසඳගමු.නැත්නම් මේ මාර්ග ටික ඊලඟ පාර අඩි 16 ට කොන්ක්‍රීට් කරන්න ආවට පස්සේ තාප්ප කඩන්න් ඕනේ.ප්‍රශ්නයක්නේ. අපිට මේක දැන් නවත්තගන්න පුළුවන් වුණොත් දැනට තියෙන්නේ ටික.අපි අපේ මනත්‍රීවරු හරහා,ග්‍රාමීය කමිටු හරහා අපි ලිවුමක් යවමු සියලුම ගෙවල්වලට ඒක අපිට දවසක් දෙකක් දාලා අතේ බෙදන්න හරි පුළුවන්. අපි ඔක්කොම කැන්වසින් ගිහිල්ලා තියෙනවනේ.අපි දන්නවා ගමක් කවර් කරන්න යන්නේ කොච්චර වෙලාවක්ද කියලා.කොට්ඨාශ නියෝජිතවරු ඉන්නවා,මන්ත්‍රිවරු ඉන්නවා වසම්වල නිලධාරීන් ඉන්නවා කට්ටියත් එක්ක කොළයක් බෙදමු.එතකොට මේක පොඩි ක්‍රමානුකූල තත්ත්වයකට ගන්න පුළුවන්.මේක එක පාරින් වෙන්නැ.අපේ ජීවිතේට ලිවුමක් දුන්නා කියලා හදන එකක් නවත්වන්නේ නෑ.ඊට පහුවෙනිදා උදේ වෙද්දි මතක් වෙලා ටක් ගාල හදා ගනී.හැබැයි අපට යම්කිසි මට්ටමකට ඒක පාලනය කර ගන්න පුළුවන්.ඊට පසු දෙවනුව වීථි රේඛා සහතික ගන්න එනකොට, ඒක අපි කොහොමත් කාර්මික නිලධාරීතුමා ඒක පරීක්ෂා කරල බලල නේ දෙන්නේ.ඒ නිසා ගැටළුවක් වෙන එකක් නැහැ.

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම කලින් සභා වාරයක මම මේ යෝජනාව කළා සභාවට. සභාවට අයත් සියලුම පාරවල් සහ කාණු පද්ධති, මොකද මේ ගැටලු ඔක්කොම එන්නේ කාර්මික සේවා කමිටුවට.කාර්මික සේවා කමිටු සභාපතිවරයා හැටියට මට මේ ගැටලු ටික එන්නේ.මම යෝජනා කළේ සියලුම පාරවල් සහ කණු පද්ධති මැනුම් කටයුතු සිදුකර සභාවට පවරා ගන්නා හැකි ඒවා සභාවට පවරා ගන්න කියලා.යෝජනාවත් ස්ථිර වුණා.ඔබතුමා එතනදි අදහසක් ඉදිරිපත් කළා දැනටමත් GPS වලින් යම් කිසි ප්‍රමාණයක වැඩ ඉවර කරලා තියෙනවා කියලා. එම ක්‍රියාවලිය ඉදිරියට යයි කියල මම බලාපොරොත්තු වෙනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම හිතන්නේ අපේ සහෝදර නදුන් මන්ත්‍රීතුමා මිට කලින්, මංදැන් කිවුවේ අපි දැන් අත්දැකීම් ගන්න ගන්න ඒ සන්නද්ධ වැඩපිලිවෙලකට එනවා ගරු සභාපතිතුමා.නදුන් මනත්‍රීතුමාට තමන්ගේ

කොට්ඨාශයේ ඇවිදිනකොට දැනෙනවා මේ තියෙන ප්‍රශ්න ටික.එතකොට එතුමා යෝජනා කරලා තියෙනවා,මං හිතනවා ඒ ගැන ප්‍රගතිය ඔබතුමාට කියා ගන්න බැරි වෙයි මේ වෙලාවේ.අපිට ඒක ප්‍රශ්නයක් නෑ.නමුත් මං කියන්නේ ඒ කාර්මික නිලධාරී ගෙනැල්ලා ඒ කටයුත්ත භාර දුන්න නම් මේ වෙලාවෙම, සභාව කාරක සභාවක් බවට පත් කරලා අපේ නදුන් මනත්‍රිතුමා කමිටුවේ සභාපතිතුමා හැටියට, ඔබතුමාටත් ඉදිරියට ලොකු සහයෝගයක් ලැබෙයි මේ කටයුත්ත කරගෙන යනකොට.ඒ නිසා මං අදහසක් විදිහට ඉදිරිපත් කරනවා සභාව කාරක සභාවක් කරලා නදුන් මන්ත්‍රීතුමාට අවශ්‍යා තොරතුරු ගන්න නිලධාරී ගෙනැල්ල සාකච්ඡා කරන්න අවස්ථාව ලබා දෙමු.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමට මම යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා

ඒ අනුව මහ සභාව කාරක සභාවක් බවට පත්විය.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට මම යෝජනා කරනවා.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපේ කාර්මික සේවා කමිටුව වෙන්න පුළුවන්, නිවාස කමිටුව වෙන්න පුළුවන්.විශාල ප්‍රශ්න ප්‍රමාණයක් එනවා.ඔබතුමන්ලා සියලු දෙනාටම ඒ සම්බන්ධව අත්දැකීම් තියෙනවා, විශේෂයෙන් මේ පාරවල් අල්ලා ගැනීම සම්බන්ධයෙන්. මන්ත්‍රීතුමා කිවුවා වගේ අපි අඩි 08ක් කොන්ක්‍රීට් කළා ට පස්සේ අඩි 08ටම ගෙනැත් තාප්පය ගහනවා.ඒක හැම වසමකම තියෙනවා.මුළු දවසම කතා කරන්න පුළුවන් උදාහරණ ගැන.ඒ සම්බන්ධව දැකල අපේ නදුන් මන්ත්‍රීතුමා යෝජනාවක් දැම්මා සභාව සතු පාරවල් මැනලා සීමා මායිම් ලකුණු කරන්න කියලා.GPS වලින් වෙන්නේ ඒකයි. GPS වලින් වෙන්නේ සභාව සභාව සතු පාරවල් ටික ලකුණු කරලා,මෙතනප්‍රාදේශිය සභා පාරක් තියෙනවා කියලා ලකුණු කරලා, ඒ ආරම්භක පළලයි,ආරම්භක පළල සටහන් කර ගන්නේ පාර ප්‍රමාණය සටහන් කරන්න.ඒහෙම දත්ත පද්ධතිය මේ වෙන කොට හදලා ඉවරයි.මංහිතන්නේ ,වර්ෂ ගණනාවක පරිශ්‍රමයක නිලධාරී මහත්වරුන්ගේ.ඒකට ප්‍රශංසා කරන්න ඕනි.අනික් ප්‍රාදේශිය සභාවල තාම කෙරෙනවා.ඇහැලියගොඩ එක ඇවිත් තියෙන්නේ ඉස්සරහට.අපිට යන්න තියෙන්නේ එතනින් ඉස්සරහට. අපිට ගැටලු තියෙන පාරවල් තියෙනවනේ, පාරවල් පටු වෙලා ගැටළු තියෙන පාරවල් ටිකක් තියෙනවා.අන්න ඒ පාරවල් ටික අඩුම ගානේ අවුරුද්දකට පාරවල් 10ක් 12ක් හෝ හඳුනාගෙන ඒවායේ මැනීම් කටයුතු සිදුකර,සීමා මායිම් ලකුණු කරල, අපි එහෙම වැඩපිළිවෙලකට තමා යන්න වෙන්නේ.එතකොට ඉතින් කාර්මික නිලධාරී මහත්මයාගේ සහය ඇතුව,ගැටළු තියෙන පාරවල් ටික,සභාවට එනවා කමිටු වලට එනවා.අපි මොකක් හරි ප්‍රමුඛතාවයක් හදාගෙන මැනුම් කටයුතු කරල,එය නිරවුල් කර ගැනීමට කටයුතු කර ගමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි මහ සභාව කාරක සභාවක් බවට පත් කළත්. නමුත් අදාල නිලධාරී නැහැ. සභාපතිතුමනි සාමාන්‍යයෙන් මහ සභාව දවසක ඒ අවශ්‍යා නිලධාරී සිටිය යුතුයි.ඒ සම්බන්ධයෙන් නිලධාරීන්ව දැනුවත් කරන්න. මොකද ,අවුරුදු එකහමාරක් දෙකක් අපි සභාවක හිටියේ නැහැනේ. සමහර වෙලාවට අලුතින් පත්වුණ නිලධාරී ඇති.එතකොට දේශපාලන මණ්ඩලයත් එක්ක එයාලට වැඩකරන්නේ කොහොමද කියන එක ගැන, හරියාකාර අවබෝධයක් නෑ කියන එක මට තේරුණා. මොනද මම දැන් සති දෙකකට කලින් අපේ හදිසියේ ජල සැපයුමක් දෙන්න අත්‍යවශ්‍ය වෙලා, මෙහෙන් නිර්දේශ අවශය වෙලා තිබ්බා,ඩප් සඳහා අදාල කාර්මික නිලධාරියාගේ නිර්දේශ අවශ්‍ය වෙලා තිබුණා.නිර්දේශ ආවෙ නෑ දවස් 03ක් 4 ක් යනකන්.මම මන්ත්‍රීවරයා විදිහට මම ඒ අවශ්‍යා කාරණාව ඒ කාර්මික නිලධාරීතුමියට මතක් කළා මේක ,ඇවිල්ලා පොඩ්ඩක් ඉක්මනට කරල දෙන්න හෙට තියෙන වැඩකට තමා, මේ කාලයක් තිස්සේ ඔබතුමියගෙන් අවසරය අනුමැතිය ඉල්ලන්නේ කියල.මගෙත් එක්ක මගෙ අනෙක් මන්ත්‍රීවරයාත් හිටියා,එතුමිය කිවුවා අනවශ්‍යා බලපෑම් කරන්න එපා මට මන්ත්‍රිතුමා කියලා.ඉතින් අපිට එහෙම නිලධාරීන්ට අනවශ්‍යා බලපෑම් කරන්න බෑ.එහෙම අනවශ්‍යා බලපෑමක් කළා නම්,තර්ජනයක් කළානම්, ඒ කාරණය ඔස්සේ ඔවුන්ට නිසි ක්‍රියාමාර්ග ගන්න පුළුවන්.එහෙම ගන්න ක්‍රමවේදයක් තියෙනවනේ.නමුත් මට ප්‍රකාශ කළා, අනවශ්‍යා බලපෑම් මන්ත්‍රීතුමා කරන්න එපා කියලා.හොඳින් කිවුවා මෙහෙමයි මේක ඉක්මනට පොඩ්ඩක් අවශ්‍යා වෙලා තියෙනවා,මන්ත්‍රීවරයෙක් වුණාම ප්‍රදේශයේ මිනිස්සුත් එක්ක සාකච්ඡා කරල නිලධාරීන් සමඟ අපි සම්බන්ධ වෙන්න ඕනිනෙ.ඒ අනුව අපි වෙනදත් එහෙම කරල තියෙනවා.ඒ අනුව තමයි එතුමියට එදත් කථා කළේ.නමුත් එතුමියගේ කටින් පිට වුණා මෙහෙම අනවශ්‍යා බලපෑම් කරන්න එපා කියල.අපිට හිතුණා සමහර වෙලාවට දේශපාලන, ඔබතුමන්ලා ඔවුන්ට උපදෙස් දීල තියෙනවද ඔවුන්ට විපක්ෂෙ මන්ත්‍රිවරුන්ට එහෙම කරන්න කියලා .අපි දන්නේ නැහැ.මට එහෙමත් හිතුණා වෙලාවකට.හැබැයි ඒතුමිය එහෙම ප්‍රකාශ කළා.ඉතින් ඔබතුමන්ලා දැනුවත් කරන්න. සභාවක මන්ත්‍රීවරු සමඟ වැඩ කරනකොට ඒ වැඩ කරන ආකාරය, අමාරුයි ගැලපෙන්න.අනිත් ආයතන වගේ නෙවෙයි.ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මෙච්චර දේශපාලන මැදිහත් වීමක් එක්ක ගැටෙන්නේ නැහැ. හැබැයි මේ වගේ ආයතන එහෙම නෙවෙයි. ගැටෙනවා.ගැටෙන්න ඕනේ.සමහර වෙලාවට හිත රිදීම් ඇතිවෙන්න ඉඩ තියෙනවා.සමහර වෙලාවට හිතවත්කම් ඇතිවෙන්න ඉඩ තියෙනවා.ඒහෙම තමයි මේ ආයතනයේ හැටි.සභාපතිතුමා ඒක පොඩ්ඩක් මතක් කරන්න .නමුත් මගෙ වැඩේ කරන දුන්නා.නමුත් ඒක වැරදි පූර්වාදර්ශයක් වෙයි.ඒ නිලධාරීන්ව දැනුවත් කරන්න අපිත් එක්ක ගනුදෙනු කරන විදිහ.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
සියලුම මන්ත්‍රීවරුන්ගේ අවධානයට විශේෂයෙන්ම කාර්මික නිලධාරී මහත්වරුන් හා මහත්මීන්, හැම මාසෙකම අවසානයේ , ඉදිරි මාසය සඳහා වැඩ සැලැස්ම ලේකම් මහතාට ලබා දී අනුමත කරගෙන තියෙන්නේ.ඒ කියන්නේ දින වෙන් කරගෙන තියෙන්නේ.ඒ නිසා යම්කිසි හදිසි කටයුත්තක් සඳහා එතුමන්ලාව ක්ෂේත්‍ර පරීක්ෂාවක හරි, ස්ථාන පරීක්ෂාවකට හරි කැඳවාගෙන යාමට අවශ්‍ය නම්,එතුමාන්ලාට බලපෑම් කරන්න යන්න එපා. ඉල්ලීම් කරන්න යන්න එපා.ලේකම්තුමා ඉන්නවා.සභාපතිතුමා ඉන්නවා.දෙන්නම නැත්නම් මමත් ඉන්නවා.කථා කරල කියන්න.එතකොට ඒක මන්ත්‍රීවරයෙක් කිවුව පමණින් ඒ ගොල්ලන්ට එළියට යන්න බෑ.මොකද ඒ ගොල්ලෝකලින් කාල සටහනක් ලියල,ලේකම්තුමාගෙන් ,සභාපතිතුමාගෙන් අනුමත කරගෙන තියෙන්නේ ඒ නිසා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනාරත්න මැතිණියගේ 6.24. යෝජනාවමාහිංගොඩ සිට මාහර පන්සල දක්වාත් පන්සල සිට අස්ගගුල මාර්ගයට පිවිසෙන බටදොබේ පාලම දක්වාත් ප්‍රාදේශිය සභාවට අයත් මාර්ග දෙපස නියමිත මැනුම් කටයුතු කොට මාර්ගයේ පළල ප්‍රමාණය ක්‍රමානුකූලව සකසා ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.25.සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණියගේ යෝජනාව.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**

**6.25.කාන්තා කමිටු පිහිටුවීමට යෝජනා කරමි.**

**සභික ගරු ජී.එච්.සුජීව නිලන්ත විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය**
ගරු සභාපතිතුමනි,මම හිතන්නේ මධ්‍යම පළාතේ විතරයි කාන්තා කමිටු පිහිටුවන්න කියලා තියෙන්නේ.මම හිතන්නේ,කාන්තාවක් විදිහට දැන් අපේ කාන්තාවෝ 07 දෙනෙක් ඉන්නවා සභාවේ. කාන්තාවන්ගේ තිබෙන ගැටළු මොනවාද ?,දරුවන්ගේ තිබෙන ගැටළු මොනවාද? පෝෂණ තත්වයන් මොනවාද?,නිවෙස් වලදී මුහුණ දෙන ගැටළු මොනවාද?,ඊට අමතරව කසළ බැහැර කිරීමේ සිට මේ සෑම සංසිද්ධියකටම මුහුණ දෙන්නේ කාන්තාවන්.කාන්තා කමිටු පිහිටුවීම මගින් අපිට මේ පවුල් පසුබිම හරහා යම් කිසි සේවයක් ජනතාවට කරන්න පුළුවන් කියල මම හිතනවා. ඒ හේතුව නිසා මෙම කාන්තා කමිටුව පිහිටුවා දීමට ඔබතුමාගේ සහයෝගය ,මැදිහත්වීම සිදුකර දෙන ලෙස ඉල්ලීම මම කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ වත්සලා මන්ත්‍රීතුමිය බොහොම හොඳ යෝජනාවක් දැම්මේ.යෝජනාවේ දෙපැත්තක් තිබෙනවා.ඔබතුමාටත් යම් ප්‍රයෝජනයක් ගත හැකි හොඳ යෝජනාවක් තමයි ඇවිත් තියෙන්නේ.අපි දන්නවා ඔබතුමා කොතරම් රාජකාරි තිබුණත්, සෑම වසමක් ගානේම ගිහිල්ල ,කොට්ඨාශයක් ගානේම ගිහිල්ල ඔබතුමාගේ දායකත්වය ලබාදෙනවා කියල අපි දන්නවා.ඒක හොඳ පූර්වාදර්ශයක්. එහෙම තමා වෙන්න ඕන.තරුණ උප සභාපතිවරයෙක් විදිහට මම හිතන්නේ අනාගතයේ යම් හොඳ තැනකට යන්න පුළුවන්.එහෙම තමයි දේශපාලනය අපි කරන්න ඕනි. ඒක හරි.අපේ වත්සලා මන්ත්‍රීතුමියකිවුව වගේ,අපේ කාන්තාවෝ ගත්තහම පළාත් පාලන ආයතනය දරුවෙකුගේ උත්පත්තියේ සිට මරණය දක්වාම කැපවෙනවා වගේම ,කාන්තාවෝ අපේ අම්මා ,භාර්යාව,අපේ දරුවෝ ,අපේ සහෝදර සහෝදරියන් ඒ කටයුත්තේ උදෑසන පාන්දර හතරේ පහේ සිටම නියැලිලා ඉන්න පිරිසක්.ඒක අපි දන්නවා අත්දැකීමෙන්ම.ඒ නිසා වත්සලා මන්ත්‍රීතුමියගේ යෝජනාව ඔබතුමත් ප්‍රයජෙනයට අරගෙන, බොහොම හොඳ යෝජනාවක් ගෙනාවේ. සෑම කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ,මෙම කමිටුව පත්කර ගන්න.මොකද එතුමියටත් දැවෙන ප්‍රශ්න ඇති.ඒ වගේම අපේ නිලධාරිනියන්ට මන්ත්‍රීවරියන්ට. ඉතාමත්ම ඉක්මනට මේ කමිටුව පත් කර ගන්න. මන්ත්‍රීතුමියන්ලා හත්දෙනෙක් ඉන්නවානේ අපේඔබතුමියට නැද්ද ? අපේ අනිත් මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් සහ අපි වෙනුවෙන්. අපේ මීන්නානේ මන්ත්‍රීතුමියට නැතිලු.එහෙනම් හයයි.අනිත් හය දෙනාටම ගැටළු තියෙන්න පුළුවන්.හැබැයි මීන්නානෙ මන්ත්‍රීතුමිය ඔක්කෝම ටික සම්පාදනය කරගෙන තියෙන නිසා ප්‍රශ්නයක් නෑ.අපේ අනිත් මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් සහ අපි වෙනුවෙන්,අපි බුළුගහපිටිය යකුදාගෙඩ කොට්ඨාශය ගත්තහම ,අපේ ආරියදාස මන්ත්‍රීතුමා ඉන්නවා.එතුමා බොහොම කැප කිරීමෙන් එම කටයුතු කරගෙන යනවා.අපිට සතුටුයි. ඇත්තටම මමත් 2011 ඉඳන් ඒ කටයුත්ත කරගෙන ආවට පස්සෙ එතුමා භාර ගත්තා, මගේ සහෝදරයා.ඒකත් අගේ කරනවා මේ වෙලාවේ. බොහොම මහන්සි වෙලා ඒ කටයුත්ත කරනවා. ඒකත් බොහොම හෘදයාංගමව කියන්නේ.අවුලක් නම් ඒකත් කෙලින්ම කියනවා.බොහොම හදවතින්ම කියන්නේ.ඒනිසා අපිට මෙහි කාගෙත් අරමුණ තමා ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය වර්ධනය කරන්න. දරුවන්ගේ,අම්මගේ,තාත්තගේ,සෑම කටයුත්තකදීම.ඒ නිසා මම සිතන්නේ ඒ වත්සලා මන්ත්‍රීතුමියගේ යෝජනාව, ඔබතුමාත් හොඳ සැලැස්මක් හදල ඒ වැඩ ටිකත් කරයි .අපි ඒක දන්නවා. එම වත්සලා මන්ත්‍රීතුමියගේ යෝජනාව ඉතාමත් ඉක්මනින්ම ක්‍රියාත්මක කරන්න වැඩපිළිවෙලක් හදන්න.බොහොම ස්තුතියි.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

වත්සලා මන්ත්‍රීතුමිය ඔබතුමියගේ කාරණය ටිකක් අපි පැහැදිලි කරගන්න. කාරක සභාවක් බවට පත්කර ගනිමුද ? කාරක සභාවකට යෝජනා කරන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමට මම යෝජනා කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මහ සභාව කාරක සභාවක් බවට පත්විය.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත්කිරීමට මම යෝජනා කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාවේ තීරණය පරිදි, වත්සලා මන්ත්‍රීතුමිය විසින් කාන්තා කමිටුවක් මේ ප්‍රාදේශියසභාවේ අතිරේඛ කමිටුවක් විදිහට පිහිටුවීමට යෝජනා කරලා ඒක ස්ථිර වුණා. අපි ඒහිදී කථා වුණා.කාන්තා ව්‍යවසාය නගාසිටුවීම,කාන්තාව සවිබල ගැන්වීම,ඒ වගේ ලෝකයේ තියෙන ප්‍රවණතාවයක් තමයි කාන්තා ව්‍යවසායකත්වය,කාන්තාව සවිබල ගැන්වීම කියන්නේ.එතකොට ස්ත්‍රී,පුරුෂ සමානභාවය ගැන කථා කරන්න.එතකොට ඒකට තවත් ඒවා බලගන්වන්න පරිපාලන ක්‍රියාවලියෙන් බැහැරව දේශපාලන මැදිහත්වීමක් කරන්න පුළුවන් අවස්ථාවක ඒ කාන්තා කමිටුව මැදිහත් වෙලා ඒ ව්‍යුහය අපි සභාවේ කථා කළා කාරක සභාවේදී .අපි තවදුරටත් ඊළඟ සභා වාරයේදී මම විශ්වාස කරනවා වත්සලා මන්ත්‍රීතුමිය සහ අනිත් මන්ත්‍රීතුමියන්ලා එකතුවෙලා ඒ ව්‍යුහය හදල ඒකෙ නීතිමය තත්ත්වය සලකා බලල අනිත් පළාත් පාලන ආයතන වල කොහොමද මේ කටයුත්ත සිද්ධ වෙන්නේ කියන කාරණාව පිළිබඳව අපිට දැනුම් දෙයි කියලා අපි විශ්වාස කරනවා.ඊළඟ ප්‍රාදේශිය සභා රැස්වීම තුළ. ඉතින් එතකන් අපි ඔවුන්ට ඒ අවස්ථාව දෙමු, සභාපතිතුමනි මේ කමිටුවේ ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
බොහොම ස්තුතියි.ඒකෙ තීරණය එතකොට සභා සම්මත උණා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණියගේ 6.25. යෝජනාවකාන්තා කමිටු පිහිටුවීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.26.සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණියගේ යෝජනාව.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**

**6.26. ප්‍රාදේශිය සභා මන්ත්‍රී / මන්ත්‍රීවරියන් සභාවට පැමිණි අවස්ථාවන්වල දී ඔවුන්ගේ කටයුතු සිදු කර ගැනීමට සහ ඔවුන්ට සිටීමට ස්ථානයක් සකස් කර ගැනීමට යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මෙම යෝජනා ගෙනාවත් මීට පෙර අපේ සභාවේ මම හිතන්නේ මෙම ස්ථානයේ වැඩියෙන් ඉඩකඩ වෙන් කරල වෙනත් තැනක් සකස්කර ගැනීම කියන යෝජනාව ආවා. නමුත් ඒක කරන්න එ් ගොඩනැගිල්ල හදල වැඩියෙන් ඉඩ අරගෙන අපිට කරන්න කාලයක් යනවා.මෙතන්දි මම යෝජනා කරන්නේ ඇත්තටම අපේ මන්ත්‍රීවරු අපේ දකුණු පැත්ත වම් පැත්ත දෙපැත්තෙම අයගේ. ඇත්තටම සභාවට ආවහම සභාවේ අපේ අය හැම තැනම ගිහිල්ල වැඩ කර ගන්නේ බොහොම අමාරුවෙන්.ඒ අතර මම දකින දෙයක් සභාපතිතුමාගේ කාමරයේ තමයි අපි වැඩි හරියක් ගැවසෙන්නේ.එතන ඉන්නේ.එතකොට එතෙන්ට එන මහජනතාවට විශේෂයෙන් වැඩක් කර ගැනීමට හැකියාවක් නැති වෙන වෙලාවල් තියෙනවා.අනිත් එක මටම වුණා මේ යෝජනාව දැම්මට පස්සේ මුදල් කමිටුවට මම ඇවිල්ලා ඉන්න කොට සභාපතිතුමා පෙ.ව.11.00ට තියෙනවා කියපු රැස්වීමට පෙ.ව.11.05ට මං ආවා.පෙ.ව.11.30 වෙනකන් මම එළියේ පුටුවක ඉඳගෙන හිටියා.ඉතින් සභාපතිතුමාගේ කාමරයේ එවලෙ රැස්වීමක් තිබුණා.ආරියදාස මන්ත්‍රීතුමා නම් මට කිව්වා ඇතුළට ඇවිල්ලා ඉඳගන්න කියලා. නමුත් වෙනත් රැස්වීමක් තියෙන වෙලාවක මම එතනට යන්න සුදුසු නෑ

කියන හේතුව හින්ද මං එළියෙන් ඉඳගෙන හිටියා. ඒක හින්ද දැනට තියෙන ඉඩකඩ ප්‍රමාණය අනුව හරි අපේ මන්ත්‍රීවරුන්ට සභාවට පැමිණුණහම ඉන්න තැනක් සකස් කරල දෙන්න කියන ඉල්ලීම කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒකෙ දිගුවක් වශයෙන්, දැන් මම හිතන්නේ ගිය සභාවල විපක්ෂ නායක කියල එකක් තිබිල තියෙනවා. මේකෙ එහෙම එකක් නෑ තාම. එතකොට එතුමටත් ඉන්න කාමරයක් වෙනම තිබිල තියෙනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ප්‍රාදේශිය සභාවේ වික්ෂ නායක කියන තනතුරක් නෑ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සභාවේ විපක්ෂ නායක තනතුරක් තිබිල නෑ.නමුත් කට්ටියක් දාගෙන එහෙම තිබිල තියෙනවා. නමුත් ඒගොල්ලන්ට ඉන්න කාමරයක් වෙනම තිබිල තියෙනවා. අද ඒ තැන හදල දෙන්න පුළුවන්නම්, දකුණු පැත්තට වම් පැත්තට,හරි පහසුවක් වෙනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපි ඇත්තටම අතන සභා ගොඩනැගිල්ල පුළුල් කරේ ඒකයි.ඔබතුමන්ලාට මතක ඇති ගියපාර සභාවේදී මේ සම්බන්ධ කාරණාව කථා කළා. අපිට සභාවේ ඉඩකඩ අඩුවක් තියෙනවානේ. ඇත්තටම ගත්තොත් එහෙම මේ මහ සභාව කලින් තිබුණේ මෙහෙම තනි රවුමක් විදිහට තනි සභාවක් විදිහට.සභාවේ හිටපු මන්ත්‍රීවරු සහ මාධ්‍යවේදීන් දන්නවා.ඒ ගොල්ලෝ හිටියේ එහා කෙලවරේ බිත්තියට හේත්තු වෙල. ඒ කියන්නේ කකුල් දෙකවත් දිග අරින්න බෑ.ඉඩක් තිබුණේ නෑ.ඊට පස්සෙ දැන් අපි මන්ත්‍රීවරු වැඩි වුණා.අපි කල්පනා කරල තමයි මේ විදිහට පේළි 02ක බැගින් 04ක් දාල එතන ලොකු ඉඩක් අරන් දුන්නේ මාධ්‍යවේදීන්ට සහ ජනතාවට ඇවිල්ලා සභාව නරඹන්න.කලින් එහෙම අවස්ථාවක් තිබුණෙ නෑ ඇත්තටම.ඉතින් අපි උත්සාහ කරමු නේද?

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණියගේ 6.26. යෝජනාවප්‍රාදේශිය සභා මන්ත්‍රී / මන්ත්‍රිවරියන් සභාවට පැමිණි අවස්ථාවන්වල දී ඔවුන්ගේ කටයුතු සිදු කර ගැනීමට සහ ඔවුන්ට සිටීමට ස්ථානයක් සකස් කර ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.27.සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණියගේ යෝජනාව.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**

**6.27.ප්‍රභාත් මහතාගේ නිවසේ සිට ශෂි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද රාජපක්ෂ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මෙතන අඩි 200ක් වගේ තමයි තියෙන්නේ. ගෙවල් 10ක් විතර තියෙනවා. මෙතන අඩි 100ක වගේ ප්‍රමාණයක යන්නම බැරි ප්‍රමාණයක් තමයි තියෙන්නේ .ඒ අඩි 100ක ප්‍රමාණය හරි කොන්ක්‍රීට් කරල දෙන්න කියල තමයි ඉල්ලන්නේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණියගේ 6.27. යෝජනාව ප්‍රභාත් මහතාගේ නිවසේ සිට ශෂි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.28.සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
**6.28. ප්‍රාදේශිය සභාවට අයත් මාර්ගවලින් ව්‍යාපෘති සඳහා අසාමාන්‍ය බර වාහන යන්ත්‍රෝපකරණ රැගෙන යාමට පෙර ප්‍රාදේශිය සභාවෙන් අවසර ගැනීම සහ යම් රැඳවුම් මුදලක් තබා ගැනීමට යෝජනා කරමි.**

**ඩී.නිරෝෂිකා නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපේ දැනට තිබෙන මාර්ග වල ඇතැම් පටු මාර්ග පද්ධතියක් තියෙන්නේ.කලිනුත් මාර්ග ගැන කතා කළා.මෙ මාර්ග වලින් අසාමාන්‍ය ටොන් 10කට වඩා වැඩි බර වාහන යාම හේතුවෙන් මාර්ග අබලන් වෙලා තියෙනවා.දැනටමත් ඒ සම්බන්ධව සභාවටත් අපිට ගොඩක් මන්ත්‍රීවරුන්ටත් සැහෙන්න ජනතාවගෙන්

ලිපි ලැබිල තියෙනවා. ඉතින් මේ මාර්ග ටික අපි පොඩ්ඩක් සංරක්ෂණය කරගන්න අපිට යම් වැඩපිළිවෙලකට යා යුතුයි කියල අවශ්‍යතාවය තියෙනවා කියල මම යෝජනා කරනවා.අසාමාන්‍ය බර වාහන,කොට ලොරි, බැකෝ යන්ත්‍ර වගේ ඒව චේන් පිටින් ගමන් කරනවා.එහෙම ගිහිල්ලා මාර්ග අබලන් වෙලා තියෙනවා.ඒ වගේම අපේ පනතේ 70 වෙනි වගන්තියේත් තියෙනවා යම් මාර්ගයක අධි බරක් ගෙන යාම හේතුවෙන් එම මාර්ගයට අලාභහානි සිදු වූ හෝ සිදු වීමට ඉඩ ඇති අවස්ථාවක එම පාර්ශවයට නඩු පවරා අලාභයක් අයකර ගත හැකි බවත් .ඒ වගේම යම් ප්‍රාදේශිය සභාවක් සමඟ යම් එකඟතාවයකින් මේ වැඩේ කරන්න පුළුවන් කියලත් සඳහන් වෙලා තියෙනවා.ඉතින් මේ සම්බන්ධව අපි අතුරු ව්‍යවස්ථාවක් හෝ ගෙනත්,මේ සම්බන්ධව නව වැඩපිළිවෙලක් හඳමු වගේම,ඇත්තටම ඒ ව්‍යාපෘති සඳහා යන්නම අත්‍යවශ්‍යම කාරණා තියෙනවා.ඒ ව්‍යාපෘතියට අත්‍යවශ්‍යමයි වාහනයක් ගමන් කිරීම. මේ සම්බන්ධව ඉන්ජිනේරුවන්ගේ අදහස් අරගෙන තාක්ෂණ නිලධාරිත් ඉන්නවා.ඒ වගේ අදහස් අරගෙන මාර්ගයට හානි නොවන විදිහට ඒවට යන්න අවශ්‍යම නම් යන්න වැඩපිළිවෙලක් හදල ,ඒ වගේම අසාමාන්‍ය බර වාහන රැගෙන යාමට පෙර ප්‍රදේශීය සභාවෙන් යම් අවසරයක් ලබා ගැනීමට යම් වැඩපිළිවෙලක් ගැනීමට දැනට දීර්ඝ කාලීන ව්‍යාපෘතියක් විදිහට මාදොල ගල් වලේ පමණයි දැනට රුඳවුම් මුදලක් තබාගෙන පාරට තියෙන්නේ.ඉතින් අනිත් පාරවල් ටිකත් සංරක්ෂණය කරගන්න,යම් වැඩපිළිවෙලක් ගෙන යමු කියල මම යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මේ කාරණාව සම්බන්ධයෙන්, අපේ පාරවල් වල දැව වගේ දේවල් ප්‍රවාහනය කරල , කාණු පද්ධතිය සැහෙන්න අබලන් වෙලා තියෙනවා.මම හිතන්නේ අවුරුදු 20ක් 25ක් වගේ තියාගන්න පුළුවන් ප්‍රාදේශිය සභාව හදපු පාරවල් .අඩි 08 පාරේ ලොකු වාහන ගිහාම රෝද 02ක් පිටින් යනවා. ගැටැති කැඩිල යනවා.ඒ වගේ දෙයක් යම් කිසි වෙලාවක අපිට එපා කියන්නවත් බැහැ. යම් කිසි මැදිහත් වීමක් වෙන්නත් බැහැ.මේ කාරණා වලදී.ක්ෂණිකව ක්‍රියාත්මක වෙන්නත් බැහැ.මේකට ක්ෂණික නීතියක් හෝ නැති හින්දා. මම හිතනවා මේ ප්‍රශ්නෙදි ක්‍රමවේදයක් හදාගන්න ඕනි කියලා. අපි ප්‍රාදේශීය සභාවක ආදායමක් නැතුව බොහොම අමාරුවෙන් ඒ මුදල් එකතු කරල යම් කිසි පාරක් කරද්දි.සමහර පාරවල් අපි දැකල තියෙනවා අනවසර විදිහට කොටන් ප්‍රවාහනය කරනව නෙවෙයි,ඇදන් ගිහිල්ල තියෙනවා.ඒ කියන්නේ රාත්‍රී කාලවල් වල ඒ වගේ දේවල් දකින්න තියෙනවා.අපිට මේවට නීතිමය පැත්තක් හදාගන්න ඕනි.ඉස්සරහට ක්‍රියාත්මක වීමක් කරන්න. පාරක් පොඩි ඉරිතැලීමක් වුනොත් ,එතනින් වැහි දෙක තුනක් යද්දි විනාශ වෙලා යනවා. මන්ත්‍රීතුමා කියපු කාරණෙත් එක්ක මොකක් හරි ක්‍රමවේදයක් හදා ගත්තොත් හොඳයි කියල මම යෝජනා කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

ඇත්තටම ඒක කාලෝචිත යෝජනාවක්. හැම පාරක්ම කැඩිල තියෙන්නේ.වියලගොඩ නාකන්දල තිබ්බටුවාව පාරත් එහෙමයි.පාරවල් හොඳටම කැඩිලා තියෙන්නේ.අර කිවුව වගේ යම් කිසි ඇප මුදලක් තැන්පත් කිරීමට හෝ උපරිම බර සීමාවක් දැමීම වගේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි මේ හදන පාරවල් ආරක්ෂා කරගන්න.බොහොම ස්තුතියි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මේක හොද කාරණාවක්.1987 අංක 15 දරණ පනතේ ප්‍රතිපාදන තියෙනවා. වෙලා තියෙන දේ තමයි විශේෂයෙන්ම , බටහිර කලටුවාව ,හේවායින්න වගේ දැව සම්බන්ධ ගොඩක් ව්‍යාපෘති තියෙන ප්‍රදේශවල තමයි ඒ වගේ කටයුතු වෙන්නේ.යම් සමහර තැන් වලදී ඒ සම්බන්ධව ව්‍යාපෘතියක් වෙද්දී සභාවට මුදල් බැඳලා ඒ කටයුත්ත කරගෙන යනවා.හැබැයි අපිට ඒ නියම තොරතුරු එන්න ඕනි සභාවට.සභාපතිතුමාටවත්,ලේකම්තුමාටවත්,උප සභාපතිතුමාටවත් මේක හොය හොය ඉන්න බැනෙ.ගොඩක්ම දැව රැගෙන එන මාර්ග වල තමයි ඔය කටයුත්ත වෙන්නේ මම දන්න විදිහට.එතකොට ඒ සම්බන්ධව අපි හිතමු දර කැල්ලක් ගලවනව කියලා , එතකොට අපේ නදුන් මන්ත්‍රීතුමා දන්නවා රබර් කැල්ල ගලෝනවයි කියලා.අන්න එතකොට අහන්න ඕනි ඔබතුමා අවසර ගත්තද කියලා . ඒ වගේ අන්‍යෝන්‍ය අවබෝධයෙන් තමයි අපි මේ කටයුත්ත යන්න ඕනි. පනතේ ප්‍රතිපාදන තියෙනවා.මේවා ක්‍රියාත්මක වෙනවා.මන්ත්‍රීතුමා කිවුවා වගේ ගල් වලේ එ්ක අපිට සල්ලි බැඳලා තියෙනවා. මම දන්න විදිහට දිවුරුම්පිටිය ගල් වලේ එහෙම බැදල ඇති.දිවුරුම්පිටිය ගල් වලේ . ඒ ව්‍යාපෘති තියෙන කොට්ඨාශ වල,අපේ කොට්ඨාශ නායකයින්ගේ වගකීමක් තමා ,අපි ඒක දැනුවත් කිරීම. ඒ වගේ ව්‍යාපෘති තියෙන කොට්ඨාශ වල නායකයින්ව දැනුවත් කිරීමේ වැඩපිළිවෙක් ඔබතුමා කණ්ඩායම් රැස්වීමේදී කථාබහ කරල ඒ වගේ වැඩපිළිවෙලකට යන්න පුළුවන්.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපිටත් ඔය වගේ ප්‍රශ්නයක් ආවා, දිවුරුම්පිටිය වත්තේ පාර හැදුවට පස්සේ.කොට ලොරි අරගෙන එද්දී ඒ මිනිස්සු ඒකට විරුද්ධ වුණා. ඒකට ආරවුලක් වෙන්න ගියා.ඒ මිනිස්සුන්ට අවබෝධයකුත් නෑ. පාර රැකගන්න උත්සාහ කළේ.අන්තිමට මට කතා කරල ගිහිල්ල විකල්ප පාරක යන්න වුනේ. ලොකු ප්‍රශ්නයක් වෙන්න ගියේ.නීතියක් තිබ්බ නම් අපිට ඒක සමනය කරන්න තිබ්බා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

නීතිය තමයි අරක.ඇත්තටම ප්‍රාදේශිය සභාවට අපිට රුඳවුම් ගාස්තු ලබාගන්න පුළුවන්.ඊට පස්සේ ඒකට හානියක් වුණොත් දඩයක් පනවන්න පුළුවන්.ඒ නිසා අපි හැමෝමටම වගකීමක් තියෙනවා,සභාවේ වත්කම් ආරක්ෂාකර ගැනීමට.එහෙම කටයුත්තක් වෙනව නම් අපිව දැනුවත් කරන්න.නාමිකව හෝ නිර්නාමිකව.අපි එතකොට කාර්මික නිලධාරී මහතුන් අදාළ ස්ථාන වලට යවලා ස්ථානීය පරීක්ෂණයක් කරලා ,ඒ

සම්බන්ධයෙන් වෙන ඒ කාර්යය ඉටු කරනවා.ඒ යෝජනාවත් සභා සම්මත වුණා.අපේ මන්ත්‍රීවරු සියලු දෙනාගේ එකඟතාවයෙන්.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමාගේ 6.28. යෝජනාව ප්‍රාදේශිය සභාවට අයත් මාර්ගවලින් ව්‍යාපෘති සඳහා අසාමාන්‍ය බර වාහන, යන්ත්‍රෝපකරණ රැගෙන යාමට පෙර ප්‍රාදේශිය සභාවෙන් අවසර ගැනීම සහ යම් රැදවුම් මුදලක් තබා ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.29.සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**

**6.29.දැනට ක්‍රියාත්මක ගැටහැත්ත පොම්පීය ජල යෝජනා ක්‍රමය වෙනුවට ගුරුත්ව ජල යෝජනා ක්‍රමයක් යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දැනට අපේ ගැටහැත්තේ,අවට තියෙන ජල යෝජනා ක්‍රම තුනම අකර්මන්‍යයි.පායන කාලයට ළිං හිදිලා යනවා. එමනිසා මෙයට සුදුසු යම් වැඩපිළිවෙලක් අපි ගෙන ආ යුතුයි. දැනටමත් සභාව විදිහට අපි පාඩු ලබනවා එම යෝජනා ක්‍රම තුනෙන්ම.සභාපතිතුමනි, අපේ ගැටහැත්තඇළ නිකන් ගලන් එන්නේ. ඒකෙ ජල මූලාශ්‍රය තියෙනවා දෙයියාගල ,කජුගස්වත්ත,නාපාවල වගේ උඩහ .එ් ප්‍රදේශයේ ඇත්තටම බීමට සුදුසු ජලය තියෙන්නේ.ඇත්තටම හොඳ ජලය .ඉතින් ඒ වගේ ජල ප්‍රදේශයක් අල්ලලා අපි ගුරුත්ව ජල යෝජනා ක්‍රමයක්, ව්‍යාපෘතියක් ගෙනාව නම්, ගෙවල් 500 කට 600 කට ජලය දෙන්න පුළුවන්.එවිට අපිට වැඩි ආදායමක් ගන්න පුළුවන් සභාවට.එම නිසා මෙම යෝජනාව පිළිබඳව සලකා බලා ,ඉදිරියේදී සභාවට ආදායමක් ලැබෙන යෝජනාවක් ලෙස මම පෙන්වා දෙනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගැටහැත්ත ජල යෝජනා ක්‍රමය ප්‍රබල අභියෝගයක් පායන කාලයට.එතුමා යෝජනා කරපු ජල මූලාශ්‍රයක් අපි බලන්නත් ගියා.අපි ඒ විදිහට ජල යෝජනා ක්‍රමයක් ආරම්භ කරල බලමු.ඒ විදිහට අපි කටයුතු කරමු.

අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමාගේ 6.29. යෝජනාව දැනට ක්‍රියාත්මක ගැටහැත්ත පොම්පීය ජල යෝජනා ක්‍රමය වෙනුවට ගුරුත්ව ජල යෝජනා ක්‍රමයක් සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.30. සභාපතිතුමාගේ යෝජනා

සභාපතිතුමාගේ යෝජනා විදිහට මම යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

**6.30. ප්‍රාදේශිය සභාවේ මුදල් අයකැමි වෙත සතියේ වැඩ කරන දිනය තුළ ලැබෙන මුදල් ඊළඟ අනුයාත දිනයේ දී බැංකුවේ තැන්පත් කළ යුතුය.එසේ තැන්පත් කළ යුතු දිනය රජයේ නිවාඩු /ප්‍රසිද්ධ නිවාඩු හෝ රජය විසින් හදිසියේ ප්‍රකාශයට පත් කරන ලද බැංකු නිවාඩු වන දිනයන්හි දී එම මුදල් ඊට අනුයාත දින තුළ තැන්පත් කිරීම සඳහා සුදුසු බවට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
මේක කාර්යාලීය කටයුතු වලදී අත්‍යවශ්‍ය දෙයක්.දැනට තැන්පත් සිදු කෙරෙන්නෙත් මේ ක්‍රමයට තමා.සභා අනුමැතියක් ලබා ගන්න තමා මෙතනට යොමු කළේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.30. යෝජනාව ප්‍රාදේශිය සභාවේ මුදල් අයකැමි වෙත සතියේ වැඩ කරන දිනය තුළ ලැබෙන මුදල් ඊළඟ අනුයාත දිනයේ දී බැංකුවේ තැන්පත් කළ යුතුය.එසේ තැන්පත් කළ යුතු දිනය රජයේ නිවාඩු /ප්‍රසිද්ධ නිවාඩු හෝ රජය විසින් හදිසියේ

ප්‍රකාශයට පත් කරන ලද බැංකු නිවාඩු වන දිනයන්හි දී එම මුදල් ඊට අනුයාත දින තුළ තැන්පත් කිරීම සඳහා සුදුසු බවට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.31.සභාපතිතුමාගේ යෝජනා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

**6.31.සමස්ත ලංකා අන්තර් දිස්ත්‍රික් පාසල් ළමුන් ප්‍රවාහන සේවා සංගමයේ ඉල්ලීම පරිදි, පාසල් දරුවන් ප්‍රවාහනය කරන රථ ගාල් කිරීමට බස් රථ නැවතුම්පොලේ (පොළ භූමියේ ) යම් ස්ථානයක් වෙන් කර ගැනිමට හා දැරිය හැකි මාසික මුදලකට එම සංගමයට ලබා දීමට මම යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒක ඇත්තටම ලිපියකින් සමස්ත ලංකා දිස්ත්‍රික් පාසල් සේවා සංගමය ඇහැලියගොඩ, මඟින් අපිට ලිපියක් එවලා තිබෙනවා.එය කෙටියෙන් කියවන්නම්.එහි තිබෙන්නේ පාසල් 05ක දරුවන් ප.ව.1.30 වෙද්දී එළියට බහිනවා. එම ප්‍රවාහනය කරන වාහන ටික පාර දෙපැත්තේ තමයි නවත්තන්නේ.ඒ අයගෙන්ම තමයි යෝජනාව ආවේ.සාමාන්‍යයෙන් අපි කරන්න ඕන යෝජනාවක්.ඒ අයගෙන් මයි යෝජනාව ආවේ.අගය කරන්න ඕනි යෝජනාවක් .දරුවන්ගේ ආරක්ෂාව ගැන හිතලා ඒ අයත් යම් කිසි ගාණක් ගෙවන්න එකඟයි.අපි සභාව විසින් පනවන ගාණක් ගෙවන්න එකඟයි.පොළ භූමියේ එයාලට නිශ්චිත ඉඩක් වෙන්කරල දෙන්න පුළුවන්නම්,ඒ ගොල්ලෝ කිවුවා, පාසල් සමඟත් කතා කරල,දරුවන්ව ප්‍රධාන පාරට එන්න අවස්ථාවක් දෙන්නෙ නැතුව .කෙටි කාලයක් යයි.අර පැත්තෙන් පාසල් මාවත දිගේ හරි නැත්නම්, මෙතන පොළ භූමිය ඉස්කෝලෙ තමා මායිම. ඒ විදියට හරි.පාසල් වෑන් රථ සහ බස් රථ වලට ළමුන් නග්ග ගන්න ඒගොල්ලන්ට පහසුයි. ප්‍රධාන මාර්ගයට අවහිරයක් නොවන පරිදි. අපේ කාර්යභාරය විය යුත්තේ ඒකට අවශ්‍ය කරන සුදුසු තැනක් යෝජනා කරල , ඒකට මොකක් හරි තක්සේරුවක් අරගෙන, ඒගොල්ලන්ට යම් කිසි ගාස්තුවක් යෝජනා කරල,එයාල ඒකට එකඟ නම්,එයාල ඉස්සරහට කරගෙන යයි.එතනින් පස්සේ එන කාරණාව තමා අපිට කතා කරගන්න වෙන්නේ ඉස්කෝලත් එක්ක.පහසුද, සුදුසුද, නැද්ද මොකද කියලා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,නැවත බස් රථ ටික එතන ගාල් කරල තියෙද්දී පාසල අවසන් වෙන වෙලාවට මෙහෙට එන්නද?

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
පාසල් කාලය තුළ එතන නවත්තලා තියෙනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
පාසල් කාලය තුළ.පාසල ඇරෙන වෙලාවට සභාපතිතුමනි, එකපාරටම ප්‍රධාන පාරට බස් රථ ගන්නනවද? මොකක්ද කරන්නේ?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඔව් ඔව්.දැන් ඉන්නෙ සාමාන්‍යයෙන්,ඒ කියන්නේ පාරෙ නවත්තලා තියෙනව නේ.ඒගොල්ලන්ගේ යෝජනාව වෙන්නේ,ළමයි එතෙන්ට ඇවිත් නැගල,අවසන් වුණාට පස්සෙ එතනින් ඒ ගොල්ගොල්ලෝ බස් රථ ටික පිටත් වෙනවා

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
අපිට දැන් මෙහෙම සභාපතිතුමනි,පොළ භූමියේ ඉඳන් ධර්මපාල විද්‍යාලයට යන පාර තියෙනවා.අපිට ඒ පාර,මං අදහසක් විදිහට කියන්නේ,මං දන්නැ ඒක කොහොම කර ගන්න වෙයිද කියලා.වාහන ගමනා ගමනය නවත්තලා ඒ වෙලාවට අපිට යම්කිසි කාලයකදී එහෙම නම් එතනට ළමයි ටිකට එන්න පොඩි කාලයක් යනවා.ග්‍රවුන්ඩ් එකට එතනින් හදා ගන්න.මං හිතන්නේ ආයෙ වාහන ටික එක පාරටම ඉස්කෝලෙ ඇරෙන වෙලාවට මෙතනට එනව නම් තදබදයක් එයි.අදහස් දැක්වීම කියන්නේ, අපිට ආදායමක් උපයනවා වගේම මාර්ග තදබදයක් එයි.මේක වෙනම කමිටුවක වගේ ලොකුවට සාකච්ඡාවට ගන්න වෙනවා මේක.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම අපේ ජයසෝම මන්ත්‍රිතුමා කිවුව වගේ ඒ අදහස ගේන ගමන්,දිගුවක් වශයෙන් අපට සෙන්ටල් එක ගාව ඉඳලා අපේ පොළ භූමියට මහ ලොකු දුරක් නෑ.අපිට හැකිනම් ඒ ඉඩම් අපිට අයිතියක් තියෙනව නම් අපිට සාමාන්‍යයෙන් ළමයින්ට වාහන නෙමේ,ළමයින්ට ඒ පැත්තට යන්න මං තීරුවක් හදා ගන්න පුළුවන් නම්,මෙතන බ්ලොක් එක නවතිනවා.සභාපතිතුමා දැකලා ඇති ,මං හිතන්නේ හදිසි ලෙඩෙක් ආවත් යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ.ඒත් එක්කලාම මේක එන්න එන්නම දැන් පාරේ බස් රථ නැවැත්වීම වැඩි වෙලා තියෙනවා.ඉස්කොලෙ අරින්න පෙරත් 12 ට 1 ට ත් පාරෙ දෙපැත්තෙම නවත්තලා.ඒක වහ වහාම පොලිසියට දැනුම් දීලා එක විසඳුවොත් හොඳයි.මොකද 1.30 ට එන එක කමක් නෑ,ඒ ළමයි ගන්න එපැයි.නමුත්

ඊට කලින් ඉදන් බස් නවත්තලා තියෙනවා.ඒක නීතියට දැනුවත් කරන්න කියලා මං ඉල්ලීමක් වශයෙන් ඉල්ලනවා.හැබැයි පුලුවන් නම්,සෙන්ට්‍රල් එකේ ඉදලා පොළ භූමියට මං හිතන්නේ කෙටි දුරක් තියෙන්නේ.එතනින් මං තිරුවක් හදා ගන්න පුළුවන් නම් ළමයින්ට එතනින් පයින් හරි යන්න, ආයෙ බස් මෙතන ගහන්න ඕන් නෑ.අපේ ජයසූරිය මන්ත්‍රීතුමා කිවුව වගේබස් ටික එක පාර මෙහෙට එන්න ආවොත් ලොකු, අර වගේම ඒ කාල පරාසයේම බ්ලොක් එකක් තියෙනවා.මම අදහසක් හැටියට හා දිගුවක් වශයෙන් මං ගේනවා පුළුවන් නම් පාර පොඩ්ඩක් හදා ගන්න පුළුවන් නම්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මමත් සෙන්ට්‍රල් එකට ගියේ.සෙන්ට්‍රල් එකට මායිමක් තමා ඒ පොල භූමිය.එතන ඉස්සෙල්ලා පොඩි ගේට්ටුවකුත් තිබ්බා ග්‍රවුන්ඩ් එකට.එතකොට සෙන්ට්‍රල් එක තියෙනවා ප්‍රාථමිකේ තියෙනවා,ධර්මපාලෙ තියෙනා,අල්-අක්ෂා එක තියෙනවා.ඉස්කෝල පහක් කියලා කතා වුණා.පස්වෙනි ඉස්කෝලෙ,

**උප සභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

මෙයාලගෙ ලිපියේ තියෙනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

අස්ගගුලෙ එක සම්බන්ධ වෙන්න බැනේ.ඉස්කෝල පහට සෙන්ට්‍රල් එකට පිටිපස්සෙන් ගේට්ටුවක් දාලා ඇතුල් වීම ඒක කතා කර ගන්න පුලුවන්.එතකොට ධර්මපාලෙයි අල්- අක්ෂයි ,අල්- අක්ෂා එක තියෙන්නේ ධර්මපාලෙටත් එහා.එතකොට ඒ බස් රථ ටිකත් මෙතනට ගේනවද? නැත්නම් මෙයාල මේ රේල් පාරේ විතරක් ගහන බස් ටික ද දාන්නේ?ඉස්සර මෙතන සභාව යට තමයි ඉස් නැවැත්තුවෙ ,ස්කූල් බස්.බස් ටික ඔක්කොම මෙතන නැවැත්තුවේ කඩේකට බිස්නස් එකක්වත් කර ගන්න බැරි තරමට.ඊට පස්සෙ තමා රේල් පාර හැදුනට පස්සේ රෙල් පාරට ගියේ .එතකොට අපි ගැටලුව විසදගන්න ඕනේ රේල් පාරේ තියෙන බස් ටික ද අයින් වෙන්නේ ?නැත්නම් පනාවල පාරේ ගහන බස් ටිකද මේ ගේන්න හදන්නේ.ආයෙ අපි ස්ථානයක් දීලා අපිට ට්‍රැෆික් එක අඩු වෙන් නැද්ද?අපේ නගරේ තිබ්බ්ච කඩ ටික කඩලා පාර ලොකු කරලා,කඩේ අයිතිකාරයට පාරෙ එන බිස්නස් එක එන් නෑ.එතකොට පාරේ වාහන නවත්වන්න බෑ.ත්‍රිවිල් ටිකයි,ලොරි ටිකයි,වෑන් ටිකයි,බස් ටිකයි ගැහුවට පස්සේ පාරේ වෙලළදාමක් නෑ.අපි වරිපනම් එකතු කරන්න ගියාට පස්සේ එයාල කියනව අපිට පාර්කින් නෑ. එයාලගෙ ඉඩම තමා අපි කඩලා ගත්තේ.දැන් රේල් පාර ආවොත් ,රේල් පාරෙත් වාහන ගමන් කරන්න බැරි වෙනවා.ඒ වාහන ටිකත් එනවා මහ පාරට.එතකොට අපි මේක සාකච්ඡා කරලා මේ තියෙන වාහන ටික ඔක්කොමයි,ඊට පස්සේ ලොරි පාර්ක්,ත්‍රිවිල් පාර්ක්,වෑන් පාර්ක් ටික තියෙනවා ,ඒවා යම්කිසි ස්ථානයකට ගෙනියන්න මුළු ඔක්කොම එක පිළිවෙලකට දා ගත්තොත් මේ ගමන්ම ලේසි වෙනවා.දැන් අපේ පරණ පොළ භූමිය තියෙනවා,ඒ ඉඩමත් තියෙනවා.ඒවගේ තැනකට මේක යන්න වෙයි. නැත්නම් පොළ භූමියේ බස් රථ 10 ක් ගහපුවහම ඉඩ ඉවරයි.ආයෙ ඔකෙ ඉඩ තියෙන්නේ ,මේ පැත්ත ස්ටෑන්ඩ් එකට පාවිච්චි කරනවා.ජේම්ස් හෝටලය ගාව ටික විතරයි ඉතුරු වෙන්නේ.එතනත් බස් 10 ක් ගහපුවහම ඉවරයි.බස් 10 යි වෑන් 5 ක් ගහන්න පුලුවන් ඕන්නම්.එයාල එන මාර්ගය මොකක්ද?අතනින් ගන්න බෑ කියයි. ජේම්ස් එක පැත්තෙන්.එතකොට එයාලට එන්න දෙන්න වෙන්නෙත් මේ පැත්තෙන්.ඊට පස්සේ මං හිතන්නේ තවත් ආයතනයකට ඉඩමක් බදු දීලා තියෙනවා.වාහන පාර්කින් එකකට.ඩීප් කෝනර් එකට.මං නිවරදි නම්.ඉස්සර දීපුවා දැන් දිලා තියෙනවද දන්නෑ.ඒ වගේ ප්‍රශ්න තියෙනවා. මේ ටික ඔක්කොම එකතු කර ගන්න වෙයි. නැත්නම් මේ රේල් පාරේ බස් 20 කට 30 කට වැඩිය නවත්තනවා.ඒටික ඔක්කොම ගිහින් දැම්මහම බස් ස්ටෑන්ඩ් එක නැති වෙනවා ඊලගට.යොජනාව හොඳයි. මම යෝජනාවට විරුද්ධ වෙනවා නෙමෙයි.මේ ගැටලුවට ක්‍රමවේදයක් හදා ගන්න වෙනවා.නැත්නම් වෙන කොහෙ හරි තියෙන වාහන ටිකක් පාර්කින් එකට දාන්න ඉඩ තියෙනවා.අපේ පුස්තකාලෙ ගාව ඉඩම තියෙනවා.ඒ ඉඩමෙත් එහා පැත්තෙ දැනට වාහන පාර්ක් එකක් විදිහට තමා දැනට පාවිච්චි වෙන්නේ.එ් වගේ මොකක් හරි ,හරි ක්‍රමවේදයක් හදා ගත්තොත් මොකක් හරි කරන්න පුලුවන් වෙයි.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඇත්තටම ඇහැලියගොඩ තියෙන ලොකුම ප්‍රශ්නය මේක.ඔබතුමත් දන්නවා ධර්මපාලෙයි ජාතික පාසලයි කියන්නේ ළමයි 5000 කට වැඩි සංඛ්‍යාවක් එළියට එනවා මෙතනින්.එතකොට ළමයි 10000 කට කිට්ටුව ළමයි සංඛ්‍යාවක් නගරයට එනවා ඉස්කෝලෙ ඇරෙන වෙලාවට .ඉතින් මම ඒ බස් හිමියොත් එක්ක එකතු වෙලා සාකච්ඡා කරලා අපි තීන්දුවක් ගත්තා එහිදී පාරේ නවත්වන්න එපා කියලා .මොකද ළමයි ටික එනකොට පාරේ එහා ගැත්තෙ බස් තිබුණහම,කහ ඉර බලන්නැ පනිනවා.මොපියොත් ඇවිල්ලා ඇදගෙන යනවා.නැත්නම් වෙන වාහනේකට යන්න බෑ.ප්‍රධාන පාරක් පාරේ දැන් තමයි ,මෑත කාලෙ තමයි දැන් ඔය නවත්තගෙන තියෙන්නේ බස් ටික.ජාතික පාසල ඉස්සරහත් නවත්තගෙන ඉන්නවා. මෙතන නවත්වන්න බෑ.මේක ප්‍රධාන පාරක්.එහෙම නවත්තන්න බෑ.විශාල තදබදයක් ඇති වෙනවා ඒ වගේ බස් එකක් තියෙන වෙලාවට.මෙක ඉස්සරහින් ළමයි යන්න ගියොත්,වාහනයක් ආවොත් වදිනවා.මේකට විකල්පයක් ඕනෙමයි.මේ වෙනකොට පොල භූමිය සුදානම් කරලා තියේ නම් තාවකාලිකව හරි ඒක සාකච්ඡා කරලා ඒ වගේ තැනකට ගත්තොත් හොඳයි.රේල් පාර ඉස්සරහට යනවා.රේල් පාරේ තමා බස් ගොඩක් තියෙනනේ.දැන් ගිහින් බැලුවත් ඉස්කෝලෙ බස් පාරේ දිගටම තියෙනවා.කාලීන අවශ්‍යතාවයක් මේක.ඒක හින්දා මේකට විසඳුමක් ගන්න ඕනේ.අපේ මන්ත්‍රීතුමා කිවුව වගේ සෙන්ට්‍රල් එක ළඟින් ගේට්ටුවක් තියෙනවා.ළමයින්ටත් එතනින් එන්න පුළුවන්.ධර්මපාලෙ ළඟ ඉදන් එතනට එන්න පුළුවන්.බස් එක එතනට යන එක නෙමෙයි බස් එක ළඟට ළමයි ගෙන්න ගන්න තත්ත්වයකට පත් කළොත් ඕක ලේසියි කියලා මට හිතෙන්නේ.නැත්නම් බස් එක ඉස්කෝලෙ ඇරෙන වෙලාවට අරහෙන් මෙහෙන් දාන්න ගියොත් එහෙම මේකෙ මොකවත් කර ගන්න බැරි වෙනවා, මේ තියෙන තත්ත්වෙත් එක්ක.බස් ටික පෝලිමේ ගිහින් ඒ ගොල්ලොත් ගහ ගන්නවා.ළමයි

ටිකත් ගහ ගන්නවා.ප්‍රශ්න ගොඩකට මුහුණ දෙන්න වෙනවා.පොලීසියටත් පාලනය කරන්න බැරි තත්ත්වයකට.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒකට දිගුවක් ඉදිරිපත් කරන්නම්.ඉස්සෙල්ලා යොජනා කරපු පාසැල් මාවත ගත්තොත් බස් එකක් යන්න බෑ, පාසැල් මාවතේ.සාමාන්‍යයෙන් වෑන් එකක් වගේ යන්න පුළුවන්.ඒක සංවර්ධනය නොකර බස් එකක් නම් යන්න බෑ.ළමයි ටික දැනට පොළ භූමියට ගෙන්න ගන්න ගියොත් ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳ ලොකු ප්‍රශ්නයක් වෙනවා.ඒ අතුරු මාර්ගය ඉතාම සංකිරණයි.නිතිවිරෝධි වැඩ බොහොමයක් සිදු වන මාර්ගයක් ඒක.ඒකට වෙනම පියවර ගන්න ඕනේ.ළමයින්ගේ අරෙක්ෂාව විශේෂයෙන් ම තහවුරු කර ගන්න වෙනවා, එකට ගෙන්න ගැනීමේ දී.ඒක එකක්. අනික අපි හැමදාම කතා කරනවා පොළ ගැන.පොළ ගැන කතා කරන්නේ වෙළෙන්දො එක්ක සාකච්ඡා නොකර.වෙළෙන්දො එක්ක සාකච්ඡා නොකර මේ වගේ ප්‍රෙවිශයක් ගන්න එපා.මං ගිය සභාවෙත් මතු කළා.සභාපතිතුමාගේ පියත් පොලේ වෙලදාම් කළා කියලා එදා කිවුවා.එකටත් ඒ අනන්‍යතාවක් දෙන විදිහට, යම්කිසි තහවුරුවක් දෙන විදිහට සියලු කටයුතු ක්‍රියාත්මක කිරිම වැදගත් කියලා මං කියනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක මහා සංකිරණ මාතෘකාවක්.ඔබතුමයි අපියි හිටපු සභාවෙත් අපි ඔය ගැන කතා කරලා යම් යම් ගැටලු වලට පත්වෙලා අවසාන තීන්දුවක් ගන්න ගිහාම ඒක බොහොම සංකීරණ ප්‍රශ්නයක් වෙනවා.මං විශ්වාස කරනවා,අපේ ආරියදාස මන්ත්‍රිතුමා ඉන්නවා ධර්මපාල ජාතික පාසලේ නියෝජ්‍ය විදුහල්පතිතුමා,අපේ දිලීන් මනත්‍රිතුමා ඉන්නවා ඇහැලියගොඩ ජාතික පාසලේ ආචාර්යවරයෙක්.ඒ වගෙමසුමිත් මන්ත්‍රිතුමාට ගයාෂාන් මන්ත්‍රිතුමාට දාල,ඔබතුමා කමිටුවක් පත් කර ගන්න.ඒ කමිටුවට භාර දෙන්න එතනදී ඉස්කොලෙනුත් ගුරුවරයෙක්,ගුරුවරියක් සම්බන්ධ කර ගෙන කමිටුවක් හදා ගන්න.ඒ කමිටුවේ නිර්දේශයක් දෙන්න කියන්න අපිට,සභාවට ඉතාමත්ම පොඩි කලෙකදී,මාසයක් හරි දෙකක් හරි අරගෙන, යෝජනාවක් දෙන්න කියන්න.අන්න ඒ යෝජනාව අනුව අපි තින්දුවක් ගමු.ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම අපේ අර පරණ බස් හෝල්ට් එක තියෙනවනේ.ඒක ඇත්තටම කවුරුත් පරිහරණය කරන් නෑ.ඕක මං හිතන්නේ දැරණියගල විවිධ සේවා සමුකාරයට අයිති එකක්.අපි ඒක බදු පදනම මත අපි අරගෙන,අපි ඕක පාර්කින් එකක් කළොත් මොකද වෙන්නේ.ඕක මොකද වවුන් එක මැද තියෙන්නේ.එතකොට සභාවට ආදායමකුත් එනවා.ඒ ගැනත් මේ වෙලාවේ අවධානය යොමු කළොත් හොඳයි කියලා මං යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
සුජීව මන්ත්‍රිතුමා කිවුව වගේ කමිටුවක් අපි නම් කර ගමු.කැමති මන්ත්‍රිවරු ඉදිරිපත් වෙන්න.නම් කරන්න කලින්.

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ඔබතුමා අවසර දෙනව නම් මම නම් ටික කියන්නම්.උපසභාපතිතුමාගේ මුලිකත්වයෙන් අපි කමිටුවක් පත්කර ගමු.සභාපතිතුමා අද නැති නිසා.දිලීන් කරුණාපාල මන්ත්‍රිතුමා, එච්.ආරියදාස මන්ත්‍රිතුමා, සුමිත් ප්‍රියංකර මන්ත්‍රිතුමා,ගයාෂාන් චින්තක මන්ත්‍රිතුමා, සමන්සිරි විජේසිංහ මන්ත්‍රිතුමා, චන්දන අතුරලිය මන්ත්‍රිතුමා, වජීර සුසන්ත ජයසෝම මන්ත්‍රිතුමා,අමිල නිමේෂ් මන්ත්‍රිතුමා,රණවීර හේවගේ මන්ත්‍රිතුමා, මාලින්ද මුදන්නායක මන්ත්‍රිතුමා, ලසිත් දීපාල් මන්ත්‍රිතුමා,ප්‍රියන්ත කරුණාරත්න මන්ත්‍රිතුමා, රථවාහන පොලිස් නිලධාරි මහත්මයෙක්, මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ නිලධාරි මහත්මයෙකු, සමස්ත ලංකා අන්තර් දිස්ත්‍රික් පාසල් ළමුන් ප්‍රවාහන සේවා සංගමයේ සභාපතිතුමා, සභාවේ ලේකම්තුමා, පාසැල් විදුහල්පතිවරු, පාසලේ ගුරුවරයෙක් සහ ගුරුවරියක්, මෙම කමිටුව සඳහා සම්බන්ධ කර ගන්නවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපේ මන්ත්‍රිවරු ඉස්සෙල්ලම සැලැස්මක් හදාගමු.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.31. යෝජනාව වූ සමස්ත ලංකා අන්තර් දිස්ත්‍රික් පාසල් ළමුන් ප්‍රවාහන සේවා සංගමයේ ඉල්ලීම පරිදි, පාසල් දරුවන් ප්‍රවාහනය කරන රථ ගාල් කිරීමට බස් රථ නැවතුම්පොලේ (පොළ භූමියේ ) යම් ස්ථානයක් වෙන් කර ගැනිමට හා දැරිය හැකි මාසික මුදලකට එම සංගමයට ලබා දීම සඳහා වූ යෝජනාවට සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සඳහාදිලීන් කරුණාපාල මන්ත්‍රිතුමා, එච්.ආරියදාස මන්ත්‍රිතුමා, සුමිත් ප්‍රියංකර මන්ත්‍රිතුමා,ගයාෂාන් චින්තක මන්ත්‍රිතුමා, සමන්සිරි විජේසිංහ මන්ත්‍රිතුමා, චන්දන අතුරලිය මන්ත්‍රිතුමා, වජීර සුසන්ත ජයසෝම මන්ත්‍රිතුමා, අමිල් නිමේෂ් මන්ත්‍රිතුමා, රණවීර හේවගේ මන්ත්‍රිතුමා, මාලින්ද මුදන්නායක මන්ත්‍රිතුමා, ලසිත් දීපාල් මන්ත්‍රිතුමා, ප්‍රියන්ත කරුණාරත්න මන්ත්‍රිතුමා, රථවාහන පොලිස් නිලධාරි මහත්මයෙක්, මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ නිලධාරී මහත්මයෙකු, සමස්ත ලංකා අන්තර් දිස්ත්‍රික් පාසල් ළමුන් ප්‍රවාහන සේවා සංගමයේ සභාපතිතුමා, සභාවේ ලේකම්තුමා, පාසැල් විදුහල්පතිවරු, පාසලේ ගුරුවරයෙක් සහ ගුරුවරියක් යන මන්ත්‍රිවරුන්ගෙන් හා ඒ හා සම්බන්ධ නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවේ නිර්දේශ මත සැකසූ යෝජනාවක් ඉදිරි සභාවකට යොමු කොට එය සභාවේ සාකච්ඡා කිරීමෙන් පසු මහා සභා අනුමැතිය ලබා දීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.32.සභාපතිතුමාගේ යෝජනාව

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

**6.32.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා 2026 වර්ෂයේ දී ලබා ගැනීම වෙනුවෙන් සැපයුම් කරුවන් ලියාපදිංචි කිරිම,ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වන කොන්ත්‍රාත්කරුවන් ,සමිති හා සංවිධාන ද ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීම දිනමිණ හා තිනකරන් පුවත්පතේ පළ කිරිමට මම යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.32. යෝජනාවඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා 2026 වර්ෂයේ දී ලබා ගැනීම වෙනුවෙන් සැපයුම් කරුවන් ලියාපදිංචි කිරිම,ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වන කොන්ත්‍රාත්කරුවන් ,සමිති හා සංවිධාන ද ලියාපදිංචි කිරීම සඳහා පුවත්පත් දැන්වීම දිනමිණ හා තිනකරන් පුවත්පතේ පළ කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.33.සභාපතිතුමාගේ යෝජනාව

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

**6.33.පුෂ්පාරාම විහාරස්ථානයට ප්‍රවිශ්ය වන මාර්ගය සංවර්ධනය කිරිම . අත්‍යවශ්‍ය කාර්යක් බැවින් එය ඉටු කිරිම සඳහා මම යෝජනා කරමි.(මේ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමිය වෙත ද ඉල්ලීම් කර ඇත.)**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒක අනිවාර්යෙන් හැදෙන්න ඕන පාරක් අත්‍යවශ්‍ය පාරක්.මං අහන්න කැමතයි ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන ඒ සඳහා යොදා ගන්න පුළුවන්ද කියලා?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපිට ආණ්ඩුකාරතුමියගෙන් ඇවිල්ලා තියෙනවා ලිවුමක්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
අපිට ප්‍රශ්නයක් නෑ.අපිට එකඟතාවය දෙන්න පුළුවන්.අනාගතයේදී ප්‍රශ්නයක් නොවෙනවා නම්.මං දන්න විදිහට ඒ විදිහට ප්‍රතිපාදන වෙන් කරන්න,අවශ්‍ය ප්‍රතිපාදන තියෙනවද කියන එක ගැටලුවක් තියෙනවා.මං දන්න විදිහට,මගේ දැනුම අනුව.හැබැයි ආණ්ඩුකාරතුමිය අනුමත කරනව නම්, මේක කරන්න කියලා කියනව නම් ප්‍රශ්නයක් නෑ, කරන්න වෙනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපි පළාත් පාලන කොමසාරිස්ගෙන්,ආණ්ඩුකාරතුමියගෙන් විමසලා ඒ යෝනාව සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමා, ඇත්තටම පුෂ්පාරාම පන්සල කියන්නේ,නාරද හාමුදුරුවො කියන්නේ මට උගන්නපු හාමුදුරුවෝ.අපේ ප්‍රදේශයේ සැම පොදු කටයුත්තකදීම නායකත්වය ගන්නවා.ඒනිසා උන්නාන්සේගේ ඉල්ලීම අපි අනිවාර්යෙන්ම අපි සභාවක් විදිහට කල යුතුයි.ඒක වම්පසද දකුණු පස ද කියලා නැ හොඳ යෝජනාවක්.මේකෙ තියෙන්නේ ආණ්ඩුකාරතුමියටත් ලිපියක් යවා ඇත කියලනේ තියෙන්නේ.ඒ වුණාට අපිට ඕනේ සභාපතිතුමා අපිට ඕනේ ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය.අනුමැතියේ ලිපිය තමයි අමුණන්න ඕනේ.මොක අපි යම් කටයුත්තක් කරන්න ඕනේ නිත්‍යානුකූලව , මේවා අධිහාරයට ලක්වෙන කාරණා, මේ සියලු දෙනාම.ඒනිසා ඔබතුමා ඒක නිත්‍යානුකූල මාර්ගයෙන් ඉෂ්ඨ සිද්ධ කරලා දෙන්න.නැත්නම් මේක ලොකු ගැටලුවකට පත්වෙන්න වෙනවා.දැන්ම නෙමේ 2029 අපේ ආණ්ඩුව ආවට පස්සේ, යම් යම් කාරණා වලදී අපිට මේක අධිහාරෙට ලක්වෙයි.ගොඩක් වෙලාවට අපේ මන්ත්‍රිවරු ගෙවල්වල ඉන්නත් පුළුවන්.දැන්ම ඉඳන්ම ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා,අනාගතයේදී ගැටලුවකට පත් නොවෙන්න වැඩ කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.අනිවාර්යෙන්ම මෙය ආණ්ඩුකාරවරියගේ අනුමැතියට යටත්ව ම පමණක් සිදු කළ යුතුයි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.33. යෝජනාව පුෂ්පාරාම විහාරස්ථානයට ප්‍රවිශ්ය වන මාර්ගය සංවර්ධනය කිරිම . අත්‍යවශ්‍ය කාර්යක් බැවින් එය ඉටු කිරීම (මේ

සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමිය වෙත ද ඉල්ලීම් කර ඇත.) සඳහා වූ යෝජනාව ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව ඉදිරි කටයුතු කිරීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.34.සභාපතිතුමාගේ යෝජනාව

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

**6.34.ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන පුස්තකාල හතර සඳහා වාර්ෂිකව පොත් මිල දී ගැනීම සඳහා රු 800,000.00 ක මුදලක් සභා අරමුදලින් යෙදවීමට මහා සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරමි.**

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
මේක ඇත්තටම 2025 අයවැයේ වැය ශීර්ෂයේ වෙන් කරලා තියෙන යොජනාවක්.ඇත්තටම ලක්ෂ 10 ක් වෙන් කරලා තියෙනවා.එකෙන් පනස් ගාණක් අරන් තියෙනවා.ලක්ෂ අටක් අපිට වියදම් කරන්න පුළුවන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පාඨකයන්ට අවස්ථාව දෙන එක හොඳයි අපේ අරමුදලින්.අපි දන්නවා හෙට අනිද්දා මහජන පුස්තකාලය නඩත්තු කිරීමක් සිද්ධ වෙනවා.පඨකයෝ කිපදෙනෙක්ම මාත් සමඟ කතා කරද්දි කිවුවේ එයාලට ඒ මාස කිපය තුළ පුස්තකාලය පාවිච්චි කරන්න අවස්ථාව අහිමි වෙනවද කියලා ඇහුවා.මං කිවුවා ඒ ගැන මං සභාවේ කතා කරලා ඒකේ අවශ්‍යතාවය කියන්නම් කියලා.ඒ නඩත්තු කාලයේදී ඒ පුස්තකාල පොත් පරිහරණය කරන්න පුළුවන්ද? පුස්තකාලය ක්‍රියාත්මකද? නැද්ද?ක්‍රියාත්මක වෙන්නේ කොහෙද?පොඩ්ඩක් ඒ ගැන අපිට අදහසක් ඉදිරිපත් කරන විදිහට ඔහතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඇත්තටම අපි යොජනාවක් දාල තියෙනවා අහලියගොඩ පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීමට.ඒක හොඳටම තෙමෙනවා.පොතුත් තෙමිලා ඒකෙ ඉන්න අය සැහෙන අපහුතාවට පත් වෙනවා ඒවා ආරක්ෂා කර ගන්න බැරුව.ඒ වහල දැන් අලුත්වැඩියා කරන්න ටෙන්ඩර් දාල තියෙනනේ.ඒගොල්ලන්ට වැඩ පටන් ගන්න අපි ඇතුළ අස් කරලා දෙන්න ඕනේ.ඒකට අපි ඒකට සුදුසු තැනක් හෙවුවා.කුලියට හරි ගන්න.උපරිම මාස එකහමාරක වගේ කාලයක් යයි.ඒ අනුව අපි තැන් ගොඩක් හෙවුවා.අපිට දැනට තැනක් තියෙනවා, ඇහැලියගොඩ රෝහලේ ගොඩනැගිල්ලක් තියෙනවා.පොත් වලට ආරක්ෂාවත් හොඳයි.පොත් බැහැර දීමේ කටයුත්තත් එතනම සිද්ධ කරන්න පුළුවන්.පුවත්පත් බැලීමට අංශයක් එතන නෑ.ඒ සඳහා අපිට ප්‍රාදේශීය සභාව තුළ තැනක් වෙන් කරලා ගන්න වෙනවා.කෙටි කාලෙකට.කලින් යොජනාව තිබුණේ අපේ තොරණගොඩ ප්‍රාදේශීය සභාවට ගෙනියන්න.එතනත් අලුත්වැඩියාව සඳහා වහලය ගලවනවා.ඒ නිසා එතනත් බැරි වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම මීට ප්‍රථම පුස්තකාල සම්බන්ධ යොජනාවක් කරාම කිවුවා, තිබෙන ස්ථානයේ ගොඩනැගිලි ඉදිකරන්න කරන්න බෑ කිවුවා. කෙසේ වෙතත් අලඅත්වැඩියා කරන එක හොදයි එත් එක්ක ම මම යෝජනා කළා ඒකේ ව්‍යුහාත්මක වෙනසකුත් ඇති කරන්න කියලා.පත්තර බලන්න යන්න තියෙන්නේ ඇතුළට ගිහිල්ලා පොඩි තීරුවක තමා.ඒකෙ කිසිම පහසුකමක් නෑ.මං උදාහරණයකට කිවුවේ.ඒක නිසා ඒක පාඨකයොත් එක්ක සාකච්ඡා කරලා ඒක ව්‍යුහාත්මක ස්වභාවයත් වෙනස් කරන ක්‍රමවේදයකට යන්න.අනිත් එක අදහසක් ආවා රෝහලේ පුස්තකාලය ස්ථාපනය කරවා කිවුවේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
රෝහලේ opd එකට පිටිපස්සේ දෙවැනි බිල්ඩින් එකේ.දැනට පාවිච්චියට ගන්නේ නැති එකක්.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
හරි.මම දැන ගැනීමට ඇහුවේ.රෝහල කියන්නේ වෙනම පරිශ්‍රයක තිබිය යුතු ස්ථානයක්.රෝහලට යම් රාමුවක් නිර්මාණය කරලා තියෙනවා රෝහල් භූමිය පරිහරණය කරන්න. පාඨකයන්ට ඕන වෙලාවක යන්න පුළුවන්ද?ප්‍රෙවිශ මාර්ගයක් වෙන් කරලා හදනවද? ඒක කොහොමද සම්බන්ධිකරණය කරන්නේ? ඒ දෙක අතර, මොකද වෙනම සිකුරිටි එකක් දාලා රෝහල් පරිශ්‍රෙය් තියෙන්නේ වෙනම පරිසරයක්.මං හිතන්නේ අපේ ලේකම්තුමා සෞඛ්‍ය අංශයට සම්බන්ධ වෙලා ඉඳලා ආව නිසා ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මං ඉල්ලීමක් කරනවා.මොකද පුස්තකාලය තියෙන්න ඕන අනිවාර්යෙන්ම පාඨකයින්ට.දැන් රෝහල් භූමිය පාවිච්චි කිරිමේ දී අපි හරි පරිස්සම් වෙන්න ඕනේ.රෝගීන්ට බාධා නොවෙන්න ඕනේ.ඒක පරිහරණය කරන ක්‍රමවේදයක් දැන ගන්න පුළුවන්ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපිට කාරක සභාවක් කරන්නත් පුළුවන් ලේකම් මහත්තයටත් අදහසක් දැක්වීමට පුළුවන් නිසා ඒ සම්බන්ධව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමට මම යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මහ සභාව කාරක සභාවක් බවට පත්විය.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත්කිරීමට මම යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකසභාපතිතුමාගේ 6.34. යෝජනාව.ප්‍රාදේශිය සභාව යටතේ ක්‍රියාත්මක වන පුස්තකාල හතර සඳහා වාර්ෂිකව පොත් මිල දී ගැනීම සඳහා රු 800,000.00 ක මුදලක් සභා අරමුදලින් යෙදවීමට මහා සභාවේ අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.35-I සභාපතිතුමාගේ යෝජනාව

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

**6.35-I ගැටහැත්ත සති පොළ භූමියේ හරක් මස් හා ඌරු මස් වෙළඳාම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් (තඩ කාමරයක් ) සකස් කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඇත්තටම ඒ කියන්නේ ප්‍රාදේශීය සභාවට මේ අවුරුද්දේ ඉඳන් ප්‍රාදේශීයසභාවේ වැටුප් ප්‍රතිපූර්ණය කරන එක 20% විස්ස අඩු වෙනවා.අඩු වෙනවා 100% දක්වා.මේ අවුරුද්දෙ 20% ක් අඩුවෙනවා.ලබන අවුරුද්දේ 40% ක් වෙනවා ඒක.ඊගාවට 60% යි ඊගාවට 80% ඊගාවට.2028 2029 වගේ වෙද්දි අපිට ප්‍රාදේශීය සභාව විසින් තමයි සම්පූර්ණයෙන් ම සභාව පවත්වාගෙන යන්න තියෙන්නේ.ඒකට අපිට සැලසුම් තියෙනවා.අපි ඒක අභියෝගයක් විදිහට භාර ගන්නවා.ඒක අපිට කරන්න පුළුවන්.සභාව විසින් අපි ආදායම් වැඩි කර ගත යුතුයි.ඒ සඳහා ඔබතුමියන් තුමන්ලාගේ තියෙන යෝජනා,ආදායම් වැඩි කර ගැනීම් සඳහා වන යෝජනා,සුජීව මන්ත්‍රීතුමා පහුගිය සභාවාරයේ දී එහෙම යෝජනා ඉදිරිපත් කළා.එවැනි යෝජනා අපිට අවශ්‍යයි.අපේ මන්ත්‍රීවරුන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා.අවුරුදු 4 ම සැලැස්මක් අපි සකස් කරමින් යනවා.අපි ඒකට මහා සභාවටත් දානවා.ඒකට හැමෝම සම්බනධ වුණා.මේක ඇත්තටම වුණේ ප්‍රාදේශීයසම්බන්ධීකරණ කාර්යාලය හරහා සිද්ධ වුණේ.ඔබතුමන්ලාත් යෝජනා දෙන්න.සාධනිය යෝජනා ඉතා ප්‍රබලයි.

ඒ විදිහට ගැටහැත්ත පොළ භූමියේ හරක් මස් හා අරු මස් වෙළඳාම සඳහා සුදුසු ගොඩනැගිල්ලක්,මේක ටෙන්ඩර් කරන්න පුලුවන්.ගොඩනැගිලි දෙකක් විදිහට අපිට හදන්න වෙයි.ඒ සම්බන්ධ ඔබතුමන්ලගේ අදහස් ඉදිරිපත් කරන්න පුලුවන්.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක ඇත්තටම කාලෝචිත යොජනාවක්.මේක ඉක්මනින්ම වගේ කර ගන්න පුළුවන් නම් වඩා හොඳයි. මොකද සෙනගත් ගැවසෙන ඒ ස්ථානයක්, මේ පොළ භූමිය.පොල භූමියේ මේ අවශ්‍යතාවය තදින්ම තියෙනවා.මේකයි මාළු වෙළඳසැලයි ඒ ටික අපිට නැවත ප්‍රතිසංස්කර ගන්න ඕනේ.මේ වැඩපිළිවෙළ බොහොම ඉක්මනින් ම ක්‍රියාත්මක වෙනව නම් හොඳයි.සභාවටත් ආදායමක් ගන්න පුළුවන් මේකෙන්.සභාව සතු දේපලක්නේ.සභාවට ගොඩක් ආදායමක් ගන්න පුළුවන් නිසා යම් වැඩ පිලිවෙලකට ගිහිල්ලා යම් මුදලක් ඒකට වෙන් කරලා කඩ ටික නැවත හදලා ගත්ත නම් හොඳයි කියලා හිතනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2026 සඳහා ටෙන්ඩර් දැම්මනේ මේ පොළ.ටෙන්ඩර් එක ගත්තද කවුරු හරි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගත්තෙ නැ කවුරුත්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ටෙන්ඩර් එක ගන්නේ නැති වෙලාවක තමා අපි අලුතෙන් හරක් මසුයි උරු මසුයි කඩවල් දෙකක් පටන් ගන්න යන්නේ.ඒකෙ සක්‍යතාව කොහොමද කියන එක පොඩි ගැටලුවක් තියෙනවා මට නම්.අපේ මුස්ලිම් මන්ත්‍රීවරු දෙන්නෙක් ඉන්නවා.ලැජ්ජාවට කියන් නැතුව හිටියට එයාලගේ ආගමේ තියෙනවා උරු මස් පිළිබඳ ප්‍රශ්නයක්.ඒ කඩ කාමර දෙක හදනකොට ඈතින් ඈත හදන්න ඔනේ. නැත්නම් මුස්ලිම් අය ගිහිල්ලා හරක් මස්

ගන්නැ.හරක් මස් ගන් නැතුව යනවා.ඒක සංස්කෘතික ගැටලුවක් ඒක.ඒ වගේම ටෙන්ඩර් ගත්තෙ නැති ප්‍රශනෙටත් විසඳුම් හොයන්න ඕනේ.අපේ ගැටහැත්තෙ මන්ත්‍රිවරු එකතු වෙලා.මං දන්නැ ඉතින් .ටෙන්ඩර් එක වැටුන් නෑ 2026.අපි නැවත ටෙන්ඩර් දැන්වීමක් සඳහා යනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අමිල මන්ත්‍රීතුමා ගිස සැරේ යෝජනා කළා පොළ භූමිය ඉතාමත් අවිධිමත් අක්‍රමවත් කියලා.මේ දෙකවත් ස්ථාපිත කරලා නැත්නම් මේ දෙකවත් ස්ථාපිත කරන්න කියලා තමා යෝජනා කරන්නේ.

**සභික අයි.එච්.රණවීරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පොළ භූමිය සඳහා කමිටුවක් පත් කර ගෙන තියෙන්නේ.ඒ කමිටුව හරහා මේ ටික සඳහා ක්‍රියාත්මක වීමක් සිදු වෙනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මීට මාස දෙකකට කලින් සභාවෙදි යෝජනාවක් ආවා,ගැටහැත්ත පොළ භූමිය කාට හරි බදු දෙනවා කියලා.පළවෙනි ටෙන්ඩරය ගන්නැ දෙවැනි ටෙන්ඩරය දෙනවා කියලා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඒක මන්ත්‍රීතුමා ඒක පොළ භූමිය නෙමේ, ඒ බහු කාර්ය ගොඩනැගිල්ල.පොළ භූමිය නෙමේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
පොළ භූමිය කියන්නේ කොයි ටිකද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
පොළ භූමිය කියන්නේ ඊට පිටිපස්සේ, තියෙන පොළ භූමිය.ඒ දෙක දෙකක් විදිහට තමා බදු දුන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපතිතුමාගේ 6.35.-IයෝජනාවI ගැටහැත්ත සති පොළ භූමියේ හරක් මස් හා ඌරු මස් වෙළඳාම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් (කඩ කාමරයක් )සකස් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.35 – II සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනා

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

**6.35-II යාය පාරට සමුපකාරය ළඟින් යන පාරේ අල්ලා ඇති ඉන්ටලොක් කැට ගෙවී විනාශ වීමෙන් ඇති වී ඇති කොටස පිළිසකර කර ගැනීම මම යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සම්පූර්ණ පාර හදන්න නෙමේ ඉල්ලන්නේ,එතන වංගුවේ ඉන්ටලොක් අල්ලා හදලා තියෙනවා.මම බැලුවා හැබැයි ඇහැලියගොඩ කොතනකවත් ඒ විදිහට ගෙවිලා නෑ.ඒ ප්‍රශනේ මොකක්ද දන්නැ.වලවල් හැරෙන සයිස් එකට ඒ කැට ගෙවිලා,එතනින් බයික් එකක් හරි මොකක් හරි ගියත් අර වලට වැටිල,වැටෙනවා.ඒක බරපතල ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ.ඒ නිසා පාරම ඉල්ලන් නැතුව මීටර් 100 ක් 150 ක් වගේ දුරක් තියෙන්නේ.ඒ ටිකේ ගල් ටික ගලවලා,ඒ ගල් ටික අයින් කරලා කැට ටිකක් අල්ලන්න කියලා තමා,මං සුජීව මන්ත්‍රීතුමා එක්කත් කතා කළා.ඒ පාර දිගට තිබුණා.ප්‍රධාන වශයෙන් කැඩාලා තියෙන ටික අයින් කරලා මේ ටික හදලා දෙන්න කියලා තමා ඉල්ලන්නේ.මේක බරපතල ප්‍රශ්නයක් එතන.එතනින් වාහනයක් වැටෙනවා මයි වංගුවත් එක්ක තියෙන්නේ.ඒ වංගුවෙන් ගන්නකොට වැටෙනවා.ඉතින් හතර පස් දෙනෙක්ම තුවාල වෙලා තියෙනවා.මේකට බරපතල විදිහට චෝදනා එල්ල වෙනවා.ඒ නිසා මේක හැකි ඉක්මනින් කරලා දෙන්න.ලොකු ගාණක් මේකට යන එකකුත් නෙමේ.

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ ආරියදාස මන්ත්‍රීතුමා බොහොම හොද යෝජනාවක් ගෙනාවේ.ඒකට ඔබතුමාගේ අවධානය යොමු කරලා ගරු සභාපතිතුමත් එක්ක කතා කරලා දෙන්න. පොඩි අදහසක් එකතු කරන්න නම් සභාපතිතුමා, මගෙ කොට්ඨාශයේ, ඒක කියන්නේ කාටවත් හිත රිදෙන්නවත් නෙමෙයි,මම නිර්දෝශී වෙන්න ඕන නිසා.ආරියදාස මන්ත්‍රීතුමා දන්නවා ඊට මෙහා පැත්තේ අපේ තුෂාර මල්ලිලාගේ ගෙවල් ටිකේ,සමහර අය දන්නවා ඇති,ලොකු ගලක් තිබුණා.කොන්ත්‍රාත් එක කළේ ලාල් අයියා තොරණගොඩ.ඒ ගල කඩල තමා මම පාර සම්පූර්ණ හැදුවේ.ඊට එහා ටික කළේ වෙන කෙනෙක්.සමාවෙන්න ඕනේ නම කියන්නැ.මගෙ නිර්දෝෂී භාවය නිසා මම කියන්නේ ගරු සභාපතිතුමනි.ඊට එහා හැදුවේ වෙන කෙනෙක්.ඒ ටික තමා ඔය විනාශ වෙලා තියෙන්නේ.ඔබතුමා බුළුගහපිටිය වසමේ අස්සක් මුල්ලක් නැර ගිහිල්ලා තියෙනවා.යකුදාගොඩ වසමේ අස්සක්

මුල්ලක් නැර ගිහින් තියෙනවා.ඔය දෝෂාරෝපනය තමා කරන්න තියෙනවා පාරේ.ඒක මං පිළිගන්නවා.ඒක ඇත්ත.ඒකට මම මැදිහත් වුණේ නෑ.ඒ කාලේ වෙන කෙනෙක්ගේ යෝජනාවකට තමා ඒක කළේ.අපි දන්න කියන කෙනෙක් තමා ව්‍යාපෘතිය කළේ.ඒක කියන්න ඕනේ.නැත්නම් යකුදාගොඩ කිව්වහම මගේ වැඩක් කියලනේ.මෙහා පැත්තෙ ටික මං ලස්සනට කරලා තියෙනවා.ඔබතුමා සාක්ෂි දරයි.මෙහා පැත්තෙ ටික ලස්සනට තියෙනවා.ඒ ටික තමා අවුල තියෙන්නේ.ඒ නිසා අපේ ආරියදාස මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාමත්ම ඉක්මනට සභාපතිතුමත් එක්ක කතා කරලා ඔබතුමා මුදල් වෙන් කරලා දෙන්න කියලා,ලොකු මුදලක් යන් නෑ මනත්‍රීතුමා කිව්ව වගේ පොඩි මුදලකට කරන්න පුළුවන්.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව සභාපතිතුමනි ඉක්මනට කරන්න කියලා.මොකද හේතුව ග්‍රාමීය කමිටුවේදීත් මම මගේ යෝජනාවක් හැටියට මම ඉදිරිපත් කරලා තියෙනවා.ඒ නිසා ගරු සභාපතිතුමා හැකි ඉක්මනින් ඒක කරලා දෙන්න කියලා යෝජනා කරනවා.මොකද ඒක මගෙත් කොට්ඨාශය.මමත් දැක්කා.මම තමයි ඒක ඉස්සෙල්ලාම ග්‍රාමීය කමිටුවට කිව්වේ.පොඩි වියදමක් යන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඉස්සෙල්ලත් කතා වුණා,කාපට් පාරක් නෙමේද යාය පාර.ආ පාරවල් දෙකක්ද? සමුපකාරෙට ඇතුළෙන් යන පාරද මේක?හරි හරි පැහැදිලියි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ආරියදාස මනත්‍රීතුමා මේ පාර යාය පාරට සම්බන්ධයක් නැද්ද?

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
යාය පාරෙන් ඇතුළට යන පාර.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ප්‍රධාන පාර නෙමේ.කාපට් කරන්න යෝජනා ටිකක් ආවා.යාය පාරත් එතන තියෙනවා.අපි හිතනවා,ඉතාම ඉක්මනින් අනුමත වෙලා වැඩේ පටන් ගන්න පුළුවන් වෙයි කියලා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
සභාපතිතුමා මේ පාර මොකද වෙන්නේ?දැන් අපි යොජනා කරපු එක.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ඔව් ඒක ස්ථිර වුණා.හරි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 6.35.-IIයෝජනාවයාය පාරට සමුපකාරය ළඟින් යන පාරේ අල්ලා ඇති ඉන්ටලොක් කැට ගෙවී විනාශ වීමෙන් ඇති වී ඇති කොටස පිළිසකර කර ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**

6.36.සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනා

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

**6.36.යායපාර දන්දෙනිය පාරෙන් අමිල මහතාගේ ගෙවල්වලට යන පාරේ වතුර එකතුවන ස්ථානය පාරේන් උස්සා සංවර්ධනය කිරීම ක්ෂණිකව විසඳිය යුතු කාරණාවන් ලෙස මම යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක යාය පාරේ ඉදලා ,යාය පාරත් එක්ක අතුරු පාරක්.අතුරු පාරේ යනකොට ප්‍රධාන පාර ඉස්සිලා තියෙන්නේ.අතුරු පාර පාත් වෙලා තියෙන්නේ.එතන අඩි 10 ක විතර වතුර වලක් හැදෙනවා වැස්සට.කොන්ක්‍රීට් කරපු පාරක් තියෙන්නේ.ඒ වතුර වල, දෙපැත්තෙන් කාණුවක් කපලා යවන්නත් බෑ.වලක් හදාලා එහා පැත්තට දාන්නත් බෑ. මේක ඒ පාර මට්ටමට උත්සන්න තියෙන්නේ.මේකටත් ලොකු වියදමක් යන එකක් නෙමේ.අඩි 15 ක් 20 ක් වගේ අතර අඩි 4 ක පින් කරන්න තියෙන්නේ.ඉතින් මේ දෙක අත්‍යවශ්‍ය කාරණා දෙකක් හැටියට ගමේ මිනිස්සු ඉල්ලන්නේ.මොකද වැහිදාට පහුවදාටත් මේ වතුර ඒ විදිහටම තියෙනවා බහින් නෑ.මේ දෙකටම මං හිතන්නේ ලක්ෂ තුනක් හතරක් යයි.මේ දෙක කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඒ යොජනාව මගෙ තිබුණා ගිය ගමන, අර මහේෂ් මහතාගේ නිවස අසල කියලා දාල තිබුණේ එතන.සභාපතිතුමත් ඒක ඒකමතිකව හදන්න ඔනේ ,හැදිය යුතුයි කිවුවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ඒක නෙමේ මේ යෝජනාව.ඒකත් වැදගත් එකක් තමා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
දැන් මේ යොජනා දෙකෙන් තියෙන්නේ එකම තැන නෙමේද?

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
නැ නැ.මේක කඩේ ළඟින් ඇතුළට යනකොට තියෙන පාර.දැන් ඔබතුමා පැහැදිලි කරා යාය පාර කාපට් කරන්න දාල තියෙන්නේ කියලා.ඇත්තටම සන්තෝෂයි.මං හිතන්නේ අපේ සියලුම මන්ත්‍රිවරුන්ට යකුදාගොඩ වසමේ මන්ත්‍රිවරුන්ට ඒක සතුටට කාරණයක්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
අපි කොට්ඨාශ ගණනාවක පාරවල් ටිකක් අපි කාපට් කරන්න දාල තියෙන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 6.36. යෝජනාවයායපාර දන්දෙනිය පාරෙන් අමිල මහතාගේ ගෙවල්වලට යන පාරේ වතුර එකතුවන ස්ථානය පාරේන් උස්සා සංවර්ධනය කිරීම ක්ෂණිකව විසඳිය යුතු කාරණාවක් ලෙස යෝජනා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
දිවා ආහාරය සඳහා සභාව පැය භාගයක් කල් තියනවා.දැන් වෙලාව 12.30.නැවත සභාව 1.00 පටන් ගන්නවා.එම නිසා හැකි ඉක්මන්න් ආහාර ගෙන නැවත පැමිණෙන්න.
දිවා ආහාරය සඳහා පස්වරු 12.30 සභාව පැය භාගයක් කල් තබන ලදී.
දිවා ආහාරයෙන් පසුව නැවතත් පස්වරු 1.00 ට සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.37.සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ යෝජනාව.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
**6.37.දිවුරුම්පිටිය වත්ත දෙමළ විද්‍යාලයට ප්‍රධාන පාරේ සිට අඩි 30 පමණ දුර ප්‍රමාණය ඇති පාර කොන්ක්‍රීට් කිරීම සඳහා අඩුපාඩු ද්‍රව්‍ය ලෙස සිමෙන්ති කොට්ට 15ක් ලබා දීම සඳහා යෝජනා කරමි.?(වැලි ගල් දෙමාපියන් විසින් ලබා දී ඇත.)**

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම දියවේල්ල පාර අපට ඉල්ලීමක් කරලා තිබිලා,ඒකෙ ප්‍රමාණය ඇත්තටම අපිට තිරණය කරන්න පුළුවන් TOමහතුන් හරහා.සමහරවිට මේ සිමෙන්ති කොට්ට 15 මදි වෙන්න පුළුවන්,මදි උණොත් අපරාදෙ.ඒ නිසා ඒ යෝජනාව පොඩ්ඩක් සංශෝධනයක් හැටියට ගේනන පුලුවන් නම්,අඩි 30 කට සිමෙන්ති කොට්ට 15 මදි වෙයිමං හිතන්නේ.මදි වුණොත් අපරාදෙ.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
යෝජනාවක් විදිහට ඉදිරිපත් කළේ.දෙමාපියන් අත්සන් කරලා තියෙන්නේ.වැලි,ගල් තියෙනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
එ කට්ටියට කාර්මික දැනුමක් තියෙනවද දන් නෑ.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
දෙමාපියන් වැලි,ගල් ලබා දීලා තියෙනවා

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
එහෙනම් අපි ඒනට සංශෝධනයක් ගේමු.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

ඇස්තමේන්තු හදල තියෙන්නේ.විශේෂයෙන් ම මට කියන්න දෙයක් තියෙනවා.විදුහල්පති විශේෂයෙන් ම කිවුවා.සංවර්ධන කටයුතුකරල තියෙන නිසා, ප්‍රාදේශිය සභාවට ස්තුති කරන්න කිවුවා.එතන ඉන්නේ ගොඩක් වෙලාවට එයාල අපි විශ්වාස කරන් නැති ජනතාවක්.දැන් අපි ගැන විශ්වාසයක් තියලා කතා කරනවා.ඒ නිසා මේ වගේ දෙයක් කරලා දෙන එක සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාරමැතිතුමා:-**

ඒ වගේම මේ යෝජනාව සංශෝධන සහිතව,කාර්මික නිලධාරින්ගේ උපදෙස් අරගෙන අවශ්‍ය ප්‍රමාණයට සිමෙන්ති ලබා දෙන්නත්, දෙමළ දරුවන් තමයි මේ පාසලේ ඉගෙනුම ලබන්නේ

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

සිමෙන්ති කොට්ට 15 කියන එක නිශ්චිත නැනේ.කාර්මික නිලධාරී ගිහින් බලන්න එපැයි,කොච්චර යයිද කියලා.අපිට කියන්න බැනේ හරියටම.ඒ අනුව ඒ සංශෝධනයට අනුව සභාවේ එකගතාවය ලැබෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකඅයි.එච්.රණවීර මැතිතුමාගේ 6.37 යෝජනාවදිවුරුම්පිටිය වත්ත දෙමළ විද්‍යාලයට ප්‍රධාන පාරේ සිට අඩි 30 පමණ දුර ප්‍රමාණය ඇති පාර, කොන්ක්‍රීට් කිරීම සඳහා අඩුපාඩු ද්‍රව්‍ය ලෙස සිමෙන්ති කොට්ට 15ක් ලබා දීම සඳහා වූ යෝජනාව,සිමෙන්ති අවශ්‍ය ප්‍රමාණය අනුව ලබාදීම සුදුසු ලෙස යෝජනාව සංශෝධනයට යටත්ව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (වැලි ගල් දෙමාපියන් විසින් ලබා දී ඇත.)

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.38.සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
**6.38.ගෝබරගලවත්ත උඩ කොටස කොන්ක්‍රීට් දැමීම සඳහා සිමෙන්ති කොට්ට 100 ක් දිමට යෝජනා කරමි.**

**සභිකආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි එතනට වැලි ගල් සේරම සපයලා තියෙනවා.තව සිමෙන්ති කොට්ට 60 ක් විතර හම්බෙලත් තියෙනවා.ඒ නිසා මේ යෝජනාව සම්මත කර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභිකආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ඒ ගැන පොඩ්ඩක් කතා කරන්න ඕන.මං හිතන්නේ ගියවර සභාවේ දි සිමෙන්ති කොට්ට ගැන කතා කළා.ඒ වෙලෙත් අපි ඒ ටික කරමු කියලා තමයි කතා කළේ.ඊට පස්සේ මුදල් කමිටුවේදී සාකච්ඡා කරාට පස්සේ තමා සභාවට දාන්න යෝජනා කළේ.ඒ නිසා හැකි ඉක්මනින් කරලා දෙන්න කියලා යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ මාර්ගය තව පොඩ්ඩක් විස්තරාත්මකව දැන ගන්න පුළුවන්ද?සිමෙන්ති කොට්ට 100 කුත් ඉල්ලලා තියෙනවා.කොච්චර ප්‍රමාණයක් සඳහාද යන්න තොරතුරු ටිකක් දැන ගන්න පුළුවන්නම් හොඳයි.

**සභික ඒ.සි.ටී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි කලින් කළ යෝජනාව වගේ TO මහත්මයා සම්බන්ධ කර,ඒ අනුව වැඩ කටයුතු කරා නම් ප්‍රශ්නෙ විසදෙනවා.සිමෙන්ති කොට්ට 100 ක් ඉල්ලා තියෙනවා, ප්‍රයෝගික තත්ත්වය නෙමේනේ.වම්පැත්ත දකුණු පැත්ත දෙපැත්තටම ඒ දේ කරන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඇත්තටම මෙහෙම යෝජනාවක් දැම්මහම ඇස්තමේන්තුවක් හදන්න එපැයි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභිකඑච්.එම්.රංජිත් බණ්ඩාරමැතිතුමාගේ 6.38 යෝජනාවගෝබරගලවත්ත උඩ කොටස කොන්ක්‍රීට් දැමීම සඳහා සිමෙන්ති කොට්ට 100 ක් දිමට යෝජනා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.39.උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**6.39.වියලගොඩ ක්‍රීඩාපිටිය අසලින් පෙර පාසල වෙත පිවිසෙන මාර්ගයේ පිවිසුම (මීටර් 20) පමණ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම මේ පාර ක්‍රීඩා පිටිය අසලින් මීටර් 20 විතර තමා ඉස්සරහට තියෙන්නේ.කෙටි ප්‍රමාණයක් තියෙන්නේ සංවර්ධනය කරන්න.ඒ නිසා මේ යෝජනාව සඳහා සභාවේ එකඟතාවය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.සි.ටී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,උප සභාපතිතුමා නියෝජනය කරන කොට්ඨාශයමයි මේ.දුෂ්කර ළමයි ටිකක් තමයි මොන්ටිසෝරි යන්නේ.මේ දවස්වලට මේ පාරෙ යන්නවත් බෑ.මඩ සහිත තියෙන්නේ ඒ ටිකේ.ඒ නිසා මේක සංවර්ධනය කිරිම ඉක්මන් කරලා කරන්න පුළුවන්නම් හොඳයි කියලා කියනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.39 යෝජනාවවියලගොඩ ක්‍රීඩාපිටිය අසලින් පෙර පාසල වෙත පිවිසෙන මාර්ගයේ පිවිසුම (මීටර් 20) පමණ සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.40.උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**6.40.වියලගොඩ පුවක්ගහදෙණිය මාර්ගයේ අතුරු මාර්ගයක් වන සභාවට අයත් SG/EHP/A4/68/09දරණ මාර්ගයේ පිවිසුම (මීටර් 80) පමණ සංවර්ධනය කිරිම යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම මං මෙ අංකෙ දැම්මේ කලින් ගැසට් කරපු එකේ අංකය දැම්මේ.මීටර් 80 ක් සංවර්ධනය කරන්න යෝජනා කරන්නේ.මීටර් 80 ක් දැම්මේ ටිකක් වැඩිපුරත් එක්ක.මීටර් 72 ක් වගේ තමා තියෙන්නේ.ඒ පාර සංවර්ධනය කිරිමට තමා යෝජනා කරන්නේ.

මං යෝජනා 6 ක් දැම්මට 3 ක් දාල තියෙන්නේ සභාවේ ආදායම් උත්පාදන යෝජනා විදිහට.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.39 යෝජනාවවියලගොඩ පුවක්ගහදෙණිය මාර්ගයේ අතුරු මාර්ගයක් වන සභාවට අයත් SG/EHP/A4/68/09දරණ මාර්ගයේ පිවිසුම (මීටර් 80) පමණ සංවර්ධනය කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.41-I උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**6.41-I වියලගොඩ නාකන්දල මාර්ගයේ දැඩිව අබලන් වූ කොටස් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
වියලගොඩ නාකන්දල මාර්ගය කිවුවහ ම කවුරුත් දන්නවා.තිබ්බටුවාව පාර කිවුවහම දන්නේ.කොටස් 4 ක් හැදිල තියෙන්නේ.කෙළවරේම කොටස හොඳටම කැඩිලා තියෙන්නේ.ඒක වසම් දෙකක් යා කරන පාරක්.ඒ විතරක් නෙමෙයි ඇහැලියගොඩ සිට ඇරැපොල, මීටිපොල පැත්තට යන්න තියෙන අතුරු මාර්ගයක්.ඒක තමා මං යෝජනා කරන්නේ.ඒ සඳහා එබතුමන්ලගේ අදහස් තියෙනව නම් ඉදිරිපත් කරන්න.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔය පාරත් සමඟ පාලමත් අනිවාර්යෙන් ම හැදිය යුතුයි.ගල් ටිපර් යනවා, ලොරි යනවා.ඒ පාර ඉතා ඉක්මනින් හදන්න පුළුවන් නම් හොඳයි.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ පාර අඩි කියටද හදන්නේ.මට නම් පේන් නෑ, අඩි 8 ක් වත් තියෙනවා.ත්‍රිවිල් එකක් යන්නෙ බොහොම අමාරුවෙන්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම ඒ පාර අඩි 16 ක පාරක්.

**සභික පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ත්‍රිවිල් එකක් යන්නෙත් බොහොම අමාරුවෙන්.ඕක බැරිද ඇත්තටම අපිට කාපට් කරන්න.කොන්ක්‍රිට් දානවට වඩා කාපට් කරන්න පුළුවන්නම් හොඳයි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
බෑ.අපි ඇත්තටම යෝජනා කළා කාපට් කරන්න.කාපට් කරන්න බෑ, ඒ පාර නිතරම යට වෙන පාරක්.

**සභික ඒ.සි.ටී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මායිම් මැනලම පාර හදන්න පුළුවන් නම් හොඳයි.දැනට නම් මෝටර් සයිකලයක්වත් යන්න බරි තැන් කිපයක්ම තියෙනවා. මීටර් 600ට ප්‍රමුඛතාව දෙන්න.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.41- I යෝජනාවවියලගොඩ නාකන්දල මාර්ගයේ දැඩිව අබලන් වූ කොටස් සංවර්ධනය කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.41-IIඋපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**6.41.II ධීවර සංස්ථා වෙළඳසැල මහජන පොළ භූමියේ මාළු විකිණීම සඳහා වෙන් කල කොටසට ගෙන යාමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
අපි හැමෝම දන්නවා පහල තියෙන ධිවර සංස්ථාවට අයත් මාළු වෙළඳසැල.ඒ කෙන් අපට බාධාවක් නෑ ඒකෙන් ඇත්තටම .ජනතාවට බස් හෝල්ට් එකක්, බස්හෝල්ට් එකක් ඇත්තටම නෑ එතන.බස් හෝල්ට් එකක් නැති නිසා එතන,එතන ගොඩක් අයට පාසල් දරුවෝ වෙන්න පුළුවන්,කොළඹ පැත්තේ ඉඳන් රත්නපුර පැත්තට යන එක බස් හෝල්ට් එකකවත් ,අවරන සහිත එක බස් හෝල්ට් එකක්වත් නෑ.අනිත් පැත්තට තියෙනවා.මේ පැත්තට එක බස් හෝල්ට් එකක්වත් නෑ.සෑහෙන අඩු පාඩුවක් නගරයේ.නගරයේ ආදර්ශයක් විදිහට අපි,මාළු වෙළඳසැල් ටිකත් එක තැනකට ගෙනිහින් ආදර්ශයක් විදිහට.සභාවේ අවසරය ඇතුව ක්‍රියාත්මක වෙන්නේ මාළු වෙලඳසැල.සභාවට ඒ ගොල්ලෝ බදු ගෙවනවා.ඒක අපිට මහජන පොළ භූමියට ගන්න පුළුවන්,මාළු වෙළඳසැල් සඳහා දාල තියෙන එකට.ඒකට තමා සභා යෝජනාව දාන්නේ.ඊට පස්සේ එතන බස් හෝල්ට් එකක් නිර්මාණය කරන්න බලාපොරොත්තු වෙනවා.ඒ සඳහා ඔබතුමන්ලගේ අදහස් ඉදිරිපත් කරන්න.

**සභික පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ යෝජනාව කාලෝචිත දෙයක්.මාළු වෙලඳසැල එතන්ට යන එක යන්නම ඕනේ.තව අඩු පාඩුවක් තියෙනවා.එතනට ගියා කියන්නකෝ,හැබැයි එතනට යන පිරිස අඩු වෙනවා.එහෙම උනොත් ඒ ගොල්ලෝ අපෙන් ගැලවෙනවා.ගැලවිලා යන්නත් ඉඩ තියෙනවා,පාඩු ලබන ආයතනයක් විදිහට.ඒ නිසා මං හිතනවා ඇහැලියගොඩ වටේම තියෙන මාළු වෙළඳසැල් ටිකත් එතනට ගෙනිහිල්ලා සේරම ටික මොනව හරි කරන්න වෙයි කියන එක මං කියනවා.ඇත්තටම එතන බස්හෝල්ට් එකක් හැදෙන්න ඕන.මොකද හේතුව ඇහැලියගොඩ මෙතන ජාතික පාසල.එතකොට මෙතනට එන ළමයි ටික හා පිරිස හැම වෙලාවෙම වැස්සට තෙමෙනවා.ඇත්තටම හැදිය යුතු දෙයක්. යෝජනාව කාලෝචිත දෙයක්.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපට ධීවර සංස්ථාවත් එක්ක එකඟතාවකට එන්න පුළුවන්ද කියන ගැටලුවක් තියෙනවා.මොකද දීර්ඝකාලින පදනමකින් තමයි එම ස්ථානය වෙන් කරලා දිලා තියෙන්නේ.අපට බස් නැවතුමක් හදන්න සුදුසුම ස්ථානය තමා එතන.හැබැයි ඒ එක්කම කියවුණා අපේ මන්ත්‍රීතුමා අතින් ප්‍රාදේශිය සභාව විසින් හට් එකක් ගහලා තියෙනවා,මගේ විශ්වාසේ හැටියට ප්‍රාදේශිය සභාව අනිත් එවා හොයනව වගේම,අනවසර ඉදිකිරිම් හොයනව වගේම,මං හිතන විදිහට ඒ හට් එකත් අනවසර ඉදිකිරිමක්.මොකද පාසලට බැරි වෙලාවත් උස වාහනයක්,පෙල පොත් ටික ගේන,නැත්නම් විලංගු ටික ගේන,නැත්නම් පාසල් බස් රථයක්,සි.ටී.බි.බස් රථයක්.Duble door තියෙන,එන්න බැ ඒ අනවසර ඉදිකිරිම හින්දා.මං දන්නැ එකට පොඩි ප්‍රශ්නයක් තියෙනවා.මං නම් කියන්නේ ඒ ඉදිකිරීම පොඩ්ඩක් සුදුසු විදිහට කල්පනා කරලා බලලා අනිත් අයට අපහසුතාවක් නොවෙන්න ඒ තාවකාලික හට් එක සකස් කර ගත්තොත් හොදයි.

අනික් කාරණාව තමයි දිගින් දිගටම අපේ ඉස්සරහ මදනසිංහාරාමය විහාරාධිපති අපේ හාමුදුරුවොත් ඉල්ලලා තිබ්බා සමන් දේව ප්‍රතිමාව ඉස්සරහ තියෙන ධිවර සංස්ථාව තියෙන ඒ ගොඩනැගිල්ල ඉවත් කරන්න කියලා.හැබැයි අපිට දිර්ඝ ප්‍රයත්නයකින් පස්සේ තමා ඒක ඉවත් කරන්න වෙන්නේ.මං විශ්වාශ කරන විදිහට ඕක 2015 ට කලින් ඕක ගිවිසුම් අත්සන් කරලා තියෙන්නේ.මම බලාපොරෙත්තු වෙනවා ඔබතුමාගෙන් ඊළඟ සභා වාරයේ දි ඒ වෙනුවෙන් ඒ සඳහා ගත්ත ක්‍රියා මාර්ගවල ප්‍රගතියත් අපි දැනුවත් කරයි කියලා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ මාළු වෙළඳසැල් එක තැනකට එක්කහු වෙනවා වගේ,එළවළු වෙළඳසැල් පාර දෙපැත්තේ වෙළඳාම් කරන එළවළු දාන් ඉන්න එළවළු වෙළෙන්දෝ මේ පොළ භූමිය තුළට ම ගෙනැල්ලා ඒ පොළභූමිය තුළම එකම තැනක මේ එළවළු වෙළඳාම ගන්නත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.මොකද අපි පොළ භූමියට ගිහාම පොළේ වෙලදාම් කරන උදවියට තියෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමා, මේ පාර දෙපැත්තේ වෙලදාම් කිරිම.එතකොට පොළ භූමියට එන්නේ නැ පාරිභෝගිකයෝ මේ මහට ඇවිල්ලා එළවළු අරන් යනවා.අපි යම්කිසි මුදලකුත් අය කරනවා.ඒ වුණාට අපිට වෙළඳාමක් නැ කියනවා.ඇයි මේකට ප්‍රාදේශිය සභාව පියවරක් නොගන්නේ කියලා අපෙන් වෙළෙන්දෝ අහනවා ගිහාම.ඒ නිසා අර කටයුත්ත වගේම මේ තැන් තැනවල විසිදිලා තියෙන විසිදීගෙන කරන එළවළු වෙළඳාමත් පොළ භූමිය තුළටම ගේන්න කටයුතු කරන්න කියලා මම යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ස්තුතියි අදහස් දැක්වීමට.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.41- II යෝජනාවධීවර සංස්ථා වෙළඳසැළ මහජන පොළ භූමියේ මාළු විකිණීම සඳහා වෙන් කළ කොටසට ගෙන යාම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.42.උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
**6.42.නාගරික සංවර්ධන අධිකාරියට අයත් මෝරගල ක්‍රීඩා පිටියේ පවත්වන සියලුම කටයුතු වලදී එක්රුස්වන කසළ බැහැර කිරීම සඳහා රු.15000.00ක ගාස්තුවක් අය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
මේක ඇත්තටම නාගරික සංවර්ධන අධිකාරියට තමා මොරගල ක්‍රිඩාපිටිය අයිතිවෙන්නේ.නාගරික සංවර්ධන අධිකාරිය තමයි, ඒකෙ සම්පුර්ණ ගාස්තුව ගන්නේ.අපිට ඒකෙන් එන්නේ විනෝද බද්දක් වගේ තමයි.මොකක් හරි දෙයක් තිබ්බට පස්සේ එතන විශාල කසල ප්‍රමාණයක් එකතු වෙනවා.එතකොට එකෙ කිසිම උත්සව සංවිධායකයෙක් ඒකෙ කිසිම වගකිමක් ගන්නෙත් නැ,ඒ අය විනොද බදු විතරයි අපිට ගෙවන්නේ.නාගරික සංවර්දන අධිකාරිය විසින් සම්පුර්ණ ගාස්තුව ගත්තට අපිට ඒකෙන් සභාවට ආදායමක් එන් නැ විනෝද බදු අය කරන එකක් නොවුණොත්.ඒ නිසා ඒ සඳහා ගාස්තු යෝජනා කරන්නේ.ඒ සඳහා ඔබතුමන්ලාගේ අදහස් අරගෙන ඒක ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අදහස හොද අදහසක්.නමුත් සංගිත සංදර්ශන වගෙ ලොකු වැඩසටහන්වලට ප්‍රශ්නයක් නැ,15000.00.සාමාන්‍යෙයන් ක්‍රිකට් මැච් එකක් වගේ පොඩියට කරන කට්ටිය ඉන්නවා.ඒ කට්ටියගෙනුත් ඒ 15000.00 අය කරන එක මං නම් හිතන්නැ ඒක එච්චර හොද එකක් කියලා.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මේ ගැන අපිට ගොඩක් වෙලාවට 2026 ආදායම් ලබා ගැනිමට කරන ගැසට් නිවේදනයකින් තමා මේ කෙ ගාස්තු අයකිරිමට අවස්ථාව තියෙන්නේ.එතකොට 2026 ගාස්තු අය කිරිම පිලිබඳ ගැසට් නිවේදනය අපි පළ කරන කොට වෙන් වෙන් වශයෙන් ගාස්තු අය කිරිම සුදුසුයි.එතකොට අපි හිතමුකෝ උපරිමය දවස් පහකට යන්න පුළුවන්නේ කානිවල් එකක්.ඒ දවස් පහේ කානිවල් එකට දවස ගානේ අය කිරිමක් කරනවද? දවස් පහටම එකවර අය කරනවද?එහෙමත් නැත්නම් ආදායම් උත්පාදනය කරන් නැති වැඩසටහන් ක්‍රිඩාපිටියේ ක්‍රියාත්මක වෙනවා.එයාලගෙන් ගාස්තු අය කරන් නැතුව ඉන්නවද?ගාස්තු අය කරනවද?එහෙනම් කියක් ද?ඊටපස්සේ තව ක්රීඩා තරග තියෙනවා,පාසල්වල ක්‍රිඩා තරග තියෙනවා නැත්නම් එක එක ආයතනවල ක්‍රිඩා තරග තියෙනවා,නැත්නම් ආදායම් උත්පාදනය සඳහා ක්‍රිඩා තරග තියෙනවා ඒයාලගෙන් අපි කියක්ද අය කරන්නේ කියන එකට අපිට තාර්කික ගාස්තු නිර්ණය කිරිමක්අවශ්‍ය වෙනවා.එතකොට මං දන් නෑ ඔබතුමාගේ යෝජනාවේ යෝජනාවක් විදිහට මේ 15000.00 කියන එක තියෙන්නේ මොන තාර්කික පදනමෙන්ද කියලා.ඒ කියන්නේ සමහර වෙලාවට මේකෙ ඩේටා කොස්ට් එක.සමහරවිට හතර දෙනෙක් යනව නම් හතර දෙනාගෙන් කොස්ට් එකයි, නැත්නම් ට්‍රැක්ටර් එකක් යනව නම් ඒ ට්‍රැක්ටරයේ කොස්ට් එකයි.නැත්නම් ට්‍රැක්ටර් දෙකක් යනව නම් ඒ කොස්ට් එකත් එක්ක ද මේ 15000.00 තිරනය කරලා තියෙන්නේ නැත්නම්,අපිට ඒක විස්තර කරන්න පුළුවන් නම් වටිනවා.මෙන්න මේ පදනමින් තමා මේ 15000.00 ගාස්තුව අය කිරීම සඳහා යෝජනා වෙලා තියෙන්නේ කියලා තාර්කික පසුබිම පොඩ්ඩක් පැහැදිලි කරන්න පුළුවන්ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඒක ඇත්තටම අපි ගාස්තු ගැසට් කිරිම කරනවා.අර විදිහට ඔබතුමා කිවුව වගේ අපි,ඒඒ දින අනුව ඊට පස්සේ අවස්ථා අනුව තමයි අපි ඒ ගාස්තු තිරණය කරන්න බලාපොරොත්තු වෙන්නේ.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඒ එක්ක ම මං මේ යෝජනාවත් එක්කම ඉල්ලීමක් කරනවා ආදායම් උත්පාදනය කරන් නැති වැඩසටහන්වලට මේ සඳහා අපිට නොමිලේ කසල කලමණාකරනය කරන සේවාව ආදායම් උත්පාදනය නොකරන ඒවා සඳහා ලබා දෙන්න කියලා ඉල්ලීම කරන්න කැමතියි.මොකද අහිංසක මිනිස්සු ඉන්නේ.සමහර වෙලාවට UD එකෙට යම්කිසි මුදලක් ගෙවලා තමයි වෙන් කිරීම කර ගන්නේ.අපිට අඩු ගානේ මේ ප්‍රදේශයේ අයගෙන්වත්,ප්‍රදේශයේඅඩු ගානේ මේ අපේ බල ප්‍රදේශයේ අයගෙන්වත් ඒක සංවිධානය කරන්නේ අපේ බල ප්‍රදශෙයේ කටයුත්තක් නම් ඔවුන්ගෙන් කසල කලමණාකරණය සඳහා මුදලක් අය කරන්න එපා කියන යෝජනාව මං මේ වෙලාවේ කරන්න කැමතියි.

**.සභික ඒ.සී.ටී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඒකට දිගුවක් වශයෙන් මං යෝජනා කරනවා ක්‍රිඩා හා පාසල් කටයුතුවලට නිදහස් කරන්න.අර දෙකට ප්‍රමුකතාවය ලබා දෙන්න කියලා මං යෝජනා කරනවා.ක්‍රිඩා හා පාසල් කටයුතු සඳහා.ගොඩක් ප්‍රයෝජන ගන්නවා ග්‍රවුන්ඩ් එක ළමයි පාසල් කටයුතු සඳහා.ඒ දෙක නිදහස් කරලා, අනිත් ඒවාට සාකච්ඡා කරලා තින්දුවක් ගන්න කියලා මං යෝජනා කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඒ කියන්නේ මට හිතෙන විදිහට විසංවාදයක් ආවොත් වෙන්නේ මේක ඇත්තටම නාගරික සංවර්ධන අධිකාරියෙන් අවසර අරන්,මුදල් දිලා අවසර අරන් කරන කටයුතු සඳහා තමයි මේක වෙන්නේ.ගොඩක් වෙලාවට ක්‍රිඩා හා පාසල් කටයුතුවලට නාගරික සංවර්ධන අධිකාරියෙන් අවසර ගන්නවා.අපිට කොහොමත් ආදායම් උත්පාදන නොවුණා වුණත්,ආදායම් උත්පාදන නොවන කාර්යකට මෝරගල ක්‍රිඩා පිටිය පාවිච්චි කරා වුණත්, කසල එක් රැස් වෙන්නැ කියලා අපට කියන්න බෑ.එහෙම ප්‍රශ්නයක් තියෙනවා.ඒකට අපිට මොකක් හරි පොඩි එකඟතාවයකට එන්න වෙයි.අපි මන්ත්‍රිවරු එකතු වෙලා කමිටුවක් විදිහට රැස් වෙලා කොහොමද ඒක කරන්නේ කියන එක ගැන තීරණයක් ගන්න,ඒක මං හිතනවා හොඳ ප්‍රවේශයක් වෙයි අපට.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**

අපිට ඔය තියෙන කමිටුවකින් බැරිද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

පුළුවන් නේද? .අපි මොන කමිටුවටද දාන්නේ?එහෙනම් අපි කාර්මික සේවා කමිටුවට දාමුද?මේ යෝජනාව කාර්මික සේවා කමිටුවට දාල කාර්මික සේවා කමිටුවේ නිර්දේශයක් අරගෙන, ඒක වෙන්නේ කොහොමද? ගාස්තු තීරණය කරන්නේ කොහොමද?බලලා නැවත මහා සභා අනුමැතියට යොමු කිරිමට සභා සම්මත වෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.42. යෝජනාවනාගරික සංවර්ධන අධිකාරියට අයත් මෝරගල ක්‍රීඩා පිටියේ පවත්වන සියලුම කටයුතු වලදී එක් රැස්වන කසළ බැහැර කිරීම සඳහා රු.15000.00 ක ගාස්තුවක් අය කිරීම සඳහා වූ යෝජනාව,කාර්මික සේවා කමිටුවට යොමු කොට කාර්මික සේවා කමිටු නිර්දේශ ලබා ගෙන,එය ක්‍රියාත්මක වන්නේ කුමන

ආකාරයෙන් ද යන්නත්,ගාස්තු තීරණය කරන ආකාරය පිළිබඳ සාකච්ඡා කර ගැනීමෙන් පසු නැවත මහා සභා අනුමැතියට යොමු කිරීමට මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.43.උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
**6.43.ප්ලාස්ටික් (PEP) සහ ඇලුමිනියම් කැන් එක්රැස් කරගැනීම සඳහා සෑම වසමකම යකඩ කූඩු ස්ථාපනය කිරීමට යෝජනා කරමි.**

**සභික පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම අපි ඇහැලියගොඩ වරිපනම් සීමාවට අයිති සියලුම වසම්වල අපි දැන් ආරම්භ කරන්න නියමිතයි. පොලිතින් හා ප්ලාස්ටික් එකතු කරන්න යනවා මාසෙකට එක වතාවක්.දිවුරුම්පිටියේ ඉදන් මාර්ග දෙපැත්තේ තියෙන වසම්වල දිවුරුම්පිටිය,ගැටහැත්ත,වලව්ට,මින්නාන, තොරණගොඩ,උඩුමත්ත,පැල්පිටිය, මෝරගල, මාහිංගොඩ,මාහර,වියලගොඩ නාකන්දල.නාකන්දලත් කැල්ලක් අයිති වෙනවා.මේ ටික කොහොමත් වෙනවනේ.මුලික අදියෙරේදී අපි යනවා මේ වසම්වල.අපි බලමු ඒ වැඩේ සාර්ථකත්වය අනුව ඊට පස්සේ අනිත් වසම්වලත් ඒක ක්‍රියාත්මක කරනවද කියන එක.ඒ පිළිබඳ ෆේස්බුක් එකෙත් දැන්වීම් දාල තියෙනවා.ඊට පස්සේ ඒ වසම්වල ඉන්න ග්‍රාම නිලධාරී මහත්වරුත් මේකට සම්බන්ධ කර ගන්නවා.ප්ලාස්ටික් පොලිතින් වෙන වෙනම හැම ගෙදරකම එකතු කරන්න කියන නිවේදනය දාල,ඒ හැම වසමකම පෝස්ටරයක් අපි ප්‍රදර්ශනය කරලා මිනිස්සු දැනුවත් කරලා,ඒ ටික අපි ට්‍රැක්ටර්වලින් ගෙනැල්ලා අපි බ්‍රෙල් කරලා ඒකඅපි විකුණනවා.ඇත්තටම මේක සභාවට ආදායමක්.මේ යෝජනාව දැම්මෙත් ඒකයි.ඒකට දිගුවක් විදිහට තමා මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. ප්ලාස්ටික් හා පොලිතින් එක් රැස් කිරීමට සෑම වසමකම,මෙ සෑම වසමක්ම කියන එක,සියලු අනොත් හොඳයි.අර විදිහට එකතු කරන්න බැරි වසම් ටිකක් තියෙනවනේ.කලටුවාව,කරඳන පැත්ත,උතුරු කරඳන,දකුණු කරඳන, හිඳුරන්ගල,ඇරැපොල,ඒ පැතිවලට තමා මෙකෙන් ප්‍රමුඛතාවය දෙන්නේ මේ යෝජනාවෙන්.ප්ලාස්ටික,පොලිතින් වැනි කසල එක්රැස් කරගැනීම සඳහා පොදු ස්ථානවල,අපේ සභාව පල්ලෙහා තියෙන්නේ, අන්න ඒ වගේ තියන්න.එක දවසක ගිහිල්ලා ඒ ටික අරන් ඇවිල්ලා,අපිට ඒක බ්‍රෙල් කරලා අපිට ඒවා ප්‍රතිචක්‍රිකරණ ආයතනවලට මුදල් වලට අපිට දෙන්න පුළුවන්.ඒ සඳහා ඔබතුමන්ලගේ අදහස් අනුව අපි මේ වැඩ කටයුත්ත කරගෙන යන්.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම ඒක හොඳ යෝජනාවක්.අපේ ප්‍රජාවත් දැනුවත් කරගෙන ඇත්තටම අපි clean Sri Lanka වැඩසටහන ක්‍රියාත්මක වෙනවා ඉස්සරහට ලස්සන ලංකාවක්,ලස්සන ඇහැලියගොඩක් ගෙන ඒම සඳහා.ඇත්තටම කාලෝචිත හොඳ යෝජනාවක්.අපිට ප්‍රජාවත් දැනුවත් කරගෙන හොඳ project එකක් වෙයි මේක.ඇත්තටම හොඳ යෝජනාවක්.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.43.ප්ලාස්ටික් (PEP) සහ ඇලුමිනියම් කැන් එක් රැස් කර ගැනීම සඳහා සෑම වසමකම යකඩ කූඩු ස්ථාපනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.44.උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
**6.44.සභා ශ්‍රවනාගාරය නවීකරණය කිරීම සඳහා යෝජනා කරමි.**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ශ්‍රවනාගාරය කියන්නේ අපේ මෙහා පැත්ත.ඇත්තටම සභා ශ්‍රවණාගාරය ලක්ෂ පහකට ආසන්න මුදලක් වියදම් කරලා අපි ශබ්ද වාහිනී යන්ත්‍ර ටිකක් සවි කරලා අපි අලුත් වැඩියාවක් කළා.සභා ශ්‍රවණාගාරය අපිට දෙන්න පුළුවන් ආදායම් උත්පාදනය සඳහා රු.15000.00 ක් නැත්නම් රුපියල්.10000.00 ක්.ආදායම් උත්පාදනය නොවන.ඒ කියන්නේ කවුරු ගත්තත් ඒමුදල ගෙවන්න ඕන.ශබ්ද වාහිනී යන්ත්‍ර ඇතුළේ සවි කළාට ගාස්තු වැඩි කරන්න බැ.හැබැයි අපට පුලළුවන් නම්,ඇහැලියගොඩ ක්‍රියාත්මක වන ලොකු අඩුපාඩුවක් තමයි

ශ්‍රවණාගාරයක් නැති කම.නිසි විදිහට තියෙන ශ්‍රවණාගාරයක්.අපිට පුළුවන් මේ ශ්‍රවණාගාරය තින්ත ටිකක් ගාලා,ඊට පස්සේ තව අලුතින් තිර දාලා ක්‍රමවත් කරලා විධිමත් කරලා අපිට ගන්න.මේකට එතකොට හැමදාම වගේ එන උත්සව,රැස්වීම් වලට තව ගෙන්වා ගන්න පුළුවන්.ඒ අනුව තමයි මේ යෝජනාව දාන්නේ.එ සඳහා ඔබතුමන්ලගේ අදහස් අනුව ඉදිරි කටයුතු කරමු.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මං දිගුවක් වශයෙන් අද ඇහැලියගොඩ ගත්තොත් සමුපකාර රැස්වීම් ශාලාව නිමල් විජේනායක මහත්මයාගේ තියෙනවා එයාගේ පුද්ගලික ස්ථානයක් තියෙනවා එක එක ශෝ සඳහා.නමුත් ඒවගේ ගාණ,අධිකමිළ.ඒ නිසා අපිට රුපියල් දහ පළොස් දහසකට අපේ ආයතනය දෙන්න පුළුවන්.හැබැයි ඒකට අවශ්‍යකරන වටපිටාව අපි හදන්න ඕන.ඒකට යම්කිසි මුදලක් වැය කරන්න වෙනවා.ඒ වැය කළා වගේ නෙමේ මං හිතන්නේ මේ වෙන කොට ඇහැලියගොඩ ළමයින්ගේ අධ්‍යාපන කටයුත්තක් සඳහා හෝ සංගීතමය කටයුත්තක් සඳහා මොනවා හෝ වැඩසටහනකට හරි ස්ථානයක් නැ,යම් පොඩි මුදලකට ගන්න.නැත්නම් තිස් හතළිස් දාහක් වැය කරන්න වෙනවා.මං හිතනවා කාලෝචිත අදහසක් ඔබතුමා ගෙනාවේ.මං හිතනවා මේ කට අවශ්‍ය කරන මුදල් වැඩේ ලස්සන වෙන විදිහට මුදල් වැය කරලා ඒක හැදුවොත් සභාවට හොඳ ආදායමක් ගන්න පුළුවන්.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මගෙන් ඉල්ලීමක් කළා මෙහෙ ටයිකොන්ඩෝ එකට ගන්න පුළුවන් ද කියලා.හවසට.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

මුදල් ගෙවීමක් කරන්න ඕන මන්ත්‍රීතුමා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
මුදල් ගෙවීමක් කරලා සභාපතිතුමා.එකට යන මුදල ප්‍රශ්නයක් නැ කිවුවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
පුහුණුවීම් සඳහාද?

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
පුහුණුවීම් සඳහා ඒ ළමයින්ට ස්ථානයක් නැ කියලා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
පංති පවත්වන්න සුදුසු වෙයිදදන් නෑ.සභාවට එන්න කියන්නකෝ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගාස්තු කොහෙමද දැනට තියෙන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

දැනට තියෙන්නේ.ආදායම් උත්පාදන නොවන කටයුත්තක් සඳහා රු.10000.00 කගාස්තුවක්.ආදායම් උත්පාදන කාර්යක් සඳහා නම් රු.15000.00 ක ගාස්තුවක්.සභා ශ්‍රවනාගාරය කියන්නේ මේක නෙමේ.එහා පැත්තෙ තියෙන එක.උත්සව ශාලාව.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම මෙතුමාගේ යෝජනාවට පොලේ කැල්ලක් දෙන්න බැරිද?මොකද ටයිකොන්ඩෝ කියන්නේ සෝෂාවත් එක්ක යන දෙයක්නේ.කෑ ගහනවනේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
එහෙම උණොත් පොළ භූමිය කතා කරලා දෙන්න පුලුවන්.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
එතකොට සභාවට ආදායමක් එනවනේ.ඒකට සුදුසු පරිසරයක් නිර්මාණය කරලා අපි හදලා දෙමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි පොල භූමිය බදු දෙන එක කලින් කතා කලා නේ ද?ඒ ගැන මොකුද් නැද්ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
Indoor එක ගැන නේද?

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒක එයාල ගන්නවද නැද්ද දන්නෑ.එයාල ගත් නැත්නම්,මං පාසලත් එක්කත් සාකච්චා කළා,අපිටත් බැට්මින්ටන් කෝඩ් එකක අවශ්‍යතාවය තියෙනවා.අපේ පාසලට බදු දෙන්න පුලුවන් නම් මං ඒ ගැන

සම්බන්ධිකරණයක් කරන්න නම්.සංවර්ධන කමිටුවෙන් කිව්වා මට ඒක සම්බන්ධිකරණය කරන්න කියලා.ඉතින් එකක් පාසලට බදු දෙන්න කැමතිද?නැද්ද කියන එක අපිව දැනුවත් කළොත් මං පාසලත් එක්ක සාකච්ඡා කරන්න පුළුවන්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඉස්සෙල්ලා රජයේ තක්සේරුකරුවෙක් හරහා ඒක තක්සේරු කරලා බලමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
තක්සේරු කරලා නැද්ද තාම.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
තක්සේරු කළේ නෑ.ඒ ක්‍රියාවලිය තාම ඉස්සරහට ගියේ නෑ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
අපි ඉක්මන් කළොත් හොඳයි නැත් නම් අවුරුදු හතර මදි වෙයි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ පොළ භූමියේ තියෙනවා ගොඩනැගිලි දෙකක්.මේවා අති විශාල මුදලක් විදම් කරලා හදපුවා.එතකොට අපි ඒවට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න ඕන.අපි එක දවසකට එක තින්දුවකුයි,තව දවසකට තව තීන්දුවකුයි ඊළඟ දවසට තව තීන්දුවකුයි ගන්නේ නැතුව.සභාවාර තුනක් ගියා වාර තුනේ තින්දු තුනක් තියෙන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
පොළ භූමිය සම්බන්ධයෙන් නෙමෙ මන්ත්‍රීතුමා මේ කතා කරන්නේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඒක පිළිගන්නවා.දැන් පොල භූමියෙන්නේ අන්තිමට කතාව නැවතුනේ.සභා ශ්‍රවණාගාරය අන්තිමට ගිහිල්ලා නැවතුනේ පොළ භූමියෙන්නේ.එතකොට මේවා,හිනා වෙන්න එපා මේවා, අපි තීන්දු තුනක් ගන්නවා.මුලින්ම අපි බදු දෙනවා කිව්වා.ඊට පස්සේ බදු දෙන් නෑ කිව්වා.ඊට පස්සේ ඉන්ඩෝ එකක් ගහන්න දෙනවා කිව්වා.ඒකෙ තීන්දුව අද ඔබතුමා කියනවා එයාලට කියලා තියෙන්නේ තවම උත්තරයක් නෑ කියලා.ඊට පස්සේ ටයිකොන්ඩෝ ගහනවා.ඊට පස්සේ බැට්මින්ටන් ගහනවා.අපි ඒ යෝජනාවට අගෞරව කරනවා නෙමේ.වැරදියට තේරුම් ගන්න එපා.හැබැයි මේවා කෝටි ගාණක් වටින දේපලක්.ටවුන් එක මැද්දෙ තියෙන දේපලක්.එතකොට ඒ දේපලින් අපි නිසි වටිනාකමක් ගන්න ඕන.හදලනේ තියෙන්නේ,හදල තියෙන එකෙන් අපට ආදායම් උපය ගන්නයි ඕන.අපි ඉස්සෙල්ලා කතා වුණා අවුරුද්දෙන් අවුරුද්ද සීයට විස්ස විස්ස අපෙන් අපේ මුදල කපනවා කියලා.එතකොට අපි ඒකට නිසි ක්‍රියාමාර්ගයක් ගන්න ඕන.දැන් ඉස්සෙල්ලා යෝජනාවක් ආවා මං ඒකට මොකුත් කිව්වෙත් නෑ.ටවුන් එකේ ඉඩම අපි අරගෙන මගෙ හිතවත් මන්ත්‍රීතුමාගේ හොඳ යෝජනාවක් පාර්කින් එකක් දාමු කියලා.හැබැයි පාර්කින් එකක් දැම්මට කීයද ගන්න පුළුවන්.පැයකට රුපියල් 100.00 යි. පැයකට රු.100.00 ගානේ පැය අටම නවත්තලා තිබ්බොත් රු.800.00 යි.වාහන 10 ක් ගැහුවොත් රු.8000.00 යි. දවසට ගන්න පුළුවන්.ඕකෙ වාහන 10 කට වඩා ගහන්න බැනේ,අපි ඉරි ගහල දුන්නට පස්සේ,කොන්ක්‍රිට් දාල.අර නිසි විදිහට ඉරි ගහලා හදලා දුන්නට පස්සේ උපරිම වාහන 15 දායි.දවසට රු.12000.00 යි ආදායම. සේවකයෙක් තියන්න ඕන.සේවකයෙක්ගෙ පඩිය දවසට 2500.00 ක් 3000.00 ක් දෙන්න ඕන.ඊට පස්සේ ඒක නඩත්තු කරන්න ඕන.මේ විහිළුවක් නෙමේ මේක.මේ කතාවමනේ ආවේ හම්බන්තොට වරායටත්.ඩොලර් බිලියනයක් වියදම් කරලා ආදායම් නෑ කියලා.අපෙත් මේක හදලනේ තියෙන්නේ.අපි මේකට අපි කට්ටියත් එක්ක කතා කරමු.කතා කරලා හොඳ යෝජනාවක් හදා ගමු.ගැටහැත්ත කඩ කාමර ටික,අර කවුද එක්කෙනෙක් දාල තිබුණ යෝජනාවක් මොකක් ද එහෙකට දෙන්න කියලා.ඊට පස්සේ ඒක ගන් නෑ කිව්වා.දෙවැනි එකට යනවා කිව්වා.හැබැයි එයා ගන්නෑ.අපි මේවට මොනව හරි ක්‍රම වේදයක් හදා ගන්න ඕන.අපි ඇත්තට කතා කරමු මේවා.මේ නගරයේ ඉන්නවා වෙළඳ ප්‍රජාවක්.එයාලත් එක්ක කතා කරමු.කතා කරලා ආදායම් උපයන විදියක් හදා ගමු.දැන් ටයිකොන්ඩෝ පංතියකට ,පෞද්ගලිකව ගන්න එපා මට,රුපියල් 1000.00 ක් දෙයි.5000.00 ක් දෙයි උපරිම.මං මේ අගෞරව කරනවා වැරදියට හිතන්න එපා.මං කියන්නේ ඒකෙන් එන ආදායම.ඉස්කෝලෙට බැට්මින්ටන් ක්‍රිඩාංගනයක්නෑ, එක දෙන්න ඕන. මං පිළිගන්නවා.බැට්මින්ටන් ගහන්න අවශ්‍යයි .දැන් ඉස්කොලෙ ළමයින්ගේ බස් ගහන්න පොල භූමිය ඉල්ලනවා.ඉස්කෝලෙ ළමයින්ගෙ බස් ටික දාන්න ඕනේ කොහෙ හරි.මං පිළි ගන්නවා.මං ඒක නෑ කියන් නෑ. හැබැයි බස් 10 යි ගහන්න පුළුවන්.රට ctb එකේ බස් ගෙනත් දාන්නෙත් එතන.එතකොට මේවා අපි කතා කරන්න ඕනේ.මේ තියෙන්නේ අති විශාල ධනයක්.ඔය බිල්ඩින් එක කෝටි කියක් වටිනවද ඔය ඉඩමක් එක්ක.අද අපි පොළ විකුණනවා කිව්වොත් කිදෙනෙක් ගන්න ඉන්නවද කියන්නකෝ.අල්ල ගන්න කිව්වොත් මරා ගන්නවා මිනිස්සු.ඕන කෙනෙක් ගිහින් අල්ල ගන්න කිව්වොත් මිනිස්සු 10 ක් මැරෙනවා ඕකේ.මේ ටවුන් එකේ ඉඩම අල්ල ගන්න කිව්වොත් මිනිස්සු 20 ක් මැරෙනවා.විකුණනවා කිව්වොත් කෝටි කියකට විකුණන්න පුළුවන්ද?ටවුන් එකේ පර්චස් එකක් කියද යන්නේ.ඒකට වටිනාකමක් අරගෙන් අපි නිසි ක්‍රියාමාර්ගයකට යන්.මොකක් හරි හදා ගමු වැඩපිළිවෙළක්.අපි මැයි 6 වෙනිදා ඡන්දෙ තියලා ආවේ ජුනි 02 පටන් ගත්තේ සභාව.මාස 6 ක් ඉවරයි.ආණ්ඩුව විදිහට ගත්තොත් ආණ්ඩුවෙත් අවුරුද්දක් ඉවරයි.මේක දේශපාලන පැත්ත ගන්න එපා.මං කියන්නේ මේ වැඩපිළිවෙලක් හදා ඕනේ.නැත්නම් මේවා කොහෙන්ද ඉවර වෙන්නේ.අපේ මේ ආදායම් වියදම් වාර්තාව අපිට දීල තියෙනවා.අපේ හිඟයක් තියෙන්නේ.මං මේ ගෞරවයෙන් ඉල්ලන්නේ වැරදියට තේරුම් ගන්න එපා, ඔයාලගේ ඔක්කොම යෝජනා වටිනවා.හැබැයි අපි මේවට නිසි මුදලක් අයවෙන විදිහක් හදාගමු.හදලා මේ ප්‍රසම්පාදන කමිටුව තියලා ඒකෙත් තින්දුවක් ගන්න.මුදල් කමිටුව තියලා එකෙන්

තින්දුවක් ගන්න ඔනේ.ආදායම් වැඩි කර ගන්නේ කොහොමද කියලා.ඒ කමිටුවල ඉන්න,පත්වෙලා ඉන්න මන්ත්‍රීවරු එන්න ඒ කමිටුවලට ,ප්‍රසම්පාදන කමිටුවට එන්න.බෝර්ඩ් එකට පත්වෙලා ඉන්නවනේ.ඇවිල්ලා කතා කරන්න ඒවා.නැත්තන් මේවා වෙන තැනකට යයි. තම තමන්ගේ අවශයතාවයන් වලට නෙමේ.බොහොම ස්තුතියි.වැරදියට තේරුම් ගන්න එපා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඇත්තටම ඔච්චරම වියදම් කරලා හදපු ඒවා අපිට හම්බුණේ ආදායම් එක්ක නෙමේ.දැන් කවුරු කතා කරත් මෙහෙම මෙහෙම කියලා, දැන් ඉපදිලා වගේ කතා කරත් ඒ යාන්ත්‍රණය හැදිලා කිසිම වැඩපිළිවෙලක් නැතුව තමා මෙතනට ආවේ. එහෙම වැඩපිළිවෙළක් එක්ක ආව නම්,අපි හිතමුකො ඔතනින් කෝටි ගාණක ආදායමක් එක්ක අපිට ආව කියලා එහෙම ආව නම් මේක අපිට මේ විදිහට අරන් යන්න පුළුවන්. නමුත් දැන් කිසිම ආදායමක් නැතුව කිසිම දෙයක් නැතුව තමා මේක ආවේ.එනිසා මේ ටිකට දැන් සැලසුමක් අරන් යන්න කොහොමත් අපිට පුළුවන්.අපි නව සැලසුමක් හදා ගෙන හොඳ විදිහට ඉස්සරහට වැඩපිළිවෙලක් අරන් යනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මං මන්ත්‍රීතුමා නිදාගෙන නැගිට්ටේ නෑ මන්ත්‍රීතුමා.මං දැන් ඉපදිච්ච කෙනෙක් නෙමේ.මමත් දන්නවා.මං ඒකේ වටිනා කම ගැන කිවුවේ.ඒ වටිනාකම තේරුම් ගන්න කිවුවේ.ඒක පෞද්ගලිකව ගන්න එපා.මේවා කෝටි ගාණක් ආදයම් ලැබුව නම්, අපි ආණ්ඩු පරදින් නෑනේ.ඒව වැරදිච්ච හින්දනේ මෙහෙම වුණේ.රටක් වශයෙන් ප්‍රශ්න ඇති වුණේ මේ ආණ්ඩු පැරදුනේ ඒ කට්ටිය ගත්ත තීන්දුවල මොකක් හරි වැරැද්දක් තියෙන හින්දනේ.මං කියන්නේ ඒවා නිවරදි කර ගන්න කියලා.සභාවේ නිති වලට යටත්ව තමයි.මං දැන් ඉපදුණා නෙමෙයි.මං ඇත්ත කතාව කිවුවේ.ඒක තේරුම් ගන්න.නැතුව වැරදියට තේරුම් ගන්න එපා කියලා මං ඔයාලට කිවුවනේ. පෞද්ගලිකව ගන්න එපා කියලා මේක.රීති පොත මමත් කට පාඩම් කරලා ඇවිල්ලා තියෙන්නේ.හරි නම් මේ යෝජනාව එතනට යනකන් යන්නත් බෑ.අපි මේක කතා කරන්න ඕනේ රීති පොතේ තියෙන්නේ.සභිකයා නැගිටලා කියන්න ඕනේ.ඒ යෝජනාව කියන එක විතරයි.ඊළගට ඊළඟ සභිකයා ස්ථිර කරාට පස්සේ තමයි ඊලඟ කෙනා නැගිටලා ඒ ගැන කතා කරන්න ඔනේ.ඒකෙ සංශෝධනයක් කරන්න,ඉස්සෙල්ලා අපි සංශෝධනයක් කළානේ.ඒ සංශෝධනය අපි ඉදිරිපත් කරන්න ඕනේ.නැතුව ඒ තව කෙනෙක්ට නවත්වන්න බෑ.අපි මේක සභා ශ්‍රවණාගාරය ගැන නම් කතා කළේ නම් ඒක ගිහිල්ලා ඉස්කෝලෙ පිට්ටනියේ නවත්වන්න බෑ.ඒක තමා රීතියේ තියෙන්නේ.මං නැගිටල කිවුවෙ ඒකයි මේක පෞද්ගලිකව ගන්න එපා.ඔයාලගේ යෝජනා ඔක්කොම වටිනවා.

**සභික ඒච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මේ ගොඩනැගිල්ල පිළිබඳව මම ඉස්සෙල්ලත් කතා කළා.ඒ ගොඩනැගිල්ලෙම කොටසක් තමා මේක.මේ අවකාශය සම්පූර්ණයෙන්ම අත ඇරලා මේ ඉදි කරලා තියෙන ගොඩනැගිල්ලේ සම්පූර්ණ ප්‍රයජෙනය අතඇරලා තියෙන්නේ.ඉතින් මම හිතනවා මේක යෝජනාවක් හැටියට ගෙනැල්ලා,මෙතන තියෙන දෙවැනි තට්ටුවේ ඉදලා,පළවෙනි තට්ටුව,දෙවැනි තට්ටුව,තුන්වෙනි තට්ටුව,මේ තට්ටු තුනනට ඉඩ,විශාල ඉඩ ප්‍රමාණයක් අයින් කරලා තියෙනවා.මේ වටේ කැල්ලේ විතරයි අපි ඉන්නේ.එතකොට මේ කැල්ල,අපේ දෙවැනි තට්ටුවේ කණු දාල උත්සලා ඒක මේකට සම්බන්ධ කරන්න පුළුවන් නම් මේ ශ්‍රවණාගාරය මෙතනට එනකම්ම ගන්න පුළුවන්.එතකොට මේ ඇහැලියගොඩ තියෙන විශාලම සම්පත හැටියට මේක පාවිච්චි කරන්න පුළුවන්.මං හිතන්නේ කණු 8 ක් යයි.ඒක බීම් වලින් දැන් ගහන්න පුළුවන් තාක්ෂණය දියුණුයි.එහෙම කරලා මේකට ස්ලැබ් එකක් දා ගත්තොත්,මේකෙන් අති විශාල ප්‍රයෝජනයක් ගන්න පුළුවන් කියනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාගේ 6.44.සභා ශ්‍රවණාගාරය නවීකරණය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**6.45.සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමාගේ යෝජනාව**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, හිරිපිටිය මන්ත්‍රීතුමාගේ ගෙදර කඨින පිංකම සඳහා ගෙදර ගියා.ඔබතුමා දැනුවත් කරලා ගියෙ කිවුවා.එම නිසා එතුමාගේ යෝජනාව මං ඉදිරිපත් කරන්නම්.

**6.45.මීන්නාන පන්ගොඩැල්ල මාර්ගය ගල්කඩ අසල ලියනමහත්මයාගේ නිවස අසල සිට මීටර් 100 පමණ කොන්ක්‍රීට් කිරීම සඳහා යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එම මාර්ගය කොටසක් භාවිතා කරනවා, සුසාන භූමියක් වශයෙනුත් භාවිතා කරනවා.එම මාර්ගය වෙලට ආසන්නව තියෙන මාර්ගයක්.නිතරම සාමාන්‍ය වැස්සට පවා මඩ වගුරක් බවට පත් වෙනවා.මීටර් 100 ක් වගේ ප්‍රමාණයක් තියෙන්නේ.විශාල ප්‍රමාණයක් නිවාසවලට එදිනෙදා කටයුතු සඳහා භාවිතා කරන මාර්ගයක්.ඒ නිසා ඒ මාර්ගය කොන්ක්‍රිට් කිරීම වැදගත් කියලා මං අදහස් කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමාගේ 6.45. යෝජනාව මීන්නාන පන්ගොඩැල්ල මාර්ගය ගල්කඩ අසල ලියනමහත්මයාගේ නිවස අසල සිට මීටර් 100 පමණ කොන්ක්‍රීට් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.46.සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමාගේ යෝජනාව

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාවත් මං ඉදිරිපත් කරනවා.
**6.46.මීන්නාන පන්සල අසල මාළු බෝක්කුවේ දෙපැත්තෙ ම අත් වැටක් සකස් කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ කියන්නේ මීන්නාන ටවුන් එකේ ඉදන් බොපැත්ත මාර්ගයේ ගමන් කරන කොටම හම්බෙන ඉස්සෙල්ලාම පන්සල තියෙන්නේ ,පන්සලට මෙහා පැත්තේ තියෙන පාරත් එක්ක සම්බන්ධ කරලා තියෙන පාලම තමයි.ඒකෙ අත්වැට හදල අවුරුදු ගානක ඉදලා අත් වැට වැටිලා තියෙනවා.ඒ අත්වැට සවි කිරීම ඉතාම වැදගත්. මේ ළඟ දිත් ත්‍රිවිල් එකක් ඒ කාණුවට වැටිලා තිබුණා.ඒක දැන් ඔබතුමන්ලගේ සංවර්ධන යෝජනා යටතේ එම මාර්ගය සුද්ද කරලා තියෙනවා.යන මාර්ගය සුද්ද කරලා තියෙනවා.ඒ නිසා මේක දැන්,අත්වැටේ වැදගත් කම තවත් ත්‍රිවුර වෙලා තියෙනවා.ඒනිසා ඒ සංවර්ධන යෝජනා ක්‍රමයට වටිනා කමක් ගන්න නම් මේ අත්වැට සවි කිරීම ගොඩක් වටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
මීන්නාන මන්ත්‍රිතුමිය දන්නවා ඇති ඒක.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒනිසා ඒ සඳහා ප්‍රවේශයක් ගන්න කියලා මං ඉල්ලා සිටිනවා.

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මේ යෝජනාවට සංශෝධනයක් ඉදිරිපත් කරන්න කැමතියි.අපේ ඇළ වේලි සුද්ද කරන ව්‍යාපෘතියේ දෙපැත්ත සුද්ද කරාට පස්සේ කලින් කැලැව තිබුණේ.එන කෙනෙකුට පේන් නෑ කැලැව තිබුණ හින්දා,වාහන යන එක නැවතුණා.දැන් මේ දෙපැත්ත සුද්ද වුණාට පස්සේ වැඩියෙන් වුමනාව දැනෙනවා එතනට.එතන්ටෙ අත් වැටට වැඩිය,එතනට පාලම ටිකක් පළල් වෙන්න ඕන.මොකද පාර පළල්.පාලම පටුයි.මෙහෙන් එන වාහන එක පාරට දැක්කෙ නැති වුණොත් පාලම පල්ලට වැටෙනවා.ඒ හින්දා මේක පාර පළල් කිරීමත් එක්ක අත්වැට සවි කරලා සංවර්ධනය කරන්න කියලා මං යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙතන පෙනී යන කාරණාව තමයි,එතන පාලමක් හදන්නයි අත්වැට ගහන්නයි විශාල මුදලක් යයි.හැබැයි දැනට මන්ත්‍රිතුමා යෝජනා කරලා තියෙන්නේ ඉතා කෙටි කාලයක් තුළ ආරක්ෂාකාරී වැඩ පිළිවෙලකට යන්න ඕනේ කියලා.මං හිතන්නේ රුපියල් පනස්දාහකට අඩු ඇස්තමේන්තු මුදලක් තමයි යකඩ වැටක් ඉදි කරන්න යන්නේ.ඒක හින්දා ඒකට ප්‍රමුඛතාවය දීලා ඒ මන්ත්‍රිතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කරමු කියන අදහස ඉදිරිපත් කරන්න කැමතියි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමාගේ 6.46. යෝජනාව මීන්නාන පන්සල අසල මාළු බෝක්කුවේ දෙපැත්තෙ ම අත් වැටක් සකස් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.47.සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
**6.47.කැනදන්ගමුව නගරය ජයසිරි හෝටලය අසලින් අස්ගගුල දක්වා දිවෙන මාර්ගයේ ගාමිණී මහතාගේ නිවස අසල බෝක්කුව සහිත අවහිරව ඇති කොටස යථා තත්ත්වයට පත්කර ගැනීම හා පිරිසිදු කර ගැනීමට මා යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ඇත්තටම අපේ ඇහැලියගොඩ ටවුන් එකේ ඉතා ආසන්නව තියෙන ගම්මානයක් තමයි අස්ගගුල කියන්නේ.අපිට දකින්නට පුළුවන් වෙනවා මේ පොළ භූමිය අසලින් එන මාර්ගය බ්ලොක් වෙනවා.ගොඩක් වෙලාවට තියෙනවා ඒ මාර්ගය බ්ලොක් වෙන වෙලාවල්.ඒ බ්ලොක් වෙන වෙලාවල් වලට shortcut පාරක් විදිහට පාවිච්චි කරනවා,ජයසිරි හෝටලය ළඟින් තියෙන ඇතුළ් පාර.ඇතුල් පාරෙන් ගොඩක් වෙලාවට අස්ගගුලේ සිට එන මිනිස්සු,ටවුන් එකේ ඉඳන් යන මිනිස්සු, ගොඩක් මිනිස්සු, ළමයි,උදේ වැඩට ගිහින් එන මිනිස්සු ගොඩක් අය ඒ පාර පාවිච්චි කරනවා.මේ පාරට,මේ පාරේ අපිට දකින්න පුළුවන් මේ පාර දෙපැත්තෙම තාප්පවල් වලින් අවහිර වෙලා තියෙන්නේ.ඒ පාරේ අඩි 8 ක් විතර පොඩි පාරක් තමා තියෙන්නේ.සාමාන්‍යයෙන් වාහනයක් ආවහම අනික් වාහනය හරවගෙන යන්න ඕනේ. මීටර් 500 ක් විතර හරවගෙන ගිහිල්ලා තමයි,අනික් වාහනය ගන්නත් වෙන්නේ.ඒ පාරේ තියෙන කාණුව,පොඩි බෝක්කුවක් තියෙනවා ඒ බොක්කුවෙන් නගරයෙන් එන වතුර Deep conerපාරෙන් ඇවිල්ලා එතනින් බැහැලා කුඹුරු යායට යන්නේ.ඒ බෝක්කුව අවහිර වෙලා තියෙන්නේ,එතන හරියට බෝක්කුව ඉදි කරලා නෑ.පොඩි බෝක්කුවක් තියෙන්නේ.ඒ බෝක්කුව හරිට ඉදි කරලා නෑ.ඒ බෝක්කුව පොඩියි.විනාඩි 5 ක් වැස්සක් වුණත්,එතන වතුර පිරෙනවා.එතන පිරෙන්නේ එතන ජරා වතුර සම්පූර්ණයෙන් ම පිරෙන්නේ.ඔතන කුණු දාලා තියෙනවා.මේ පාරේ යන්න එන්නම බැරි තත්ත්වයකට තියෙනවා.ඒක පුළුවන් තරම් ඉක්මනින් එම ස්ථානය සුද්ද පවිත්‍ර කර ඒ බෝක්කුව හදලා දෙන්න කියලා මං ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඒක වංගු සහිත මාර්ගයක්.මං හිතන්නේ අස්ගගුලයි නගරයයි සම්බන්ධ වෙන්න පුළුවන් කෙටි මාර්ගයක්.ඒක ඉවත් කළොත් අපිට ඇපත් නෑ.අනිත් එක ඒ ස්ථානය ගංවතුර ගැලුවහම පැය ගානක් වතුර රැදිලා තියෙනවා.මං හරිද මුන්සීර් මන්ත්‍රීතුමා.වැටවල් වලින්,තාප්ප වලින් තමයි ආවරණය වෙලා තියෙන්නේ.ඒ නිසා ඒක පරිසර ප්‍රශ්නයක් බවටත් පත්වෙලා තියෙනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මං හිතන්නේ මේ මාර්ගය අපේ මාර්ගයට විකල්ප මාර්ගයක් ලෙස භාවිතා කරන්න පුළුවන්.ඒකෙ ගැටලුවක් තියෙනවා ,එකෙ තාප්ප දැනට ඉදිවෙලා තියෙනවා.මම දන්නා තරමට අඩි 10 ක 12 ක තිබුණ පාරක් තමයි. දැන් අඩි අටක් නෑ.අඩි 16 ගැසට් කිරීමක් තියෙනවා කියලා,නමුත් මං ඒක හරියටම දන්නේ නෑ.මේ මාර්ගය භාවිතා කරන්න පුළුවන් විකල්ප මාර්ගයක් විදිහට, නගරයේ පොඩි බ්ලොක් එකක් වුණොත්.මං හිතන්නේ ඒක හදලා දෙනව නම් හොඳයි.ඒවගේම තමයි මේ මන්ත්‍රීතුමා කිව්ව වගේ දාල තියෙන බෝක්කුව පල්ලෙහයින් දාල තියෙන්නෙ.ඒ කියන්නේ පාරට ගොඩක් පහතින්. ඒ කියන්නේ වතුර යන්නේ පසට උඩින්.ඒ නිසා ඒ බෝක්කුව ගලවලා,යන්නේ ජරාම වතුර තමයි.ඒ කියන්නේ නගරයේ එන,පොලෙන් එන සියලුම වතුර ටික ඔතනින් බහින්නේ.ඒනිසා ඒක මං හිතන්නේ හැකි ඉක්මනින් කරලා දෙනව නම්,ඒක හොඳ කරුණක්. මං හිතන්නේ,ඒක ඉක්මනින් ම කරලා දෙන්න කියලා සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුවසභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 6.47 යෝජනාව කැනදන්ගමුව නගරය ජයසිරි හෝටලය අසලින් අස්ගගුල දක්වා දිවෙන මාර්ගයේ ගාමිණී මහතාගේ නිවස අසල බෝක්කුව සහිත අවහිරව ඇති කොටස යථා තත්ත්වයට පත්කර ගැනීම හා පිරිසිදු කර ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.48.සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**

**6.48.පොළ භූමියේ සිට අස්ගගුල දක්වා දිවෙන මාර්ගයේ Deep corner වෙළඳසැල අසල අවහිර වී ඇති ගස් ඉවත් කර කාණුව ප්‍රතිසංස්කරණය කිරීමට මා යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,පොළ භූමිය පාරේ අස්ගගුලට යන මාර්ගයේ Deep conerවෙළඳසැළෙන් එහා පැත්තට පොළ භූමියේ තියෙන තාප්පයේ මහා විශාල ලොකු ගස්,මං හිතන විදිහට ගස් 4 ක් විතර,මහා ලොකු ගස් වෙලා තියෙනවා.ඒ ගස් කවදා කඩා වැටෙයිද කියලා අපිට හරියටම කියා ගන්න බෑ.වැයර් ටික උඩ තමා ගස්ටික ඔක්කොම තියෙන්නේ.බැම්මත් එක්ක ම ලොකු විශාල ගස් එතන තියෙනවා.හැම විටම ඔතන පාසල් ළමුන් ගමන් කරන ස්ථානයක්.ඒ ගස් කඩාගෙන වැටුණොත් එතන කරන්ට් වැයර් විතරක් නෙමෙයි,ටෙලිෆෝන් වැයරුත් තියෙනවා, ඔය ගස් අස්සෙ දැන්.වැවිලා ඒ ගස් ලොකු වෙලා දැන් ඒ ගස් දැන් කැඩිලා තියෙන්නේ.ගොඩාක් කාලෙකින් ඒක කවුරුත්,මං හිතන්නේ හරියට බලා ගන්න බැරුව ඇති.අනිත් එක ඔතන තියෙන කාණුව මං කියපු, අර අනිත් කාණුවට ජොයින්ට් වෙන තැන,පොළෙන් එන වතුර පාර.ඔතන දැන් වුනත් බලාගෙන යද්දී හොඳට පේනවා.හැම විටම ජරා ගොඩක් වගේ තමා ඔතන පේන්නේ.ජරා ගොඩක් වගේ

ප්ලාස්ටික්,පොලිතින් අනම් මනම් ඔක්කොම කුණු ගොඩවල්,ටවුමට එන අයත් ටවුමෙන් එන අයත් හරි ටවුමෙන් යන අයත් හරි ඔතනින් ඇවිල්ලා දාල යනවා.එම ස්ථානය ඉතා ඉක්මනින් පිරිසිදු කරගෙන ඔය කාණුව අවහිර වෙලා තියෙන තුන සුද්ද පවිත්‍ර කරගෙන ඔය ගස් ටික ඉවත් කරලා දෙන්න කියලා මං ඉල්ලා සිටිනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 6.48 යෝජනාවපොළ භූමියේ සිට අස්ගගුල දක්වා දිවෙන මාර්ගයේ Deep corner වෙළඳසැළ අසල අවහිර වී ඇති ගස් ඉවත් කර කාණුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

6.49.සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**

**6.49.ප්‍රාථමික විද්‍යාලය දෙස සිට අස්ගගුල දක්වා දිවෙන මාර්ගයේ කාණු පද්ධතිය සකස් කර මාර්ගය දෙපස ශුද්ධ පවිත්‍ර කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, විල්ලේගොඩ පනාවල මාර්ගයේ ප්‍රාථමික විද්‍යාලය ඇතුළට තියෙන මෙම මාර්ගයේ පාර පැත්තට දැන් කලින් දාල තිබුණු කාණුව එක පැත්තක් විතරයි කොන්ක්‍රිට් දාල තියෙන්නේ පටියක් විතරයි.කොන්ක්‍රිට් පටියක් තියෙන්නේ.අනික් පැත්ත පාර පැත්ත ඔහොන්මම වතුර පාරට ඇවිල්ලා ඔක්කොම කොන්ක්‍රිට් එක අස්සේ තියෙන පස් ඔක්කොම ගලාගෙන ගිහිල්ලා ඇතුළේ හිස් වෙලා තියෙන්නේ.ඒ පාරේ බර වාහන යනවා.ඒක බයිපාස් විදිහට පාවිච්චි කරන පාරක්.ඒ පාරේ වැහි වෙලාවට ලොකු වතුර පාරක් එනවා.ඒ වතුර පාරෙන් ඒ කාණුව හෝදගෙන ගිහිල්ලා තියෙන්නේ.ඒ ස්ථානයට කොන්ක්‍රිට් කාණුවක් සකස් කරලා දෙන්න කියලායි,ඒ පාර දෙපැත්ත ලොකු මාන ගස් වැවිලා පාර වංගුවක්වත් පේන් නෑ.පොඩි ළමයි නිතරම යන එන මාර්ගයක්.අපිට cctv දර්ශන හම්බුණා.ගොඩක් අය වාහනවල එද්දි,ඔය ටිකට කුණු විසික් කරලා එනවා.කුණු දාල යනවා.ඉතාම අපිරිසිදු තත්ත්වයක ඔතන තියෙන්නේ.එම ස්ථානයට ඉතා ඉක්මනින් සුද්ද පවිත්‍ර කරලා දෙන්න කියලා මං ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඕකටත් මං දිගුවක් එකතු කරනවා.මං හිතන්නේ මේ යෝජනාවට දකුණු පැත්තෙන් එන්න ඕනේ කරුණු.කරන්න දෙයක් නෑ වම්පැත්තෙන් කරන්න එපැයි.මේ පාර කාණු පද්ධතිය සැකසීම ඉතාම වැදගත්. ඒත් එක්කම මෙතුමා කිව්ව වගේ විකල්ප මාර්ගයක් විදිහට කවර් කරගන්න පුළුවන් අස්ගගුල පැත්තට පනාවල මාර්ගයට සම්බන්ධ වෙන්න.ඒකට මේ කාණු පද්ධතිය සකස් කරලා ස්ලැබ් කැලි දාල,තියෙන ඉඩ ප්‍රමාණය පාරටම ගන්න පුළුවන් ක්‍රමයක් හදලා දුන්න නම් හොදයි කියලා මං අදහස් කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 6.49 යෝජනාවප්‍රාථමික විද්‍යාලය දෙස සිට අස්ගගුල දක්වා දිවෙන මාර්ගයේ කාණු පද්ධතිය සකස් කර මාර්ගය දෙපස ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා වූයෝජනා කරමි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

හදිසි යෝජනා දෙකක් තියෙනවා.

**හදිසි යෝජනා:-01**

**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව හා මහජන පුස්තකාලයන් එක්ව සංවිධානය කරනු ලබන සාහිත්‍ය කලා මංගල්‍යයේකටයුතු සඳහා රුපියල් 250,000.00 ක මුදලකට උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.**

මේක ඇත්තටම ඇස්තමේන්තුවක් සකස් කරලා තියෙනවා සාහිත්‍ය කලා,සාහිත්‍ය දිනයට.ත්‍යාග ප්‍රථම දෙවන තෙවන.සංග්‍රහ,ආරාධනා ,සහතික පත්‍ර මුද්‍රණ,සැරසිලි,ඡායාරූප,නැටුම් කණ්ඩායම්,නිවේදන,බැනර්සඳහා ඇස්තමේන්තුව හදලා තියෙනවා 217000.00 ක.මේකේ යෝජනාව දාන්නේ.මං යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාරමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මම දන්නැ මේක හදිසි යෝජනාවක් විදිහට ආවේ කොහොමද කියලා.දැන් වර්ෂය මුලදී මේ සාහිත්‍ය උත්සවය තියෙනවා කියලා,තීරණයක් අරන් තිබුණ් නැද්ද?අය වැයෙන් මේක වෙන් කරලා තිබුණ්

නැද්ද?ඇයි මේක හදිසි යෝජනාවක් විදිහට ආවේ.ඒ වගේ යෝජනා කීපයක්ම අපි දැක්ක.රුපියල් ලක්ෂ අටක් ඉල්ලුවා.සාහිත්‍ය මාසේ ඉවර වුණාට පස්සේ තමා පුස්තකාලෙට පොත් ගන්නේ.අර සාමාන්‍ය ආයතනයක හරි කොහෙ හරි පුස්තකාලෙට පොත් ගන්නේ, සාමාන්‍යයෙන් සාහිත්‍ය මාසේ.ගොඩක් වෙලාවට සැප්තැම්බර් මාසේ.ගොඩක් ලොකු ඩිස්කවුන්ට් එකක් එක.,වට්ටමක් එක්ක ගන්න පුළුවන් මාසයක් තමයි සැප්තැම්බර් මාසේ.දැන් අද තමයි යෝජනාව ආවේ ලක්ෂ අටක් පුස්තකාලෙට පොත් ගන්න.දැන් මේ යෝජනාවත් එන්නේ හදිසි යෝජනාවක් විදිහට.මේක මං නම් හිතන්නේ මේක සුදුසු නෑ.මේක කලමණාකරණ දෝෂයක් විදිහට තමයි මම දකින්නේ.සභාපතිතුමා මේක මැදිහත්වෙලා ඒ දෝෂ ටික ඉවත් කර ගන්න වෙයි.ලබන අවුරුද්ද වෙන කොටත් අපි නිශ්චිත වැඩපිළිවෙළකට එන්න.year plan එකේ මේක තියෙන්න ඕනේ,සාහිත්‍ය මාසේ වෙනුවෙන් පවත් වන උත්සවය මේ දවසේ තියෙන්නේ.මේ ගාණක බජට් එකක් යනවා.මේ සඳහා අනුමැතිය සභාවෙන් කලින් අරගෙන තියෙන්න ඕන.හදිසි යෝජනාවක් විදිහට මේක ආපු එක එච්චර සුදුසු නෑ,කියන එක තමයි මගේ අදහස.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
සාහිත්‍ය කලා මංගල්‍යයේ දිනේ තියෙන්නේ නොවැම්බර් 24.ප්‍රාදේශිය සභාව විසින් කරන.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ ආසනයේ සියලුම කලාකරුවන් සම්බන්ධ කර ගෙන ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔව්.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ඉන්න කලාකරුවන්ව සම්බන්ධ කරන එකක්.ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසිනුත් හෙට අනිද්දට කරනව නේද?ප්‍රාදේශිය සබාව විසින් කරන එක තමයි මේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව ඉදිරිපත් කරන කොට ඒ යෝජනාවේ අත්‍යවශ්‍ය කාර්ය සභාවට කියන්න ඕනේ.මහජන සුභ සිද්ධිය සඳහා හේතු වන ආකාරය පැහැදිලි කරන්න ඕනේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ දේ උනේ නෑ නේද? ඇත්තටම මේක ඔබතුමා මතක් කරපු එක හොඳයි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
හදිසි යෝජනාවක් විදිහට යෝජනාවක් ඉදිරිපත් කරනව නම් ,රීති එකේ 20 -13 තියෙන්නේ අත්‍යවශ්‍ය කාරණය සඳහන් කරන්න ඕනේ,මහජන සුභ සිද්ධිය සඳහා බලන්නේ කොහොම ද කියලත් සඳහන් කරන්න ඕනේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම මේක ඇහැලියගොඩ සභා බල ප්‍රදේශයේපුස්තකාලවල පාඨක සමාජ,පාසල් දරුවන්, රාජ්‍ය ආයතන,පෙර පාසල් වගේ සම්බන්ධ කරගෙන එම අයට නිර්මාණ කරන්න, නිර්මාණ ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙන සාහිත්‍ය උත්සවයක්.විශේෂයෙන්ම ඇහැලියගොඩ සභා බල ප්‍රදේශයේ ම කලාකරුවන්ට නිර්මාණ එළි දක්වන්න අවස්ථාව තියෙනවා.පළාත් පාලන සතියෙත් අපි එහෙම එකක් කළා.ඔබතුමාලට මතක ඇති ඊ සඟරාවක් අපි එළිදැක්වූවා.පුස්තකාල පාඨක සමාජ එවපු නිර්මාණ.අන්න ඒ වගේ සාහිත්‍ය දිනයක් තමයි,ඊට වඩා පුළුල්ව ක්‍රියාත්මකකරන්නේ.සති දෙකක තුනක දැවැන්ත වැයමක්, මේක.පුසතකාලාධිපතිවරු ඊටපස්සේ විෂය භාර නිලධාරීතුමිය විශාල මහන්සියක් දරනවා මේක සාර්ථක කර ගන්න.ඒකට ඔබතුමාලටත් සහයෝගය දෙන්න පුළුවන්.මේකෙ චිත්‍ර තරගයක් තියෙනවා,කවි තරගයක් තියෙනවා,පාසල් අංශය,කෙටි කතා තරගජන ගායනා තරග,පෙර පාසල් අංශය තියෙනවා,පාසල් අංශය තියෙනවා.කවි තරග තියෙනවා.පාසල් අංශ,විවෘත,ඊට පස්සේ කෙටිකතා තියෙනවා පාසල් අංශ විවෘත,ඊටපස්සේ ජන ගායනා තරග තියෙනවා රාජ්‍ය අංශය හා වැඩිහිටියන්.මේ විදිහට තමා සාහිත්‍ය උත්සවය කෙරෙන්නේ.මේ සඳහා තරග අයදුම්පත තියෙනවා වෙබ් සයිඩ් එකේ.නැත්නම් කාර්යෙන් ලබා ගන්නත් පුළුවන්.ඒවට සම්බන්ධ වෙලා ප්‍රදේශයේ ඉන්න ජනතාවට ඔවුන්ගේ නිර්මාණ කුසලතාවය ඔප් නංවා ගන්න අවස්ථාවක් විදිහට මේ සාහිත්‍ය උත්සවය භාවිතා කරන්න පුළුවන්.
තවත් මේ සම්බන්ධව අදහස් තියෙනව ද?

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අර දිලීන් මන්ත්‍රීතුමා කළ කාරණය සම්බන්ධව අවධානය යොමු කරන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔව්.එතන දී වැරද්දක් තියෙනවා.අපි ඒක නිවරදි කර ගන්නම්.ඒ කියන්නේ year plan එක ,ඒ කියන්නේ අවුරුද්දට වැඩ සැලැස්මක් තියෙන්න ඕනේ.අපි අවුරුද්දෙ මැදක් ගිහිලිලා තමයි වැඩ භාර ගන්නේ.අපි ඊ ළඟ අවුරුද්දෙ ඉඳන් හරියට හදා ගමු. අපි ආවට පස්සේ හිර වෙලා තිබ්බ ප්‍රශ්න ටික ඔක්කොම ආවෙ අපිට නේ.එදිනෙදා ප්‍රශ්න විසඳන ගමන් තමයි මේ ප්‍රශ්නත් විසඳන්නත් වෙලා තියෙන්නේ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දැන් හෙට අපි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සංස්කෘතික බල මණ්ඩලය හා ප්‍රාදේශිය ලේකම් තාර්යාලය ඒකාබද්ධව සාහිත්‍ය උත්සවය තියෙනවා.මම ඒකෙ සභාපති.මං හිතන්නේ සභාවක් විදිහට,අපි සභාවේ සියලු දෙනා ම ප්‍රමුකත්වයක් ගමු.මං හිතන්නේ දිලින් මන්ත්‍රීතුමා,සුජීව මන්ත්‍රීතුමා,ඔබතුමා ඇරෙන්න අනිත් අය අත් දැකීම් අඩු අය.ඒනිසා මං හිතන්නේ අපි මේක මෙවර උත්සව පොඩ්ඩක් සාකච්ඡා කරලා හොඳට ලස්සනට විනිවිද භාවයෙන් යුතුවකරමු.අපි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පැවැත්වෙන උත්සවය දැනට මාසෙක ඉදන් වගේ,හැබැයි ඒ උත්සවය පැවැත්වෙන්නේ පැය තුන හතරක කාලයක් එක කෙරෙන්නේ.ඒ වුණාට දැන් මාසෙක ඉදන් වගේ ඒ Progrmeඑකේ වැඩ.සුනිල් සෙනවි අමාත්‍යතුමත් එනවා.ඒනිසා එක පාර පටන් ගන්නේ නැතුව

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම මේකෙ උත්සවය තියෙන්නේ නොවැම්බර් 27,තව එකට කල් තියෙනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ඒ නිසා ඒකට දැන්ම ඉදන් සංවිධාන කටයුතු කරමු.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔව්,ඔබතුමත් ඒකට සම්බන්ධ වෙන්න.ඒකෙ ප්‍රධාන ආරාධිත අමුත්තා විදිහට සම්බන්ධ වෙන්නේ අපේ ආසනේ පාර්ලිමේන්තු ඇමතිතුමා සුනිල් සෙනවි ඇමතිතුමා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුවහදිසි යෝජනා 01 යටතේ ඉදිරිපත් වූ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව හා මහජන පුස්තකාලයන් එක්ව සංවිධානය කරනු ලබන සාහිත්‍ය කලා මංගල්‍යයේ කටයුතු සඳහා රු.250,000.00 ක මුදලක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
තවත් හදිසි යෝජනාවක් තියෙනවා.

**හදිසි යෝජනා:-02**
**සභාව සතු ක්‍රියාකාරී තත්ත්වයේ පවතින වාහන 08 ක් පැවතියද,සිටින රියදුරන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් නව රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බව මම මේ ගරු සභාවට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාරමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
මේක ඇත්තටම ක්‍රියාරී තත්ත්වයේ තියෙන වාහන අටක් තියෙනවා.අපිට ඉන්නේ මං හිතන්නේ රියදුරෝ තුන් දෙනයි.අපේ මෙල්සිරි මහත්තයත්,විදුලි කම්බිකරු තමා එයාගේ තනතුර. ඒ අතර ත්‍රිරෝ රථ රියදුරෙක්.එහෙම තමයි කටයුතු කරන්නේ.ඒ නිසා අපට කොන්ත්‍රාත් පදනමින් තමයි අපි බඳවාගන්න අදහස් කරන්නේ.එතකොට ඒකට තත්කාර්ය පදනම මත .එතකොට ඒකට අදහස් එහෙම තියෙනව නම් කියන්න.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මීට පෙර අපේ සභාපතිතුමාගේ නිල රථයට රියදුරු මහතෙකු ලබා ගන්න යෝජනා ස්ථිර වුණා.ඒ යෝජනාව ක්‍රියාත්මකද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
නැ.ඒ යෝජනාව ක්‍රියාත්මක වුණේ නැ.ඒක අනුමත කරන්න බැ කිවුවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගිය පාර සභා වාර්තාවේ තියෙනවා 32 පිටුවේ ,මං මේ ගිය සැරේ යෝජනාව කියවන්නේ"ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය රාජකාරී කටයුතු ඉටු කිරිමේ දී ප්‍රමාණවත් නොවන බැවින් පහත සඳහන් තනතුරු බඳවා ගැනිමේ සුදුසුකම් අනුව PL-1 කාණ්ඩයේ වැටුපක් ගෙවීම මත සේවා ගිවිසුම් යටතේ බඳවා ගැනිම සුදුසු බව මම මෙම ගරු සභාවට යෝජනා කරමි.මුරකරු-04, පුස්තකාල සහයක-01, වැඩ ක්ෂේත්‍ර කම්කරු- 06, ආදාහනාගාර භාරකරු-01, ආදාහනාගාර, ක්‍රියාකරු-01, ආදාහනාගාර ක්‍රියාකරු සහයක -01, ජලනල වැද්දුම් ශිලපීන්-01, ට්‍රැක්ටර් රියදුරු -01"එතකොට අපේ අමිල් මන්ත්‍රීතුමා මේ යෝජනාව ස්ථිරත් කළා.එතකොට මේක හදිසි යෝජනාවක් ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

නැ මන්ත්‍රීතුමා,මේක පැහැදිලි කිරීමක් කරන්න ඕන.අපි මේ යෝජනාව කරාට අපේ මේ යෝජනාව සභා සම්මත වුණාට පස්සේ ,ඒක අපි නැවත අනුමැතියට යවනවා.අපි මේ දැන් කරන්නේ මොකද්ද,සභාවේ අවසරය ගන්නවා,සභා අනුමැතිය ගන්නවා.ඊට පස්සේ පළාත් සභාවට යවලා අනුමත කරල තමයි ගන්නේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගිය සැරේ 16 දෙනෙක් ගන්න අනුමත කරා.එතකොට අපි මේක ගිය පාර දාගත්ත නම් මේ ප්‍රශ්නය ඉවරයි.මේක වැරදියට තේරුම් ගන්න එපා.බොහොම සද්භාවයෙන් කියන්නේ පිළිවෙලක් අනුගමනය කරන කොට හරි ලේසියි.නැත් නම් දවසින් දවස ප්‍රශ්න ඇති වෙන් නෑ.මේක අපි වෙන තැනකට යමු.හදා ගමු.වාහන 8 ක් තියෙනව නම් වාහන වලට රියදුරෝ දවසින් දවස ගන්නව නම්,ඒක එක පාර අවශ්‍යය රියදුරෝ ප්‍රමාණය වැඩ ආවර්ණය කරන්න පුළුවන් විදිහට,ටිපර් එකට කෙනයි,අපේ කැබ් දෙකට දෙන්නයි, ත්‍රිවිල් එකට එක්කෙනයි, වගේ කොහොම ගන්නවාද,වැඩ ආවරණය වන විදිහට ගන්නවාද?වාහන 8 ම එක පාර දුවන් නැනේ.මේවා අපි කතා කර ගමු.ගියපාර යෝජනාවක් දාලා සභාපතිතුමාට පෞද්ගලික රියදුරෙක් ගන්න අපි අනිවාර්යෙන් ම එකඟ වුණා.මේවටත් අපි විදිහක් හදා ගෙන ,මේ ඉතින් ගියපාර සභාවේ අනුමත කරපු එකම තමා.මේ වෙන විදිහකින් දාලා තියෙන්නේ.ගියපාර යෝජනාවට තව එක්කෙනෙක් දැම්ම නම් වැඩේ ඉවරයි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඒක මන්ත්‍රීතුමා අපි සේවකයෝ බඳවා ගන්න කොට විවිධ පදනම් මත තමයි ගන්නේ.දැන් මේ මෙතන යෝජනාව දාල තියෙන්නේ සේවා ගිවිසුම් මත බඳවා ගන්න.අපි අද යෝජනා කරන්නේ තත්කාර්ය මත බඳවා ගන්න.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, තත්කාර්ය පදනම කියන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

අපි මහා සභාව කාරක සභාවකට යෝජනා කරමුද?

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභිකටී.ඩී.වජිර සුසන්ත ජයසෝමමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මෙතැන් සිට කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කරනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, කාරක සභාවේ සාකච්ඡා කරපු විදිහට ගියවර සභාපතිතුමාට පෞද්ගලික රියදුරෙක් ගන්න, හදිසි යෝජනාවක් යටතේ ගියවරසභාවේ යෝජනාවක් ඇවිල්ල තිබ්බා.අපි ඒකටත් අනුමැතිය දුන්නා.හැබැයි ඒ ආකාරයෙන් නව බඳවා ගැනීම් කර ගන්න බැරි නම් තත්කාලීන පදනම මත ඒ අවශ්‍යතාව සපුරා ගැනිම සඳහා අපි, අපේ වම් පැත්තෙ කණ්ඩායම නැත්තන් අපේ විපක්ෂ කණ්ඩායමේ අපේ අනුමැතිය ලබා දෙනවා.ඒක ප්‍රශ්නයක් නෑ.හැබැයි මං තව දුරටත් කියන්න කැමතියි, මං ඉස්සෙල්ලත් කිවුවා මේ වගේ දේවල් හදිසි යෝජනා විදිහට ගෙන ඒමේ පදනම මං දන් නෑ කොච්චර අවශ්‍යතාවයක් තියෙනවද කියලා?අපි තැමතියි නොවැම්බර් මාසේ සභාවේ සාකච්ඡා කරන්න න්‍යාය පත්‍රයේ ඇතුළත් කරලා මීට වඩා විධිමත්ව ඒ යෝජනා ස්ථිරත්වයෙන් අපේ ඊළඟ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවට කියලා ඒ අවශ්‍ය කටයුතු සිදු වුණා නම් අපි මීට වඩා සැහිමකට පත් වෙනවා.කෙසේ වෙතත් සභාවේ අවශයතාවය තියෙනව නම් රියදුරෙක් බඳවා ගැනිම සඳහා කුමන පදනමින් හෝ ඒ රියදුරු බඳවාගෙන ඒ අවශයතාවය ඉටු කර ගැනිම සඳහා අපේ විරෝධතාවයක් නෑ කියන අදහස අපි මේ වෙලාවේ ඉදිරිපත් කරන්න කැමතියි.

ඒ අනුව මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුවහදිසි යෝජනා 02 යටතේ ඉදිරිපත් වු සභාව සතු ක්‍රියාකාරී තත්ත්වයේ පවතින වාහන 08 ක් පැවතියද,සිටින රියදුරන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් නව රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බවට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.කාරක සභා වාර්තාව**

**07.01. 2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව**

මං හිතනවා මේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තා ලැබිලා ඇති.ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව සභා සම්මත කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

අපේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටුවමයි ප්‍රසම්පාදන කමිටුවත් වෙන්නේ. ඒ අනුව 07.01, 07.02, 07.03, 07.04, 07.05, 07.06, 07.07, 07.08 ලෙස මුදල් හා ප්‍රතිපත්ති සම්පාදක කමිටුව සහ ප්‍රසම්පාදන කමිටු වාර්තා ඔබතුමන්ලා අතට ලැබිලා ඇති.මම යෝජනා කරනවා 07.01 සිට 07.08 දක්වා වන

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අපි එකෙන් එක අරගමු නේද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමාට මොනව හරි කතා කරන්න දෙයක් තියෙනව නම් ප්‍රශ්න කරන්න දෙයක් තියෙනව නම් දැන් ඒකට අවස්ථාව

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අපි එකින් එකට යන්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
හරි.අපි එකින් එකට යන්.

**07.01. 2025.09.09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමං සභා සම්මත කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ සම්බන්ධව මොකුත් කතා කරන්න දෙයක් තියෙනව ද?

ඒ අනුව මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.09 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.02. 2025.09.15 වනදින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.15 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමං සභා සම්මත කරනවා.

ඒ අනුව මූලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.15 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.03. 2025.09.30 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව**

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමං සභා සම්මත කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025.09.30 දින පැවති මුදල් කමිටුවේ මං කැමතියි අවධානය යොමු කරන්න, 3 වැනි කාරණාවට.ගෙවීමට ඇති බිල්පත්,ගෙවල තියෙන සේවා.ඒකෙ තුන් වෙනි එකේ තියෙනවා.දියවෙල්ල මාර්ගයට රුපියල් 84000.00 ක මුදලක් ගෙවලා තියෙනවා.ඒකට සිමෙන්ති කොට්ට 154 ක් අරන් දීලා තියෙනවා.282600 ක්,එතකොට අපි දන්නවා සභාවේ යෝජනා දෙකක් ආවා එකක් ආරියදාස මන්ත්‍රීතුමාගේ මං හිතන්නේ, අනිත් එක තමා අපේ රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමාගේ.සමාවෙන්න ආරියදාස මන්ත්‍රීතුමා නෙමේ රණවීර මන්ත්‍රීතුමාගේ.එතකොට මේ හා සම්බන්ධම යෝජනා දෙකක් තමා ඒ ඇවිල්ලත් තියෙන්නේ.මේ අවස්ථාව මීටිපොල දියවෙල්ල සඳහාත්,ඒ අවස්ථාව දීලා තියෙනවා.ඒක හින්දා ඒ අවස්ථාව ගත්ත විදිහට, මෙතුමන් දෙන්නාලගේ යෝජනා දෙක ඉක්මනට,දැන් ගමේ වැඩක්,රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමාගේ වැලි කියුබ් ටිකත් අරන් දීලා තියෙනනේ ගමේ අය.ගල් ටිකත් අරන් දීලා තියෙන්නේ.සිමෙන්තිත් අරන් දීලා තියෙන්නේ

කොටසක් මදි වෙලා තියෙන්නේ.ඒ ඉල්ලීම් මෙන්න මේ ආකාරයට ඉටු කරලා දෙන්න පුළුවන් නම් හොඳයි කියන අදහස මේ වෙලාවේ ඉදිරිපත් කරන්න කැමතියි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ ක්‍රියාවලියම යනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මට මතක විදියට මෙක මාස දෙකකට වඩා අඩු ක්‍රියාවලියක ප්‍රතිඵලයක් තමා මේ තියෙන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
මාස දෙකක් විතර ගියා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒ ක්‍රියාවලියට ගිහිල්ල හරි මේ යෝජනා සඳහා සභාවේ අවධානය යොමු කරොත් හොඳයි කියලා අදහසක් ඉදිරිපත් කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කතා කරන්න පොඩි දෙයක් තියෙනවා.මං මේක කලින් සභාවලත් කතා කළා.මේ කමිටුවේ වාහනවලට ඩීසල් ගහපුවා තියෙනවා.එතකොට මේ නම්බර් සම්බන්ධව නෙමේ මේ ගැටලුව තියෙන්නේ.අපි දැන් ගත්ත එකේ ගත්තොත් 2025.09.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවේ දෙවැනි පිටුවේ ගෙවීමට ඇති බිල්පත් 02 ක.වාහන සඳහා ලබා ගත් ඉන්ධන බිල්පත් PF-7135 රු.44849.00 යි.2025.09.01 ගහලා තියෙනවා රු.21000.00 ක 2025.09.04 ගහල තියෙනවා රු.10000.00 ක.2025.09.05 ගහල තියෙනවා රු.11000.00 ක.එතකොට මේ,මේක මටත් තේරෙනවා.ඔබතුමාල කිලෝමීටරයට ගිය ඩීසල් ප්‍රමාණයට ගහලා.ෆුල් ටැන්ක් කරනවා.හැබැයි මං සභාවාර තුනකට කලිනුත් කිවුවා,එදා මං මතුකරපු ප්‍රශ්නෙ තමා,එදා මුදල් කමිටුවට දාල තිබුණු එකේ දිනේ තිබ්බේ නෑ බිල්වල,වාර්තාවේ.හැබැයි එදා හිටපු මන්ත්‍රීවරු සියලු දෙනා ඒක අනුමත කරලා තිබුණා,ඒක ගැටලුවක් නෑ.මේකෙ අපිට දාන්න පුළුවන් නම් 09.01 සිට 09.05 දක්වා බිල .ඔබතුමාල එක බිලෙන් නෙමේ,එක පාර ඩීසල් ගහනකොටඑන බිල නෙමේ මේ.කාල බැලන්ස් වීමෙන් නම් එන්නේ,ඒක දාන්න පුළුවන් මෙතන.කවදා සිට කවද දක්වා ද යන්න,කාල පරාසයක්.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙතැන් සිට කාරක සභාව මහා සභාවක් බවට යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මං ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.30 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.04.2025.09.09 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.09 දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාවමං සභා සම්මත කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.09 දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.05. 2025.09.15 වනදින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්ථාව**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.15 දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ)කමිටුවාර්තාව මං සභා සම්මත කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.15 දින පැවති (මිලදී ගැනීම් සම්බන්ධ)කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.06.2025.09.15 වනදින පැවති ප්‍රසම්පාදන (දේපල බදු දීම සම්බන්ධ) කමිටු වාර්ථාව**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.15 දින පැවති ප්‍රසම්පාදන(දේපල බදු දීම සම්බන්ධ) කමිටු වාර්තාව මං සභා සම්මත කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.15 දින පැවති (දේපල බදු දීම සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.07. 2025.09.30 වන දින ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.30 දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ)කමිටු වාර්තාව මං සභා සම්මත කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.30 දින පැවති (මිලදී ගැනීම් සම්බන්ධ)කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.08. 2025.09.22 වන දින ප්‍රසම්පාදන (ඉදිකිරීම් සම්බන්ධ) කමිටු වාර්තාව.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.22 දින පැවති ප්‍රසම්පාදන(ඉදිකිරීම් සම්බන්ධ)කමිටු වාර්තාව මං සභා සම්මත කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.22 දින පැවති (ඉදිකිරීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**07.09. 2025.09.24 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභා වාර්තාවේ 2025.09.24 දින පැවතිනිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව මං සභා සම්මත කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව කවුරුත් අත්සන් කරලා නෑ.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි අත්සන් ලේඛනයේ අත්සන් කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
නෑ. එතන නෙමේ.දැන් මේක කමිටු වාර්තාවක් නේ.කමිටු වාර්තාවේ මෙතන පැමිණීම අත්සන් කිරීම නෙමේ මම කියන්නේ.මම කියන්නේ ඒ Document එක අත්සන් කරලා නෑ කියලා.
**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ඔබතුමා කියන්නේ සභාපතිතුමාගේ අත්සනක් මේකට දාල නෑ කියලනේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
සභාපතිතුමාගේ හරි, ලේකම්තුමාගේ හරි. (ඝෝෂාව)

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ඔබතුමා කියන එක හරි.අනිත් වාර්තා අත්සන් කරනවනේ.මේකත් ලොකු දෙයක් කරන එකක්නේ.මේක සෑහෙන දේවල් නිත්‍යානුකූල වෙන දේවල් මේ යෝජනා ඇතුළේ තියෙන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
හරි.අපි ඒක නිවරදි කරන්නම්.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025.09.24 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

07.10. කාර්මික සේවා කමිටුව - නොපැවැත්විණි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

07.11.පරිසර හා සේවා පහසුකම් කමිටුව - නොපැවැත්විණි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ කමිටු නොපැවැත්වීම පිළිබඳව ඔබතුමාට දැනුම් දීලා තියෙනවද? ඒ කමිටු සභාපතිවරු මොකක් හරි තීරණයක් අරන් තියෙනවද ඒ කමිටු පවත්වන්නේ නෑ කියලා.ඒ කමිටුවලට අදාළ ප්‍රශ්න උද්ගත වෙලා නැද්ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ප්‍රශ්න ආවොත් තමා ඒවා දාන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ප්‍රශ්න නෑ, ඒ කියන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම ඒක මොකක්ද දන්නවද වුණේ.සභාපතිතුමා ඍජුව මැදිහත් වුණා ඒ ප්‍රශ්න වලට, ඒකයි වුණේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ප්‍රශ්න නැත්නම් ප්‍රශ්න එවන්නම්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ප්‍රශ්න එවන්න.ප්‍රශ්න එවන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**08. ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා,වෙනත් වාර්තා**

**08.01. 2025 සැප්තැම්බර් මස ආදායම් වියදම් වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025 සැප්තැම්බර් මස ආදායම් වියදම් වාර්තාවමං සභා සම්මත කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025 සැප්තැම්බර් මස ආදායම් වියදම් වාර්තාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**08.02. 2025 සැප්තැම්බර් මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025 සැප්තැම්බර් මස හිඟ ආදායම් වාර්තාවමං සභා සම්මත කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ ටික බැරිද අපිට වාර්තාවත් එක්ක එවන්න විදිහක් හදා ගන්න පුළුවන්නම්.(ඝෝෂාව) ඇත්තටම මෙක study කරන්න වෙලාවක් නෑ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
දෙවන සතියේ අගහරුවාදා නේ සභාව තියන්නේ.සභාව තියන්න දවස් හතරකට කලින් අපි ඔක්කොම ලේඛන ටික තැපැලට දානවා.ඉස්සර නම් අපි මන්ත්‍රිවරුන්ට කැබ් එකේ ගිහින් දුන්නා.තැපැලට දාන කාලෙ වෙන කොට මේ වාර්තා ටික හැදිල නැති එක තමයි ගැටලුව.බැංකු වාර්තාව ලබා ගන්න පුළුවන් පළවෙනිද පහුවෙලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
සභාව පටන් ගන්නකොටම ඔබතුමන්ලා ඉතාමත් වටිනා කාලෝචිත තාක්ෂණික, මේ සඳහා පිළිතුරක් දුන්නනේ.අපිට මේ Document එක වට්ස්ඇප් එවන්න.අපිට අදහස් දක්වන්න ඒක ගැටලුවක් නෑ.වට්ස්ඇප් එකෙන් හරි ඊ මේල් එකෙන් හරි බලලා අපිට අධ්‍යනයක් කරලා එන්න පුළුවන්නම්,අපිට මේ ගැන කතා කරන්න පුළුවන්.එතකොට අපිට මේ ගැන කතා කරන්න විදිහක් නෑ.ඒකට අවස්ථාව සලසා දෙන්න කියලා මං ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තට ම මේක වුණේ නම් සභාවට අපි යෝජනාව දැම්මෙ සභාවාර්තා,කමිටු වාර්තා වට්ස්ඇප්වලින් එවන්න.නමුත් ඒකට එක්කෙනෙක් හරි අකමැති වුණොත් ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න බැරි නීතිමය තත්ත්වක් තිබ්බා.ඒදා ඒකට සියලු දෙනා කැමති උන් නැති නිසා ඒක ක්‍රියාත්මක වුණේ නෑ.හරි ඒකට කමක් නෑ.අපි ඊළඟ සභා වාරේ ඉදන් වට්ස්ඇප් දාන්නම්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
හිඟ මුදල් අය කර ගැනීමට

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
හිඟ මුදල් අය කර ගැනීමට තමයි අපි වරිපනම් සීමාවේ ඉන්න ජනතාවට අපි පහසුකම් දෙන්නේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගැටලුවක් තියෙනවා.අපි වරිපනම් ගන්නේ,සේවා සපයන්න නෙමේ.අපි මතයක් හදාගෙන තියෙනවා කුණු ගන්න ඕනේ වරිපනම් ගෙවන්න.ලයිට් දාන්න ඕනේ වරිපනම් ගෙවන්න.පාර හදන්න ඕනේ වරිපනම් ගෙවන්න.එතකොට වරිපනම් කියන්නේ ගෙවන දෙයක්.පනතෙවත් කොහෙවත්, වරිපනම් කියන්නේ සේවා සපයන්න එකතු කරන ගාස්තුවක් කියලා,නගර සීමාව තුළ පළාත් පාලන බල ප්‍රදේශයට අයිති නගර සීමාව තුළ ඉන්නවා කියන්න තමා වරිපනම් බද්ද ගෙවන්නේ.ඒක තමා මූලික දේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
බද්දට අරාධනා කිරීමක්,එතකොට බද්දක් අය කර ගැනීමේ අරමුණක් තියෙන්න ඕන.වරිපනම් බදු අය කර ගැනීමේ අරමුණ තමයි,ඒ මිනිස්සු වරිපනම් ගෙවන්නේ ඒ මිනිසුන්ගේ කසල ප්‍රශ්නයට, නැත්නම් ප්‍රාදේශිය සභාවෙන් වෙන්න ඕන සේවා ටික විධිමත්ව ලබා ගන්න තමයි.දැන් අපි වරිපනම් ගන්න එකේ අරමුණක් තියෙන්න ඕනනේ.අරමුණ තමා අපේ මේ සේවා සැපයීම.අරමුණක් නැතිව බද්දක් ගන්න බෑ.මං විශ්වස කරන විදිහට වරිපනම් අය කරන්නේ ඒ අවශ්‍ය පහසුකම් ටික සලසන්න.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
මේක මේ ඒ කාල වලත්,කලින් වරිපනම් ගම් සභා කාල වල ඉඳන් තිබ්බ්ච දෙයක්.එතකොට ඒ කාලේ ඉංග්‍රිසි කාලෙ ඉඳන් එන දෙයක්.එතකොට ඒ කාලේ අර්ථ දැක්වීම අදට එන්නනේ නෑ.මොක හේතුව ඒ කාලේ තිබුණේ,කරත්ත.ඒ කාලේ ටොයිලට් වලට තිබුණේ බාස්කට්.ඒ බාස්කට් එකතු කරගෙන එන්නත් කරත්තයක් සභාවෙන් යැවුවා.ඕවා තමා ඒ කාලේ තිබ්බ්ච සේවා.අද වර්තමානය වෙනකොට තමා එවා විදි ලාම්පු දක්වා,සමහර තැන්වල සෝලා ලයිට්.අර පරිපාලන කියන එක තියෙන්නේ,මං හිතන්නේ ලේකම්තුමා ඒක නිවරදි කරයි.වරිපනම් තියෙන්නේ අපි සභා සීමාව තුළ ඉන්නවා කියන්න. මේක මේ සභාවේ, ඔය කියන පුද්ගලයොම දන්නවා,මේවා හැමදාම කතා කරනවා.වරිපනම් කියන්නේ මොකටද කියලා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
දියුණු බල ප්‍රදේශයක ජිවත් වෙනවාය කියන්න තමයි වරිපනම් ගෙවන්නේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
දියුණු ගම් මණ්ඩියක් කියන එක තමා, වරිපනම් ගෙවන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම දියුණු ගම් මණ්ඩියක් කියන්නේ,ඇත්තටම අපි ඒවට සේවා සපයන්න එපැයි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඒක දෙකක්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
පනතේ තියෙන්නේ 134-2.ප්‍රාදේශීය සභාව විසින් දියුණු කළ,වෙනත් ප්‍රදේශ සඳහා හෝ එහි කොටස් සඳහා වෙනස් වන වරිපනම් බදු එම ප්‍රදේශවල,කොටස්වල සංවර්ධන මට්ටම සැලකිල්ලට ගෙන නියම කරනු ලැබිය හැකිය.ඒ විදිහට තියෙන්නේ. වරිපනම් ප්‍රදේශ කියන්නේ අපි ඇත්තටම ඒවට සේවා දිය යුතු වෙනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025 සැප්තැම්බර් මස හිඟ ආදායම් වාර්තාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

**09.ගෙවා අවසන් බිල්පත්**

**09.01. 2025 සැප්තැම්බර් මස ගෙවීම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025 සැප්තැම්බර් මස ගෙවීම් වාර්තාවමං සභා සම්මත කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව 2025 සැප්තැම්බර් මස ගෙවීම් වාර්තාවමහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**10.වෙනත් කාරණා**
**10.01. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.**

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මට කියන්න පොඩිකාරණා කිහිපයක් තියෙනවා මෙතැන දී විශේෂ ස්තුතියක් කරන්න ඕන. හොරගොඩ මෝරගල මාර්ගයේ කරුණාවතී මහත්මියගේ නිවස ඉදිරිපිට එළිපෙහෙළි කරලා දෙන්න කියල පොඩ්ඩක් එතනට යවල අනුමැතිය අරන් දෙන්න කිව්වා. ඒක මම කරලා මෙහෙන් මට ලියුම යනකොටත් මම වැඩේ කරල ඉවරයි. නමුත් දැන් එතන කාණුව සකසා ගැනීමේ වුවමනාව තියෙනවා මං හිතන්නේ ලේකම් මහත්තයාලිවුම දීලා දවස් දෙකක් යනකොට වැඩේ කෙරුණා.

ඊට අමතරව හොරගොඩ මෝරගල මාර්ගයේ පාරේ යන්න බැරි තත්ත්වයක් තියෙන්නෙ මාන ගස් පාරට වැටිලා. ඒක ගොඩක් දුරට කරල තියෙනවා. ඒ සම්බන්ධයෙන් ස්තුති කරනවා සභාපතිතුමාට. ලේකම් මහත්තයටත්.ඒත් එක්කම මේ වෙනකොට අපි සාම විනිසුරු දිවුරුම තාම අපි දීල නෑ. එතන ගැටළුවක් තියනවා. සාම විනිසුරු කෙනෙක් විදිහට සාමවිනිසුරු සීල් එක ගහන්නමට නම් ගැටළුවක් තියනවා. මොකද අපිට දිවුරුමක් දෙන්නෙ නැතිව. අපිට ඒක මන්ත්‍රීවරයෙකුට ලැබෙන වරප්‍රසාදයක් විදිහට ම කරන්නේ කොහොමද කියන ගැටලුව මට තියෙනවා.

අනෙක සභාපතිතුමා සභාපතිතුමන්ගේ යුතුකම තමයි සියලුම මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වෙන් කරවා දීම. මං හිතන්නේ දැනට වම් පැත්තේ සිටින මන්ත්‍රීවරුන්ට නම් ප්‍රතිපාදන ලැබෙන්නේ නෑ. නමුත් මං මේ වෙලාවේ මතක් කරන්න ඕනේ කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට ලක්ෂ පහ ගාණේ වෙන් කරලා දීලා තියෙනවා. නමුත් ලක්‍ෂ දහතුනක ස්වාධීන කණ්ඩායම්, අපේ කාන්තා මන්ත්‍රීවරියකට මේ වෙනකොට ලක්ෂ දහතුනකට වැඩිව්‍යාපෘති අවසන් කරලා තියෙනවා. මේ වෙලාවෙ ඒ ප්‍රතිපාදන ලබාදෙන්න කියලත් මං ඉල්ලීමක් කරනවා.

තවත් සිද්ධියක් වුණා මං මේකකියන්නම ඕන විදුලි ආලෝකය ලබා දීම කොහොම කරනවද කියන එක මම දැනන් හිටියේ නෑ. එතනදි මම දැනගෙන හිටියේ කොතනටද බල්බ් එකක් දාන්න ඕනේ බල්බ් එක පිච්චිලා තියෙන්නෙ කොතනද කියල සභාව දැනුවත් වීම තමයි සුදුසු කියල තමයි මම දැනගෙන හිටියේ. මොකද අර මන්ත්‍රීවරු මේ මන්ත්‍රීවරු කියන එක නෙමෙයි. අපි ආවේ ජනතාවට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සේවය කරන්නත් ඒ පිච්චිලා තියෙන බල්බ්වල, ඒවගේ තොරතුරු ටික සභාවට ලැබෙන්න ඕන කියන එකත් තමයි මමදැනගෙන හිටියේ. ඊට අමතරව දැන් කතාවක් යනවා, මං දන්නෑ සභාපතිතුමා කොහොමද තත්ත්වෙ කියල, බල්බ් පහළොවක් තමයි වසමකට දෙන්නෙ කියලා. එතනදී මට හරිම කණගාටුදායක සිද්ධියක් වුණා. මගේ නිවස අසල නිවස තිබෙන පාරේ බල්බ් හතරක් පිච්චිලා තිබ්බා. මම ඒ බල්බ් හතරේ තොරතුරු ටික දුන්නේ වෙන හේතුවක් හින්ද නෙමෙයි. සභාවට ඒ තොරතුරු ටිකඑන එකක් නැහැයි කියල හිතිලා. නැතුව මගේ ගේ ඉස්සරහ බල්බ් එක මට ඕනෙම නෑ. මගේ ගෙදර වටේට බල්බ් තුන හතරක් හැමදාමපත්තු වෙනවා. මට ඕන්නෑ මොකද එතන තුන් මං හන්දියක්. ගමේ මිනිස්සු තමයි එතනින් එහාට මෙහාට යන්නේ එන්නේ. එතනදි මගේ කිසිම ගැටළුවක් නෑ ගයානි මන්ත්‍රීතුමිය එක්ක. කිසිම පෞද්ගලික තරහක් එහෙම නැහැ. නමුත් කාර්මික නිලධාරියා ගියා. කාර්මික නිලධාරියාගෙන් මං ඇහුවා බල්බ් හතරක් පිච්චිලා තියෙනවා ඒවා දාන්න ඕන නේද කියලාඇහුවහම කාර්මික නිලධාරියා කියනවා මට ඒකට මොකුත් කියන්න බෑ, අර කට්ටිය කියන දේ තමයි කරන්න ඕන

කියල. මම දන්නෑ ගිය දෙන්න කවුද කියල. පස්සේ තමයි මං අඳුර ගත්තේ ගයානි මන්ත්‍රීතුමියගේ මහත්තයා ගියේ කියල. මං හිතන්නේ කාර්මික නිලධාරියාට නැති ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියක් විදිහටමට මං හිතන්නේ සභාවේ සියලුම වම්පස හා දකුණු පස සිටින අය ලැජ්ජ වෙන්න ඕන මේ සිද්ධිය සම්බන්ධව. මට එහෙම කතා කරන්න බැරි, එහෙම කෙනෙකුට කරන්න පුළුවන්කම ඇවිල්ල තිබුණා. ඉතින් මම දන්නෑ මොකක්ද සිද්ධිය කියල. මේක ගයානි මන්ත්‍රීතුමියගේ බල්බ් වලින් එකක් විතරයි දාන්නේ කිව්වා. ඉතින් ඒ දාපු බල්බ්වලට තමයි බල්බ් හතරක්පිච්චිලා කියලා තොරතුරු ටික දුන්නෙ. ඊට පස්සේ ගිය කාර්මික නිලධාරිතුමා කිව්වා, මන්ත්‍රීතුමියඔබගේ ගේ ගාව බල්බ් එක මං කොහොමහරි දාලා දෙනවා කියල. මං කිව්වා පිස්සුද කතා කරන්න එපා. දාන්නම එපා කිව්වා. ඒක බල්බ් එකක්වත් දාන්නත් එපා. දාන්නේ එතුමියගේ බල්බ් නම් ආයෙ අපට බල්බ් ඕනේ නැනේ. මට මිනිසුන්ට කියන්න තියෙන්නෙ අන්න එක බල්බ් එකක් දාලා ගියා කියන එක. මං ඒ වගේ ප්‍රචාරය කළේ නෑ. මේ වගේ ගතියක් මගේ නෑ. ඒ වගේ දූෂ්ට ගතිගුණ මගේ නැති හින්දා. මං ඒ වෙලාවෙම අප සභාපතිතුමාට කතා කළා කතා කරලා සිද්ධිය කිව්වහම එහෙම වෙන්නේ නෑ කිව්වා. හැබැයි ඒක බල්බ් එකක් දාලා ගිහිල්ලා. මට ඇත්තට කාර්මික නිලධාරී මෙතනට ගෙනැල්ල අහන්න ඕන. මොකද එයා ඒ වගේ, මං දන්නවා ඒ මනුස්සයකාර්මික නිලධාරියා නම් සභාවෙන් යොමු කරලා තියන්න කෙනා නම්, අර කට්ටිය කියන එකට දාන්නේ, මං එහෙම කියන්න මම දන්නේ නෑ කියන්න මොකක්ද තියෙන බලතලය කියලා. ඒක මම දන්නෑ. ඒ හින්දා ඒ සම්බන්ධව සභාපතිතුමා තීරණයක් ගන්න. මොකද නිලධාරියෙක් යනකොට එක්කෝ සභාවේ නිලධාරියෙක් යවන්න ඒත් එක්ක. මම හරි කණගාටුදායක වෙනවා ඒ සම්බන්ධව. මං කියන්නේ මං දි පු ලේඛනයට බල්බ් ඕනෙම නෑ.මොකද මම හොරගොඩ මාර්ගයේ ඇවිදගෙන ගිහිල්ලම තමයි බල්බ් පිච්චිච්ච තැන් ටික හොයා ගත්තේ.මට උවමනාවක් නෑ.මට කවුරු උඩ බලන් හිටියත් කමක් නෑ. බල්බ් ටිකදැල්වෙන එක විතරයි අපට ඕනේ.ඇත්තටම මගේ නම ඕනෙම නෑ කොහෙවත් ගැවෙන්න.ජනතාවට සේවය කරන්නයි ගමට මොනව හරි දෙයක් දෙන්නයි මට ඕනේ.ඒක මම මේ වෙලාවේ මතක් කරන්න ඕනේ.බොහොම ස්තුතියි.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, බෝපැත්තට විදුලි ආලෝක බල්බ් සවිකරනවා කියලා 09-17 එනවා කිවුවා කියලා සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම්තුමා කිවුවා.ඒ කියලා 17 ආවේ නෑ.ඊට පස්සේ 10-07 වෙනිදා කාර්මික නිලදාරි මහත්මයත් එක්ක ත්‍රිවිල් එකේ ඇවිත් ගයානි මන්ත්‍රිතුමියටග් ගේ ළඟ නවත්තලා තිබ්බා.ඒ ත්‍රිවිල් එකේ හිටියා ගයානි මන්ත්‍රිතුමියගේ මහත්මයයි තව එක්කෙනෙකුයි.එතකොට ඒ මහත්මයා කිවුවා,මං ඇහුවා,අද බල්බ් හයි කරනවද ? මම දන්නෙත් නැ.නෑ අපට 15 දිල තියෙන්නේ ඒ 15 තමයි හයි කරන්නේ කියලා.එතකොට අපිට කවද්ද දෙන්නේ,ඔය ගොල්ලන්ටත් දෙනවා කිවුවා කිවුවා. මේ 15 දීල තියෙන්නේ අපිට, ඔයාලටත් 15 දෙනව කිවුවා කියලා කිවුවා.ඔයාලත් Call කරලා අහන්න කිවුවා.මම ඉතින් call කරලා අහන්න ගියේ නැ.ඊළඟට ඒ එතනම ලයිට් කණුවක බල්බ් එක පිච්චිලා තිබ්බා.ඒකට එහෙනම් බල්බ් එකක් දැම්මද කියලා මම ඇහුවා.නෑ ඒකට දැම්මෙ නෑ කිවුවා.ඒ කිවුවෙත් ගයනී මන්ත්‍රිතුමියගේ මහත්මයා.ඒක අඅපේ ලිස්ට් එකේ නෑ කිවුවා.ඒක හැබැයි මගෙ ලිස්ට් එකේ නම් තිබ්බා.ඒ කියන්නේ මමත් දිලා තිබුණා.මගෙ ලිස්ට් එකේ තිබුණා 30 ක්.ඉතින් මම බලා පොරරොත්තු වුණේ, දැන් මේ 15 හරි ආරම්භයේ සිට පියවරෙන් පියවර පිච්චිලා තියෙන බල්බ්වලට දායි කියලා. නමුත් එහෙම නෙමේ දාල තියෙන්නේ.තැන් තැන්වල තමයි දාල තියෙන්නේ.ඉතින් මෙතනදි අපිටත් ඒ කියපු විදිහට අපිටත් බල්බ් 15 හම්බෙනවද?එතකොට ඇත්තටම ඒ මාර්ගයේ යන්නේ ජාතීන් හැටියට ගත්තොත් සිංහල,දෙමළ,ඉංග්‍රිසි,මැලේ,බර්ගර් යන සෑම ජාතිකයින්ම මෙම මාර්ගවල ගමන් කරනවා.එතකොට මේ එළිය කියන එක කාටත් පොදුයි.රාත්‍රියට අන්ධකාරය නැති කර ගන්න. එතකොට ඒ වගේම තමයි අපි පක්ෂ වශයෙන් ගත්තත් සෑම පක්ෂයකම උදවිය මෙම මාර්ගවල ගමන් කරනවා. එහෙම නම් හැමෝටම පොදුයි මේ බල්බ් එකක් දාලා රාත්‍රියේ අන්ධකාරය නැති කරලා දෙන එක.එහෙනම් එහිදි මේ ආකාරයට කටයුතු කරන්නේ ඇයි.දැන් තමුන්නාන්සේලා විපක්ෂය කියන්නෙත් නෑ.වම්අත පැත්ත කියලා තමයි හඳුන්වන්නේ.එහෙම නම් තවමීට පෙර මම ඔබතුමාටත් කිවුවා, මට මේ විදුලි කාර්මික මහත්මයා ලබා දෙන්න කියලා කිවුවා, බල්බ් ටිකක් තියෙනවා දාගන්න කියලා.එතකොට ඉතින් අධික වැඩ නිසා ඒ දවස්වල දෙන්න විදිහක් නෑ කිවුවා.ඉතින් මම ඉල්ලා සිටිනවා මේ අවස්ථාවේදී ඉදිරියටවත් ඒ විදුලි කාර්මික ශිල්පියා ,ශිල්පිය මහත්මයා අපිට ලබා දෙනව නම් ඒ බල්බ් දාගන්න පුළුවන්.නමුත් ඒ මහත්මයා අධික වැඩ රාජකාරී නිසා එවන්න විදිහක් නෑ කියන කතාව තමයි කියන්නේ.නමුත් එදා 07 වෙනිදා ගිහිල්ලා බල්බ් දාල තියෙනවා.ඉතින් ඒ එක්කම මං කියනවා විදුලි කාර්මික මහත්මයෙක් සභාවට ගන්න කියලා.මොකද ඒ අඩුපාඩුව තියෙනව නම් ,අපට නැත්තම් අවශය සේවයක් කරන්න බැනේ නැත්නම්.ඒ නිසා අර කියන විදිහට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ගරු සභාපතිතුමා මීට කලින් කියලා තිබුණා සියලු මන්ත්‍රිවරුන්ට වෙනසක් කරන්නේ නෑ සියලු දෙනාටම විදි ලාම්පු බල්බ් ලබා දෙනවා කියලා.නමුත් ඒ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරු අපේ බෝපැත්ත කොට්ඨාශය ගත්තාහම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරියට තමයි බල්බ් 15 එවලා තියෙනනේ.ඒ නිසා අර ඒ විදිහට කටයුතු කරන්නේ නැතිව,මොකද කොට්ඨාශයටම තමා මේ එළිය වැටෙන්නේ.එ නිසා ඒ ගැන හිතලා ඒ විදුලි කාර්මික ශිල්පී මහත්මයත් සමඟ මේ අවශ්‍ය බල්බ් අවශ්‍ය තැන්වලට දාන්න අපටත් ලබා දෙන හැටියට ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.එහෙම නැත්නම් අපේ විදුලි කාර්මික ශිල්පී මහත්මය හරි ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු මන්ත්‍රීවරු, අපිට ඇත්තටම වෙනත් අදහස් දැක්වීම තියෙන්නේ.කාලය සම්බන්ධ ප්‍රශ්නයක් තියෙනවා.කාලය ප්‍රශ්නයක් නැ ඇත්තට ම.සංෂිප්තව ඉදිරිපත් කරන්න.ඒක අපි හැමෝටම ලේසියි.මං හිතන්නේ සභා වාර්තාව සකසන නිලධාරී මහත්මීන්ටත් ලේසියි.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**

මගෙ ලිස්ට් එකේ තියෙන දෙකකටත් බල්බ් දාල තිබුණා.ඒ ගැන සතුටු වෙනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඒ කියන්නේ දාලනේ බල්බ්.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ගිය සභාවාරෙත් මම කතා කළා.මේ පල්ලෙහා බිල්ඩින් එකේ වතුර වැටෙනවා.ඒක දිරාපත් වුණාට පස්සේ හදලා වැඩක් නෑ.ඊට කලින් ඒක කරා නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

දෙවැනි එක අපේ ට්‍රැක්ටර් ටික තියෙනවනේ.ඔය ටික රෑට දුවනවනේ.රෑට පිටිපස්සෙන් එන වාහනවලට පේන් නෑ.ඒ නිසා මං හිතනවා ලොකු මුදලක් යන්නේ නැති වෙයි,පිටි පස්සෙන් එන වාහනයක් එහෙම හැප්පුනොත් එහෙම ඉස්සරහින් දෙපැත්තෙ යන අය අහුවෙලා මැරෙන්නත් ඉඩ තියෙනවා.ඒ නිසා ඒකට ලුමිනස් මොකක් හරි පාවිච්චි කරලා කරන්න පුළුවන්න නම් හොඳයි කියලා.ඒක සාර්ථකයි.මං හිතන්නේ ඒකට ලොකු වියදමක් යන්නේ නෑ.එතකොට ඇතින් එන අයට වාහනයක් යනවා කියලා පේනවනේ.ඒ හින්ද සභාපතිතුමනි ඒකට අද හෙටම වුණත් කරන්න පුළුවන් නම් හොඳයි, මොකද අපේ සේවකයින්ගේ ආරක්ෂාව වෙනුවෙන්.

ඊළඟ කාරණාව මං ඉල්ලා සිටිනවා මං ගිය ගමනත් කිවුවා නාකන්දල පාරේ විදි ලාම්පු ටික දාල දෙන්න කියලා.හැබැයි ඒ ගම්වාසීන් ඉල්ලන්නේ කඨින පිංකමට කලින් දාල දෙන්න කියලා.ඔබතුමාගේ කොට්ඨාශයේ හැකි ඉක්මනින් දාල දෙන්න.කඨින පිංකම තියෙනවා කිවුවා මේ මාසෙ 18 ද කොහෙද?ඒක හින්ද ඔබතුමා මැදිහත් වෙලා ඒකට ඒ කටයුත්ත කරලා දෙන්න.

ඊළඟ එක අපේ ගමේ යකුදාගොඩ කොට්ඨාශයේ අපේ පාරෙත්,අපේ පාර ප්‍රධාන පාර.ඒකෙ ලයිට් ටික තැනින් තැන පිච්චිලා තියෙනවා.ඒ කටත් වැඩි අවධානයක් යොමු කරන්න.මගේ නමට ලකුණු නම් දාන්න ඕන් නෑ.ආරි මන්ත්‍රීතුමාට ලකුණු ටික දාලා එයාටම ඒවා හයි කරන්න කියන්න.අනිත් එක හිටපු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් කරුණාරත්න එයාලගේ ගේ ඇතුල් පාරෙ ටිකත් සම්පූර්ණයෙන්ම පිච්චිලා.ඒ ටිකෙන් සම්පූර්ණයෙන්ම NPP එකට ඡන්දෙ ටික වැටුනේ.ජාලියගේ ගෙවල් පාර.අන්න ඒක කඨින පිංකමට කලින් ඔබතුමා මැදිහත් වෙලා ඒ ටික දාල දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මගේ පළවෙනි ඉල්ලිම,ඔබතුමා යොජනාවක් දුන්නා සෝලා පවර් ලයිට් ගේනවා කියලා.ඒ ටිකට මොකද වුණේ දන්නෑ නේද? තාම ආවේ නැනේ?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඒකෙ ගැටලුව තමයි අපට කණුවත් ගන්න වෙනවා,ලයිට් විතරක් අරන් හරියන් නෑ.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**

මගේ දෙවනි ප්‍රශ්නය සභාපතිතුමා, මම කිවුවා මෝරගල මහජන ක්‍රිඩාංගනය,ඒක UD එකට අයිතියි කියලා.ඒකෙ වතුර එකතුවෙන තැන් ටික හදන්න කියලා.දැන් මාස ගානක් වෙනවා කියලා.ඒ පැත්තෙ මිනිස්සු හැමෝටම උණ හැදිලා.ඒකෙ වතුර හිටිනවා තැනින් තැන.මේදෙවැනි වතාවට කියන්නේ.ඒ හින්ද ඔබතුමා ඒක UD එකට යොමු කරලා ඒක හදලා දෙන්න.මෝරගල ක්‍රිඩාංගනයේ ඒ කාණු පද්ධතිය.ක්‍රිඩාංගනයත් එක්කම ලොකු කාණු පද්ධතියක් තියෙනවා..ගිහිල්ලා බලන්න ඔබතුමා.වතුර කොච්චර පිරිලා තියෙනව ද කියලා.වතුර යන් නෑ.පිරිලා තියෙන්නේ.පොඞ්ඩක් බැකෝ එකක් දාල,දවසක වැඩක් තියෙන්නේ.ඒක අපිට අයිති නැ කියලා ඔබතුමා කිවුවා.ඒක ඔබතුමා UD එකට දැනුවත් කරන්න.

අනිත් එක මෝරගල ඇළට මේ ළඟදි ඉදන් මාළු ලොරියක් ඇවිල්ලා මාළු කුණු ටික ඔක්කෝම දානවා ඒ ඇළට ,මේ ළඟ දි ඉදන්.හවස හතරයි පහමාරයි අතර එන්නේ.පිටිපස්සෙන් ඇවිත් ඔක්කොම ටික දානවා.මොරගල මිනිස්සු ඔක්කොම කියනවා.අර පාරෙන් යනකොටම ගඳයි.ඒ ලොරියෙන් මාළු කුණු ටික ඔක්කොම ගෙනැල්ල අතන්ට පාර්ක් කරනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඔයගොල්ලෝ දන්න කවුරු හරිද?

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**

අපිට පිටිපස්සේන යන්න බැනේ.අපිට පොලිසියේ රාජකාරි කරන්න බෑ,අපට හරිද සභාපතිතුමෝ.ඒ ටික තමයි මට කියන්න ඕන අනිවාර්යෙන්ම.අපිට මහ ලොකු වැඩක් වෙලා නෑ.ඒ ටික තමයි කර ගන්න ඕන.සාමාන්‍යයෙන් ඒ වගේ වැඩක් තමයි කර ගන්න ඕන.මොකද UD එකෙන් කෙරෙන වැඩක්නේ.ඒකට ඔබතුමා මැදිහත් වෙන්න.

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මගේ සහෝදරයාගේ බිරිඳ අසනිප තත්ත්වයෙන් ඉදලා අපි අතරින් සමුගත්තා.අවමංගල්‍ය කටයුතු සඳහා සභාවේ සභාපති බන්ධුලසේන දූණුවිල මැතිතුමා සහභාගී වූ සියලු දෙනාමත් නොවුණු සියලු දෙනාමටමත් හැමෝම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා පවුලේ සියලු දෙනා වෙනුවෙන්.ඇත්තටම ඒ සම්බන්ධව කණගාටුදායක සිද්ධි කීපයක් තියෙනවා කියන්න.මොකද සහොදරිය වැටිලා තිබුණේ පන්සලේ.පන්සලේ බෝධි පූජාවකට ගිහිල්ල තමයි පඩිපෙළින් ලිස්සල තමයි වැටිලා තිබුණේ.වැටිලා ඇගේ හිසට විශාල අනතුරක් වෙලා තිබුණේ.ඉතින් අවස්ථාවේදී ක්ෂණිකවම කිරිපෝරුව රෝහලට තමයි ගෙනිච්චේ.කිරිපෝරුව රෝහලේ ඒ අවස්ථාවේ වෛද්‍යතුමන් ඉදලා නෑ.වෛද්‍යතුමන් ඒ අවස්ථාවේ ප්‍රයිවට් බෙහෙත් දෙන්න තමයි ගිහින් ඉදලා තියෙන්නේ එතනදී.කාර්ය මණ්ඩලයේ හැමෝම call කරලා තිබුණා හැමෝම වෛද්‍යතුමාට, හදිසි ලෙඩෙක් ගෙනාව කියලා.නමුත් මම ඒ අවස්ථාවට යනකොට කිරිපෝරුව රොහලින් ඇහැලියගොඩ රෝහලට ගෙනැල්ලා තිබුණා.කිරිපොරුව වෛද්‍යතුමාට call කරලා කිවුවහම වෛද්‍යතුමන් කියලා තියෙන්නේ මේ අපිට එහෙම ලෙඩෙක් භාර ගන්න බෑ,අවිස්සාවෙල්ලට හරි රත්නපුරට හරි ගෙනියන්න කියලා.ඇහැලියගොඩට ගෙනියන්න කියලා නෑ.ඒ වෙනකොටත් ඇය සිහි නැතුව හිටියේ.නාහෙන් කටින් ලේ එනවා.ඉතින්එහෙම ඉන්න ලෙඩෙක් ත්‍රිවිල් එකේ අරන් ගියේ.එතකොට අර ඒ වෙලාවේ හදිසියට ඇහැලියගොඩ රෝහලට ගෙනියනවා ඇරෙන්න අපිට වෙන මොකුත් කරන්න තිබුණෙ නැහැ.ඉතින් වෛද්‍යතුමන් ඒ වෙලාවේ හිටියෙත් නෑ.ඊට පස්සෙ ඇහැලිගොඩට ගෙනිච්චහම ඇහැලියගොඩින් ඇහුවහම අපි කිවුවා කිරිපෝරුව රෝහලට ගිහින් ආවේ කියලා.ඉතින් කිසිම දෙයක් කරලා නෑ.ත්‍රිවිල් එකෙනව් එළියට ගන්න හැදුවහම ,කතා කරහම අරන් යන්න කියලා තමයි doctor කතා කරලා කියලා තියෙන්නේ.ඉතින් ඇහැලියගොඩින් මූලික ප්‍රතිකාර කළා.ගිලන් රථයෙන් රත්නපුරට යැවුවා.මමමයි ගියේ රත්නපුරට යනකන්.ඊට පස්සේ දැඩිසත්කාර ඒකකයට දාල කොහොම හරි ශල්‍ය කර්මයකට භාජනය කළා පාන්දර තුන හතර වෙනකන්.ඉතින් ඒසියල්ල කරනකොට මම හිටියේ.ඊටපස්සේ දවස් පහක් හයක් විතර දැඩිසත්කාර ඒකකයේ හිටියා සිහි නැතුව.ඊටපස්සේ ඇයට ඉන්නේ දියණියක් හා පුතෙක් විතරයි.දියණිය මානසික ක්ලිනික් එකකින් බෙහෙත් ගන්න ළමයෙක්.අවුරුදු 34 ක් 35 ක් වෙනවා.ඉතින් ඇය හිටියේ මගේ භාරයේ.නමුත් මම රෝහලට යන අතරේ,ඊටපස්සේ තාත්තා එක්ක තමයි එයා ගෙදර හිටියේ.අම්මා දිගටම බෙහෙත් දුන්නා.තාත්තා ඒ දවස් ටිකේ දැන් මාසයක් වෙනකන් බෙහෙත් දුන්නේ.බෙහෙත් අතට දෙන්න ඕන.ඉතින් ඒ වෙලාවේ රෑ කෑම කාල බෙහෙත් ටික ,රෑ කෑම කාල බොන බෙහෙත් ටිකයි,උදේ බොන ටිකයි අයියා කොළ දෙකක ඔතලා තියලා තියෙනවා.උදේ ටික වෙනම තියලා තියෙනවා.එතනින් අයින් කරන්න බැරි වෙච්ච ටිකට එයා අර බෙහෙත් දෙකම බීලා.රෑ එකයි ,උදේ එකයි.ඊට පස්සේ මට call කරලා කිවුවා මෙහෙම සිද්ධියක් වුණා කියලා.මං ඒ වෙලේම ගියා.ආයෙ මං මමයි කිරිපෝරුව රෝහලට එක්කන් ආවේ.කිරිපෝරුව රෝහලට එක්කන් ආවහම ඒ වෙලෙත් වෛද්‍යතුමා ඇතුලේ හිටියේ නෑ.එදා හිටපු DOCTOR සමිත් අසංක ලියනගේ ඩොක්ටමයි.ඊටපස්සේ කොහොම හරි හෙදනිලධාරීතුමා හිටියා.එතුමා සායනයෙන් බෙහෙත් ගන්න පොත අරන් බලලා,ඇහැලියගොඩ රෝහලින්මයි බෙහෙත් ගන්නේ.ඉතින් එතකොට කිවුවා ,ඇහැලියගොඩ රෝහලින් බෙහෙත් ගන්නේ අපිට මෙතන මොකුත් කරන්න විදිහක් නෑ,ඔයාල ඇහැලියගොඩ එක්කන් යන්න කියලා.වමනේ කරවන්නවත් අපට විදිහක් නැ, විශේෂ ඖෂධ ගන්න නිසා කිවුවා.ඉතින් එක කතා කරල එළියට එනකොට ඩොක්ටර් බංගලාවේ ඉදලා ආව එතනට.ඊට පස්සේ ඇවිල්ලා කෑ ගහන්න ගත්තා,තමුසෙලා දන්නැද්ද මෙතන මානසික රෝහලක්ද?මානසික රෝහලක් නෙමේ මෙතන,ඇයි මෙතනට අරන් ආවේ කියලා.ඉතින් ඇත්තටම සියලු දෙනාම කණගාටුවට පත්වෙන අවස්ථාවක් මේක.ඒ කියන්නේ අසරණ වෙලා හිටපු වෙලාවක්.මට හරිම දුකයි.සහොදරයයි මමයි ගියේ ළමයත් අරගෙන.ඉතින් ඒ වෙලාවේ කතා කරලා අපි එළියට දැම්මා.මම ඒ වෙලාවෙම ඇහැලියගොඩ රෝහලට එක්කන් ආවා.ඇහැලියගොඩ රෝහලේ දවසක් තියන් හිටියා.අන්තිම අසාධාරණයි කිරිපෝරුව රෝහලේ ක්‍රියාකලාපය.ඇත්තටම ඉතින් එහෙම කියන්න කණගාටුයි.මට විතරක් නෙමෙයි. මට ඒක වුණ නිසා මම දන්නවා එක කියන්න.කිරිපොරුව රෝහලට දැන් එහෙම හදිසි ලෙඩෙක් ගෙනියන්න විදිහක් නෑ.රෝහල් කමිටුවක් තියෙනවා, අපිට ඒක කියන්නේ නෑ.රෝහල් කමිටුවේ ඉන්න කවුරුත් නිලධාරීන් අපිට කතා කරන්නේ නෑ.ඉතින් අපි දන්නෙ නෑ.රෝහල් කමිටුවේ ඉන්න අය.කවුරුත් නිලධාරීන් කතා කරන්නෙත් නෑ අපිට කියන්නෙත් නැ.ඉතින් ඇත්තටම කණගාටුයි.අපි මූලික රෝහලකට යන්නේ,එතනට යන්නේ මොනව හරි දෙයක් අහගන්නනේ.ඉතින් අයිය කිවුවා නෑ ඩොක්ටර් මම දන්නවා මෙතන මානසික රෝහලක් නෙමේ කියලා,මට කියන්න මේ දරුවට මොකද කරන්නේ කියලා,අහලා අපි ත්‍රිවිල් එකට නැගලා අපි ආවා.ඉතින් ඇත්තටම පොඩ්ඩක් කතා කරන්න සභාපතිතුමා මේ ගැන.මෙහෙම කරන්න එපා කියලා.මොකද ලෙඩ්ඩු අසරණ වෙන වෙලාවල්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
මේක ඇත්තටම ලේකම් මහත්මයා දැනුම් දුන්නා ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ හරහා දැනුවත් කරලා අපි ඒක ඒ විදිහට නැවත නොවෙන්න සහ ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කරන්න අපි ක්‍රියාමාර්ගක් ගමු.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කිරිපොරුව රෝහල ගැනකතා කරද්දි තමයි මට කතා කරන්න හිතුනේ.ඔය කිවුව වගේ රෝහල් කමිටුවට නම් කාටවත් කතා කරන්නේ නෑ.රෝහල ආරම්භ කරන්න මූලික වුණේ මගේ ආතා.අපි ඉඩම් දීලා රෝහිනී සේනානායක කියන වාමාංශක නායිකාවගේ කාලෙ තමයි හැදුවේ.කාලෙකට ඉස්සෙල්ලා රෝහලේ ඇත්තටම හොඳ දිස්පැන්සරියක් තිබ්බා.දිස්පැන්සරියක් තිබිලා 1997 නිමල් විජේරත්න සෞඛ්‍ය ඇමතිතුමා ඉන්න කාලෙ සම්බන්ධ වෙලා ගැහැණු පිරිමි දෙගොල්ලම එකට ඉන්න රෝහලක් තමයි ඒකෙ ආරම්භ වුණේ.ඊට පස්සේ කාලයක් ගිහින් දිලින් කරුණාපාල

මන්ත්‍රීතුමාගේ ආදරණීය පියාණන් ජී.එච්. කරුණාපාල මැතිතුමා අපට තව ගොඩනැගිල්ලක් හදලා දුන්නා.එතකොට චිකන්ගුන්යා කියන රෝගය තියෙන කාලෙත් කිරිපෝරුව රෝහලෙන් තමයි බෙහෙත් කළේ.ඇහැලියගොඩට එන්නෙත් නෑ.ඒ ප්‍රදේශයේ අපේ රෝහලටඇවිත් තමයි බෙහෙත් ගන්නේ.රෝහල හොඳින් කෙරීගෙන ගියා.ඒ කාලෙ සිද්ධියක් නිසා කඩා වැටුණා.ආපසු ආයේ හොඳින් ම කෙරීගෙන ගියා.මේ මැත කාල සීමාවේ ඉඳන් තව එකක් තියෙනවා, බෙහෙත් නෑ.ඊට පස්සේ තුවාලෙකට බෙහෙත් දාන්න ඕන් නම් ප්ලාස්ටර්, බැන්ඩේජ්,ගොස් ඒවගේ අරන් යන්න ඕන.ගොඩක් ඉන්නේ අසරණ මිනිස්සු.ඒ වගේ මිනිස්සු ඉන්න ගම්මානවල.ඉතින් ඔබතුමා මේ සභාව මඟින් දැනුම් දීලා අවශ්‍ය කරන බෙහෙත් ටික අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන්න නම් හොඳයි කියලා මම සභාවෙන් ඉල්ලා සිටිනවා.මේ රෝහල ,මේ කතාව නම් කීප දෙනෙක්ම කියලා තියෙනවා.මාත් එක්ක හොඳයි.මට ප්‍රශ්නයක් නෑ.හැම වෙලාවෙම අසරණ රෝගීන්ට මොනව හරි කියනවා.අගතියක් ප්‍රශ්නයක් දානවා.සැර කරනවා.ඒවගේ.ඇත්තටම ඒ වගේ දේවල් වෙන්න හොඳ නැනේ.ප්‍රධාන වෛද්‍යතුමා හොඳටම හොඳයි.ඒ වෙනුවෙන් සභාවෙන් ගන්න පුළුවන් ක්‍රියාමාර්ගයක් ගමු.

තව එකක් කියන්න තියෙනවා පොලේ, ගරු සභාපතිතුමා කුකුළු මස් හා එළුමස් වෙලදසැළටෙන්ඩර් වෙන් නැති හේතුවක් තියෙනවා.මොකද නගරයේ කුකුළු මස් කඩ වෙනම තියෙන නිසා, ඒකට ටෙන්ඩර් ඉදිරිපත් කරන්නේ නෑ කියලා ඒ මහත්වරු කිව්වා.ඒ නිසා ඒකටත් යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න පුළුවන්නම් වඩා හොඳයි කියලා කියනවා.

ඒ වගේම හැමදාම කියනවා පොල භූමියේ තියෙන අනිත් ගොඩනැගිල්ල ගැන කතා කරනවනේ.පොල භූමියේ ගොඩනැගිල්ල ,මට අද අදහසක් අවේ,ගරු සභාපතිතුමනි රත්නපුරේ කේතුමතී වගේ ගොඩනැගිල්ලක් හදලා උත්සව ශාලාවලට හා ශ්‍රවණාගාරයකට දෙන්න පුළුවන්.ඒ ගොඩනැගිල්ල නැවත දියුණු කර ගන්න අවශ්‍යයි.ඒ වගේ දේකට ගත්තොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.බොහොම ස්තුතියි.මේ සම්බන්ධව කාරණා තුනක් කිව්වා.සභාවේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ සංවර්ධනය මම දකිනවා හැම කොට්ඨාසයකම වැඩක් සිද්ධ වෙනවා. ඒක අපේ කොට්ඨාසය ද ඒක තවතැනකද කියල නෑ අපට. ඒක අහැළියගොඩ කොහෙ වැඩක් උනත් ඒ ගැන සතුටු වෙනවා. හැබැයි මම ඉස්සෙල්ලාත් කතා කළේ අපේ මන්ත්‍රීවරුන්ට අපේ සභාපතිතුමා ඉස්සෙල්ලා කතා කරපු වෙලාවෙත් කිව්වා යාය පාර, අස්ගඟුල, පැල්පිටිය යන ප්‍රධාන පාරවල් තුන අපි කඩිනමින් සංවර්ධනය කළ යුතු පාරවල් තුනක්.මොකද මේවා සංවර්ධනය වෙන්න ඕන නගරයේ සංවර්ධනය වෙනවා නම්. මේ නගරය ආශ්‍රිතව තියෙන අතුරු පාරවල් සංවර්ධනය විය යුතුයි. ඒ පිළිබඳව අපි සතුටු වෙනවා, ඒකට ඒ අවස්ථාව අරගෙන තියෙන එක පිළිබඳව. ඒ එක්කම සභාවේ ට්‍රැක්ටර් හතරක් හෝ හයක් තියෙනවා. කැඩිච්ච දෙකක් තියෙනවා. තව හතරක් තියෙනවා ට්‍රැක්ටර් ටික සම්පූර්ණයෙන්මටෙන්ඩර් කරලා හරි හදා ගත්තොත් මේ අවට කුණු එකතු කරන්න එන්නේ නෑ කියන චෝදනා කරන, අලුතෙන් බදු එකතු කරන්න පුලුවන් තත්ත්වයකට පත්කර ගන්න පුළුවන්. විශේෂයෙන්ම යාය පාර බුළුගහපිටිය, දන්දෙනිය ඉල්ලීමක් තියෙනවා ට්‍රැක්ටරය එවන්න කියල. වරිපනම් ඒ ගොල්ලො ගෙවන්න කැමතියි. මම කියනවා ඒක අපි ඉක්මනට හදල ඉවර කරලා ඒවගෙන් ප්‍රයෝජනයක් ගමු කියලා.එතකොට අපිට ආදායමක් එනවා.

ඊළඟ එක තමයි සභාපතිතුමා එක්ක කතා කරල තියෙනවා ට්‍රැක්ටර් දෙකක් ගොවිජන සේවා එකට දෙනවා කියලා. මං හිතනවා ඒ පිළිබඳව ඉක්මන් වුණොත් හොඳයි කියලා. මොකද මිනිස්සු අලුතෙන් පටන් අරන් තියෙනවා මේ ප්‍රදේශයේ පුරන් කුඹුරු අස්වද්දන්න. මේක හොඳ ප්‍රවණතාවක්. අපි බලාපොරොත්තු වෙනවා ඇහැලියගොඩ පුරන් වෙලා තියෙන කුඹුරු ටික අස්වැද්දුවොත් ඇහැලියගොඩ මිනිස්සුන්ට කන්න ඇති. මේ වගේ ලංකාව පුරාම ක්‍රියාත්මක වෙන නිසා ඒවට අපෙන් සහයෝගයක් හැටියට මේ ටැක්ටර් දෙක හැකි ඉක්මනට ගොවිජන සේවා එකට ගන්නත් අවස්ථාව ලබා දෙන්න උත්සාහ කරමු කියන ඉල්ලීමත් කරනවා.

ඊළඟ එක තමයි මං දැකපු අනවසර ඉදිකිරීම් වේගයෙන් ක්‍රියාත්මක වෙමින් යනවා. ඒක දැන් මේ ප්‍රධාන පාරටත් මායිම්ව වේගයෙන් ඉදිකරගෙන යනවා, කණ්ඩායමක්. මොකද මං කීප පාරක්ම එතනටත් ගිහින් ඇහුවා ඇයි මල්ලී මේක මේ ඉස්සරහ කාපට් එක පාර කපන්නේ කියලා.එහෙම කරන්නෙ ඒ ගොල්ලන්ගෙ වතුර යවා ගන්න. මේ පාර අයිනෙන් කපල දාලා. මං ඇහුවා ඇයි මෙහෙම කරන්නේ කියලා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

කොතනද මන්ත්‍රීතුමා එතන?

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

මෙතන මේ ඉස්සරහ ඊ කඩේ ළඟ. අනික තමයි දැන් මේ පේමට් එකත් ඒ පැත්තෙන් නැති වේගෙන යනවා. අර කාණුව උඩින් නේ ඉස්සෙල්ල ගියෙ කැට දාලා තිබුණ. දැන් ඒගොල්ලො කාණුව අල්ලගෙන. මේ පැත්තෙත් කාණුව අල්ලගෙන.මිනිස්සුන්ට පාරේ යන්න තියන ඒක නිසා, හැකි ඉක්මනට අපි RD එකත් එක්ක කතා කරල, පොලිසිය සමඟ සාකච්ඡා කරල, ඒ සම්බන්ධව යම් තීන්දුවකට එමු. මොකද මිනිස්සු මේකට උදව් කරනවා වගේ දැන ගත්ත ගමන්ම, මිනිස්සු කරත්ත හදාගෙන එනවා, ටෙන්ට් ගහගන්නවා, ලෑලි ගහගගෙන ඉන්නවා. දැන් හෝ ගාලා ඒ පැත්තට බර වීගෙන යනවා. ඒ නිසා අපි ඒවට, කණ්ඩායමක් හැටියට අපි ඔක්කොමලා එකතුවෙලා, මොකද නගරයේ සැලැස්ම කියලා කියන්නේ අපේ මේ nppඑක නෙමෙයි, අපි ඔක්කොගෙම නගරය මේක. ඒක නිසා අපි ඔක්කොම එකා වගේ එකතු වෙලා, මේ නගරය සංවර්ධනය කරන්න එකා වගේ එකතුවෙන්න කියලා. සුද්ද පවිත්‍ර කරමු.

අනිත් එක තමයි පොලේ අර ගොඩනැගිල්ල පිළිබඳ සහෝදරයා කතා කළා. ඒක ඇත්තට එක ගොඩනැගිල්ලක් සමහරමන්ත්‍රීතුමාට මතක ඇති අපි ඕකෙ ......එකක් පෙන්නුවා ලක්ෂ පනස් තුනක් හෙව්වත් එක. එක ගොඩනැගිල්ලක 2000 ක් විතර දාන්න පුළුවන්. ඒක නිසා අපට කුලියට දෙන්න පුළුවන්. තව පොඩ්ඩක් ඒක මොඩිෆයි කරලා ඉෂ්ටේජ් එකක් එක පැත්තකින් උස්සලා හදල එහෙම දෙන්න පුළුවන්කමක් තියෙනවා. ඉතින් අපට පුළුවන් වුණා නම් අර වගේ මුදලක් හොයාගන්න දවසක් ඇතුළතදී,ඉතින් ඕකට එන්න පුලුවන් ඕන තරම් ඉල්ලුම.ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඊළඟ එක තමයි බල්බ් ප්‍රශ්නය. ප්‍රශ්නයක් තමයි.විදුලි කාර්මිකයෝ එක්කෙනයි ඉන්නේ. ඔය පහළොවක් දෙනව කියල කියන්නේ කොට්ඨාසයට නෙමෙයි, දවසකට දාන්න පුලුවන් පහළවයි. දහයත් පහළොවත් අතර තමයි දාන්න පුළුවන්. ඉතින් මම ගියේ එයාගේ උදව්වට. ඒ වෙලාවෙ එයාට උදව් කරන්න කෙනෙක් නෑ. කම්කරුවො නෑ. ඒ නිසා මම ගියා එයත් එක්ක. දවසට පහළොවක් විතර වගේ තමයි දාන්නේ ඇත්තටම. අපේ මන්ත්‍රීතුමා කිව්වෙ අර විදුලිබල මණ්ඩලයෙන් දාලා තියෙන ලයිට්, අපිට දාන්න බෑනේ. සභාපතිතුමත් විදුලි බල මණ්ඩලයත් එක්ක කෙලින්ම සාකච්ඡා කළා. ඒක හැකි ඉක්මනට දාල දෙන්න කියලා. ලිඛිත ඉල්ලීමකුත් කළා. සමහරක්විට ඒගොල්ලො කියන දේවල් අදාළ නෑ. එතන තියෙන ප්‍රශ්නය ඒකයි. මේ නගරෙ යාය පාර ඒ පැත්තෙන්,මෙහා පැත්තෙන් බුලුගහපිටිය පාරේ, ඉතින් ඒ වගේ එකතුවෙලා තියෙන ටික. මම දවස් දෙකක් අරන් ගියා තමයි. ඒ උනාට දෙන්නෙ නෑ. එක දවසයි අපට දීලා තිබුණේ. ඉතින් අර වැස්ස එහෙම හින්ද මම කතා කරල සභාපතිතුමාටත් කියලා අරගෙන ගියා දවස් දෙකක්. ගත්තේ එහෙමයි. නැත්තන් දවස් දෙකක් ගත්ත නෙමෙයි. ඒ නිසයි අපට ටිකක් දාගන්න පුලුවන් වුණේ. තව තියෙනවා. ඒ වගේම බුලුගහපිටිය කියන්නේ ඇත්තටම ලොකු ඒරියා එකක්. හැබැයි දවස් තුනක් වත් ඒකට ගන්න වෙනවා. හැබැයි මම දින ඉල්ලල තියෙනවා. මට දින දීලා තියෙනවා. එකොළොස් වැනි මාස එකොළොස් වැනි ද ද කොහෙද තව දවසක් දීලා තියෙනවා. අන්න ඒ වගේ තැන්වලදී තමයි අපි මිනිස්සුන්ගෙන් බැනුම් අහන්නේ.එයාල දන්නෙ නෑ. ඒක නිසා විදුලි බල මණ්ඩලයෙන් අර ටික කෙරුණොත්, අර ලොකු ඒවට රුපියල් පහළොස් දාහක් වෙනවා බල්බ් එකක්.

ඊළඟ එක තමයි කුණු දැමීම. කුණු ප්‍රශ්නය ඒව ක්‍රමවත් වෙන්න ඕන. මිනිස්සු සමහරු සංවිධානාත්මකව කුණු ගෙනැත් දානවා. පි දැනට දෙන්නෙක් ඇල්ලුවා. ඒ දෙන්න අල්ලලා උසාවියට දැම්මා. ඒ නිසා තමයි මම අර කිව්වෙ ටෙලිෆෝන් නම්බර් එක හරි ලියල ඒගොල්ලන්ගෙ වාහනේ අංකය හරි මොනවා හරි ලියල දුන්නොත් තොරතුරක් දුන්නොත් අපට පුළුවන් පොලිසියට ගිහිල්ල කතා කරන්න. අනික අපි දෙන්නෙක් ඇල්ලුවා. කනත්තෙ කුණු දානවා. ඒක එතනත් කුණු ටික දානවා. ඒක පිළිබඳව අපි ඒව දකිද්දි අපේ මන්ත්‍රීතුමා, ඒගොල්ලන්ට කතා කරන්න. ඔයා මන්ත්‍රී කෙනෙක්නෙ, කතා කරන්න මන්ත්‍රී කෙනෙක් වෙන්න ඕන්නෑ. සාමාන්‍ය මිනිහෙක් වුණත් මොකද .යකෝ ඔය කරන්නේ මොකක්ද කියලා අහන්න පුළුවන්. ඒ නිසා අපි ඔක්කොමලා මේ වැඩේට එකතු වෙන්න ඕන.ඔක්කොම එකතුවෙලා මේ වැඩේ ක්‍රියාත්මක කරමු කියලා මම යෝජනා කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්න මං අදහස් කරන් හිටියේ නැහැ ඇත්තටම කතා කරන්න ඕන කාරණාවක් බවට පත්වුණා අද වීදි ලාම්පු ප්‍රශ්නය. අපට මේල්සිරි මහත්මයයි කතා කරලා කිව්වේ අපට සහයෝගය දෙන්න කෙනෙක් නැහැ, කවුරු හරි දෙන්න පුළුවන්නම් වසමට බලපු දාන්න පුළුවන් කියලා. ඒ නිසා තමයි අර ගයානි මන්ත්‍රීතුමියගේ මහත්මයා, මං හරි සතුටු වෙනවා ඒ ගැන. මෙතුමාත් කිව්වා මෙතුමාත් සහයෝගය දුන්නා කියලා. මමත් සතුටින් හා උද්යෝගයෙන් කියනවා ගයානි මන්ත්‍රීතුමියගේ මහත්මයා තමයි ඒ වෙලාවෙ වසමේ බල්බ් දාන්න නිලධාරියකු වෙනුවට, නිවාඩුවකුත් දාගෙන තවත් අයකුත් එකතු කර ගෙන බල්බ් දාන්න සම්බන්ධ වුණේ. ඒහිදී අපට බොහෝ ලියුම් දුන්නා. අර පුරවල ලියුම් දුන්නා.42ක් දීලා තියෙනවා. මේකෙදි කිසිම අවභාවිතාවක් නැතුව පළමු ලිස්ට් එකේ දාපු පළවෙනි පළවෙනි තමයි බල්බ් පහළව දුන්නේ. ඊළඟ හතළිස් දෙකටම දාන්න බෑනේ. පළවෙනි පහළොස් දෙනාට දුන්නා. සමහරවිට මෙතන තියෙන්න පුළුවන් කණුවක්. තවත් කෙළවරේ තියෙන්න පුළුවන්. එහෙම තමයි දැම්මේ. ඒකෙදි සමහර විට චන්ද්‍රදාස මන්ත්‍රීතුමා කියන විදිහට, අහුවනම් මේ බල්ට් එක දාන් නැද්ද කියල, එතැනදි ඒ බල්බ් එක දාන්න නැතුව වෙන්න පුළුවන්. මොකද ඒ ලිස්ට් එකේ තියෙන හතළිස් දෙකට ඒ පළවෙනි පහළව අතරට නැති වෙන්න ඇති. ඒක නිසා තමයි එතනදි හතළිස් දෙක අතරින් පහළවක් අතරට එන ලිස්ට් එකේ නැත්තෙ. සතුටු වෙනවා මම එතුමාගේ පාක්ෂිකයෝ දෙන්නෙකුටත් බල්බ් දැම්මලු. හැබැයි ගයානි දේවේන්ද්‍ර කියන මන්ත්‍රීවරියට ගමේ දැන් කිසිම විදිහකට දේශපාලනිකව නෙමෙයි ගොඩගන්නේ ගම. සියලු දෙනාම ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ප්‍රාදේශීය සභාව යටතේ ඉන්න හැමෝම ආදරණීය මිනිස්සු. ඒ නිසා කිසිම දවසක මම මේ ගයානි කියන මන්ත්‍රීතුමිය දැන් බෙදීමක් කරන් නෑ. එදා මං දේශපාලනය කළා. ඡන්දය ගත්තා. කොට්ඨාසයේ මන්ත්‍රීවරිය බවටත් පත්වුණා. හැබැයි එදත් ඒ පත්වෙලා මෙතන වාඩිවෙච්ච දවසෙ ඉඳන් දේශපාලනය කරන්නේ නෑ. හැමෝම සංවර්ධනය කරන්නේ එක අරමුණකින්, එකා විදිහට. මේ බල්බ් පහළොව දාන එක විතරක් නෙමෙයි. එදා කලේ. මේ ගමේ ඒ 9 වෙනිද. අපි මීට මාස අවුරුදු ගණන් ඉඳන් බල්බ් එකක් දාන්න කියල ගමේ කෙනෙක් කතා කරල තිබුණා නම් මේ සභාවට ඇවිල්ල, මම යෝජනා කරලා අපට පුරවල දෙන්න කියල බල්බ් දාපු අවස්ථා එමටයි. ගමේ මේ බල්බ් පහළව තියෙන එක එච්චර ලොකු ක්‍රියාවක් නෙමෙයි. නමුත් මේ ප්‍රතිපාදන දෙන්නේ යම් සේ ද බෙදලා මේ වසම්වලට ඒ විදිහට තමයි අපිට ඒ අවස්ථාවක් හම්බුනේ. බල්බ් පහළොව විතරක් නෙමේ ගරු සභාපතිතුමනි ලක්ෂ දහයේ ඇලවේලි ප්‍රතිපාදනයක් හම්බෙලා පුරන් කුඹුරු හතරක් තියෙන අපි ඇලවේල්ල කිලෝමීටර් තුනක් හතරක් සුද්ද පවිත්‍ර කළා. එහිදීත් මෙතන පත්වෙලා හිටපු මන්ත්‍රීවරු හිටියා. බල්බ් පහළොව ගැන කතා කරන මේ මන්ත්‍රීවරු එදා ඇයි ලක්ෂ දහය ප්‍රතිපාදන එනකොට කතා කරන්න හිටියේ නැත්තේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

බාධා කරන්න එපා මන්ත්‍රිවරු.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගෞරවනීයව කියනවා, මේක මගේ අවස්ථාව මගේ අවස්ථාව මට දෙන්න. මෙතන ඉන්න කිසිම කෙනෙකුට කිසිම බාධාවක් කරල නෑ මම කතා කරන කොට. ඒ නිසා ඒ අවස්ථාව ඕන කෙනෙකුට සම්බන්ධ වෙන්න පුළුවන්කම තිබුණා, ගමේ තියෙන සාමූහික වැඩක් විදිහට. මම කිසිම කෙනෙකුට ඔයාලා එන්න එපා කියලා කියලා නෑ. ඔයාලා එන්න එපා කියලා නෑ. මම හැම වෙලාවෙම කටයුතු කළේ ඒ විදිහට. ඒ වගේම තමයි ප්‍රාදේශීය සභාවේ අපට ලක්ෂ පහක පාරක් හම්බෙලා තිබුණා. ඒකෙදි සම්බන්ධ වෙන්න පුළුවන්කම තිබුණා. කවුද වැට බඳින්නේ? මෙතනට එන්න එපා කියලා. ඇවිදින් බලල ක්‍රියාත්මක වෙන්න පුළුවන්. ඒ වගේම තමයි අපට නිවාස ආධාර ලක්ෂ දහයක ප්‍රතිපාදන හම්බෙලා නිවාසයක් හම්බුණා. එතනදි කවුද එන්න එපා කියලා තියෙන්නේ. ගයානි දේවේන්ද්‍ර කියන මන්ත්‍රිතුමිගේ බල්බ් පහළොව ගැන හිතල කවදාවත් මේ නිවාසා ආධාර වලට මේ වැඩසටහනට එන්න එපා කියලා කතා කරල නෑ. ඒ වගේම තමයි මන්ත්‍රිතුමිය දන්නවා හොඳටම ග්‍රාමීය කමිටුවේ යෝජනා කරන කොට සංවර්ධන යෝජනා, මම නිහඬව හිටිය මිසක් එතුමිය පළවෙනි යෝජනාව ආවහම එතුමා මේ යෝජනාව මගේ පොල්හනාවපාර දෙන්න කියල කියද්දි කතා කරද්දි,අනෙක් අයගේ පාරවල් අමතක කරලා මෙතුමිය ඇගලුම් කම්හලේ පාර දෙන්න කියලා කතා කරද්දි මම කවදාවත් මේක දෙන්න එපා,මේක දෙන්න එපා කියලා කතා කළේ නෑ කියන එක මේ දෙන්නටම සාක්ෂි.ඒනිසා මං කාරුණිකව ඉල්ලනවා මේ ගයානී දේවේන්ද්‍ර කියන කෙනා කිසිම විදිහකින් දේශපාලන වැඩක් නෙමේ දැන් කරන්නේ,ගමේ සංවර්ධනය කරන වැඩක් විතරයි.ඒක තමයි මගේ ප්‍රතිපත්තිය හා ජාතික ජනබල වේගයේ ප්‍රතිපත්තිය.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මටත් මතු කරන්න තියෙන්නේ ආරි මන්ත්‍රිතුමා මතු කරපු අදහසට දිගුවක්.ගරු සභාපතිතුමනි ඇහැලියගොඩ නගරයේ මේ වන කොට මේවන කොට ඉතාම ඉක්මනින්ම යම් යම් ස්ථානවල අයථා විදිහට ගොඩනැගිලි හදනවා.ඔබතුමා උඩහ සිට පල්ලෙහාට යන්න.ලැලි ගහලා පොඩි කඩ කාමර හදා ගෙන තියෙනවා.ඒවා මහා පරිමාණ හෝටල් බවට යම් යම් දේවල් පත්වෙලා තියෙනවා.

දෙවැනි කාරණාව මං හිතන්නේ අහනවා මේ මාලිමාව ආණ්ඩුවෙන් මේ ගොල්ලන්ට අවසර දීලා තියෙනවද? දෙනවද?සභාපතිතුමා මේවා බල බලා ඉන්නවද?ඇයි මේවට ඇක්ෂන් එකක් ගන්නේ නැත්තේ කියන මගෙන්,තව කට්ටියක් යම්කිසි දෙයක් කරන්න උත්සහ කරනවා.ඒ කියන්නේ ඔබතුමාට තේරෙනවා ඇති මං කියන දේ,මොකක්ද කියන එක.ඒ නිසා මං හිතන්නේ තවදුරටත් යන්න කලින් ඒක මොකක් හරි තීරණයක් අරන් ඒක නීතියට දීලා මොනව හරි දෙයක් කළොත් හොඳයි කියන එක මං අදහසක් විදිහට ගේනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, විදුලි බල්බ්වලින් පටන් ගන්නම්.විදුලි ලාම්පු ගැන කතා කරනකොට ,ඔබතුමා මට හිතවත්.මං හිතනවා මං හිතවත් කියලා.දකුණුපැත්ත වම්පැත්ත කියලා හඳුන්වන්නේ.මං හිතනවා ඒක මේ සීමා වෙලා තියෙන්නේ මේ රාමුව තුළට විතරක්ද?කියලා.මේකෙන් පිටට ගියාට පස්සේ දකුණු පැත්ත වම් පැත්ත කියලා නෙමෙයි,වෙන වෙන පැතිවලට යන්නේ. සභාපතිතුමාගෙන් ඍජු උත්තරයක් බලා පොරොත්තුවෙන් ම මං ඉස්සරහට කතා කරන්නම්.නමුත් මං සභාපතිතුමාගෙන් ඇහුවා බල්බ් දාන කොට මම ඇහුවා.මේ බල්බ් සවිකිරීම සම්බන්ධව කාර්මික නිලධාරී සහයට අපේ මන්ත්‍රිවරු යනවා.බොහොම සන්තෝෂයි.එයාලගෙ සහයට කවුරු හරි ඉන්නත් එපැයි.අපේ වියලගොඩත් බල්බ් දාල තියෙනවා.එතකොට මං දන්නෑ,අපි දන්නෑ,ලේඛන කතා කරන කොට කවුද ඉස්සෙල්ලා දීලා තියෙන්නේ කියලා දන්නෙ නෑ.දැන් අපි හිතුවා මේක ප්‍රතිපත්තිමය තින්දුවක් අරගෙන ,මෙතුමියත් ඇත්තෙන්ම සද්භාවයෙන් කතා කරන්න ඇත්තේ.ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන ජාතික ජනබල වේගයේ ඒ ක්‍රියා පටිපාටිය අපි හිතනවා පොතේ තිබ්බ්ච ක්‍රියාපටිපාටිය අන්තර්ගතයේ ඇති කියලා.මොකද පොතේ තියෙන දැක්ම දැන් ප්‍රායෝගිකව තියෙනවද කියලා අපට,ඒකත් ඉස්සරහට තීන්දු කරයි.ඒ ක්‍රියාවලිය තුළම අන්තර්ගතවෙලා ද කියන එක අපට ගැටලුවක් තියෙනවා.සමන්සිරි මන්ත්‍රිතුමා සහය වෙන්න ඇති.අපටත් කතා කළා නම් අපිත් සහයෝගය දෙනවා එතකොට.මං පිළිතුරු අපේක්ෂාවෙන්.අපටත් බල්බ් දෙනවද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔව් දෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
කොහොමද දෙන්නේ? කවද්ද දෙන්නේ?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
හරි මං කියන්නම් අපි බල්බ් 1000 ක් ගත්තා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
2000 දුන්නා.සභාපතිතුමා කිවුවනේ 1000 ක් ගත්තහම තව 1000 ක් දුන්නා කියලා.බල්බ් 1000 ක් ගත්තාහම company එකෙන් 2000 ක් දුන්නා කිවුවා.ලොකු ප්‍රතිලාභයක් තියෙනවනේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
නෑ බල්බ් 1000 යි ගත්තේ.ඒ බල්බ් 1000 අපි කොට්ඨාශවල හැමෝටම අපි දෙනවා.උදාහරණයක් වශයෙන් ගත්තොත් එහෙම අපි ප්‍රමුඛතාවක් විදිහට ගත්තා වරිපනම් සීමාවේ ඉන්න අය,හැමදාම එනවා වරිපනම් ගෙවන් නෑ පහසුකම් දෙන්නැති හින්ද කියලා.අපි දිවුරුම්පිටියේ ඉඳන් වරිපනම් සීමාවේ ඉඳන්

අපි දාගෙන ආවේ.එතකොට ඒ අතර තමයි අපි අනික් වසම්වලටත් දාන්නේ.එතකොට දැන් මට පෙන්නන්න දිවුරුම්පිටියේ ඉදන් මාහර දක්වා ඒ කියන්නේ වසමවලට ලැබුණේ නැත්තේ කාටද කියලා.පැල්පිටිය මෝරගලටත් වැටිලා තියෙනවා.මෝරගලට වැටුන් නැත්තේ මෝරගල තියෙන්නේ අර ලොකු බල්බ්.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**

ලොකු බල්බ් තියෙන්නේ පාර අයිනේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

මෝරගල වසම පොඩියිනේ,මෝරගල වසම පොඩි එකක්.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**

අනිත් ඔක්කොම තියෙන්නේ පොඩි බල්බ්.L.E.D බල්බ්.මම දෙතුන්පාරක් ආවා.මෙතනට ඇවිල්ලා කිවුවහම කිවුවා මේ වරිපනම් තියෙන ඒරියා එකට තමයි මුලික තැන දෙන්නේ කියලා.මෝරගල ඔක්කොම වරිපනම් ගෙවන අය තමයි ඉන්නේ.නගරයට කිට්ටු හින්දා.නමුත් තව වෙනතුරු නම් ආවෙ නෑ.සභාපතිතුමා ඒක නිවරදි කරන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

පැල්පිටියට දැම්ම,අනිවාර්යෙන්ම දැම්මා.ඊට පස්සෙ අපි ගත්තොත් එහෙම,එක කාර්මික නිලධාරී කෙනයි ඉන්නේ.සමහර වෙලාවට එයාට උදව්වට ගන්නවා ,මන්ත්‍රිවරයෙක් ගන්නවා,සමහර වෙලාවට සෞඛ්‍ය කම්කරුවෙක් ගන්නවා.සමහර වෙලාවට සෞඛ්‍ය කම්කරුවෙකු ගන්න බැරි අවස්ථාවල තමයි අපේ මන්ත්‍රිවරු උදව් කරන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

මෙතන සද්භාවය ගැනනේ කතා කරන්නේ, අපිටත් කිවුවනම් අපිත් යනවා උදව්වට.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඔයාල නෙම් මාත් එක්ක සංවාද කරන්න.ඒ කියන්නේ ඇත්තටම දවසකට දාන්න පුළුවන් අවමය 15 ක්.තව පොඩ්ඩක් උඩට යන්න පුළුවන් වෙයි.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

කරන ක්‍රමය මං ඕන්නම් කියන්නම්.15 ක් දානකොට අපිඅ හිතමුකෝ යාය පාරට දානව කියලා,යාය පාරේ ඉන්නවා මන්ත්‍රිවරු 5 දෙනෙක් ඉන්නවා මේ බල්බ් ටික දාන්න.යාය පාරේ දානකොට ආරියදාස මන්ත්‍රිතුමාට තව මන්ත්‍රිල යයි.එහෙම ක්‍රමවේදයකට යන්න ඕන.නැත්නම් අපි හිතන්නේ

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ක්‍රමවේදයකට තමයි යන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ක්‍රමවේදය පැහැදිලියි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ක්‍රමවේදය පැහැදිලියි.අපේ සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් මහත්මයා ළඟ chart එකක් තියෙනවා,කොට්ඨාශවලට වසම්වලට වසම්වල මන්ත්‍රිවරුන්ට දෙන විදිහ.ඊට පස්සේ දැන් වුණත් සුජීව මන්ත්‍රිතුමාටත් ලයිට් දීලා තියෙනවා.තව අජන්ත මන්ත්‍රිතුමාටත් දුන්නා.මේ ගොල්ලෝ තෝරලා දෙන එකක්.මේ ගොල්ලෝ ඔක්කොටම දීලා ඉවර වෙලා දෙනවා කියලා, එහෙම එකකුත් නෑ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

දැන් දෙන්න පුළුවන්ද දින?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

දැන් දිනයක් දෙන්න මගෙ අතේදැන් chart එක නෑ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ඒකෙන් අපිට දිනයක් ගත්ත හැකිද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**

ඇත්තටම ඔව්.සභාපතිතුමාගේ ලේකම් මහත්මයා ළඟ තියෙනවා.ඇත්තටම එතුමාගෙන් දිනයක් ගන්න පුළුවන්.තව දාපු තැන් තියෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

නිශ්චිත වෙන්න ඕන.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
නිශ්චිත තමයි.සභාපතිතුමාගේ ලේකම්තුමා ඇවිත් හම්බෙන්න.හෙට ඇවිත් සභාපතිතුමාගේ ලේකම් මහත්තයා ඇවිත් හම්බෙන්න.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
සභාපතිතුමාගේ ලේකම්තුමා එක්ක ද කතා කරන්න ඕන.මේ සභාවේ ලේකම්තුමා එක්ක නෙමෙද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
නැහැ.සභාපතිතුමාගේ ලේකම්තුමා එක්ක.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
අපි ගනුදෙනු කරන්න ඕන නිත්‍යානුකූල වැඩකටයුතුවලදී සභාවේ ලේකම්තුමා එක්ක.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
එහෙම එකක් නෑ.සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම්තුමා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
පෞද්ගලික ලේකම් නිසා ඇහුවේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
එහෙම ප්‍රශ්නයක් නෑ.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
මෙහෙමයි,ඒ ඒ වසම්වලට දීන දීල තියෙනවනේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
නෑ.මන්ත්‍රීතුමා මං මතුකරන ප්‍රශ්නෙ දැන් අපි කියන්නේ දකුණ හා වම කියලනේ.දැන් අපි එළියට ගිහාම දකුණ හා වම ඒ විදිහට තියෙනව නම් අපෙ, සමන්සිරි මන්ත්‍රීතුමා යෝජනා කරනවා මං ස්ථිර කරනවා.මං යෝජනා කරනවා මෙතුමා ස්ථිර කරනවා,ඒ එළියෙත් කරන්න පුළුවන් නම්.ඔයගොල්ලන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ මට මතකෙ හැටියට තියෙනවා යෝජනා එක්දහස් තුන්සිය ගාණක්.ඒක තුළ ,රාමුව තුළ තියෙන ක්‍රියාවලිය අනුව නම් මේ ගැටලුව වෙන්නෙ නෑ.මං කියන්නේ ලයිට් දාන එක මිනිසුන්ගේ අවශ්‍යතාවක්.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
මන්ත්‍රීතුමා ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට එක්දහස් හයසිය ගාණක් බල්බ් දාන්න පුළුවන් අනුමත බල්බ්.එතනින් එහාට අපිට සීමාව පනින්න බෑ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
එතනින් එහාට අලුතින් බල්බ් දාන්න, මෙතුමා කිවුව වගේ සෝලා පැනල් බල්බ්.විදුලිබල මණ්ඩලයෙන් දැනට දාල තියෙන තැන්වල දාන් නැද්ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒක අපි විදුලිබල මණ්ඩලයට කතා කළා මෙහෙ.ඇත්තටම විදුලි බල මණ්ඩලය එහෙම වැඩ අත ඇරලා තියෙන්නේ දැන්.අපි බල ශක්ති අමාත්‍යාංශයටත් දැන්නුවා.ඒ කියන්නේ ඇහැලියගොඩ හා රත්නපුර ඒවා කරන් නෑ කියලා.ඒනිසා අපට ප්‍රාදේශිය සභාව විදිහට ඒ දාල තියෙන තැන්වලත් අලුත් වැඩියාවක් තියෙනව නම් ප්‍රාදේශිය සභාවට වැඩේ කරන්න.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒ කියන්නේ අලුතින් බල්බ් දාන්න.දැන් දාලද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔව් දානවා. අපි දානවා. දැන් දාලා නෑ. තව ඉස්සරහදි දානවා. දැන් දාල තියෙන්නෙ අලුත් වැඩියා තියෙන ඒවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
බෝපැත්ත පාර, විජේනායක මාවත නගර සීමාවට අයත් සීමාව තුළ විජේනායකයට හැරෙන තැන බල්බ් එක මෙහෙන් දාලා තියෙන්නේ. ඉස්සෙල්ල දාල තිබුණේ විදුලි බල මණ්ඩලේ බල්බ් එකක්. එතන ගැටළුවක් නෑ. අපිට ඒවට කුහක නෑ. එතන බල්බ් එකක් දාපු එක කොහොමත් වටිනවා. තුංමංහන්දියේ. හැබැයි මේක පොතේ තියෙන ක්‍රමයයි, කියන ක්‍රමයයි පැට්‍රිකල් වෙන්නෙ නෑ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
patricalනැනේ සමහර වෙලාවට. වැස්ස තියෙන දවස්වලට වැඩ කරන්න බැනෙ. සතියක් විතර තිබ්බ පළාත් පාලන සතිය. පළාත් පාලන සතියේ ඒ වැඩසටහන්වලට යන්න බැරි වුණා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
වහින දවස පායන දවස කියලා නෙමේ, මං අදහස් කළේ ඒක නෙමේ.පොතේ තියෙන එකයි,ප්‍රකාශ කරන එකයි පැට්‍රිකල් වෙනව නම් හොඳයි කියලා මං කියන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
අදහස පැහැදිලියි.අරමුණ පැහැදිලියි.ප්‍රතිපත්තිය පැහැදිලියි.වැඩ කරද්දි ප්‍රායෝගික ගැටලු එනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
අපිට ස්ථිර වශයෙන්ම බල්බ් දෙනවාද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
හැමෝටම දෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
බල්බ් එක්දහස් හයසිය ගාණක් දාන්න තියෙනවා කිවුවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
15 ව 15 ව ගානේ දෙන්නේ දවසට.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
බල්බ් එක්දහස් හයසිය ගානෙන් 1000 යි තියෙනවා කිවුවේ.හයසිය ගානක් මදි වෙනවනේ?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
එක වටයක් දීල තමයි නැවත වටයක් මේ ගොල්ලන්ට දෙන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
නැතිවෙනව නම් අපට අවස්ථාව දෙන්න, විලේගොඩ බල්බ් ටික දාන්න අපිට අවස්ථාව දෙන්න.අපි පෞද්ගලිකව බල්බ් ටික අරගෙන දාන්න පුළුවන් ඒක ගැටලුවක් නෑ.ඒ හැකියාව තියෙනවා.කාර්මික නිලධාරියෙක් ගන්න කිවුවොත් ඒකත් ගන්නවා.මම කියන්නේ.මම දානවා කිසිම ගැටලුවක් නෑ.ඒ ගමේ යම් රැකියාවල ඉන්න සම්පත්දායකයෝ ඉන්නවා.හැකියාවක් තියෙනව නම් පුළුවන් නම් දෙන්න.ඒකට අපි මැදිහත් වෙන්නම්.ඒක එකක්

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
අනික මොකක්ද?

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඔබතුමාගෙන් පිළිතුර දැන ගත්තාබොහොම ස්තුතියි.50 ට 50 වගේ පිළිතුරක් ලැබුණා.පොතේ තියෙන මෙතන තියෙන සද්භාවය එළියෙත් ක්‍රියාත්මක කරන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
සැහීමකට පත්වෙන්න පුළුවන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
සැහීමකට පත්වෙන්න බෑ.බලමු ඉස්සරහට පුළුවන්ද කියලා.
ඊළඟට මං යෝජනා කළා මංගල සැසිවාරයේදී යෝජනා කළා ජානීස් මාවත රෝහලට විකල්ප මාර්ගයක් වශයෙන් වැඩිදියුණු කරන්න යෝජනා කළා.දැන් මං අදහස් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙන්නෑ.දැන් දුම්රිය මාර්ගයත් එනවලු.දුම්රිය මාර්ගයත් ආවොත් විකල්ප මාර්ගයක් රෝහලට නැති වුණොත් ලොකු ගැටලුවක්.මං කියන්නේ ලේකම්තුමා සෞඛ්‍ය ක්ෂ්ත්‍රයට ඍජුව සම්බන්ධ වෙලා හිටියේ.හොඳ කිර්තිමත් නිලධාරියෙක් වශයෙන් තමයි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එතුමාව පිළිගත්තේ.එතුමාටත් එක බලපායි ඉස්සරහට.එතකොට දුම්රිය මාර්ගය මේක ක්ෂණිකව ක්‍රියාත්මක වුණොත් රෝහලට විකල්ප මාර්ගයක් නොවුනොත් ඒ ප්‍රශ්නාර්ථය ඉස්සරහට ලොකුවට බලපානවා.දං හිතන්නේ දැන් මාස 6 කට ආසන්න කාලයක සිට යෝජනා කළේ.ඒකට මොකක් වුණාද කියලවත් අපි දන්නේ නෑ.අපි දන්නෙ නෑ මොකක්ද ක්‍රියාපටියාටිය අනුගමනය කරන.මං දන්නේ සාකච්චා කරලා යෝජනාව දිනුව

විතරයි.මේක ඉක්මන් ක්‍රියාවලියක් ලෙස මේක මොකක්ද වුණේ කියලා අපි දන්නේ නෑ.අපි දැනුවත් වීමකුත් නෑ.ඒකත් එක්කම දැන් පෞද්ගලික ව්‍යාපාරිකයෙක් ශල්‍ය ඒකකයට මුදල් ලබා දෙන්න ප්‍රකාශ කරලා තියෙනවා.එතකොට මේක මේ වැඩිදියුණු වෙනවාත් එක්ක මේ රෝහලට තියෙන ඉල්ලුම වැඩිවෙනවා.ඒ එක්ක මේ විකල්ප මාර්ගය වැදගත් වෙනවා.ඒකත් එක්කම දැනටමත් දැනට තියෙන මාර්ගය දැනටත් හැමවෙලාවෙම බ්ලොක් වෙලා තියෙන්නේ.ඒකට හේතුව මාර්ගයේ තියෙන අවහිරතාවය නිසා.දැනටත් ඒක ක්‍රමානුකූලව මාර්ගය භාවිතා කරන්න විදිහක් නෑ.හදිසියේ ගිලන් රථයක් ආවත් ඇතැම් විට අපහසුතාවට පත්වෙන අවස්ථා තියෙනවා.මොකද මං රෝහලට සෘජුව සම්බන්ධවෙලා කටයුතු කරන නිසා ඒ සම්බන්ධව මං නිරන්තරව අධ්‍යානය කරනවා.නිරන්තරයෙන් ඒක දැකපු නිසා තමයි ඒ කාරණාව මතු කළේ.එතකොට ඒ විකල්ප මාර්ගයට යන එක මං හිතන්නේ ලේකම්තුමා සෞඛ්‍ය අංශයට සම්බන්ධවෙලා හිටපු නිසා ලේකම්තුමාට විශාල ප්‍රසාදයක් තියෙනවා සෞඛ්‍ය අංශය තුළ.ඒ හින්දා සෘජු මැදිහත්වීමක් වෙලා අපි විකල්ප මාර්ගය ගොඩනගන වැඩේට,මං හිතන්නේ ඉක්මන් ක්‍රියා මාර්ගයකට ප්‍රවේශයක් ගන්න කියලා.මං අදහස් කරනවා.

ඊළඟට පොල භූමිය ඉස්සෙල්ලාම සභාවේදී දැක්කේ සුදු අලියෙක්.ඒ සුදු අලියා පාට වෙවි, මං හිතන්නේ විවිධ සංවර්ධන යෝජනාවලටදැන් යෝජනා වෙනවා.ඒ ඔක්කොම හොඳයි.දැන් ඒ පොළ භූමිය තුළ වතුර ගහගෙන යන කාණු පද්ධතිය අවහිර වෙලා තියෙනවා.ඒත් එක්කම ගලි ආවරණ මේ වෙනකොට නෑ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
නෑ.ගලි හදලා තියෙන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඊයෙ පෙරේදා හැදුව නම් බොහොම ස්තුතියි.මං හිතන්නේ මං ගිය සතියේ අධයනය කරන කොටත් එහෙමමයි තිබුණේ.මං නැවත නිරීක්ෂණයක් කරන් නම්.ඊට පස්සේ ප්‍රකාශ කරන්නම්.අනතුරු වෙච්ච අවස්ථා තියෙනවා.එහෙම හදල තියෙනව නම් ඉතුරු ටික කියන්න අවශ්‍යතාවයක් නෑ.ඔක්කොම හදලා ද තියෙන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
කොයි එකේද මන්ත්‍රීතුමා?

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
පොළ භූමියේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
නෑ.මේ පැත්තේ ටොයිලට් එකට තියෙන ගලි වලද?

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
නෑ.වතුර බැහැගෙන යන පොඩි ගලි වලවල් තියෙනවනේ,තැනින් තැන.ඒවයේ ඔක්කොම ආවර්ණ ඉවත් වෙලා තියෙනවා.මේවාට සමහර තැන්වල ඉණි හිටවලා තියෙනවා.පෙලක් තැන්වලින් තුවාල වුණු අවස්ථා තියෙනවා.අනිත් එක දැන් පාසල් බස් රථ ටිකත් එතනට ගෙනියන්න අපේක්ෂා කරනවා.එතනින් ගිහාම ක්‍රිඩාංගනයකට දෙන්නත් බලාපොරොත්තු වෙනවා.ඊට පස්සෙ මෙතන තියෙන මාළු වෙළඳසැළත් එතනට ගෙනියන්න බලාපොරොත්තු වෙනවා.ඔය ටික අරන් ගිහින් අර වලවල් ටික අර විදිහට තිබ්බොත් මං දන්නෑ මොකක්ද තත්ත්වේ කියලා.ඩිස්පැන්සරියකටත් තව කොටසක් වෙන් කරන්න වෙනවා එතකොට.දැනටත් අනතුරු සිදු වුණු අවස්ථා තියෙනවා.ඒකටත් විශේෂ අවධානයක් යොමු කරන්න කියනවා.සභාවට ආදායමක් ගන්න නම් ඒවා නිවරදි විදිහට ඒවා අධ්‍යානය කරලා පිළියමක් යොදන්න ඕන.බොහොම ස්තුතියි අවස්ථාව ලබා දුන්නට.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මටත් විනාඩියක් දෙන්න අපි සමස්තයක් විදිහට මේ කාරණා ගත්තහම,අපිට යම්කිසි විත්‍රයක් හරස්කඩක් තියෙනවා. ඒ හරස්කඩ තමයි අපි අතීතයේ ගෙනාපු සංකල්පයවල හරස්කඩවල් තියෙන්නේ. අතීතයේ තිබෙන්නේ අපි එක එකිනෙකා පරයා ගිහිල්ල යම්කිසි දෙයක් කිරීම. බල්බ් බෙදිල්ලෙත් තියෙන්නෙත් ඕකම තමයි.බල්බ් දැම්මේ මමයි බල් දැම්මේ මමයි වගේ අර්ථයකුයි යන්නේ එතන. හැබැයිබල්බ් එකේ එළිය එනකොට කවුරුත් යන්නේ එක එළියෙ තමයි. ඒ නිසා අපි ප්‍රතිපත්ති රැක ගන්න විදිහට, ජරා ජීර්ණ වූ සමාජයක් හදමින් යන්නේ. අපි ජරාවෙච්ච අපිරිසිදු වෙච්ච භාජනයකට පිරිසිදු වතුර වත් කරන කොට වක්කරන්න මොහොතේම භාජනය පිරිසිදු වෙන්නෙ නෑ. වත්කරන්න වත්කරන්න අපිරිසිදු ටික ටික එහාට ගිහිල්ල යන්න යන්න පිරිසිදු වෙනවා. ඒ නිසා අපි වගකීමෙන් කියනවා මේ සමාජය පිරිසිදු කරනවාමයි.මේ පිරිසිදු කිරීමේ ක්‍රියාවලියට, ඒ ක්‍රියාවලියට යද්දී අඩුපාඩුකම් ඇති වෙන්න පුළුවන්. ඒක මොහොතින් වෙන දෙයක් නෙමෙයි. අවුරුදු ගාණක් ආපු ආකල්ප තියෙනවා. ඒ හින්ද අපි මේඋත්සහ කරන්නේ. අපේ මේ ව්‍යාපාරයට ඇවිල්ලා තියෙන්නේ ඒ කිසිම දෙයක් නිසා නෙමෙයි. මේ රට අපේ අනාගත පරපුර වෙනුවෙන් හදන්න. ඒනිසා මං කියන්නේ අපි හැමෝම සද්භාවයෙන් ඉන්න ඕනි ආත්මාර්ථකාමිත්වය පොඩ්ඩක් අයින් කරලා අධ්‍යාත්මිකව හිතන්න clean ඕන.clean srilanka වලින් අධ්‍යාත්මිකව පිරිසිදු කිරීමක් කරන්නේ. අපි අධ්‍යාත්මිකව පිරිසිදු වෙන්න

ඕනේ. අපිරිසිදු භාජනය තමා හදන්න යන්නේ.ඒක හදන කොට සමහර අයට පේන්න ගන්නවා මේ කරන්නේ වංචාවක් කියලා.නෑ නමුත් අපිපිරිසුදු කරන අදහසින් කරන්නේ. ඒක තුළ යම්කිසි විවේචන එන්න පුළුවන්. ඕනෑම දේකට හරි දේ කරන කොට වුනත් විවේචන එනවා. ඒක තමා ස්වභාවය ඒ නිසා අපි පැහැදිලිවම පෙනී ඉන්නවා මේ රට පිරිසිදු රටක් කරන්න. ජරා ජීර්ණ සමාජය නැති කරල පිරිසිදු රටක් කරන්න. අවුරුදු හතරක් පහක් විතර යයි. දීර්ඝ කාලයක් යැයි රට හදන්න.අපි රට හදමු. බොහොම ස්තුතියි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, රණවීර අපේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විදියට ජරා ජීර්ණ සමාජයක් අපි අමතකකරන්න හොඳ නෑ මේ ජරා ජීර්ණ සමාජයෙන් ලක්ෂ හැට අටක් අරගෙන තමයි මේ ආණ්ඩුව පත් වුණේ. එතකොට මේ ලක්ෂ හැට අටක් දුන්න ඡන්දෙ දුන්න ජනතාවට තමයි මෙතුමා ආමන්ත්‍රණය කළේ,ජරා ජීර්ණ සමාජයක් කියලා.අපි ඒක පිළිකුළෙන් යුතුව හෙළා දකිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
අන්න ඒක තමයි සාවද්‍ය පරාවර්ථය කියන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
එතකොට කෙසේ වෙතත් මේ බල්බ් දාන එක ගැන බල්බ් භාවිතය, ආවභාවිතය ගැන මගෙන් අහන්න. පැල්පිටිය කොට්ඨාසයේ බල්බ් දාපු විදිය මම තත්පර කීපයක් අරගෙන මම කියන්නම්. පැල්පිටිය කොට්ඨාසෙ බල් පහළොවක් දැම්මෙ කොට්ඨාස සභාව කොට්ඨාස සභාවෙන්. මම මුල ඉඳන්ම කතා කරන්නේ මේ වගේ තීන්දු තීරණ ගන්නෙ, අජේසමන්සිරි මන්ත්‍රීතුමා කිව්වා වගේ ග්‍රාමීය සංවර්ධන කමිටුවකින් නෙමෙයි. ඒ වගේ තීන්දු තීරණ ගන්නේ දේශපාලන කොට්ඨාස සභාවකින්. එතකොට ඒකෙ භාවිතය අවභාවිතය ගැන අපේ මේ මන්ත්‍රීතුමියත් කතා කළා, අවභාවිතයක් ගැන. එතුමියලාට අවබෝධයක් තියෙනවා. තේරුම් ගන්න පුළුවන් කොච්චර අවභාවිතා වෙලා තියෙනවද කියල. මිනිස්සු ප්‍රජාතන්ත්‍රවාදී විදිහට මන්ත්‍රීවරයෙක් විදිහට අපිව පත් කළේ අවශ්‍ය ඡන්දය දුන්නේ, අවශ්‍ය තැනදී තීන්දු තීරණ ගන්න. හැබැයි තීන්දු තීරණ ගන්න නොහැකි යම් කිසි ප්‍රභවයක් ඔස්සේ බලය නිර්මාණය කර ගත්තෙ නැතිඋදවිය දේශපාලන වශයෙන් කොට්ඨාශ සභාවක් කියන ආයතනයක් පිහිටුවා ගෙන ඒ තුළින් තීන්දු තීරණ අරගෙන අර බල්බ් පහළොව දැම්ම. ඒකෙ දෝෂාරෝපණය ඔබතුමාට.ආයෙත් ඒ බල්බ් දැමීම ගැන මං කතා කරන්න අවශ්‍ය නෑ. ඒක අන්තිම අසාර්ථකයි. කාර්යක්ෂමව බල්බ් දානව නම් අපි කරන්න ඕන අපිට හම්බෙච්ච පැමිණිලි අනුව බල්බ් දාන එක නෙමෙයි.අපි කොටසක් තෝර ගෙන, අපිට බල්බ් පහළව නම් හම්බෙන්නේ පහළොව පියවරෙන් පියවර පිළිවෙලට බල්බ් පහළොව දාන එක තමයි කාර්යක්ෂම. තැන් තැන්වලින් බල්බ් දාන්න ගියාම මොකද වෙන්නේ දැන් මං දන්නෑ ඔය බල්බ්15 දාපු පිළිවෙල ලකුණු කරා ද කියලා. කාර්මික නිලධාරියා හරි අදාළ මන්ත්‍රීතුමා හරි උදව්වට ගියා නම් ඒ ඒ බල්බ් කණුවලට දාපු ඒ පහළොව ලකුණු කරාද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ලකුණු කරා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ලකුණු කරලා තියෙන්නේ. එතකොට ඊළඟ සැරේ විපක්ෂෙ කණ්ඩායමේ අයට බල්බ් දීල ඊළඟ සැරේ යන කොට ඒ බල්බ් 15 පිච්චිලා තිබ්බොත් ආයෙත් ඒවට දාන්න ඕන. එතකොට මම විශ්වාස කරන විදියට ආයෙත් කවදාවත් බල්බ් එකක් පරිහරණය කරන්න බැරි ජනතාවකුත් සමහර වෙලාවට ඉන්න ඉඩ තියෙනවා. එතකොට ඒ වැඩේ අසාර්ථකයි. මේක කාර්යක්ෂම වෙන්න නම්

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඇත්තටම එක එක්කෙනා රණ්ඩු වෙන නිසා තමයි මේ ප්‍රශ්නෙ වෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
කාර්යක්ෂම වෙන්නෙ නම් නෑ. රණ්ඩුවීම තුළ මම දකින්නැ, රණ්ඩුවීම තුළ මේ වැඩේ වෙලා තියෙනවනේ. රණ්ඩු වුණා කියලා මේ වැඩේ නතර වෙලා නැනේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
නතර වෙන්නෙ නෑ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
බල්බ් පහළොව දීල තියෙනවනේ කොට්ඨාස කිහිපයකට, ඒක හින්ද රණ්ඩු වීම බලපාල නෑ. රණ්ඩුවීම පැල්පිටියට බලපාලත් නෑ. පැල්පිටියෙත් තැනින් තැන තැනින් තැන වන්දෙ දුන්නු පිළිවෙලට බල්බ් ටික දාලා තියෙනවා. ඡන්දය දීපු පිළිවෙලට. නැත්නම් එයාලගේ ඉල්ලීම මත නෙමෙයි බල්බ් පහළොව දාල තියෙන්නේ. සභාපතිතුමා. එතකොට තමන් තේරුම් ගන්න ඕන කොච්චර අවභාවිතා වෙලා තියෙනවද, මේ ආණ්ඩුව මහ ලොකුවට කියපු ඒ දේශපාලන සංස්කෘතිය නිර්මාණය කරලා තියෙනවද කියන එක සැකයක්. අවුලක් නෑ කියල කවුරු හරි කියනවනම් පැල්පිටියට එන්න මෝරගලටඑන්න අපි පෙන්නන්නම් එතකොටමේ මහ ලොකුවට කියපු ස්ටේජ් ගහගෙන බොරුවට මිනිස්සු රවට්ටපු ඒ දේශපාලන සංස්කෘතිය නිර්මාණය වෙලා නෑ කියල අපි පැල්පිටියට ආවහම කියන්නම්. මම දන්නෑ අනිත් ඒ වගේ උදාහරණ. මට ඕනැවට වඩා හොයන්න යන්නෙත් නෑ. මොකද මටම උදාහරණ තියන හින්දා. ඒ ගැන තවදුරටත් කතා කරන්නෑ.

කොට්ඨාස සභාව හරහා මං එදත් කිව්වා ඔබතුමා ඉන්න තැනම කිව්වා කොට්ඨාස සභාව හරහා වැඩ කරගන්න. මිනිස්සු තෝරා ගත්ත ක්‍රමවේදය අනුමත කරන් නැත්නම්. රුපියල් ලක්ෂ දහයක් වෙන්වෙලා තියෙනවා පාරක් හදන්න. පැල්පිටියේ ඒ පාර හදන්න ගමේ තියෙන ග්‍රාම සංවර්ධන සමිතිය තමයි ක්‍රියාකාරීම සමිතිය. ඒගොල්ලෝ ගිහිල්ල AG OFFICE එකට ගිහිල්ලා. ක්‍රියාකාරී ආයතනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගිහිල්ලා ගිවිසුම් අත්සන් කරාට පස්සේ බලපෑමක් එනව, එම සංවර්ධන සමිතියට ඒ ගිවිසුම අත්සන් කරන්න එපායි කියල බලපෑමක් කරනවා. බලපෑමක් කරන්නේ කවුරුවත් නෙමෙයි, අපේ උපසභාපතිතුමා. එතකොට උපසභාපතිතුමා කියනවා ග්‍රාම සංවර්ධන සමිතියට ඒක අත්සන් කරන්න එපා කියලා. හැබැයි එතකොට ගිවිසුම් අත්සන් කරලා තියෙන්නේ. දැනටම ගිවිසුම අත්සන් කරලා තියෙන්නේ. ඒ මොකද බලපෑම ඇවිල්ල තියෙන්නෙ අර බලය උත්පාදනය කරන්න ප්‍රභවයක් නැති දේශපාලන ආකෘතියක් වන ගමේ කොට්ඨාස සභාව විරුද්ධ වෙලා තියෙනවා. ග්‍රාම සංවර්ධන සමිතිය අත්සන් කරනවාට. හේතුවක් විදිහට කියන්නේ මේ ග්‍රාම සංවර්ධන සමිතිය ක්‍රියාකාරී නෑ දූෂිතයි නැත්නම් ඒකෙ වෙන දේශපාලන අතපෙවීම් තියෙනවා කියලා. මොකක් හරි එක එක හේතු කියනවා. කාර්යක්ෂම නෑ මීට වඩා කාර්යක්ෂමයි සමූපකාර සමිතිය කියලා. මම හොයලා බැලුව, අනිත් පැති වල සමූපකාර සමිතියට කරන්න පුළුවන් අවස්ථා තිබෙද්දිත් අනිත් පැතිවල වලත් එක එක සමිති නැත්නම් ග්‍රාම සංවර්ධන සමිති වලට තමයි මේ ගිවිසුම් අත්සන් කරලා ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා තියෙන්නේ පැල්පිටිය විතරක් ග්‍රාම සංවර්ධන සමිතියට ගිවිසුම අත්සන් කරලා ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න අවස්ථාව දුන්නෑ. මෙන්න අසාධාරණ දේශපාලනය. මේ දේශපාලන සංස්කෘතියක් ගොඩ නගන්න නෙමේ ජාතික ජන බලවේගයට ඔය මහලොකුවට කියන NPP එකට මිනිස්සු ඡන්දෙ දුන්නේ. හැබැයි මේක මිනිස්සු දන්නවා දැන් යන වැඩ පිළිවෙල දන්නවා. ඊළඟට පළාත් සභා ඡන්දයක් තිබ්බහමමේ ආණ්ඩුවට මොකක්ද වෙන්නේ කියලා මිනිස්සු දන්නවා.හැබැයි උත්සහ කරනවා nppආණ්ඩුව මේ පළාත් සභා ඡන්දය නැත්නම් ඔය මහ ලොකුවට කිව්ව මැතිවරණ සිතියම අකුළන් නෑ කියපු කණ්ඩායම මේ මැතිවරණ සිතියමඅකුළන්න දරන උත්සාහය මිනිස්සු දන්නවා අපේ රටේ විදේශ ඇමතිතුමා ගිහිල්ලා සද්ද නැතුව කරඔගෙන ඉඳල ඉන්නකොට මානව හිමිකම් කවුන්සලේ ඒක මං හිතන්නේ හැට හත එක ගිවිසුම (67-i)ගිවිසුම මානව හිමිකම් කවුන්සලයෙන් ඒක යෝජනා සම්මත වෙනකොට ඒකෙ තිබුණ පළාත් සභා ඡන්ද තියන්න ඕනේ කියල. එතකොට මං විශ්වාස කරනවා ලබන අවුරුද්දේ අප්‍රේල් වගේ වෙන කොට පළාත් සභා ඡන්දයක් තියෙනවා. ඒක වළක්වන්න බෑ. ඒක වළක්වන්න විදියක් නෑ. නැත්නම් ඒක ආණ්ඩුවෙන් කරන වැඩක් නෙමෙයි. ආණ්ඩුවෙන් කරන මැතිවරණයක් නෙමෙයි. අර ජාත්‍යන්තරයේ බලපෑමට පළාත් සභා ඡන්දය කරන්න වෙනවා. ඒකෙ කරබාගෙන හිටියත් ප්‍රතිඵල අපිට අනාගතයේදී දකින්න ලැබේ. එතකොට අර අහිංසක රණවිරුවන් තමන්ගේ ජීවිත පූජා කරලා තම කැපවීම් කරල තමන් දිනාගත්ත දේශය වෙනුවෙන් ඔවුන් කරන කැප කිරීම තව කාලයක් යනකොට අපට බලාගන්න පුළුවන් වෙයි. වන්දි ගෙවන්න සිද්ධ වෙයි. ඒ වගේ කාරණාවක් තමයි මේ, මානව හිමිකම්. අපට අනවශ්‍ය විදිහට, ලංකාවේ තියෙන ස්වාධීපත්‍යට බලපෑම් කරල මේවට මැදිහත් වෙන කොට අපිටත් ඒවට වන්දි ගෙවන්න සිද්ධ වෙයි කියන එක විශ්වාසය අපට තියෙනවා. අපි එච්චර දුර කතා කරන්න යන්න අවශ්‍ය නෑ.

මම විශ්වාස කරා අද පැමිණි සහ පෙත්සම් වාරයේදී ඔබතුමාට ලිපියක් හම්බවෙලා තියෙනවා, ඒක කියවයි කියලා. ජී. චන්ද්‍රපාල නොම්මර 255, විජේනායක මාවත, ඇහැලියගොඩ. සභාපතිතුමාට එවලා තියෙනවා. මං හිතන්නේ ඒක පෙස්සමක් විදිහට එවල තියෙන්නෙ. ඒක සභාවේ කතා වුණේ නෑ. මම ඒ අවස්ථාව ගන්නවා. ඒකෙ මාතෘකාව තියෙන්නේ ජල සැපයුමක් ලබා ගැනීම සම්බන්ධයෙන් මතු වූ ගැටළුවක් සම්බන්ධව. මං අර කිව්වා වගේ ප්‍රාදේශීය සභාවට ඇවිල්ල මිනිස්සු වතුර ගන්න ජල සැපයුම ගන්න සල්ලි බඳිනවා. ඒ වෙනුවෙන් අදාළ කාර්මික නිලධාරිය තමයි ඒ ගාන ඇස්තමේන්තු කරන්නේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ජල සම්පාදන සම්පාදනයෙන්ද?

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
දැන් අපි පාර කඩනවනේ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ආ.. පාර කඩන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
එතකොට ඇපයක් බඳිනවනේ.එතකොට ඔහුගේ ගාණ රුපියල් 10000.00 ක් ඊට අමතරව රුපියල් 1500.00 ක පර්යේෂණ ගාස්තුවක් අරන් තියෙනවා. ඒතන නිරීක්ෂණය කරනවට 1500.00 ක් ගෙවලා තියෙන්නේ. එතකොට 11500.00 ක සම්පූර්ණ මුදලක් සභාවට ගෙවලා තියෙනවා. හැබැයි සතියක් ගියා දෙකක් ගියා තුනක් ගියා, වෝටර් බෝර්ඩ් එක ඇවිල්ල එහා ගෙදර අයට පාර කඩලා ජල සැපයුම ලබා දුන්නා. එතකොට චන්ද්‍රපාල මහත්තයාගේ නිවසට ජල සැපයුම ලබා දෙන්න පාර කැඩුවොත් එයාලට බලපානවා, ඒ සඳහා එයාලට වගකීමක් ගන්න බෑ, කවුරු හරි දම්මල හරි ඒක කඩන්න. ඒ විදියට විවිධ බලපෑම් කරනවා. ඒ මොකටවත් නෙමෙයි, අල්ලස් ගන්න. මේ ජල සැපයුම ගන්න.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ කියන්නේ ප්‍රාදේශිය සභාවෙන්ද?

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
නෑ. ජල සම්පාදන මණ්ඩලයේ. මං දිගින් දිගටම කාර්මික නිලධාරිත් එක්ක මගේ දැනුමේ හැටියට වාද කරාට, එතනින් එහාට යන්න බෑ. එතකොට මං විශ්වාස කරන විදිහට ඒ සඳහා කිසිම ප්‍රතිපත්තියක් නෑ,

ජල සැපයුම් ලබාදීමට මාර්ග පළුදු කිරීම සම්බන්ධයෙන් මේ ප්‍රාදේශීය සභාව තුළ ප්‍රතිපත්ති නෑ. ඒක මට හොඳටම ඉස්මතු වෙච්ච තැනක් තමයි ඒ අවස්ථාව. එතකොට මෙහා ගෙදර අයට ජල සම්පාදන මණ්ඩලයෙන් ඇවිල්ල අදාළ ජල සැපයීම ලබා දුන්නා. චන්ද්‍රපාල මහත්මයාට ලබා දුන්නේ නෑ. ඇයි ඒ, එයාලා කියනවා එයාලට කිසියම් අල්ලසක් ඉල්ලනවා. එහෙම වෙන්න දෙන්න බෑ. අපේ මේ බල ප්‍රදේශයේ, ජීවත්වන ඔබතුමන්ලට විශාල වශයෙන් උදව් කරපු චරිතයක් තමයි ඒ. දේශපාලන වශයෙන්. එතකොට එයාලා ඒ අසාධාරණය ප්‍රාදේශීය සභාවට ලියල එවල තිබ්බා නමුත් තාම ඒ පිළිබඳ කටයුත්තක් කරල නෑ තාම.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ලිවුමක් නම් ආවේ නෑ තාම.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මං දිනෙත් කියන්නම්. දැන් සති දෙකක් විතර වෙනවා. 2025-09-29 තමයි එවල තියෙන්නෙ. එතකොට ඒ ලියුම් පිළිබඳ ඇක්ෂන් එකක් අරගෙන නෑ. මම ඉල්ලනවා ඒ පිළිබඳ ඇක්ෂන් එකක් ගන්න. මේ අපේ බල ප්‍රදේශයේ ජීවත්වන මනුස්සයෝ. ඒ අයට සාධාරණයක් කරන්න, නැවතත් ඒ වගේ අකටයුත්තක් නොවෙන්න. ප්‍රාදේශීය සභාවෙන් ගත යුතු ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුතුයි. රුපියල් 10000.00 ක් බැන්දේ නිකන් නෙමෙයිනේ, ඇපයක් විදිහට. ඇපය අපි තියාගන්නෙ පාරේ කැඩුනොත් හදන්නනෙ. ඒ ඇපයක් විදියට භාරගෙන කඩන්න කියලා, මේකෙ ඇප තැන්පත් කරල තියෙද්දිත් ජල සම්පාදනය එහෙම නොකරන්නේ? මං දන්නෑ මොකක්ද කියල. ඒක අසාධාරණම වැඩක්.

ඊළඟ කාරණාව මෙතුමිය මතක් කරා ජේ.පී. ඒ කියන්නේ සමාදාන විනිශ්චයකාර පදවිය අපට හම්බවෙනවද? ඒ ගැන නීති රීති වෙනස් වෙලා තියෙනවද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
අපට ලැබෙනවා.දිවුරුම කරන්න ඕනේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඇයි දන්නෑ. ඒක කරන්නෙ නැත්තෙ. පරක්කු මොකද දන්නෑ. මං දන්නෑ. මං කියන්නේ අපට අවුරුදු හතරයි හම්බවෙලා තියෙන්නේ. ආයෙ අපි ප්‍රාදේශීය සභාවේ ඉඳගන්නෙත් නෑ. ආයෙ මේ පැත්තටවත් එන්නෙත් නෑ. මට දැන් අවශ්‍යයත් නෑ. මේ වෙනුවෙන් අපිට හඬක් නගන්න එපැයි. තාම ඒ පිළිබඳ ක්‍රියා කරන නිලධාරියෙක් නැද්ද? අපි නම් ගිය ගමන ඇවිල්ල මාසෙන් දිසාවිනිසුරු ගාවට ගිහිල්ලා දිවුරුම් දීලා ඒ පදවිය අරගෙන විශාලවැඩ කොටසක් කරා සාම විනිසුරු කෙනෙක් විදිහට. නමුත් ඒ අවස්ථාව මන්ත්‍රී කෙනෙක් විදිහට මෙතන ඉන්න සියලුම පක්ෂ විපක්ෂ සියලු දෙනාටම ඒ අවස්ථාව අහිමිවෙලා තියෙනවා. මාස හතරක් ගිහිල්ලා. අන්න ඒ අවස්ථාව සලසලා දෙන්න. අපි මීට කලිනුත් ඒ ඉල්ලීම ඔබතුමාට ඉදිරිපත් කළා. ෆොටෝ ගැහුව තාම අයිඩින්ටිය නෑ තාම. ප්‍රමාදයි. එහෙම ප්‍රමාද වෙන එක නම් සම්පූර්ණයෙන්ම, අනේ මන්දා ඒක, අකාර්යක්ෂම බව තමයි මේකට හේතුව වෙලා තියෙන්නේ. ඊළඟට අවසාන වශයෙන් වැඩිය කතා කරන්න යන්නෑ. මං තැනින් තැන අවශ්‍ය කාරණා ටික පැහැදිලි කරා සභාවේ දී. එතකොට අවසාන වශයෙන් අපි මේ ඉදිරිපත් කරන කාරණා,අපි කාලයත් කැප කර ගෙන එන්නේ මිනිස්සු වෙනුවෙන් කතා කරන්න එන්නෙ. ඒව අපි සභාවේ ඉදිරිපත් කරාම, ඒකෙ නිත්‍යානුකූල බවක් තියෙනවා. ඒ නිත්‍යානුකූල වේදිකාව තුළ අපි ඉදිරිපත් කරහම ඒ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ග අපිට ඊළඟ සභාවේදී දැනුම් දෙන. නැත්නම් අපිට ඒක ලිඛිතව එවන්න. මේ ආයතන වලට සම්බන්ධ කරා කියලා දෙන්න. අන්න ඒ වැඩපිළිවල කිසිම විටකවත් ක්‍රියාත්මක වුණේ නෑ මේ මාස හතර තුළ. ඒ වෙනුවෙන් ඔබතුමා මැදිහත් වෙලා අපි මොනවා හරි යෝජනාවක් ඉදිරිපත් කළහම ඒ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ග අපිට දැනුම් දෙන්න. අපි ගමේ ගිහිල්ලා කියන්න ඕන, අපි මේ වගේ යෝජනාවක් කරා ආණ්ඩුව මෙන්න මේ වගේ තමා ප්‍රතිචාර දැක්වුවේ ඒක ඉදිරිපත් කරන්න ඕනේ.ලිඛිතව අපට එවන්න. එතකොට අපිට පුළුවන් ඒකෙ පිටපතක් එව්වහම එතනින් එහා ඒ සම්බන්ධීකරණ කටයුත්ත කරන්න. අන්න ඒකට උනන්දු වෙන්න කියන කාරණාව ඉදිරිපත් කරමින් මේ අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම දීර්ඝ කතාවක් කරන් නෑ.දිලින් කරුණාපාල මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයක් නිවරදි කිරිමක් විතරයි මට කරන්න තියෙන්නේ.දිලින් කරුණාපාල මන්ත්‍රීතුමා කිවුවා අපේ විදේශ ඇමති විජිත හේරත් ඇමතිතුමා මානව හිමිකම් කවුන්සලේ දි අපි නිහඬව ඉදලා එතෙන්දී අර පළාත් සභා ජන්දය එහි බලපෑම නිසා දෙනවා කියලා.මං හිතන්නේ එතුමා විජිත හේරත් ඇමතිතුමාගේ මේ ළඟ දී තිබුණා වීඩියෝ එකක්.ඒක බලන්න නැතුව ඇති.එහි දී ඔහු ප්‍රකාශ කරපු දේ තමයි මෙතුවක් කාලයක් පහුගිය කාලවල් වලදී තිබිච්ච රජයවල් සැහෙන්න තිබුණා.හැබැයි මානව හිමිකම් හැම එකකටම කවුන්සිලයට ගියා ඒ හැම රජයක්ම. හැබැයි ගිහිල්ලා, ඒ මානව හිමිකම්වලින් දිනපු තැනක් කියන්නකෝ.අපේ රට ජයග්‍රහණය කරපු එකක් ඒ ආපු යෝජනාවල.මානව හිමිකම් උලංඝනය කරා කියලා අපිට විරුද්ධව ඒකෙදි ගේනවා.ඒ ගේන අවස්ථාවලදී එකම වතාවකදීවත් අපි ජයග්‍රහණය කරලා නෑ මං දන්න විදිහට.ඒ නිසා තමයි විජිත හේරත් ඇමතිතුමා කිවුවේ ඒකට ගොඩක් වියදම් කරලා තියෙනවා.ඒ කියන්නේ ඒ රජයවල් ඒක දිනා ගැනිම සඳහා වෙනත් රජයන් සමඟ සාකච්ඡා කරන්න කණ්ඩායම් ඇවිල්ලාඒක දිනා ගන්න පුළුවන්ද කියලා සැහෙන මුදලක් වියදම් කරලා තියෙනවා. නමුත් ඒ වියදම් කරාට ඒක ජයග්‍රහණය කරන්න එකම අවස්,ාවකවත් ලැබිලා නෑ.ඉතින් විදේශ ඇමතිතුමා කිවුවේ එවැනි නිරපරාධ අපරාධ වියදමක් දැරුවත් අපි පරාද වෙනවා කියන එක දන්න නිසා ඒකෙදි අපට ජයග්‍රහණය කරන්න බැරි නිසා අපි ඒකට එච්චර උනන්දුවක් දැක්වුයේ නෑ කියලා.නැතුව මේ පළාත් සභාව අපට එතනින් බලපෑම් කරලා තියෙනවා නෙමේ,අපි අනිවාර්යෙන් පළාත් සභා ගේනවා කියලා රජය විදිහට තින්දුවක් ගෙන

තිබුණා.අප්‍රේල් පහු වෙනකොට පළාත් සභාව ගේනවා.හැබැයි ඉතින් ඕන කෙනෙකුට හීන දකින්න පුළුවන්. පළාත් සභාව දිනාගන්න පුළුවන් වෙයි කියලා, ඔය කියන කණ්ඩායම්වලට.අපි මේ අවස්ථාවේ කියනවා අපි බිමේ ජීවත් වෙන මිනිස්සු.බිමත් එක්ක ගනුදෙනු කරන මිනිස්සු.ඒ නිසා අපට විශ්වාසයක් 200% විශ්වාසයක් තියෙනවා ඒ මිනිස්සුන්ගේ මතය මොකක්ද කියලා කියන එක.මං දන්නැ මොනව හිතාගෙන එහෙම කියනවද කියලා.ඒ නිසා අපි කියනවා අනිවාර්යෙන් ම ඊළඟ පළාත් සභාවේ දී ජාතික ජනබලවේගය අනිවාර්යෙනම රත්නපුර දිස්ත්‍රික්කය විදිහටත් අපි ඉහළින්ම ජයග්‍රහණය කරනවා මොකද ඒ බිමේ තියෙන මතය ඒ බිමේ ඉන්න මිනිස්සුත් එක්ක අපි ඉන්න නිසා, අපි දන්නවා ඒක වෙනවා කියලා.ඒ නිසා ඕන කෙනෙවකුට හීන දකින්න පුළුවන්.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මටත් යම්කිසි අදහසක් ඉදිරිපත් කරන්න තියෙනවා.දැන් කතාවෙන මාතෘකාවට මේක පොඩ්ඩක් එළියෙන්. මට මතක් කරන්න තියෙන්නේ අපේ සභා වාර්තාවේ කලින් යෝජනා කළා,අපේ ප්‍රියන්ත මන්ත්‍රීතුමත් යෝජනා කළා,ඇහැලියගොඩ පොළ භූමිය ඉදිරිපිට තියෙන එළුමස් හා කුකුල් මස් වෙළඳ ස්ථානය ඒක සාමාන්‍යයෙන් ලක්ෂ විසි පහයි ගාණකට ටෙන්ඩරය එනවා.හරක් මස් කඩේ.ගව මස් කඩේ.ඒක මේපාර ලක්ෂ හතළිස් හතයි ගාණකට ටෙන්ඩරය ගිහිල්ල තිබුණා.ඉතින් අපි ගැටහැත්ත පොළ භූමිය අලුතින් හරක් මස් කඩයක් හරි මොනව හරි එකක් අලුතින් අපි යෝජනා කරනව නම්, අපි පොඩ්ඩක් කල්පනා කරන්න ඕනේ මේ ස්ථානයේ ගැටහැත්ත ඉන්න මිනිස්සු හරස් මස් කනවද?මං දන්නා තරමින් ඒ හරියේ මං දන්නා තරමින් මුස්ලින් අය නෑ.උරු මස් කඩේට මුස්ලින් මන්ත්‍රී දෙන්නා , ලැජ්ජාවෙන් නිකන් ඉන්නවා කියලා මන්ත්‍රීතුමා කලින් මතක් කරපු නිසා මතක් කරන්නේ.ඒ හරියේ මුස්ලින් මිනිස්සු නැ.ඒ හින්දා අපිට අදාළ වෙන්නැ.ටවුමේ සාමාන්‍යයෙන් ඒ තියෙන ගව මස් කඩේ ගාව උරු මස් කඩයක් එනව නම් ඒ ගැන පොඩ්ඩක් කල්පනා කරන්න වෙනවා.එහෙම එකක් නැති හින්දයි අපි දෙන්නා සද්ද නොකර හිටියේ.මේ හරියේ ලක්ෂ හතළිස් හතයි ගාණක් මාසෙකට,සාමාන්‍යයෙන් ලක්ෂ හතර හමාරක් පහට කිට්ටු වෙන මුදලක් එයාල කුළිය ගෙවනවා.එහෙම තියෙද්දී අපි පොඩ්ඩක් කල්පනා කරන්න ඕන,ඒක විතරක් නෙමෙයි මෙතනින් කිලෝමීටර දෙකකින් එහාට කුරුවිට ප්‍රදේශයට ළං වෙන තව මස් කඩයක් තියෙනවා.ඒ කියන්නේ අපට ලාභ ලබන ස්ථානයක් තියෙනව නම් ඒක අපි රැක ගන්න ඕන.ඒ මිනිස්සුන්ට සාමාන්‍යයෙ වෙළඳාමක් වැටෙන්න ඕන.මං මේ මතක් කිරීමට කියන්නේ,මේපාර අපි ටෙන්ඩරය රුපියලක්වත් වැඩි කළේ නෑ.ගියපාර තිබ්බ්ව ගාස්තුවමයි දැම්මේ.ඒත් රුපියල් 100.00 ක් වැඩි වෙලා තියෙනවා මස් කිලෝ එකක්.ඊට පස්සේ සමහර මිනිස්සු,මස් කඩේ කට්ටිය නෙමේ ,කියලා තියෙනවා අපේ ආණ්ඩු පක්ෂෙන් මේක වැඩි කරලා.අපේ සභාවෙන් ටෙන්ඩරය වැඩි කරපුවහම මස් කිලෝ එකක් 3000.00 කට යන්න හදනවා කියලා.එහෙම එකක් ඇත්තටම නෑ.අපි වැඩි කළේ නෑ. ඒ හින්ද ගැටහැත්ත පොළ භූමිය තුළ අපි ඉදි කරන එක අපි පොඩ්ඩක් කල්පනා කරලා බලන්න ඕනේ.එතන ගැටලුව එන්නේ එළු මස් කඩේ හා කුකුළු මස් කඩේ.දෙකම තියෙන්නේ අපේ පොළ භූමිය ගාව.ඔතන ඇත්තටම වෙලඳාම අඩුයි.ලක්ෂ විසිපහ ගාණේ ටෙන්ඩරය එනව කිපුවහම, සාමාන්‍යයෙන් දවසට මං හරියට ගාන බැලුවෙ නෑ , දවසකට 7000 ක් 8000 ක් වෙන් කරන්න ඕන.7000 ක් විතර දවසකට වෙන් කරන්න ඕ෦න.එතරම් ලාභයක් ලබා ගන්න බෑ කියලා දැන් කඩේ කරන අයත් ටෙන්ඩරයට ඉදිරිපත් වෙලා තිබුණේ නෑ, ඇත්තටම.ඔතන එළු මස් කඩේ විතරක් නෙමෙයි,කුකුල් මසුත් විකුණනවා.ඒකෙ වෙළඳාම අඩුයි එයාල කියනවා දවසකට සාමාන්‍යයෙන් කිලෝ 5 ක් වත් විකුණ ගන්න බෑ.දවසකට කිලෝ 5 ක් වත් විකන් විකුණ ගන්න බෑ.ඒ කියන්නේ වෙන මොකවත් නෙමේ ,අපේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ තියෙන කඩවල් බැලුවොත් සාමාන්‍යයෙන් චිකන් කඩවල් තියෙනවා 20 කට වැඩියෙන්.ඒවයෙන් මාසෙකට,අවුරුද්දකට අපිට ලැබෙන්නේ එක කඩෙකින් අපිට රුපියල් 1000.00 ක් වගේ මුදලක් තමයි මං දන්නා තරමින් ලැබෙන්නේ.අපි එකතු කරලා බැලුවොත් අපිට රුපියල් 20000.00 ක් වගේ තමා අපිට ලැබෙන්නේ.දැන් අපිට අලුතිනුත් සමහර කඩවල් වල අයිස් චිකන් විකුණන කියලා අනුමැතිය අරන් එයාලා ෆිසර් දාගෙන චිකන් කපාගෙන,විකුණනවා.ඒ මිනිස්සුන්ට වෙළඳාම අඩුයි කියලා එයාල කියන්නේ. අපිට පැමිණිලි කරනවා.ඒක අනිවාර්යෙන්ම අපි සභාවක් හැටියට අපි බලා ගන්න ඕන අපේ ලොකු ආදායමක් අපිට ලැබෙන ස්ථානයක්.ඒක තමයි මං පොඩ්ඩක් පැහැදිලි කරන්න හිටියේ.ස්තූතියි.

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,කාරණා ගොඩක් පැහැදිලි කරන්න හිටියත් අත්‍යවශ්‍යම එක කාරණාවක් මතක් කරනවා පොඩ්ඩක්.ආහාර පාන රැගෙන යන සංචාරක වෙළඳ රථ වලින් අපේ සභාවට අය වියයුතු ආදායමක් මඟ හැරිගෙන යනවා.ඒ ගැන පොඩ්ඩක් මතක් කරන්නයි ගත්තේ.ඒ වෙළඳ රථ සඳහා ඇහැලියගොඩ බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳ රථ දඳහා අතුරු ව්‍යවස්ථාවේ 3-I සඳහන් වෙනවා අතුරු ව්‍යවස්ථාවේ පළමු වන ලේඛනය යටතේ."ආකෘතියට අනුකූල සභාපතිවරයාගෙන් ලබා ගත් බලපත්‍රයක් ඇත්තේ නම් මිස කිසිදු තැනැත්තෙකු විසින් ඇහැලියගොඩ, ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ආහාර පාන හෝ වෙනත් භාණ්ඩ රැගෙන සංචාරක වෙළඳාම නොකළ යුතුයි කියලා."මේ අතුරු ව්‍යවස්ථානුකූලව අපිට දැනටමත් එකළුක සංචාරක වෙලඳ රථ යනවා,මින්නාන, ගැටහැත්ත ඒ අවට යනකන්ම .ඒ අවට සංචාරක වෙළඳ රථ යනවා.මං හොයලා බැලුවා ඇත්තටම ප්‍රාදේශිය සභාව විසින් යම් බලපත්‍රයක් ලබා ගෙන නෑ.ඉතින් අපරාදෙ අපිට ලැබිය යුතු ආදායමක් මගහැරෙනවා.ඒ ගැන පොඩ්ඩක් සභාව අවධානය යොමු කරලා ඒකට සැලසුමක් හදන්න කියනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මං මේ අපේ සභාපතිතුමාට ස්තූති කරන්න තමයි කතා කරේ.විශේෂයෙන්ම මාස ගාණක් තුළ අපේ මැණික් පොළ ඉදිරිපිට ජලය අපතේ යන ස්ථානයක්.මං හිතන්නේ අර මැණික් පොලේ බුදුමැදුර යටින් බටය පළුදු වෙලා.අපි එතනින් යද්දී මට අපේ ආරි මන්ත්‍රීතුමාටත්,අපේ අතුරලිය මන්ත්‍රීතුමාටත් ඒ ගොල්ලෝ කියනවා.වෝටර් බෝර්ඩ් එකට කතා කරාම ඒගොල්ලෝ ඒක මග ඇර මග ඇර හිටියා.සභාපතිතුමාට කතා කරලා රත්නපුරට කතා කරලා එක දවසයි මං හිතන්නේ ඒ ගොල්ලෝ

පාර කඩන්න ඕන අවසර ගන්න ඕනේ කරන්න බැ කියලා.මං හිතන්නේ පැයක් යනකොට වටේ කඩලා බටේ දාල වතුර ලීක් එක හදල තියෙනවා.මං. හිතන්නේ ඒක සම්පත් අපතේ යැම වැලක්වීමක්.බොහොමත්ම ස්තුතියි.

ඒ වගේ ම ගරු සභාපතිතුමාට තව යෝජනාවක් ගේන්න තියෙනවා.මොකද මං උදේ හවස මං එතනින් වැඩට යන නිසා,අපේ මැණික් වෙළඳ ව්‍යාපාරිකයන් ඉල්ලීමක් කරලා තියෙනවා මැණික් පොළේ ශාන්ත බවන ප්‍රදේශයේ කාණු පද්ධතිය අක්‍රියයි කියලා.ඒ කාණු පද්ධතියෙ වතුර බැස යන් නෑ.මං හිතන්නේ එතන මැණික් ව්‍යාපාරිකයෝ කීප දෙනෙක් ඩෙංගු රෝගය හැදිලා ඉස්පිරිතාලේ ගෙනිහින් තියෙනවා.එතන වෙළදාම් කරද්දි.ඉතින් ඒ කාණු පද්ධතියත් බැකෝ යන්ත්‍රයක් දාල සුද්ද කරලා දෙනව නම් මැණික් ව්‍යාපාරිනයන්ට ලොකු සේවයක්.විශේෂයෙන් නැවත වතාවක් ජල අපතේ යැම වැලක්කුවට සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වගේම විශේෂයෙන් ම කියන්න ඕනේ.අපි සද්භාවයෙන් වැඩ කටයුතු කරනවා.නමුත් යම්කිසි අඩුපාඩු වෙන්න පුළුවන්.අනිත් මන්ත්‍රිවරු විවෙචන එල්ල කරනවා.අපි ඉතින් ඒ විවේචනවලට මුණ දෙන්න් ඕන.ඇත්තෙන්ම සියලු දෙනා අපි වම්පස දකුණුපස කිවුවට හැමෝගෙම දේශපාලනයක් තියෙනවා.අපි ඒක පිළිගන්න ඕන.මොකද මගෙත් දේශපාලනයක් තියෙනවා,අතුරලිය මන්ත්‍රිතුමාගෙත් දේශපාලනයක් තියෙනවා.ඉතින් අපි වැඩ කරද්දී නමුත් එහෙම දේශපාලනය බෙදා ගැනීමක් නෑ.මම බල්බ් දාන්න ගියහාම මම කරේ නැගෙනහිර විලේගොඩ විලේගොඩ වසමේ කෙළවරක ඉදන් දාගෙන ගියා.ඉවර වුණාද විලේගොඩ වසමේ එක කෙළවරක ඉදන් දාගෙන ගියා.මං හිතන්නේ විශේෂයෙන්ම විලේගොඩ වසමේ මං බල්බ් දාපු ප්‍රදේශයේ මට ඡන්ද ලැබුණෙම නෑ.ලක්ෂ ගාණක් පැරදිච්චි මැණික් ව්‍යාපාරිකයෝ මට විරුද්ධව ඔට්ටු අල්ලා ඒ ගෙවල් ඉස්සරහින් තමයි දාන් ගියේ බල්බ් ටික.එතනින් යද්දී මට කට්ටිය හිනහත් වුණා.ඒකට කමක් නෑ.ඒක ප්‍රශ්නයක් නෑ.මං වැඩ කරන්න ඇවිත් තියෙන්නේ වසම් දෙකටම.මට අතුරලිය මන්ත්‍රිතුමාට කතා කරන්න තිබුණා.නමුත් මම මෙල්සිරි මහත්මයාගෙන් දවස ගත්තේ බොහොම අමාරුවෙන්.ඒ කියන්නේ වහිනව කියනවා.අද යන්න බැ එක කාර්මිකයයි ඉන්නේ එතුමා පළාත් පාළන සතියේ දවසක්ම අපට තියෙන දිනේ දෙන්න බෑ කිවුවා.ඊටපස්සේ ඇවිල්ලා ඊට කලින් දවසේ රාත්‍රියේ වැස්සත් පහුවදා උදේ යන්න කෙනෙක් නැති හන්දා කෙනෙක් ගේන්න බැ කිවුව හින්දා මං සෙනසුරාදා දවසක ගියේ.ඉතින් මං කියන්නේ එතුමාටත් ඒ අවස්ථාව ලබා දෙන්න.එතුමා යන වෙලාවට මම ඕන්නම් මමත් උදව් කරන්නම්.ආයේ මම බල්බ් දාද්දි ඔබතුමාට කතා කරන්නම්.අපේ වසමේ වෙන සංවර්ධන යෝජනාවලට එන්න.මං කිසිම වෙලාවක එන්න එපා කියලා නෑ.වසමේ සංවර්ධන වැඩවලට ඔබතුමාට එන්න පුලුවන්.වසම් දෙකේම.ඉතින් මං හිතන්නේ අපි ව්‍යාපෘතිය අත්සන් කරපු සමිතියෙත් එතුමා ඉන්නවා සභාපති වහයෙන්.එහෙම කිසිම ගැටලුවක් නෑ.මටත් එහෙම ප්‍රශ්නයක් නෑ.මොකද දෙන්නටම ඕනේ ගමට වැඩක් වෙන්න.ඉතින් ඒ මතේ මං ඉන්නවා.අපි දේශපාලනය කරයි.දේශපාලනය මෙතන කරලා ඉවර වෙලා අපි දේශපාලනයෙන් සමුගනියි.නමුත් අපි ගමේ එකට ඉන්න ඕනේ.ඉතින් ප්‍රතිපත්තියේ තමයි මම ඉන්නේ.විශේෂයෙන්ම අපේ පක්ෂෙ ප්‍රතිපත්තිය රැක ගනිමින් ජනතාවට සේවය කිරීම තමයි මගේ අරමුණ.ඒකෙදි යම්කිසි කෙනෙකුට හිත් රිදීමක් වුණා නම් සමාවෙන්න.නමුත් අපි ඉතින් ඉදිරියට වැඩ කරගෙන යනවා ඉදිරියට.විවේචනවලටත් මුහුණ දෙන්නත් සුදානම්.බොහොමත්ම ස්තුතියි.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ ස්තුතියක් පුද කරන්න ඕනේ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට සහ සභාපතිතුමාට.මීටිපොල කොට්ඨාශයේ.......මාර්ගයේ වැඩකටයුතු අවසන් කරලා තියෙනවා.ඒක දැන් ජනතා අයිතියට පත්වෙලා තියෙනවා.ඒවගේම කිරිපෝරුව වසම තුළ නිවාස ව්‍යාපාති යටතේ අපේ ප්‍රාදේශීය සභාවේ සභාපතිකුමා යටතේ නිම කෙරුණා.ඒවගේම දියවෙල්ල මාර්ගය වෙනුවෙන් අපට ප්‍රාදේශීය සභාවෙන් ද්‍රව්‍යමය ආධාර ලබා දුන්නා.ඒවගේම ඒ පිළිබඳව ග්‍රාමීය ජනතාවගේ සතුටක් තියෙනවා ඉතා කෙටි කාලයක් තුළ වැඩ කොටසක් නිමකරලා දුන් එක ගැන.ඒවගේම මම ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමන්ට හා ප්‍රාදේශිය සභාවේ අධීක්ෂණ නිලධාරීතුමන්ට ස්තුතිවන්ත වෙනවා.ඒවගේම මට තව පොඩි දෙයක් කියන්න ඕනේ.කිරිපෝරුව රොහල ගැනත් ප්‍රශ්නයක්.ඇත්තටම මේ අපේ මන්ත්‍රිතුමිය සභාවට ඉදිරිපත් කළා.ඇත්තටම ග්‍රාමීය රෝහල් කමිටුවක් තියෙනවා.මමත් ග්‍රාමීය රෝහල් කමිටුවේ ඉන්නවා.හැබැයි මමත් මන්ත්‍රිවරික් වෙන්න කලින් තමයි ග්‍රාමීය රෝහල් කමිටුවට ගියේ.ඒ හින්ද මං එතුමියටත් කියනවා.එතන කාටවත් පක්ෂ විපක්ෂ කියලා නෑ.ඒකට පොදුවේ හැමෝටම යන්න පුළුවන්.ඇත්තටම් ඒ තුමිටයට වගේම ඒ වෙච්ච අසාධාරණය හරි අතපසු විම හරි ඉදිරියට නොවෙන්න. දැන් එයාට වෙච්ච දේ මට වෙන්න පුළුවන්.තව අපේ ගමේ අහිංසක කෙනෙකුට වෙන්න පුළුවන්.අපි ඒක ඉදිරියේදී රෝහල් කමිටුවේදී දැනුවත් කරන්නම්.ඔය සිද්ධිය වෙච්ච මාසය තුළදී රොහල් කමිටුව ඇත්තටම රැස් වුණේ නෑ.ඉතින් ඒක නිසා ඉදිරියට ප්‍රියන්ත මන්ත්‍රිතුමාටත් ඒ වගේම ක්‍රිෂ්ණා මන්ත්‍රිතුමියටත් ග්‍රාමීය රෝහල් කමිටුවට සහභාගී වෙලා එහිදී ප්‍රශ්න හා මොනව හරි ගැටලු තියෙන දේවල් සාකච්චා කරන්න.ඒවා අපි හැමෝටම පොදු කාරණා.මගේ වචන ස්වල්පය අවසන් වෙනවා.ස්තුතියි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරණා කිහිපයක් කතා කරන්න තියෙනවා.ඉතින් පොඩි වෙලාවක් යයි.අපේ ගරු රණවීර මන්ත්‍රිතුමාගේ කතාවෙන්ම පටන් ගන්නම්.අපිරිසිදු වතුර භාජනයකට පිරිසිදු වතුර වක්කරාහම ටික කාලයක් යනවා ඒ භාජනය පිරිසිදු කරන්න.හරියටම හරි.එතකොට ඒ අපිරිසිදු භාජනය කියලා ඔබතුමා ඒ අදහස් කළේ අපේ තිබුණ දේශපාලන සංස්කෘතිය වෙන්න ඇති කියලා මම හිතනවා.ඒක නිවරදි කිරීම සම්බන්ධයෙන් ගනු ලබන(පැහැදිලි නෑ)ස්තුතිය පුද කරනවා.එතකොට ඒ වගේම ඔබතුමා සඳහන් කරා අපේ මේ ගැටලුව වෙලා තියෙන්නේ මේ විදි ලාම්පු දැමීමේදී අහවලා කරා අහවල් මන්ත්‍රිතුමාගේ යෝජනාවක් අනුව වෙච්ච දේ ආරිදාස මන්ත්‍රිතුමා දැම්මා ගයේෂාන් දැම්මා, සමීර දැම්මා ඔය නමින් දැම්මා කියන කතාවනේ.ඉතින් ඒ අපිරිසිදු වතුර භාජනයට ඇයි තවත් අපිරිසිදු වතුර එක්

කරන්නේ.ඔබතුමාලටත් පුලුවන් එහෙම නැතුව මේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ට 36 දෙනාම එකතු කරගෙන 36 දෙනාම සම්බන්ධ කරගෙන ඒ වැඩසටහන් කරන්න.ඒක චෝදනාවක් නෙමෙයි,පොඩි යෝජනාවක් විතරයි.ඉතින් ගරු සභාපතිතුමනි මං මීට කලිනුත් මේ යෝජනාව කළා,ප්‍රාදේශිය සභා මුදල්වලින් සංවර්ධන යෝජනා ඉටු කිරීමේදී සියලුම මන්ත්‍රීවරුන්ට යම්කිසි නිශ්චිත මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න කියලා.එතකොට ගිය කලින් හිටපු ලේකම්තුමා හිටියේ.මම නැවතත් අද යොජනා කරනවා සියලුම මන්ත්‍රීවරුන්ට යම්කිසි මුදලක්,නිශ්චිත මුදලක් දෙන්න.ලක්ෂෙද ලක්ෂ දහයද ලක්ෂ පනහද කියන එක නෙමේයි.නිශ්චිත මුදලක්.එතකොට අපි දන්නවා ඒ මුදල අපිට වාර්ෂිකව දෙන්න.රුපියල් ලක්ෂය,මට නම් රුපියල් ලක්ෂයකුත් ඇති.මං දන්වා රුපියල් ලක්ෂයෙන් මේ ඇහැලියගොඩ ආසනයට ඇහැලියගොඩ ආසන බල ප්‍රදේශයට ම ඇති වෙන යම් කිසි වැඩක් කර ගන්න.මගෙ ක්‍රෙඩිට් එක හදා ගන්න මම දන්නවා.අපි මේ දේශපාලනයනේ කරන්නේ ඇත්ත කතාව.ඒකකම අපි බලා පොරොත්තුවෙනවා අපි කළා කියලා දෙයක් දැන ගන්න.ඒක ආයෙ හංගන්න දෙයක් නෑ.එතකොට මම ඉල්ලනවා නැවතත් මට රුපියල් ලක්ෂයක් දෙන්න ඒ ඇති.ඒ ලක්ෂයෙන් මම වැඩේ කර ගන්නම්.ලක්ෂයෙන් කරන්න පුළුවන් වැඩ තියෙනවා ඕන තරම්.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවට දැනෙන්න.සියලුම දෙනාට.එතකොට කිසිකෙනෙක්ට අසාධාරණයක් වෙන් නෑ.දැන් මං උදාහරණයක් විදිහට කියන්නම්,ඔබතුමිය නේද කිවුවේ.මගේ ගමට ලක්ෂ 10 ක ඇළ වේලි සුද්ද කරන්න ලැබුණා.ලක්ෂ 10 ක් හම්බුණා පාරවල් හදන්න.හැබැයි ඒවා හම්බෙච්ච නැති කොට්ඨාශයන් ඉන්නවා.මොකුද එතුමා ගෙනා අත්‍යවශ්‍ය යෝජනාවට යන්නේ පක්ෂ දෙකයි නම්,එතුමාට ලැබෙන්නේ ලක්ෂ දෙකයි.හැබැයි යෝජනාවක් ගිහිල්ලා.කොට්ඨාශ 18 න් ඒ කොට්ඨාශෙටත් ගිහිල්ලා මේ කොට්ඨාශෙටත් ගිහිල්ලා.මේ කොට්ඨාශයට ලක්ෂ දෙකකුයි බල්බ් 15 කුයි ගිහිල්ලා තියෙනවා.හැබැයි අර අපේ කාවින්ද මන්ත්‍රිතුමාගේ කොට්ඨාශෙට ගිහින් තියෙන්නේ ලක්ෂ දෙකයි.මං මේ නම් කිවුවේ උදාහරණ වලට විතරයි ගත්තේ.හැබැයි ඒ ක්‍රමය අපිට වෙනස් කර ගන්න පුළුවන්.යම්කිසි නිශ්චිත මුදලක් දෙන්න.ඒක ඔබතුමන්ලා කොට්ඨාශවලට දාගන්න එක දාගෙන ඉතුරුවෙන එනකන් අපේ විපක්ෂවල ඉන්න මන්ත්‍රීවරුන්ට දෙන්නනකෝ.ලිස්ට් එකෙන් එන අයට.මොකද ඒගොල්ලෝ ලිස්ට් එකෙන් එන අයනේ.අපේ දිලීන් මන්ත්‍රිතුමා විතරයි කොට්ඨාශයක් ජයග්‍රහණය කරලා ඉන්නේ.එතකොට එතුමාට කොට්ඨාශයට හිමි අයිතිය තියෙනවා.අනිත් කොට්ඨාශවල මන්ත්‍රීවරු ගිහිල්ලා බල්බ් එක දානව නම් දිලීන් මන්ත්‍රිතුමාටත් ඒ අයිතිය තියෙනවා.ඒක අපිට වලක්වන්න බෑ.එයා ඒ කොට්ඨාශය දිනුව.එතකොට ඒ කාරණය පිළිබඳව වීදි ලාම්පු ලබා දීමේදී මං දැක්ක කලින් සභාවේ කොළ කැල්ලක් ගහලා තිබ්බා විදි ලාම්පු අවශ්‍යා නම් දෙන්න කියලා.මම ඉල්ලුවේ නෑ.මොකද සභාපතිතුමාට පුළුවන්,හරි විපක්ෂෙ සියලු මන්ත්‍රීවරුන්ට බල්බ් 5 ක් දෙනවා, අවුරුද්දකට.ඒක හරි පැහැදිලිව ඉවර කරගන්න පුළුවන් ලේසියි.බල්බ් 10 ක් දෙනවා.මේ ආණ්ඩු පක්ෂෙද විපක්ෂෙද වම්අත පැත්ත,දකුණු අත පැත්ත කතා කරලා බොරු කතා කියන්න ඕන් නැනේ.ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂෙ,අපි විපක්ෂෙ.ඒක අපි කෙලින් කතා කරන්න පුළුවන් වෙන්න ඕන.අපි මේ සභාපතිතුමාගේ වම්අත පැත්ත කියලා නිකන් බොරුවට හුරතල් වෙන්න දෙයක් නෑ.මේ ඔක්කොම දන්නව එළියට බැස්සහම, අපේ දේශපාලනය මොකද්ද කියලා.අපි කොහොමද දේශපානය කරන්නේ මොකද්ද අපේ මතවාදය .අපි එදා ඉදන් කරපු දේශපාලනය මොකද්ද කියලා පාරට බැස්සහම දන්නවා, මිනිස්සු.ආයෙ මේක හංගන්න දෙයක් නෑ.පනතේ නෑ. මං පිළි ගන්නවා.පනතෙ එහෙම එකක් කරලා නෑ.හැබැයි අපි අසුන් පනවලා තියෙන්නේ පනතට පිටින්නේ.පනතට අනුව අසුන් පනවලා නෑ.පනතට අනුව අසුන් පැනෙවුවනම් සභාපතිතුමා, උපසභාපතිතුමා, සුජීව මන්ත්‍රිතුමා, දිලීන් මන්ත්‍රිතුමා.ඊට්පස්සේ තමා ඔබතුමන්ලගේ මන්ත්‍රීවරු වාඩිවෙන්න ඕනේ.පනනතට අනුව වාඩිවෙන් ඕනේ.ආයෙ ඉතින් ඇඟිලි වහල කන්න දෙයක් නෑ.කවුරු හරි කෙනෙක් හැංගි හොරා ගහනව නම් ඒ ගේමක්.කෙනෙක්ට කෙළින් කතා කරලා කියන්න බැරි නම් මම ඉන්නේ විපක්ෂෙ කියලා ඒක ගේමක්.මං දන්නෙ නෑ.ආණ්ඩු පක්ෂෙ ඉන්නවා කියලා කතා කරන්න බැරිනම් එක මොකක් හරි ගේමක් තියෙන්නේ.කොළේ වහල ගහන්න දෙයක් නෑ.කෙළින් අපි කතා කරමු.නැවතත් මං ඉල්ලන්නේ සියලුම මන්ත්‍රීවරුන්ට විදි ලාම්පු ඔබතුමා දැන් 15 ගානේ දිල තියෙනවා කිවුවා,වරිපනම් සීමාව තුළ.අනිත් මන්ත්‍රීවරුන්ටත් යම්කිසි ප්‍රමාණයක් දෙන්න.මට නම් එක බල්බ් එකක් දෙන්න ඒ ඇති.අන්න ඒ බල්බ් එක මම දන්නවා එක මට හිමියි කියලා.මට මේ අවුරුද්ද තුළ ප්‍රාදේශිය සභාවෙ ප්‍රතිපාදන වලින් බල්බ් 5 ක් දාන්න පුළුවන් කියලා මම දන්නවා.ආයෙ සභාපතිතුමාට කතා කරලා,අනේ සභාපතිතුමා මට එකක් දෙන්න,මේ අපේ විපක්ෂෙ නම් කියවුණා නේ,උපසභාපතිතුමාගේ කටින්.ගත්ත කියලා.ඒ දිව ඕන් නැනේ.මේ ප්‍රදේශයේ මුදල් තියෙන්නේ.මේ සියලුම ප්‍රදේශයේ මුදල් මේ සියලුම ජනතාවගේ මුදල්.එතකොට ඒ වැඩි කොටස ආණ්ඩු පක්ෂෙට දෙන්න.ඔබතුමාලා දේශපානය කරන්න ඕනේඒකෙ .කිසිම විරෝධයක් නෑ.අපිටත් යම්කිසි මුදලක් දෙන්න සාධාරණ මුදලක් දෙන්න.බල්බ් 5 ක් හරි 10 ක් හරි දෙන්න.සංවර්ධන යෝජනාවලටත් ලක්ෂයක් හරි ලක්ෂ 5ක් හරි ලක්ෂ 10ක් 15 ක් දෙනව නම් බොහොම සන්තොසයි.ඊළඟ දවසෙ ඔබතුමා වර්ණනා කරලා කතාවකුත් කරන්නම්.ඒන හොඳයි.එහෙම කරන්න කියලා ඉල්ලනවා.

ඊට පස්සේ අපේ ප්‍රාදේශිය සංවර්ධන කමිටුව ගැන අපි,ඒකට අපිට ආරාධනා ලැබෙන් නෑ කියලා,ඊට කලින් තිබ්ච්ච සංවර්ධන කමිටුවට අපි අදහස් ප්‍රකාශ කළා එතකොට,මට මතක නෑ.මට මතක විදිහට නදුන් මන්ත්‍රිතුමා වෙන්න ඕනේ,සියලුම දෙනාට පුටු දාල තිබුණා අපේ කවුරුත් ආවේ නෑ කියලා.මම ඒකට උත්තරේ දුන්නා.පුටුදාල තිබුණට එන්න බෑ.මොකද ආරාධනාවක් තියෙන්න ඕනේ.මගුල් ගෙදරක ආරාධනා නැතුව ගියොත් එළියට දානවා.රැස්වීමකත් මේ රැස්වීමටත් ආරාධනා නොකළ අයට එන්න බෑ.එළියට දානවා.නොදානවා කියලා හිතාන ඉන්න බෑ.ඉතින් ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවේ අපිට අදාළව 2025-09 -01 ස්වදේශ කටයුතු චක්‍රලේක 3/2025 දාල තියෙනවා ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවට සංයුතිය.මේ සංයුතිය අනුව,ප්‍රධාන ටික මං කියවන්නෑ.3.1.5 ඒකෙ තියෙනවා” නගරාධිපති හෝ සභාපතිධුරය හිමි කණ්ඩාමට අයත් නොවන සභාව නියොජනය කරන නියෝජිතයින් දෙදෙනෙකු ඔවුන්ගේ එකඟතාවය පරිදි.” එතකොට මම මේක සම්බන්ධයෙන් සභාපතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා,චක්‍රලේඛයක් වෙනස් කරන්න බෑ.එතකොට ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවට සහභාගිවෙන්න වෙන්නේ අපේ විපක්ෂෙ ඉන්න 18 දෙනා, 17 දෙනාගෙන් දෙදෙනයි.එතකොට මෙතන පක්ෂම තියෙනවා 8ක්. මේක අලුත් චක්‍රලේකයක්.වාද කරලා වැඩක් නෑ.ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ආපු

වක්‍රෙල්බය.එතකොට මෙතන විපක්ෂයේ කණ්ඩායම් 8 ක් ඉන්නවා.මේක ඉතින් ඉවර කරගන්න වෙන්නේ වෙන විදිහකට.කවුද යන් දෙන්නා කියලා.ඉතින් මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා සභාපතිතුමාගෙන්,සංවර්ධන කමිටු සභාපතිතුමාට අපේ අමාත්‍ය සුනිල් සෙනවි අමාත්‍යතුමාට කතා කරලා සභාපතිතුමාට ආරාධනා කරන්න පුළුවන් ඕනම අයෙක්ට සම්බන්ධ වෙන්න ප්‍රාදේශිය සංවර්ධන කමිටුවට.එතකොට ඒ අයට අපිටත් අවස්ථාවක් ලබා දෙන්න කියලා මං ඉල්ලනවා මොකද එතෙන්දි ප්‍රදේශයේ සියලුම නිලධාරී මහත්වරුන් එනවා.ඒ අයත් එක්ක අපිට අපේ ප්‍රදේශයේ තියෙන සංවර්ධන ගැටලුවක් ඍජුව කතා කිරීමේ අවශ්‍යතාව හදා ගන්න පුළුවන්.එතකොට අපිට පෞද්ගලිකව මටත් ගැටලුවක් තිබුණා ඇයි ප්‍රාදේශිය සංවර්ධන කමිටුව පවත්තන් නැත්තෙ මාසිකව කියලා.මේකෙ තියෙනවා කාර්තුවකට එකක් පවත්වන්න කියලා.ඉතින් ඒ හින්දා මාස තුනකට සැරයක් තමා පවත්වන්නේ.එතකොට එකෙ ගැටලුවක් නෑ.මෙකෙ දි කරන විශේෂ ඉල්ලීම තමා ගරු අමාත්‍යාතුමා සම්බන්ධිකරණ කමිටු සභාපතිතුමාට කතා කරලා විපක්ෂෙ කණ්ඩායමටත් එකට අවස්ථාව ලබා දෙන්න, දෙන්නෙක් ගිහිල්ලා කරන්න හරි අමාරුයි මේක.

ඊට පස්සේ ග්‍රාමීය සංවර්ධන කමිටු සම්බන්ධව පොඩි ගැටලුවක් තියෙනවා.එතකොට ඒකෙ ලැබිලා තියෙන උපදෙස් අනුව සාමාජිකයන් වෙන්නේ,ග්‍රාමීය සංවර්ධන කමිටුවක සාමාජිකයන් ග්‍රාමනිලධාරීන් තමා කැඳවුම් කරු වෙන්නේ.ආර්ථික සංවර්ධන නිලධාරී,සමෘර්ධි සංවර්ධන නිලධාරී,කෘෂිකර්ම නිලධාරී,පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී,පී.එච්.අයි.,කොට්ඨාසෙ නියොජනය කරන මන්ත්‍රිවරු ප්‍රභූන් ඇතුළු සියලු දෙනාතමා ප්‍රධාන.එතකොට මෙතන ඉන්නවා අපේ විපක්ෂේ ඉන්නවා මන්ත්‍රිවරු කණ්ඩායමකටත් ආරාධනා ලැබිලා තිබුණා සංවර්ධන කමිටුවලට.මගෙ පැත්තෙන් මම උදාහරන කියන්නම්.මම පදිංචි කොට්ඨාශය යකුදාගොඩ තමයි පදිංචිවෙලා ඉන්නේ.නමුත් මං දේශපාලන වශයෙන් සම්බන්ධ වෙලා තියෙන්නේ පලීගල,පහලගම ඒ ප්‍රදේශයේ.පලීගලත්, මං 2020 තමා යකුදාගොඩට මගෙ පදිංචිය වෙනස් කරන්නේ.එතකන් අවුරුදු 30 ක් ජීවත් වුණේ පලීගල.එතකොට මේ කොට්ඨාශ දෙකෙන් එකකින්වත් මට කැඳවීමක් ලැබුණේ නෑ.මං ඒකෙන් තව දෙයක් පිළි ගන්නවා මම සහ අපේ සරෝජනී මන්ත්‍රිතුමිය විතරයි කොට්ඨාශවලට තරහ කරපු නැති කෙනෙක් ඉන්නේ. අනිත් සියලුම දෙනා, සමාවෙන්න අපේ මාලින්ද මන්ත්‍රිතුමා ඉන්නවා,අපි තුන් හතර දෙනයි ඉන්නේ අපි කොට්ඨාශවලට තරහ කරපු නැති කෙනෙක්ට ඉන්නේ.එතකොට අපි කොට්ඨාශෙකට තරහ කළා නම් අපි අනිවාර්යෙන්ම දන්නවා මම අයිති මේ කොට්ඨාශෙට කියලා.මේ ලයිස්තුවෙන් ඇවිල්ලා ඉන්න මන්ත්‍රිවරුන්ටත් ඒ අවස්ථාව නියෝජනයක් දෙන්න ඕනේ.එතකොට මොකද නැත්නම්,මම උදාහරණයක් විදිහට මාව ගන්නේ,පලීගලින් හිතනව ඇති යකදාගොඩ කියලා, යකදාගොඩ හිතනවා ඇති පලීගල කියලා.ඒක නිලධාරී මහත්වරුන්ගේ වැරුද්දක් නෙමේ,මේක අපේ සන්නිවේදනයේ ගැටලුවක්.එතකොට ඒ කාරණය ගේන්න හේතුව තමා ග්‍රාමීය කමිටුවේ,දැන් දිලීන් මන්ත්‍රිතුමා මතු කළා,දිලීන් මන්ත්‍රිතුමාගේ කමිටුවේ දිලීන් මන්ත්‍රිතුමාට ආරාධනා ලැබුණේ නෑ,උපසභාපතිතුමා තමා කරන්නේ කිවුවා.මං නිවරදි ද?

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ග්‍රාමීය කමිටුවේද? මං නිවරදි කරන්නම් ඒක, අපේ දිලීන් මන්ත්‍රිතුමත් එනවා.(ඝෝෂාව)

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
2018 නම් මන්ත්‍රිවරයා තමා සභාපතිවරයා විදිහට හිටියේ.එතකොට ඒ සියලුම නිලධාරීන් කැඳවන්න කියලා මං ඉල්ලනවා.එතකොට අපේ ගයානි මන්ත්‍රිතුමිය කිවුවා බෝපැත්ත ග්‍රාමීය කමිටුවේදී,අපේ චන්ද්‍රදාස මන්ත්‍රිතුමා ගෙනාපු යොජනාවත්,අපේ වත්සලා මන්ත්‍රිතුමිය ගෙනාපු යෝජනාවත් කැපුවේ නෑ කියලා.එහෙම කපන්න බෑ.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
අපි සංවාදවලට යන් නැතුව වැඩේ කරන් යමු.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
මේ සියලුම මන්ත්‍රිවරුන්ට යෝජනා ඉදිරිපත් කිරීමේ අයිතියක් තියෙනවා.ඒ අයිතිය අපි පිළිගන්න ඕන.ඒ ග්‍රාමීය කමිටුවට ගමේ ඉන්න අහිංසකම මනුස්සයා ආවත් ඒ මනුස්සයාගේ ඉල්ලීමක් තියෙනවා නම් ඒකටත් අපිට ඇහුන්කන් දෙන්න වෙනවා.එතකොට ගිය සැරෙත් සමහර අය වැරදි වචන කියලා හැප්පුණා.හැප්පිලා සවුත්තු වුණා.එහෙම කරන්න එපා කියලා අපි කියන්නේ.සංවාද වැඩක් නැනේ. කිවු දේ තමා කිවුවේ.එතකොට කිසිම අවස්ථාවක ග්‍රාමීය කමිටුවකට එන යෝජනාවක් කිසිම කෙනෙක්ට නවත්තන්න බෑ.හැබැයි ප්‍රමුඛතාගත කරන්න පුළුවන්.මුලින්ම හදන්න ඕන පාර මොකක්ද කියලා ඒකෙදි තමන් දැන ගන්න ඕනේ ,තමන්ට ඕනෙ යෝජනාව උඩට දාගන්නත් අනිත් යොජනා අයින් කර ගන්න ක්‍රමෙත් තමන් දැන ගන්න ඕනේ,ප්‍රමුඛතාව අනුව.ඒක අපිට උගන්නන්න එන්න බෑ.ඒකත් මං මතක් කරනවා.මොකද එහෙම කතාබහ මේ, කමිටුවේ ගේන යෝජනා තමන්ගේ පාරවල් දා ගන්න නෙමේ ගමේ පාරවල්.තමන් ජීවත් වෙලා ඉන්න පාර ගමේ පාරක් වුණාට කරන්න දෙයක් නෑ.එහෙනම් ඉතින් අපිට දෙන්න ඕන වෙන කොට්ඨාශයක්. මට දෙන්න ඕනේ අස්ගගුල වගේ.පලීගල කොට්ඨාශෙ නෙමේනේ.මුන්සීර් මන්ත්‍රිතුමත් එක්ක රණ්ඩු වෙවී කරන්න කියලා.එහෙම කරන්න බැනේ.තමන්ගෙ ගමේ පාර තමා පදිංචි පාර.ඒකට ඉතින් කරන්න දෙයක් නෑ.එතකොට

ඊළඟ එක තමා අපි කතා වුණා මානව හිමිකම් එකේ විජිත හේරත් ඇමතිතුමා ගිහිල්ලා කතා වෙච්ච දේට මගෙ පොඩි එකතු කිරීමක් කරන්න වෙනවා.අපි 2009 යුද්දෙ ජයග්‍රහණය කළාට පස්සේ අපි ගිහිල්ලා අපිට සහයෝගය වශයෙන් යෝජනාවක් එනවා ශ්‍රිලංකාව ඉන්දියාව ,චින,රුසියාව,පකිස්තාන ,කියුබාව.මේ එටවල් 5 එකතුවෙලා අපිට වාසි දායක යෝජනාවක් කරනවා, මේ යෝජනාව තමා ශ්‍රි ලංකාවට එරෙහිව තියෙන අන්තර්ජාතික විමර්ෂනයක් පවත්වන්න ගෙනාපු යෝජනාවකට විරුද්ධව,ඉන්දියාව තමා මේකෙ මුලික වෙන්නේ. ඉන්දියාව ,චිනය,රුසියාව,පකිස්තානය හා කියුබාව එකතු වෙලා යෝජනාව ගේනවා ඒ යොජනාව,අපි ජයග්‍රහණය කරනවා.ඊට පස්සේ මෙවර වෙන දේ තමා

2025 සැප්තැම්බර්-/L 1 කියන එක.අපි විජිත හේරත් මන්ත්‍රීතුමාගේ කතාව කියන්නේ ඒ යොජනාවට.එකෙදි අපි මෙච්චර කාලයක් අපිට,අපි ඡන්ද දිනුවෙ නෑ.හැබැයි අපි විරුද්ධ වුණා.මෙවර අපේ තියෙන්නේ.....Without a voteඡන්දයක් රහිතව අපි එකඟ වුණා.අපි මේ යෝජනා,අපි මේ අදහසක් ගෙන්න දක්වන්නේ,UN එකේදි අපි දන්නවා,ඡන්දෙ දිනන්න බෑ.විනෙ හරි රුසියාව හරි අපේ පැත්තට හිට ගත්තේ නැත්තන් දිනන්න බෑ.ඒකඇත්ත.හැබැයි මෙච්චර කාලයක් අපි කළේ හැමදාමත් ෆයිට් කරනවා.විශාල මුදලකුත් වියදම් වෙනවා. ඒකත් ඇත්ත.හැබැයි මෙවර අපි ඡන්දයක් නැතුව විරෝධය ප්‍රකාශ නොකර එකඟ වුණා කියන එක තමා මේ අපේ අදහස වුණේ.අදහස් දක්වන්න අපිට උවමනාව තිබ්බෙ.

එතකොට ඊට පස්සේ තව විශේෂ යමක් තියෙනවා ප්‍රකාශ කරන්න.කමිටු වාර්තා වලදී ඒ කමිටු වාර්තා ටික එක පෙළට ගන්නේ නැතුව,එකින් එක ගන්න කියලා මං ඉල්ලීමක් කළා.ඒ ඉල්ලීම කරනකොට ඒක විශේෂයෙන්ම වැදගත් වෙනවා අපේ සියලුම මන්ත්‍රීවරුන්ට.මොකද ඒ මුදල් කමිටු වාර්තා ඔයාල බලන්න,හම්බුණාට පස්සේ.ඒකෙ තියෙනවා කාටද කොයි කොට්ඨාශයටද වැඩ කරලා සල්ලි හම්බෙලා තියෙන්නේ කියලා.එකෙන් පොඩි අදහසක් ගන්න පුළුවන්.අපේ විපක්ෂෙ මන්ත්‍රීවරු ඒක කියවන්න.ඒකෙ තියෙනවා අහවල් කොට්ඨාශයට,පලීගල කොට්ඨාශයට කොච්චර හම්බෙලා තියෙනවද?හිඳුරංගලට කොච්චරද?අරයට කොච්චරද?මෙහෙට කොච්චරද කියලා, ඔක්කොම ටික නෙමෙයි, දළ අදහසක් ගන්න පුළුවන්.මේ යෝජනාව සභාවට දාල අනුමත වුණාට පස්සේ අපිට ඇස්තමේන්තු හදන කොට අපිට දැනුවත් වෙන් නෑ.වැඩ පටන් ගන්නකොට දැනුවත් වෙන් නෑ.හැබැයි අපිට දැනුවත් වෙන්නේ වැඩ අවසන් කරන කොටත් නෙමේ,මුදල් ගෙවන කොට.මුදල් කමිටු වාර්තාව කියවන්න.ඒකෙ අදහස ගන්න පුළුවන්.එතකොට නැත්තන් අපි අපරාදෙ,මේ මුදල් කමිටු වාර්තා අපිට ප්‍රින්ට් කරලා දෙන එක.ඒව අපි දන්නෑ නැත්තම්.මොකද මම උපසභාපති හම්බෙලත් එදා මම කිවුවා කමිටු වාර්තාවල තුනක් අඩුයි කියලා.ඒනිසා මං විශේෂ ඉල්ලීමක් කරනවා ඒ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරලා මේ වාර්තාව,මේ හම්බෙන ඒවා කියවන්න,එකෙන් දළ අදහසක් ගන්න පුළුවන්,මොකද වෙන්නේ කියලා.ඊට පස්සෙ මාසිකව දෙනවා ආදායම් වියදම් වාර්තාව,ගෙවීම් වාර්තාව .මේකෙ තියෙනවා .සභාවට කොච්චර සල්ලි හම්බෙලාද?සභාවෙන් කොච්චර සල්ලි ගිහිල්ලා තියෙනවද?ඒවා සභාවේ තියෙන ආර්ථික තත්ත්වෙත් එක්ක ,උපසභාපතිතුමා ඇවිල්ලා මෙතන කියනවා සල්ලි නෑ කියලා.එතකොට අපිට ඇත්තටම දැන ගන්න පුළුවන් සල්ලි තියෙනවද නැද්ද කියලා.ඒක අපි ගාව තියෙනවා.ඒ නිසා මං ඉල්ලීමක් කරනවා.

ඒ වගේම මේ මගේ අවසන් කාරණය මට ගිය සතියේ දවස් තුනකට කළින් ලිවුමක් ලැබෙනවා, ප්‍රාදේශිය සභා මන්ත්‍රි ගයාෂාන් මයා, නො 10, නාගහවත්ත, පලීගල, ඇහැලියගොඩ.කියලා.ඒ ලිපිය ලැබෙන්නේ සභාපති ප්‍රාදේශිය සභාව ඇහැලියගොඩ.මේ ලිපියේ තියෙන්නේ ගංවතුරින් විනාශ වූ ලේඛන හා පොත් පත් අපහරණය කිරීමේ කමිටුව.මේ ලිවුම අත්සන් කරන්නේ අපේ ප්‍රාදේශිය සභාවේ ලේකම්තුමා මනෝජ් තිවංක මහත්මයා.එතකොට මේ ලිවුම හම්බෙලා තියෙනවා.ප්‍රාදේශිය සභා මන්ත්‍රි වසන්ත, එච්.ආරියදාස, අජන්ත, අනුෂා රෝහිණී, සාරංගා.එච්.ආර්.ජී.සාරංගා නිලධාරීතුමිය. මේ ලිපිය පෙන්නන්න ප්‍රධානම හේතුව වුණේ, මන්ත්‍රීවරුන්ගේ නම් ලියලා තියෙන විදිහ.ප්‍රාදේශිය සභා මන්ත්‍රි වසන්ත, ප්‍රාදේශිය සභා මන්ත්‍රි එච්.ආරියදාස, ඔබතුමාගෙ නම් මුල අකුර හරි තියෙනවා.ප්‍රාදේශිය සභා මන්ත්‍රි අජන්ත, ප්‍රාදේශිය සභා මන්ත්‍රි ගයාෂාන්.සාමනායයෙන් අපි නමක් ලියන කොට ලියන්නේ,නමයි වාසගමයි, හරි නමේ කෑලි දෙකක් හරි.දැන් මෙතන වසන්ත කියලා මන්ත්‍රිවරු දෙන්නෙක් හිටියොත්,අපි කොහොමද දන්නේ මේ මොන වසන්ත ද කියලා.ඒ.අයි.වසන්ත ද, බී.වයි. වසන්ත ද සී.අයි.වසන්ත ද අපි දන්නෑ.එතකොට එච්.ආරියදාස කියලා තියෙනවා.එතුමාට වෙලාවට මුල අකුර දාල තියෙනවා.නැත්තන් ඒ දන්නෙත් නෑ.මන්ත්‍රි අජන්ත, මේ ලේකම්තුමා අත්සන් කරලා එවපු ලිවුමක් තියෙන්නේ.මං මේ එතුමාට චෝදනා කරනව නෙමේ.Draf කරපු ලිවුමක්නේ අත්සන් කරන්නේ.දවසකට ලිවුම් 100 ක් 200 ක් අත්සන් කරනව ඇතිනේ.එතකොට මේ,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ලිවුමක්.මේක මේ ලොකු විශාල දෙයක් නෙමි,හැබැයි මේක ප්‍රශ්නයක්.මන්ත්‍රිවරයෙක්ගේ නම දන් නැත්තන් සභාව.සභාවෙ ඉන්න නිලධාරීන් සභාවේ ඉන්න මන්ත්‍රිවරුන්ගේ ලිස්ට් එක ගහ ගන්නකෝ,ප්‍රින්ට් අවුට් එකක් අරන් නම් ටික.අරගෙන දාන්න ඕනේ.මොකද නම දාල ආමන්ත්‍රණය කරන්න ඕනේ.නැත්තන් මේ වගේ තමයි ඉතුරු අඩුපාඩුත් වෙන්නේ.අපි ටෙන්ඩර් කමිටුවෙන් මොකක් හරි එකක් පාස් කරලා යවනවා.ටෙන්ඩර් වලට නම් දාන හැටි දන්නවනේ අපි.බිල් කරන හැටි.එකම එක්කෙනාගෙ බිල් 5 ක් තියෙනවා.අපි දාන්නේ ඒ. අයි. පෙරේරට, බී.අයි. පෙරේරට දීල දානවා.ප්‍රශ්නයක්නේ.කවුද වගකියන්නේ.ඒ සම්බන්ධවත් මං ඔබතුමන්ලගෙන් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
මන්ත්‍රිතුමා, ලිවුම ගහල තියෙන දිනේ කවද්ද?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ලිවුම ගහල තියෙන්නේ 09-18,

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
අංකයක් එහෙම තියෙනවද?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
තියෙනවා.ඇ.ප්‍රා.ස.4/3.ඊටපස්සේ මේකට කතා කරලා දිනයකුත් දා ගත්තා,16 එන්න පුළුවන්ද කිවුවා බෑ කිවුවා.ලබන සතියේ අඟහරුවාදා මේක බලන්න යන්නත් යෝජනා කර ගත්තා.එකට සක්‍රිය දායකත්වය දෙනවා, ඒක ගැටලුවක් නෑ.හැබැයි ලිවුමක් ගහනකොට ඒක හරියට ලිවුමක් ටයිප් කරන්න බැරිනම්, ඒක තේරුම් ගන්න වෙනවා.

ඊළඟට මගේ අවසන් කාරණය තමා මුදල් ඉපයීමේදී මම ඉස්සෙල්ලත් කිවුවා පොල භූමිය ගැන.ඒකට අපි නිසි වැඩ පිළිවෙළක් හදා ගමු.ඒකට ඕන්නම් කමිටුවක් දාගමු, මමත් එන්නම් සක්‍රිය දායකත්වය ලබා දෙන්න.අපි කණ්ඩායමක් එකතු වෙලා මේක ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.මෙක ආණ්ඩු පක්ෂෙ ද විපක්ෂෙ ද නෑ සභාව සභාව විදිහට කරන්න ඔනේ.සභාවට සල්ලි නැති වුණොත්,සභාව දුවන්න බෑ.අපේ සභාව මේ.අපි කුරුවිට ප්‍රාදේශීය සභාව ගත්තොත් , කරුවිට ප්‍රාදේශීය සභාව අපේ ප්‍රදෙශයේ තියෙන ලොකුම ප්‍රාදේශීය සභාව.සල්ලි හොඳම ආදායම තියෙනවා.අපිටත් ඒ තත්ත්වයට ගේන්න පුළුවන්.හැබැයි අපි ඒක මස් කඩේ විකුණලයි,මේ වරිපනම් ටික එකතු කරලයි, කරන්න බෑ.සාමාන්‍යයෙන් සමහර ප්‍රාදේශීය සභා තියෙනවා,මස් කඩේ වහනවා.ටෙන්ඩර් එක දෙන්නෙ නෑ.මං කියන් නෑ ඒ තත්ත්වෙට යන්න කියලා.මේවා ව්‍යාපාරනේ.එතකොට අපි ඊට වඩා හොඳ ආදායම් මාර්ග හොයා ගන්න ඕනේ.ඒකට මං ඔබතුමාට යෝජනා කරනවා,කමිටුවක් වගේ දා ගන්න,පුළුවන් තරම් ආදායම් උත්පාදනය කරන යෝජනා ගේන්න.

මොකද අනිත් එක,අමතක වෙච්ච දේ විශේෂම දේ ලබන සැරේ ඉදන් අපි හිතනවා උප සභාපතිතුමාගෙන් මං ඉල්ලා සිටිනවා අපිට යෝජනා 3 ට වඩා දාන්න පුළුවන් ඇති.ඔබතුමා යෝජනා 5 ක් දාල තියෙනවා.ඔබතුමා යෝජනා 7 ක් දාල තියෙනවා.ඔබතුමා උත්තරේ දෙනවා ඒක ආදායම් උත්පාදනය කියලා.ආදායම් උත්පාදනය යෝජනා 3 කියලා ගන්න පුළුවන්.හතරක් තියෙන්නේ,අනිත් යෝජනා.ඕක පොඩ්ඩක් කියවන්න.වියලගොඩ ක්‍රීඩාපිටිය අසලින් පෙර පාසල වෙත පිවිසෙන මාර්ගය

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒක සංවර්ධන යෝජනාවක්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඊට පස්සේ වියලගොඩ පුවක්ගහදෙනිය මාර්ගය, ඊ ළඟට නාකන්දල මාර්ගය, ඊට පස්සේ ධීවර සංස්ථාව, අපිට ආදායම් උත්පාදන කියලා දාගන්න පුළුවන්.විශෙෂ දෙයක් වෙන් නැනේ උපසභාපතිතුමා.තියෙන එකමනේ,ඒ කැට ගරියට දාන්න පුළුවන්.හැබැයි ඇත්ත වශයෙන් ම අපේ හෘදය සාක්ෂිය දන්නවනේ එක ආදායම් උත්පාදනය ද කියලා. ඊළඟට නාගරික සංවර්ධන අධිකාරියට අයත් මෝරගල ක්‍රීඩා පිටියේ පවත්වන සියලුම කටයුතු වලදී එක්රැස්වන කසළ බැහැර කිරීම සඳහා රු.15000.00ක ගාස්තුවක් අය කිරීම.හිතාගන්න පුළුවන්.ආදායම් උත්පාදනය කියන්නේ අපි අලුත් දෙයක් කරන්න ඕනෙ කියන එක.එතකොට ප්ලාස්ටික් (PEP) සහ ඇලුමිනියම් කෑන් එක්රැස් කරගැනීම සඳහා සෑම වසමකම යකඩ කුඩු ස්ථාපනය කිරීම. සභා ශ්‍රවනාගාරය නවීකරණය කිරීම.මේ යෝජනා ඔක්කොම හොඳයි.මේ සියලු මන්ත්‍රිවරු ගෙනැත් දෙන යෝජනා හොඳයි.හැබැයි අපි පොඩි සහයෝගයක් දෙන්න ඕන.ඔබතුමා විතරක් හය හතක් දාලා,ඔබතුමා ලබන මාසෙ මෙතනනේ.ඔබතුමා ඔය පුටුවට ගියාට පස්සේ පුළුවන් යෝජනා ඕන තරමක් දාන්න.අපි යන්න කියලත් සුභ පතනවා.ඉක්මනට යන්න ලැබේවා කියලත් ප්‍රාර්ථනා කරනවා.හැබැයි මෙතන ඉන්න කොට අපි සියලු දෙනාටම එක බෝට්ටුවේ නේ.ඔබතුමා උපසභාපතිතුමා.අනිත් සියලුම දෙනා 34 දෙනාම මන්ත්‍රිවරුනේ.අපි සියලු දෙනාටම,ඔබතුමාලගේ කට්ටියටත් අසාධාරණයක් කරනවනේ.ඒ අසාධාරණය කරන්න එපා.ඔබතුමා ප්‍රතිපත්තිත් එක්ක ඉන්න.සර්ව සාධාරණ සමාජයක් ගොඩනගන්න ඉතින්.ලබන සැරේ උදේ වරුවේ මේ ටික අල්ලගෙන කියන්නත් බෑනේ.ඒ හින්දා මං විශේෂයෙන් ඉල්ලනවා යෝජනා ලබා ගැනීමේදී අපිටත් අවස්ථාව ලබා දෙන්න. මම නම් මේ කියන මම සභාවට එක යෝජනාවක්වත් කරලා නෑ.ඉදිරිපත් කරලත් නෑ.ඉදිරිපත් කරන්න නැතිවෙන්න හේතුව තමා මුදල් ලැබෙනවද නැද්ද කියන එක අපි දන්නවා.අපිට මේ දේශපාලනය යන විදිහක් තියෙනවනේ.මේකට මගේ කිසිම විරෝධයක් නෑ.ඒකයි කියන්නේ හැම වෙලේම කියන්නේ,අපිත් ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරයෙක් විදිහට යම්කිසි නිශ්චිත මුදල් ප්‍රමාණයක් ලබා දෙන්න.ඒ මුදල් ප්‍රමාණය අනුව අපිට ඒ සභාවේ මුදල් වලින් වැඩ කටයුත්තක් කරන්න පුළුවන්.මම සියලු දෙනාටම ස්තුති වන්ත වෙනවා.බොහොම ස්තුතියි.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා:-**
අවසාන වශයෙන් පැහැදිලි කිරීමක් කරන්න ඕන ඇත්තටම අපි මන්ත්‍රිවරුන්ට බල්බ් වලට රණ්ඩුවෙන්න වෙන් නැතුව,හැම වසමකම තියෙන දාල තියෙන බල්බ් තියෙනවනේ,මොකෙන් හරි දාල තියෙන බල්බ් ටිකක් තියෙනවනේ. ඒ බල්බ්වල අලුත් වැඩියා කරන්න ඉස්සෙල්ලාම යන්නේ.ඒවට කොකු දාල ඊට පස්සේ.ඒවගෙත් ඔක්කොම දාන් නෑ.අලුතින් දාන්නෙත් නෑ,තියෙන ඒවට ඇටැච් කිරීමක් තමයි කරන්නේ.

ඊට පස්සේ තව කාරණයක් තියෙනවා ඇත්තටම පැල්පිටිය මෝරගල වසම් දෙකේ මම සම්බන්ධ වෙන්නේ කොට්ඨාශ මන්ත්‍රිවරයාට අමතරව.එතන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා යන වැඩ ටිකක් තියෙනවා.ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා යන වැඩවලට අපිට ආණ්ඩු පක්ෂෙ නියෝජනය කරන්න,එතන මහජන නියෝජිතයෙක් අවශ්‍ය නිසා තමයි මං එතනට සම්බන්ධ වෙන්නේ.එතනදී කිසිසේත් ම දිලින් කරුණාපාල මන්ත්‍රිතුමාව, කොට්ඨාශ මන්ත්‍රිවරයාව අතික්‍රමණය කිරීමක් නෙමෙයි,ඒ වගේම එතනදී පැල්පිටිය මෝරගල වසම් දෙකේම ග්‍රාමීය සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී එතුමා සම්බන්ධ වෙනවා.ඒ විතරක් නෙමේ අනිත් වසම්වලත් මං හිතන්නේ ග්‍රාමීය සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී සෙසු පක්ෂවල මන්ත්‍රිවරු සම්බන්ධ වෙනවා.හැම පක්ෂවලම මන්ත්‍රිවරු සම්බන්ධ වෙනවා.එතකොට ග්‍රාමීය සංවර්ධන සැලැස්ම,එතනදී ගත්තොත් එහෙම හිඳුරංගල සම්බන්ධ කර ගත්තොත් (ඝෝෂාව)ඒනිසා අපි ආණ්ඩුව විදියට අපි ජනාධිපතිවරණය ජයග්‍රහණය කළා.ඊට පස්සේ මහ මැතිවරණය ජයග්‍රහණය කළා.ප්‍රාදේශීය සභාවේදී අපිට කොට්ඨාශය පැරදුණා කියලා අපිට ඒ කොට්ඨාශය අත අරින්න බෑ.ඒ නිසා තමයි මං සම්බන්ධ වෙන්නේ ඒකට. දිලින් කරුණාපාල මන්ත්‍රිතුමාව, කොට්ඨාශ මන්ත්‍රිවරයාව අතික්‍රමණය කරන්නෙ නෑ. නමුත් අපට ආසනයක් හැටියට සංවර්ධන යෝජනාවලට ප්‍රතිපාදන ලැබෙනවා.අමාත්‍යාංශ ප්‍රතිපාදන එනවා,පළාත් සභාවෙන් ප්‍රතිපාදන

එනවා,ඊට අමතරව තමා අපි මේ ප්‍රාදේශිය සභාවෙන් ප්‍රතිපාදන වෙන් කරන්නේ.බලමු ප්‍රාදේශිය සභාවේ ඉදිරි අය වැයේදී මන්ත්‍රිවරුන්ට වෙන් වුණු ගාණක් දෙන්න අදහස් කරන් ඉන්නවා

අනිත් එක තමයි අමාත්‍යාංශ ප්‍රතිපාදන හා පළාත් සභා ප්‍රතිපාදන ඒවා ලොකු ප්‍රමණයක්,ඒවායෙන් කරන වැඩ ඒ කියන්නේ හැම කොට්ඨාශයකම කිසිම කොට්ඨාශයක් නෑ එහෙම වැඩ කෙරෙන් නෑ කියලා.අපි ප්‍රාදේශිය සභාව විදිහට මන්ත්‍රිවරයෙක් විදිහට,පැල්පිටිය කොට්ඨාශයෙත් ඒ වැඩ වෙනවා.ඒ නිසා මං කියන්නේ හැම වසමකම වැඩ වෙනවා.නිවාස හැදෙනවා,පාරවල් හැදෙනවා,ඊටපස්සේ ජල ව්‍යාපෘති,මින්නානෙ එහෙම ජල ව්‍යාපෘතිය,......ව්‍යාපෘතිය, පාරවල් විදිහට ගත්තොත්, කාපට් පාරවල් පහ.පහම වසම් පහකට දුන්නා.එකක් දීලා තියෙන්නේ දිලීන් කරුණාපාල මන්ත්‍රිතුමාගේ පැල්පිටිය කොට්ඨාශයට.අපි කිසිසේත්ම ජනතාව අතර බෙදීම කරන් නෑ.ජනතාව අපිට ඡන්දෙ දුන්නද? නැද්ද? (ඝෝෂාව) කොහොම හරි අපේ බලා පොරොත්තුව සභාවේ සියලු බල ප්‍රදේශ දියුණු කරන්න.ඇත්තෙන්ම ඇත බටහිර කලටුවාවටත් එක්කෝටි තිස් තුන් ලක්ෂයක පාරක් සංවර්ධනය වෙනවා.ඊට පස්සේ මිටිපොල සංවර්ධනය වෙනවා.ඊට පස්සේ බටහිර කරඳන.ඒ නිසා අපි දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ටිකක් කරනවා.පාරවල් හැමදාම වැඩ කර කරා ඉන්න බැනේ.පාරක් හැදුවහම අවුරුදු 20 ක් 30 ක් තියෙන්න ඕන.ඉතින් අපි හදපු පාරවල්වලත් ප්‍රමිතිය නැති එක සහ ඊට පස්සේ ඒ වගේ ප්‍රශ්න නිසා පාරවල් කැඩෙනවා.ඒනිසා අපි පාරවල් ඔක්කොම හදලා ඉවර කරනවා.ඊටපස්සේ ආයේ පාරවල් හදන්න වෙන්නෙත් නෑ.කිසිම ජනතාවක් අපි නොසලකා හරින් නෑ.නමුත් ප්‍රායෝගික ප්‍රශ්න එනවා බිමේ වැඩ කරද්දී.අර රණවීර සර් කිවුවා වගේ භාජනයේ තියෙන පොඩි පොඩි (පැහැදිලි නෑ,ඝෝෂාව) හින්දා.

අනිත් එක තමයි අපිට රීති ටිකක් පැනවිලා තියෙනවා.අපිට සභාවට එද්දී අපි රීති ටික හරියට පොඩ්ඩක් කියවමු.ඒකෙ තියෙනවා කතා කරන විදිහ,සභාවට එද්දි සැරසෙන්න ඕන විදිහ එහෙම තියෙනවා.හොඳට කියවන්න.ඇත්තටම මේකෙ ඇත්තටම අකුරු පොඩියි.අකුරු ටිකක් ලොකු එකක් තිබ්බ නම් හොඳයි.මට නම් කියවන්න පුළුවන්.විශේෂයෙන් ම සභා රැස්වීම ක්‍රමවත්ව පවත්වාගෙන යෑම,යෝජනා,සංශෝධිත යෝජනා දැමීම,ඊට පස්සේ යෝජනා ස්ථිර වීම,සභාවට පැමිණිය යුතු විදිහ.ඇත්තටම සභාවේ කතා කිරීමේදී,අපි ඒක පොඩ්ඩක් හදා ගමු.නැත්නම් සභාව විධිමත්ව පවත්වාගෙන යන්න බැරි වෙනවනේ.ඊටපස්සේ තව යෝජනාවට සංශෝධන,සභාවට පැමිණිමේදී ඇඳුම සම්බන්ධයෙන් වුණත් අපි සැලකිලිමත් වෙමු.

අද දින සභාවට හොඳ සහයෝගයක් ලැබුණා අපේ මන්ත්‍රිවරු,මන්ත්‍රිවරියන් සියලු දෙනා ගෙන් ම.ඉස්සරහටත් ඒ සහයෝගය අවශ්‍ය වෙනවා.අද දිනට නියමිත සාමාන්‍ය මහා සභා වාරය මෙතනින් නිමා කරනවා.බොහොම ස්තුතියි. දැන් වේලාව පස්වරු 4.52 යි.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2025 ක් වූ.................................මස...........දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.